201 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 201 - இல. 6
**Volume 201 - No. 6**

**2011 අගෝස්තු 24 වන බදාදා**
2011 ஓகஸ்ட் 24, புதன்கிழமை
**Wednesday, 24th August, 2011**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**කාර්මික ආරවුල් (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී

**පාර්ලිමේන්තු සේවයේ ස්වාධීන තත්ත්වය ශක්තිමත් කිරීම පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීම පිණිස වන විශේෂ කාරක සභාව**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත :**
නියෝගය

**කුඩා තේ වතු සංවර්ධන පනත:**
නියෝග

**කල්තැබීමේ යෝජනාව:**
කටුනායක නිදහස් වෙළඳ කලාපයේ සේවකයන් මුහුණපාන දුෂ්කරතා

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**கைத்தொழில் பிணக்குகள் (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது

**பாராளுமன்றச் சேவையின் சுயாதீனப் பண்பை வலுப்படுத்துவது பற்றி ஆராய்ந்து அறிக்கை சமர்ப்பிப்பதற்கான தெரிகுழு**

**இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம்:**
கட்டளை

**தேயிலை சிறு பற்றுநில அபிவிருத்திச் சட்டம்:**
ஒழுங்கு விதிகள்

**ஒத்திவைப்புப் பிரேரணை:**
கட்டுநாயக்க சுதந்திர வர்த்தக வலய ஊழியர்கள் எதிர்நோக்கும் கஷ்டங்கள்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

INDUSTRIAL DISPUTES (AMENDMENT) BILL:
Read the First time

SELECT COMMITTEE TO INQUIRE AND REPORT ON STRENGTHENING THE INDEPENDENT CHARACTER OF THE PARLIAMENTARY SERVICE

SRI LANKA EXPORT DEVELOPMENT ACT:
Order

TEA SMALL HOLDINGS DEVELOPMENT LAW:
Regulations

ADJOURNMENT MOTION:
Difficulties faced by Workers of Katunayake Free Trade Zone

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2011 අගෝස්තු 24 වන බදාදා***
*2011 ஓகஸ்ட் 24, புதன்கிழமை*
*Wednesday, 24th August, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி. ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p. m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2010 අගෝස්තු මස 24 වන බදාදා, එනම් අද දින පස් වරු 3.00 ට මාගේ නිල කාමරයේ දී පැවැත්වීමට නියමිත බැවින් එයට පැමිණ සහභාගි වන ලෙස සියලුම ගරු සභික මන්ත්‍රීවරුන් හට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

(1) 2010 වර්ෂය සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව; සහ

(2) 2010 වර්ෂය සඳහා මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව

මෙම වාර්තා මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2006, 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා - පැමිණ නැත.

**ගරු මහින්ද සමරසිංහ මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க - பெருந்தோட்டக் கைத் தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, මම කොළඹ 07, ටොරින්ටන් චතුරශ්‍රය, අපරාධ කොට්ඨාසය, උසාවි ප්‍රතිඵල අංශයේ සේවය කරන කේ.ඩී.සී.පී. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු කුමාර වෙල්ගම මහතා - පැමිණ නැත.
ගරු රංජිත් සියඹලාපිටිය මහතා - පැමිණ නැත.

**ගරු සී.ඒ. සූරියආරච්චි මහතා (සමාජ සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ.ஏ. சூரியஆரச்சி - சமூகசேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. C. A. Suriyaarachchi - Deputy Minister of Social Services)
ගරු කථානායකතුමනි, මම රණාල, දැඩිගමුව, විජිතපුර මාවත, අංක 98 ඒ. දරන ස්ථානයේ පදිංචි ඩී. ජේ. කොඩිතුවක්කු මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි,මම අලව්ව, දොඩම්කුඹුර, දොඩම්කුඹුර වත්ත, අංක 344 දරන ස්ථානයේ පදිංචි මතුගමගේ පේමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා - පැමිණ නැත
ගරු සනත් ජයසූරිය මහතා - පැමිණ නැත.
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා - පැමිණ නැත.
ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
ගරු කථානායකතුමනි, මම පොළොන්නරුව, විජයබාහු පුර, අංක 244/2 දරන ස්ථානයේ පදිංචි එම්. බී. සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නාමල් රාජපක්ෂ මහතා - පැමිණ නැත.
ගරු ආර්. දුමින්ද සිල්වා මහතා - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 2, ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, -

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අධ්‍යාපන ඇමතිතුමාගෙන්ම මට අහන්න ලැබුණා නම් සාර්ථක පිළිතුරක් ලබා ගන්න පුළුවන්. මම දැක්කා එතුමා භෝජනාගාරයේ ඉන්නවා. මම දෙවැනි වටයේදී ඒ ප්‍රශ්නය අහන්න කැමැතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ප්‍රශ්න අංක 3-1094/'11-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ගොඩැල්ලවත්ත, පාමංවැල්ල මාර්ගය: මූල්‍ය ප්‍රතිපාදන
## கொடல்லவத்த - பாமன்வெல்ல வீதி அபிவிருத்தி: நிதி ஒதுக்கீடு
## DEVELOPMENT OF GODELLAWATTA-PAMANWELLA ROAD: FINANCIAL PROVISION

1084/'11

8. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ගොඩැල්ලවත්ත, පාමංවැල්ල පාර 1995.08.24 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් රජයට අයත් පාරක් ලෙස ප්‍රකාශයට පත් කොට ඇති බවත්;

(ii) එම මාර්ගයේ දුර කි.මී. 15 ක් පමණ වන බවත්;

(iii) එම මාර්ගයේ ආරම්භක කොටස සහ අවසාන කොටස වාහන ගමන් කළ හැකි සේ සකස් කර ඇති නමුත්, පාර මැද කොටසේ මීටර් 100ක් පමණ දුර ප්‍රමාණයක් සංවර්ධනය කර නොමැති බවත්;

(iv) එයින් ජනතාවගේ ගමනාගමන කටයුතුවලට විශාල බාධාවක් සිදුව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය ඒකාබද්ධ කොට ගමනාගමන කටයුතු සඳහා සුදුසු පරිදි සංවර්ධනය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாணசபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தில் அக்குரஸ்ஸ பிரதேச சபை ஆளுகைப் பிரதேசத்தினுள் அமைந்துள்ள கொடல்ல வத்த பாமன்வெல்ல வீதி, 1995.08.24 ஆம் திகதி இலங்கை சனநாயகக் சோசலிஷக் குடியரசின் வர்த்தமான அறிக்கை மூலம் அரசுக்குச் சொந்த மான வீதியென பிரகடனப்படுத்தப்பட்டுள்ளது என்பதையும்;

(ii) இவ்வீதியின் நீளம் சுமார் 1.5 கி.மீ. என்பதையும்;

(iii) இவ்வீதியின் ஆரம்பமும் இறுதியும் வாகனப் போக்குவரத்து ஏற்றவாறு ஒழுங்கமைக்கப்பட்டு இடைநடுவிலுள்ள 100 மீற்றர் அளவிலான பகுதியை அபிவிருத்தி செய்ய நடவடிக்கை மேற் கொள்ளப்படவில்லை என்பதையும்;

(iv) இதனால் மக்கள் போக்குவரத்து பெருந்தடை ஏற்பட்டுள்ளதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) இவ்வீதியை ஒருங்கிணைத்து போக்குவரத்துக்கு ஏற்றவாறு அபிவிருத்தி செய்வதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) அவ்வாறாயின் எப்போது என்பதையும்;

(iii) இதற்கென நிதி ஏற்பாடுகள் மேற்கொள்ளப்பட் டுள்ளனவா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Is he aware that-

(i) the Godellawatta-Pamanwella road in the Akuressa Pradeshiya Sabha area has been declared as a road belonging to the government through the Gazette Notification of the Democratic Socialist Republic of Sri Lanka dated 24.08.1995;

(ii) the distance of this road is about 15 kilometers;

(iii) although the beginning and the end of the road had been renovated to enable vehicular traffic, a 100- meter stretch in the middle of the road has not been developed; and

(iv) the transport activities of the people have been severely hampered as a result ?

(b) Will he inform this House -

(i) whether action will be taken to connect the two ends of the road and develop suitably for transport activities;

(ii) if so, when; and

(iii) whether financial provisions have been allocated for this purpose?

(c) If not, why ?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)

(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැත.

(ii) නැත.

(iii) ඔව්.

(iv) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) මුදල් ප්‍රතිපාදන ලද පසුව.

(iii) දැනට නැත.

(ඇ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි.දැන් මේ පාරෙන් කොටසක් සකස් කරලා අඩි එකහමාරක, දෙකක කොටසක් වෙල්ලක් විධියට ඉතුරු වෙලා තිබෙනවා.මේ මාර්ගය ප්‍රතිපාදන ලැබුණු පසු සංවර්ධනය කරන බව තමයි කිව්වේ.සමස්තයක් විධියට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක පාරවල්වලට යොදවන මුදලින් බොහොම සොච්චම් මුදලක් තමයි මේකට යොදවන්න නියමිතව තිබෙන්නේ.

මේ වාගේ දෙයකට ප්‍රතිපාදන යොදවන්න මෙපමණ කාලයක් ගන්නේ ඇයි කියන එකයි මම අහන්නේ.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**

(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)

(The Hon. Indika Bandaranayake)

ගරු කථානායකතුමනි, මේ වෙනකොට මාර්ග විශාල සංඛ්‍යාවක් අපි නිම කර ගෙන යනවා. ප්‍රතිපාදන ලද විගස මේ මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන්න අපි කටයුතු කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මේ "ප්‍රතිපාදන ලද විගස"කියන එක අවුරුදු සියයක් ගත්තොත් අවුරුදු දහයක වාගේ කාලයක්. "ප්‍රතිපාදන ලද විගස"කියන එක උත්තරයක් විධියට නම් ලස්සනයි. නමුත් ප්‍රශ්නය මේකයි. ඒක නිසා මේකට - [බාධා කිරීමක්]

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු මන්ත්‍රීතුමා, අපි ඒ මාර්ගය හදනවා. මේ වෙනකොටත් අපි මාර්ග ගණනාවක් [බාධා කිරීමක්]

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා පරක්කු වෙලා ඇවිල්ලා.

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මේකයි. මේ මාර්ගයේ හදා තිබෙන කොටස පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා.මා එය ගරු පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. මගේ අතේ ඡායාරූපයක් තිබෙනවා. අකුරැස්ස මැතිවරණ කොට්ඨාසයේ අතුරලිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයිති මේ පාරේ හදා තිබෙන කොටසේත් කොන්ක්‍රීට් ගැලවිලා ගිහිල්ලා. ඒ කියන්නේ මේ පාර කොන්ක්‍රීට් කරන්න කලින් තිබුණාටත් වඩා නරා වළක් බවට පත් වෙලා තිබෙනවා.මේ ඡායාරූපය මා ඔබතුමාට එවන්න කැමැතියි. මේක ගරු ජනාධිපතිතුමා නියෝජනය කරන අමාත්‍යාංශයක්. නමුත් මේක ප්‍රාදේශීය සභාව හරහා යන නිසා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයටයි අයිති වන්නේ. ඒ නිසා මේ ගැන දැඩි අවධානයක් යොමු කර මේ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් ගන්නවාද කියන කාරණය මා අහනවා.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ඔබතුමා අපට විස්තර දෙන්න. අපි ඒ අවශ්‍ය කරන කටයුතු කරන්නම්.

## මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනය: සමෘද්ධි ආධාර
## மஹிந்த சிந்தனை கொள்கைப் பிரகடனம்: சமுர்த்தி உதவி
## MAHINDA CHINTANA MANIFESTO: SAMURDHI ASSISTANCE

1095/'11

9. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන්වූ පරිදි සමෘද්ධිලාභී පවුල්වල ගැබිනි මව්වරුන්ට මේ වන විට පෝෂණ මල්ලක් ලබා දෙන්නේද;

(ii) සමෘද්ධිලාභී පවුලක සිදු වන නව දරු උපතකදී දරුවාට අවශ්‍ය දෑ අඩංගු තිළිණ කට්ටලයක් ලබා දීමට මේ වන විට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආබාධ සහිත සමාජිකයෙකු සහිත පවුලක ආර්ථික තත්ත්වය නොසලකා සමෘද්ධි ආධාරය ලබා දීම සිදු කරනු ලබන බවට මහින්ද චින්තන ප්‍රතිපත්තියේ සඳහන් අයුරින් මේ වන විට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, මේ වන විට ඒ යටතේ ප්‍රතිලාභ ලබා ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மஹிந்த சிந்தனை கொள்கைப் பிரகடனத்தில் குறிப்பிடப்பட்டுள்ளவாறு சமுர்த்தி பெறும் குடும்பங்களைச் சேர்ந்த கர்ப்பிணித் தாய்மாருக்கு தற்போது போசாக்குப் பொதியொன்று வழங்கப் படுகின்றதா என்பதையும்;

(ii) சமுர்த்தி பெறும் குடும்பமொன்றில் புதிதாக ஓர் குழந்தை பிறக்கின்றபோது குழந்தைக்கு தேவையான பொருட்கள் அடங்கிய பரிசுப் பொதியொன்றைப் பெற்றுக்கொடுப்பதற்கு தற்போது நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வலது குறைந்த அங்கத்தவரொருவரைக் கொண்ட குடும்பத்தின் பொருளாதார நிலையைக் கருத்திற் கொள்ளாது சமுர்த்தி உதவி பெற்றுக்கொடுக்கப் படும் என மஹிந்த சிந்தனை கொள்கைத் திட்டத்தில் குறிப்பிடப்பட்டுள்ளவாறு தற்போது நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், இற்றைவரை இதன்கீழ் பயன்பெற்றுள்ள குடும்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he state -

(i) whether a bag of nutrients is provided at present to pregnant mothers of Samurdhi beneficiary families, as stated in Mahinda Chintana manifesto; and

(ii) whether measures are taken at present to provide a gift pack containing baby care items at the birth of a child of a Samurdhi beneficiary family ?

(b) Will he inform this House-

(i) whether action has been taken by now in line with the statement in Mahinda Chintana manifesto that the Samurdhi assistance would be provided to any family with a disabled member, irrespective of its economic status; and

(ii) if so, the number of families that have been benefited under that, by now ?

(c) If not, why ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්. මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වන පරිදි සමෘද්ධිලාභී පවුල්වල ගැබිනි මවුවරුන් හා කිරි දෙන මවුවරුන් සඳහා පෝෂණ මල්ලක් ලබා දෙනු ලැබේ.

(ii) සමෘද්ධිලාභී පවුලක සිදුවන නව දරු උපතකදී දරුවාට අවශ්‍ය දෑ අඩංගු තිළිණ කට්ටලයක් නොව සමෘද්ධි සමාජ ආරක්ෂක අරමුදලින් පළමු හා දෙවන දරු උපතක් සඳහා රුපියල් 5,000ක දීමනාවක් ලබා දීමට කටයුතු කරයි.

(ආ) (i) දැනට සමෘද්ධි සහනාධාර දෙනු ලබන්නේ අඩු ආදායම් ලබන පුද්ගලයන් සඳහා වන අතර ආබාධ සහිත සාමාජිකයෙකු සිටින පවුලක ආදායම් තත්ත්වය සලකා බැලීමේදී අබාධිත බව විශේෂ නිර්ණායකයක් සේ සැලකේ. ආබාධ සහිත පුද්ගලයෙකු සිටීම සමෘද්ධි සහනාධාර ලබා දීමට හේතුවකි.

(ii) පවුලේ ආදායම නොසලකා ආබාධ සහිත පුද්ගලයන් සඳහා දැනට සමෘද්ධි සහනාධාරයක් ලබා දීම ඉල්ලීම් ලැබෙන පරිදි කටයුතු කරනු ලැබේ. මේ අයගේ සංඛ්‍යාව වෙනමම ගණනය කිරීමක් සිදු නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ පෝෂණ මල්ල සම්බන්ධව ප්‍රශ්නයක් නැහැයි කියලා කියමු කෝ.මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශන දෙකම මා ළඟ තිබෙනවා. එකක් "මහින්ද චින්තන-අලුත් ශ්‍රී ලංකාවක්" කියන ප්‍රකාශනය. අනෙක් එක, "ජනාධිපතිවරණය -2010 මහින්ද චින්තන ඉදිරි දැක්ම" කියන ප්‍රකාශනය. මේ දෙකේම බොහොම පැහැදිලිව සඳහන් කර තිබෙනවා, දරු උපතකදී දරුවාට අවශ්‍ය දෑ අඩංගු තිළිණ කට්ටලයක් ලබා දීමට කටයුතු කරනවාය කියලා. රුපියල් 5,000ක දීමනාව නම් දිගටම ලබා දෙනවා. ඒකේ ප්‍රශ්නයක් නැහැ. ඒකත් එම ප්‍රකාශනවල සඳහන් කර තිබෙනවා. නමුත් මේ තිළිණ කට්ටලය ලබා දෙන්නේ කවදාද කියන එක තමයි මගේ ප්‍රධාන ප්‍රශ්නය. මොකද, ඒක දෙවන හා තුන්වන දරුවන්ට-[බාධා කිරීමක්] මා බොහොම වග කීමක් ඇතිවයි කියන්නේ. [බාධා කිරීමක්] මොකක්ද? [බාධා කිරීමක්] ඒක මම කර ගන්නම්. ඒකට තිළිණ කට්ටල් ඕනෑ නැහැ.[බාධා කිරීමක්]ඒ නිසා මම අහන්නේ, - [බාධා කිරීමක්]ඒකට තිළිණ කට්ටලයක් ඕනෑ නම් මම තිළිණ කට්ටලයක් හදා ගන්නම්.

ගරු කථානායකතුමනි, මේ මගේ අතේ දැන් තිබෙන්නේ 2005 දී ඉදිරිපත් කරපු " මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනය. මගේ අතේ තිබෙන අනික් එක 2010 දී ඉදිරිපත් කරපු "මහින්ද චින්තන ඉදිරි දැක්ම." මේකේ අපේ අතිගරු ජනාධිපතිතුමාත් ඉන්නවා, දැන් මේ ගරු සභාවේ ඉඳ ගෙන හිනා වෙවී ඉන්නවා වාගේ.මම අහන්නේ කවදාද මේ තිළිණ කට්ටලය දෙන්නේ කියලායි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, " තිළිණ කට්ටලයක්" කියා මෙහි සඳහන් කළා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

තිළිණ කට්ටලය මාරු කරන්න එපා. ඒකයි මම මේ කියන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, අපි පළමුවැනි සහ දෙවැනි දරු උපත් සඳහා රුපියල් 5,000ක මුදලක් දෙන්නේ මේක සැලකිල්ලට අරගෙනයි. මොකද මේ තිළිණ කට්ටල ගැන අපි කල්පනා කරලා බැලුවා. මේවා දෙන්න ගියාම එක එක්කෙනා එක එක විධියට මේක අර්ථ කථනය කරලා දෙන්න පටන් ගන්නවා. ඒ නිසා රුපියල් 5.000 ක් පළමුවැනි සහ දෙවැනි දරු උපත්වලදී ලබා දෙන්න කටයුතු කිරීම තුළ ඒ පවුලට ඕනෑම දෙයක් මිලයට ගැනීම කරන්න පුළුවන්. ඒ නිසා ඒ පවුලට අවශ්‍ය දේ නිර්ණායකයක් හැටියට සලකලා තමයි මේක ක්‍රියාත්මක කළේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක තමයි. නමුත් මම කියන්නේ මේවා දෙන්න අමාරු නම් මෙහෙම ලස්සන වචන නොදමා ඉන්න ඕනෑ කියලායි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

නැහැ, ගරු කථානායකතුමනි, මේ-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඡන්ද කාලයේදී ඡන්ද ටික ගන්න තිළිණ කට්ටල දෙනවා කියලා කියනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පිළිතුර ඉතාමත් පැහැදිලියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ක්‍රියාකාරීව කරන කොට මෙහෙම තිළිණ කට්ටලයක් දෙන්න බැහැ කියලා බොහොම පැහැදිලියි. ඒකයි අප කියන්නේ. මොකද මේ අනික් කට්ටිය දැන් මේ තිළිණ කට්ටලය ගන්න දරුවෙක් හම්බ වෙනකම් බලා ගෙන ඉන්නවා. ඒකයි මම කිව්වේ.

ගරු කථානායකතුමනි, මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මේකයි. මහින්ද චින්තන ඉදිරි දැක්මේ 20 වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

> "ආබාධ සහිත පුද්ගලයින්ගෙන් සමන්විත පවුලකට සමෘද්ධි ප්‍රතිලාභ ලබා දීමේදී එම පවුල්වලට අදාළ ආර්ථික තත්ත්වය නොසලකා සමෘද්ධි ආධාර ලබා දීමට කටයුතු කරමි."

නමුත් දැන් මෙතුමා දුන්න ඒ උත්තරයේ ඒක නොවෙයි තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ, ඒක තමයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම මේක check කළා, දැනුත් අමාත්‍යාංශයටත් කථා කරලා ඇහුවාම එතැනිනුත් කියපු නිසායි මේ කියන්නේ. මෙහෙම ක්‍රමවේදයක් තවම ආරම්භ කරලා නැති බව තමයි ඒ ගොල්ලෝ කිව්වේ. මහින්ද චින්තන ඉදිරි දැක්මේ තිබෙන්නේ, "එම පවුල්වලට අදාළ ආර්ථික තත්ත්වය නොසලකා" කියලායි. ඒ කියන්නේ ඔවුන්ගේ ආර්ථික තත්ත්වය නොසලකා ඕනෑම කෙනෙකුට දෙනවා කියලා තමයි එහි තිබෙන්නේ. නමුත් දැන් කරන විධිය තමයි-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ, නැහැ. ඔය අර්ථකථනය වැරදියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නියෝජ්‍ය ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්නකෝ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ. ඔබතුමා වැරදියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරියට පැහැදිලි කරලා කියනකල් ඉන්න කෝ. මහින්ද චින්තනයේ තිබෙන්නේ ආබාධ සහිත පුද්ගලයන් පවුලක සිටී නම් එම පවුල්වල ආර්ථික තත්ත්වය නොසලකා සමෘද්ධිය දෙනවා කියලායි. ඒ කියන්නේ, කෙනෙක් සමෘද්ධි ආධාර ලබා ගන්නා තත්ත්වයක නොසිටියත්, ආබාධිත තත්ත්වය සලකලා ඔහුට සමෘද්ධිය දෙනවා කියන එකයි. නමුත් එහෙම එකක් තවමත් ආරම්භ කරලා නැති බව තමයි පෙනෙන්නේ. මම මීට අදාළ හැම ආයතනයකටම වාගේ කථා කළා, ගරු කථානායකතුමනි. එතකොට තමයි මම ඒ බව දැන ගත්තේ. ඒක තමයි මම ඔබතුමාට කිව්වේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, සමෘද්ධිය නොලබන පවුලක ආබාධිතයකු හිටියත්, වැඩි ආදායමක් ඒ පවුලට ලැබෙනවා නම් ඒ පවුල නඩත්තු කරන්න පුළුවන්. අපි නිර්ණායකය හැටියට අරගෙන තිබෙන්නේ මේකයි. ආදායම පොඩ්ඩක් වැඩි වුණත්, ආබාධිතයකු ඉන්නවා නම් සමෘද්ධිය නොලබන පවුල්වලටත් අපි ඒ සහනාධාරය දෙනවා. නමුත් එක්ලක්ෂ පනස්දහසක්, දෙලක්ෂයක් මාසික ආදායම තිබෙන පවුලකට ඒක දෙන්නේ නැහැ. එක විශේෂත්වයක් හැටියට සලකලා ක්‍රියාත්මක කරලා තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. මහින්ද චින්තන ඉදිරි දැක්මේ තිබෙනවා,-

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
නායකතුමා එනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්. නායකතුමා ඉන්නවා. මොකක්ද තිබෙන ප්‍රශ්නය? ඔබතුමා කොහේ නායකයාද? [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අපට ඉන්නේ එකම එක නායකතුමායි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි පරිස්සමෙන් එතුමාත් එක්ක ගනුදෙනු කරන්නම්. ඔබතුමා බුද්ධදාසගෙන් පරිස්සම් වන්න. ඒකයි දැන් තිබෙන ප්‍රශ්නය. නේද ජනාධිපතිතුමනි? ජනාධිපතිතුමනි, එතුමාට බුද්ධදාසගෙන් පරිස්සම් වන්න කියන්න ඕනෑ. ඒකයි තිබෙන ප්‍රශ්නය. බුද්ධදාසගෙන් ඇන ගත්තා හතර ගාතෙන් යන්න. බිම ඇද ගෙන වැටුණා. කඩුවෙල වයසට යන්න දෙන්න එපා කියලායි කිව්වේ. අන්තිමට කඩුවෙල වයසට යවලා නිකම් හිටියා. [බාධා කිරීමක්] දැන් මේ පාර වෙන කොහේ හරි එකකින් ඇන ගන්නද හදන්නේ?

රුපියල් 1000ට වඩා අඩුවෙන් සමෘද්ධි සහනාධාර ලබන පවුල්වලට රුපියල් 1000 ක් දෙනවා කියලා 2010 වර්ෂයේ කියා තිබෙනවා. මම අහන්න කැමතියි කවදාද මේක ක්‍රියාත්මක කරන්නේ කියලා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අපි ඒක ක්‍රියාත්මක කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කවදාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
දැනට අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ කීපයක රුපියල් 1500 සීමාවට වැඩි කරලා තිබෙනවා. අපි දැනට සාකච්ඡා කර ගෙන යනවා, ඉතිරි ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවලත් රුපියල් 1500 දක්වා මේ දීමනාව අදියරෙන් අදියර වැඩි කරන්න. මහින්ද චින්තනයේ කොතැනකවත් කියලා නැහැ, අහවල් අවුරුද්දේ දෙනවා කියලා. අපට තව අවුරුදු ගණනක් ඉස්සරහට තිබෙනවා. ඒ අවුරුදු ගණන ඇතුළත අපි ඒක කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10-1245/'11-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
දැයට කිරුළ කෙරිලා ගොඩක් කල්.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා සේවය: ශ්‍රී ලාංකික ආරක්ෂක සේවා භටයන්
## ஐக்கிய நாடுகள் அமைதி காக்கும் பணி: இலங்கைப் பாதுகாப்புத் தரப்பினர்
UNITED NATIONS PEACE-KEEPING ACTIVITIES : SRI LANKAN SECURITY PERSONNEL

0994/'10

12. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය—(1) :

(අ) (i) 2000 වර්ෂයේ සිට අද දක්වා, එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා සේවය සඳහා පිටත්ව ගොස් ඇති පොලිස් සහ ත්‍රිවිධ හමුදා භටයන්ගේ සංඛ්‍යාව වාර්ෂික පදනමින් කොපමණද;

(ii) එක්සත් ජාතීන් විසින් සොල්දාදුවෙකුට හෝ පොලිස් භටයකුට ගෙවූ මුදල කොපමණද;

(iii) ඔවුන් සේවයේ යොදවා ඇති රටවල් කවරේද;

(iv) එම එක් එක් රටේ සේවයේ යොදවා ඇති ශ්‍රී ලාංකික ආරක්ෂක සේවා භටයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙහි සඳහන් කරුණට පරිබාහිර වෙනත් කරුණක් සඳහා සොල්දාදුවන් සහ පොලිස් භටයන් විදේශ රටවල සේවය සඳහා යවා තිබේද;

(ii) එසේ නම්, ඔවුන් සේවය සඳහා යවා ඇති ස්ථාන කවරේද;

(iii) ඉහත කී ස්ථානවලට ඔවුන් යැවීමේ අරමුණ කවරේද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2000 ஆம் ஆண்டு முதல் இற்றைவரை ஐ.நா. அமைதி காக்கும் நடவடிக்கைகளுக்கு சென்றுள்ள பொலிஸ் தரப்பினர் மற்றும் ஆயுதப் படைத் தரப்பினர்களின் எண்ணிக்கையை வருடவாரி யாகவும்;

(ii) ஐ.நா. வினால் படை வீரர் அல்லது பொலிஸார் ஒருவருக்கு செலுத்தப்பட்ட தொகையையும்;

(iii) அவர்கள் சேவையில் அமர்த்தப்பட்டுள்ள நாடுகளையும்;

(iv) ஒவ்வொரு நாட்டுக்கும் சேவையில் அமர்த்தப் பட்டுள்ள இலங்கைப் பாதுகாப்புத் தரப்பினரின் எண்ணிக்கையையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) படை வீரர்களையும் பொலிஸாரையும் வெளிநாடு களுக்கு அனுப்பி சேவையில் ஈடுபடுத்துவதற்கான வேறேதும் காரணங்களுண்டா என்பதையும்;

(ii) ஆமெனில், அவர்கள் அனுப்பிவைக்கப்பட்டுள்ள இடங்களையும்;

(iii) அவ்விடங்களுக்கு அவர்களை அனுப்பியதற்கான நோக்கத்தையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House-

(i) the number of police personnel and armed forces personnel who have gone for UN peace-keeping work from the year 2000 to date on per year basis;

(ii) the amount paid for a soldier or police person by the UN;

(iii) the countries where they are deployed; and

(iv) the number of Sri Lankan security personnel deployed per country?

(b) Will he state-

(i) whether there is any other purpose that soldiers and policemen are sent overseas for deployment;

(ii) if so, the places they are sent; and

(iii) the purpose of sending them to said places?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා. දීර්ඝ විස්තරයක් තිබෙනවා.

(අ) (i)

| වර්ෂය | පිටත්ව ගිය සංඛ්‍යාව (එ.ජ. සා. හමුදාව) | | | |
|---|---|---|---|---|
| | යුධ | නාවික | ගුවන් | පොලිස් |
| 2000 | - | - | - | 28 |
| 2001 | - | - | - | 33 |
| 2002 | 2 | - | - | 44 |
| 2003 | 4 | - | - | - |
| 2004 | 757 | - | - | 21 |
| 2005 | 1621 | 50 | 48 | 40 |
| 2006 | 1714 | 50 | 100 | 70 |
| 2007 | 1722 | 100 | 100 | 68 |
| 2008 | 1721 | 100 | 100 | 68 |
| 2009 | 1724 | 100 | 100 | 83 |
| 2010 | 1192 | 100 | 112 | 74 |
| 2011 | 1753 | 100 | 50 | 43 |
| **එකතුව** | **12210** | **600** | **610** | **572** |

(ii) ත්‍රිවිධ හමුදා සොල්දාදුවන් සඳහා මසකට ඇ. ඩො. එක්දහස් විසි[1]අටක් හා ඇ. ඩො. හැත්තෑ තුනක අමතර දීමනාවක්ද පොලිස් භටයකු සඳහා දිනකට ඇ. ඩො. එකසිය විස්සක් / එකසිය පනහක් අතර මුදලක් ගෙවනු ලැබේ.

(iii) යුද හමුදා භටයින් හයිටි, ලෙබනනය, චැඩ්, ඇමරිකාව, බටහිර සහරා, සුඩාන්, කොංගෝ, ඉතියෝපියාව හා බුරුන්ඩි යන රටවල්[1]වලද, නාවික හමුදා භටයින් සුඩානය හා හයිටි රාජ්‍යයන් යන රටවලද, ගුවන් හමුදා භටයින් හයිටි රාජ්‍යයටද, පොලිස් නිලධාරීන් නැගෙනහිර ටිමෝරය, අයිවරිකෝස්ට්, සියරාලියෝන්, ලයිබීරියාව, දකුණු සුඩානය හා හයිටි යන රටවලද සේවයේ යොදවා ඇත.

(iv)

| රට | යොදවා ඇති භටයින් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | යුධ | නාවික | ගුවන් | පොලිස් |
| හයිටි | 860 | 600 | 50 | 79 |
| ලෙබනන් | 151 | - | - | |
| ඇමරිකාව | 2 | - | - | |
| කොංගෝ | 4 | - | - | |
| බටහිර සහරා | 3 | - | - | |
| සුඩාන් | 6 | 2 | - | 124 |
| අයිවරි කෝස්ට් | | | | 1 |
| සියරාලියෝන් | | | | 10 |
| ලයිබීරියාව | | | | 70 |
| නැ. ටිමෝරය | | | | 288 |
| **එකතුව** | **1026** | **602** | **50** | **572** |

(ආ) (i) නැත.
(ii) අදාළ නොවේ.
(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බොහොම ස්තුතියි දීර්ඝ පිළිතුරට. ගරු කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. නැඟෙනහිර ටිමෝරයට ගිය අපේ සොල්දාදුවන්ට යම් කිසි ප්‍රශ්නයක් සම්බන්ධයෙන් අනිසි ලෙස බලපෑමක් කරලා තිබුණා. ඒ හා සම්බන්ධයෙන් විදේශ අමාත්‍යාංශය ඉදිරිපත් වෙලා ඒ ප්‍රශ්නය නිරාකරණය කරලා තිබෙනවාද ඇමතිතුමනි? අභූත චෝදනාවක් ඉදිරිපත් කරලා තිබුණා. මම හිතන විධියට ඒක නිරාකරණය කරන්න ඉදිරිපත් වුණා. ඒක සම්පූර්ණයෙන්ම අභූත චෝදනාවක්. ඒ ප්‍රශ්නය නිරාකරණය කරන එක හොඳයි. මොකද, ඒ කාලයේත් එය අනවශ්‍ය ප්‍රශ්නයක් ඇති කළා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, එක්සත් ජාතීන්ගේ සාම හමුදාවට අප හමුදාවල නියෝජිතයන් යැවීම තවදුරටත් කර ගෙන යන්නේ ඒ ගැටලු කිසිවක් පැන නොනඟින නිසා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මගේ ප්‍රශ්නය ඒක නොවෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒවා නිරාකරණය වී තිබෙන නිසා තමයි අපේ හමුදාවන්-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගිය කට්ටියට අභූත චෝදනාවක් ඉදිරිපත් කළා. අපේ කට්ටිය තමයි හොඳම කට්ටිය කියලා-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒක තමයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ නිසා ඒ ප්‍රශ්නයට විදේශ අමාත්‍යාංශයෙන්-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අපේ කට්ටිය තමයි හොඳම කට්ටිය කියලා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සාම හමුදාව පිළිගන්නවා. ඒකයි පළමුවන වැදගත් දේ. නේද? තිබුණු පොඩි ගැටලුවක් විසඳා ගෙන තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා පීලි පනිනවා නේ. මම ඇහැව්වේ ඒක නොවෙයි නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පීලි පනින්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විදේශ අමාත්‍යාංශයෙන් ඒ අය වෙනුවෙන් ඉදිරිපත් වුණාද නැද්ද කියන එක තමයි ඇහැව්වේ. අපි ඉදිරිපත් වෙලා ඒ ප්‍රශ්නය විසඳන්න ඕනෑ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තිබුණු ප්‍රශ්න නිරාකරණය වීම නිසායි ඒ කටයුතු දිගටම කර ගෙන යන්නට පුළුවන්කම ලැබිලා තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය ගරු කථානායකතුමනි. එහෙම නම් ඊට වැඩි ප්‍රමාණයක් එම රටට යැවීමට අවස්ථාවක් අපට - ලංකාවට- ලබා ගන්න බැරි වන්නේ ඇයි කියන ප්‍රශ්නයට උත්තර දෙන්න පුළුවන්ද? 12,00කටයි අවස්ථාව තිබෙන්නේ. සාර්ථක යුද හමුදාවක් අපට ඉන්න අවස්ථාවක මීට වැඩි ප්‍රමාණයක් යවන්න අවස්ථාවක් ලබා ගන්න පුළුවන්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපේ රටින් යවන ප්‍රමාණයන් දැන් වැඩි වී තිබෙනවා ගරු කථානායකතුමනි. ශ්‍රී ලාංකික ත්‍රිවිධ හමුදාවේ අයගේ හා පොලිස් සේවාවේ අයගේ රාජකාරි ඉතාමත් ඉහළින් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සාම හමුදා පිළිගන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වන අයට ස්වාධීන interview එකක් තියලා ඒ තුළින්ද මේ අවස්ථාව ලබා දෙන්නේ, නැත්නම් ඔවුන් දැක්වූ දක්ෂතාවන් උඩද, කොයි ආකාරයෙන්ද මේ අය පිට රට යවන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ශ්‍රී ලංකා හමුදාංකවල අය තෝරන්නේ එම සාම හමුදාවේද නියෝජිතයන් පැමිණිලා ඒ එකඟතාවන්ද අනුවයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හතරවැනි අතුරු ප්‍රශ්නය, ගරු කථානායකතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මටත් දැනුණේ දැන් හතරවැනි අතුරු ප්‍රශ්නය තමයි අහන්න හදන්නේ කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනේ නැහැ, ගරු කථානායකතුමනි. ඔබතුමා දන්නවා නේ මම හරියාකාරව ප්‍රශ්න අහනවා කියලා. ගරු ඇමතිතුමා කිව්වා දකුණු සුඩානවල අපේ යුද හමුදාවේ සහ පොලිසියේ අය ඉන්නවා කියලා. මා ළඟ ජූලි මාසයේ 14 වෙනිදා වාර්තාවක් තිබෙනවා, South Sudan රට බිහිවීම සම්බන්ධයෙන්. ඒ රට බිහි වුණු දවසේ ගරු තිස්ස විතාරණ ඇමතිතුමා ලංකාව නියෝජනය කළා කියලා අපව දැනුවත් වෙලා තිබුණා. එතුමාට දකුණු පැත්තේ වාඩි වෙලා සිටියා, කවුදෝ නම් කරපු ඊළාම් පාර්ලිමේන්තුවේ "රුද්‍රා" කියලා එක්කෙනෙක්. ඒ ප්‍රශ්නය තිබුණා නම් ඇයි එතුමා එතැන ඉඳගත්තේ කියන එක මෙතැන අපට අහන්න සිදු වෙලා තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඒක සම්පූර්ණ අසත්‍යයක්. මේ මන්ත්‍රීතුමාගේ නිර්මාණයක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අසත්‍යයක් නම් බොහොම හොඳයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක ඔබතුමාගේ නිර්මාණයක්. ඒක අසත්‍යයක්. එතැන හිටපු ඇමතිතුමා ඒ ගැන අපට වාර්තා කරලා තිබෙනවා. එතැන ඔබතුමා ඉඳ ගෙන හිටියේ නැහැ නේ. ඇමතිතුමා නේ ඉඳ ගෙන හිටියේ. අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. කොටි එක්ක ඉඳ ගෙන පුරුදු තමුන්නාන්සේලාට.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
රූපවාහිනී, අයිටීඑන් නොවෙයි එහේ තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13. [බාධා කිරීම්] දැන් ප්‍රශ්න අංක13ට ගිහිල්ලා ඉවරයි. ප්‍රශ්න අංක 13ට පිළිතුරු දෙන්න අමාත්‍යතුමා සූදානම් [බාධා කිරීම්] ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා වාඩි වෙන්න 13වැනි ප්‍රශ්නය.

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ලබා දී ඇති නිවාස ණය: මාතර දිස්ත්‍රික්කය
## வீடமைப்பு அபிவிருத்தி அதிகார சபை வழங்கிய வீடமைப்புக் கடன்: மாத்தறை மாவட்டம்
## HOUSING LOANS GRANTED BY NATIONAL HOUSING DEVELOPMENT AUTHORITY: MATARA DISTRICT

1085/'11

13. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) වර්ෂ 1977 සිට 1993 දක්වා කාල සීමාවේදී මාතර දිස්ත්‍රික්කයේ ජනතාවට නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ලබා දී ඇති නිවාස ණය සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාල සීමාවේදී ලබා දුන් නිවාස ණය ප්‍රමාණයේ සම්පූර්ණ වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1977 සිට 1992 දක්වා එම දිස්ත්‍රික්කයේ ජනතාවට ලබා දුන් නිවාස ණය කපා හරින්නට එවකට රජය කටයුතු කළ බවත්;

(ii) එලෙස කපා හරින නිවාස ණය ආපසු අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග පවා ගෙන ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) කපා හරින ලද නිවාස ණය, ණයලාභීන්ගෙන් ආපසු අය කර ගැනීමට කටයුතු කරනු ලබන පදනම කවරේද;

(ii) එම ණය නැවත අය කිරීමේ ක්‍රියාවලිය නතර කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම් ඒ මන්ද?

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1977 தொடக்கம் 1993 ஆம் ஆண்டு வரையிலான காலப்பகுதியில் மாத்தறை மாவட்ட மக்களுக்கு வீடமைப்பு அபிவிருத்தி அதிகார சபையினால் வழங்கப்பட்டுள்ள வீடமைப்புக் கடன்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இக்காலப்பகுதியில் வழங்கப்பட்ட வீடமைப்புக் கடன்களின் மொத்தப் பெறுமதி யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 1977 தொடக்கம் 1992 ஆம் ஆண்டு வரை இம்மாவட்ட மக்களுக்கு வழங்கப்பட்ட வீடமைப்புக் கடன்களை பதிவழிப்பதற்கு அப்போதைய அரசு நடவடிக்கை எடுத்ததென்பதையும்;

(ii) இவ்வாறு பதிவழிக்கப்பட்ட வீடமைப்புக் கடன் களை மீள அறவிட்டுக் கொள்வதற்காக நீதிமன்ற நடவடிக்கைகள் கூட மேற்கொள்ளப் பட்டுள்ளது என்பதையும்

அவர் அறிவாரா?

(இ) (i) பதிவழிக்கப்பட்ட வீடமைப்புக் கடன்களை கடன் பெறுநர்களிடமிருந்து மீள அறவிடுவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படும் அடிப்படை யாதென்பதையும்;

(ii) இக்கடன்களை மீள அறவிடப்படுவதை நிறுத்து வதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாளரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Will he state -

(i) the number of housing loans provided to the people of the Matara District by the Housing Development Authority during the period from the year 1977 to 1993; and

(ii) the total value of the housing loans granted during the aforesaid period?

(b) Is he aware that -

(i) the then government took measures to write off housing loans granted to the people of the aforesaid district from the year 1977 to 1992; and

(ii) even legal action has been initiated to recover the loans thus written off ?

(c) Will he inform this House-

(i) of the basis on which action is being pursued to recover the written off housing loans from the recipients of loans; and

(ii) whether action will be taken to stop the process of recovery of the aforesaid loans ?

(d) If not, why?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச )
(The Hon. Wimal Weerawansa )
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) 1977 සිට 1983 දක්වා ණය ලබා දී නැත.

| අනු අංකය | වර්ෂය | ණය සංඛ්‍යාව |
|---|---|---|
| 01 | 1977 සිට 1983 | ණය ලබා දී නැත. |
| 02 | 1984 | 993 |
| 03 | 1985 | 1,277 |
| 04 | 1986 | 1,700 |
| 05 | 1987 | 764 |
| 06 | 1988 | 463 |
| 07 | 1989 | 850 |
| 08 | 1990 | 5,048 |
| 09 | 1991 | 3,074 |
| 10 | 1992 | 632 |
| 11 | 1993 | 833 |
| එකතුව | | 15,634 |

වර්ෂ 1984 සිට 1993 දක්වා කාල සීමාවේදී ලබා දුන් නිවාස ණය සංඛ්‍යාව 15,634කි

(ii)

| අනු අංකය | වර්ෂය | ණය මුදල |
|---|---|---|
| 01 | 1977 සිට 1983 | ණය ලබා දී නැත. |
| 02 | 1984 | 4,965,000.00 |
| 03 | 1985 | 6,385,000.00 |
| 04 | 1986 | 8,500,000.00 |
| 05 | 1987 | 5,730,000.00 |
| 06 | 1988 | 3,472,500.00 |
| 07 | 1989 | 6,375,000.00 |
| 08 | 1990 | 63,100,000.00 |
| 09 | 1991 | 38,425,000.00 |
| 10 | 1992 | 6,320,000.00 |
| 11 | 1993 | 8,330,000.00 |
| | එකතුව | 151,602,500.00 |

වර්ෂ 1984 සිට 1993 දක්වා කාල සීමාවේදී ලබා දුන් නිවාස ණය මුදලේ සම්පූර්ණ වටිනාකම රුපියල් මිලියන 151.6025කි.

(ආ) (i) වර්ෂ 1977 සිට 1992 දක්වා කාලය තුළ නිවාස ණය ලබා ගත් ණයලාභීන්ගේ නිවාස ණය මුදල් කපා හැරීමක් සිදු නොවුණ අතර, එය පහතින් විස්තර කර ඇති ආකාරයට සෙවණ අරමුදලින් පියවීමට එවකට ගරු නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යතුමා විසින් අනුමැතිය ලබා දී ඇත.

දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන යටතේ ආහාර මුද්දරලාභීන්ට සහන සැලසීමේ අරමුණින් එකී ගණයට අයත් ණයලාභීන් විසින් ලබා ගෙන තිබූ නිවාස ණය වෙනුවෙන් 1988 අගෝස්තු මස 31 දින දක්වා ගෙවිය යුතු ණය වාරික මුදල් පමණක් අයකර ඉතිරි මුදල් සෙවණ අරමුදල මඟින් පියවීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව 1988 අගෝස්තු මස 31 දක්වා වූ ණය වාරික ආපසු අය කිරීමටත්, 1988 සැප්තැම්බර් මස 01 දින සිට අය විය යුතු මුදල් සෙවණ අරමුදලින් පියවීමටත් කටයුතු කර ඇත.

(ii) සෙවණ අරමුදල මඟින් පියවන ලද ණය මුදල් ආපසු අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැත.

(ඇ) (i) ආහාර මුද්දරලාභී ණයලාභීන් විසින් ලබා ගත් නිවාස ණය වෙනුවෙන් 1988 සැප්තැම්බර් මස 01 දින සිට අය විය යුතු ණය වාරික සෙවණ අරමුදලින් පියවා ඇති බැවින්, එකී ණය මුදල් නැවත අය කිරීමක් සිදු නොකරනු ලබයි.

එහෙත්, ආහාර මුද්දරලාභීන් නොවන ණයලාභීන්ගෙන් සහ 1988 අගෝස්තු මස 31 වන දින දක්වා හිඟ ණය වාරික මෙතෙක් නොගෙවූ ආහාර මුද්දරලාභී ණයලාභීන්ගෙන් දැනටමත් ණය වාරික ආපසු අය කිරීම් සිදු කරනු ලබයි.

(ii) සෙවණ අරමුදල මඟින් පියවනු ලැබුවේ ආහාර මුද්දරලාභී ණයලාභීන් විසින් ලබා ගෙන තිබූ ණය වෙනුවෙන් 1988 සැප්තැම්බර් මස 01 දින සිට ගෙවිය යුතුව තිබූ ණය වාරික මුදල් පමණක් බැවින්, එකී ණය වාරික නැවත අය කිරීමක් සිදු නොකරයි.

(ඈ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යතුමා අංග සම්පූර්ණ පිළිතුරක් දුන්නු එක පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වනවා.

"අපි බලයට පත් වුණාම මේ ණය ගෙවන්නම්" කියලා ඒ ණය ගෙවිය යුතුව තිබෙන අය පිළිබඳව පක්ෂ දෙකේම දේශපාලනඥයෝ මැතිවරණ කාලයේදී පොරොන්දු දීලා තිබෙනවා. නීතිරීති රෙගුලාසිවල කුමක් සඳහන් වෙලා තිබුණත්, ඔබතුමන්ලාගේ ක්‍රමවේද මොනවා තිබුණත් ඒ අයගේ හිත් තුළ ඒ විශ්වාසය තිබෙනවා. නමුත් ඔබතුමන්ලා ඒ ණය අය කරන්න යනවා නම් එම නිවාස හිමියන්ගේ පැත්තෙනුත් සාධාරණ වැඩ පිළිවෙළක් හදන්න පුළුවන්ද කියන එකයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළා වාගේ ඇතැම් අවස්ථාවලදී යම් යම් දේශපාලන මැදිහත්වීම් අනුව "නිවාස ණය කපා හරිනවා" වැනි ප්‍රකාශ කිරීම නිසා ජනතාවගෙන් යම් කිසි කොටසක් අඛණ්ඩව නිවාස ණය ගෙවීමේ ක්‍රියාවලියෙන් අත් මිදිලා තිබෙනවා. නමුත් ඒ පිළිබඳව නීත්‍යානුකූලව ගත් තීරණයක් කොහේවත් නැහැ. ඒ නිසා තමයි අපි ඒ අයට නැවත දන්වලා තිබෙන්නේ "ඔබ ගත් නිවාස ණයවලට අදාළ වාරික නියමිත ආකාරයට ගෙවන්න" කියලා. එබඳු අවස්ථාවලදී දුක්ගැනවිලි ඉදිරිපත් කරන අයගේ සාධාරණ ප්‍රශ්න ඇහුම් කන් දීලා අපි සහන දෙන අවස්ථා තිබෙනවා. විශේෂයෙන්ම සමහර අවස්ථාවල දඩ මුදල කපා හරිනවා. එහෙම නැත්නම් ණය ගෙවීම සඳහා ඔවුන්ට දැරිය හැකි ආකාරයේ වෙනත් යම් කිසි ක්‍රමවේදයක් හදලා දෙනවා. මේ විධියේ සහන සැපයීමක් සිදු වෙනවා. එම ණය මුදල් නැවත අය කර ගැනීමෙන් තමයි තවත් පිරිසකගේ නිවාස ප්‍රශ්නය විසඳීම සඳහා මුදල් ආයෝජනය කිරීමේ වැඩි හැකියාවක් ලැබෙන්නේ. ඒ නිසා ඒ කටයුත්ත සිදු වෙනවා. නමුත් සාධාරණ දුක්ගැනවිලි ඉදිරිපත් වන අවස්ථාවලදී මානුෂීයව බලා අපි ඒවාට අවශ්‍ය සහන දීම සඳහා කටයුතු කරමින් ඉන්නවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. අකුරැස්ස, තිබ්බොටුවාව ප්‍රදේශයේ වල්පොල, ගොඩහේන කියන ප්‍රදේශය තුළ පිහිටා තිබෙන නිවාස 22 ක් නියෝජනය කරමින් එවා තිබෙන ලියුමක් තිබෙනවා. මම ඔබතුමාට එය ලැබෙන්නට සලස්වන්නම්. ගරු කථානායකතුමනි, මේ අය කියන්නේ මෙයයි. මේ අයට ගෙවන්න තිබෙන්නේ රුපියල් 20,000 යි. දැන් පොලිය එකතු වෙලා මේ ලියුම ලියන දවස වන විට මේ අයට ගෙවන්න තිබෙන මුදල රුපියල් 39,103.60 ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ රුපියල් 39,103.60 වාරික තුනකින් ගෙවන්න කියලා කියනවා. මේ අය කියනවා මේ අයගේ ආර්ථික තත්ත්වය, ජීවන තත්ත්වය සහ ජීවන වියදම කියන සියලු කාරණා සමඟ වාරික තුනකින් මෙය ගෙවන්න බැහැ, අඩුම ගණනේ මාස්පතා රුපියල් 500ක්, 750ක්, 1,000ක් වාගේ සාධාරණ ක්‍රමයකින් ගෙවන්න වැඩ පිළිවෙළක් හදලා දෙන්න, රුපියල් 39,000 ක් තුනෙන් බෙදලා එක සැරේ රුපියල් 10,000 එහෙම නැත්නම් රුපියල් 12,000 වාගේ ගණන් ගෙවන්න බැහැ කියලා. මෙවැනි කාරණා සම්බන්ධයෙන් මීට වඩා ප්‍රගතිශීලී වැඩ පිළිවෙළක් කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න පුළුවන්ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු මන්ත්‍රීතුමනි, ඕක තමයි ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ණය අය කර ගැනීමේදී අනුගමනය කරන ප්‍රතිපත්තිය. ඔබතුමා ඔය ප්‍රශ්නය මෙතැන කථා කිරීමේ වරදක් නැහැ. නමුත් ඔබතුමා අද -බදාදා- උදේ අමාත්‍යාංශයට කවුරු හෝ නියෝජිතයෙක්ව එව්වා නම්, ඒක සලකා බලා ඒ අවශ්‍ය සහනය දෙන්න කටයුතු කරන්නට අපට පුළුවන්. ඒ අයට වාරික තුනකින් ගෙවීම අපහසු නම් ඒ ගණන වාරික වැඩි සංඛ්‍යාවකට කඩලා ගෙවීමට හැකි වන ආකාරයට ඒක සකස් කරලා දෙන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මාගේ අවසන් අතුරු ප්‍රශ්නය මෙයයි. අපි උදාහරණයකට ගනිමු රුපියල් 20,000 ක් ගෙවීමට තිබෙනවා කියලා. ඒ අය එයින් සියයට 70 ක් 80 ක් පමණ ගෙවා තිබෙනවා. දළ වශයෙන් රුපියල් 20,000 ක් ගෙවන්න තිබෙනවා නම් බාග වෙලාවට රුපියල් 12,000 ක් 14,000ක් 15,000 ක් වාගේ ගෙවා තිබෙනවා. එහෙම අයටත් ඉතිරි මුදල වෙනුවෙන් නඩු මඟින් අය කර ගැනීමේ ක්‍රියා මාර්ගවලට ගිහින් තිබෙනවා. සමහර වෙලාවට නඩු මඟින් අය කර ගැනීමේ ක්‍රියා මාර්ගවලට යනවාට අමතරව උසාවියේ පිස්කල් මහත්වරු ඇවිල්ලා ගෙවල්වල තිබෙන බඩු බාහිරාදියත් තහනම් කරලා ගිහින් තිබෙනවා. ඒක උසාවි ක්‍රියාමාර්ගයක්. ඒ ගැන මම මොකුත් කථා කරන්නේ නැහැ. නමුත් මේ අහිංසක නිවාස හිමියන්ගේ බෙල්ල තද කරලා -ඔබතුමා ගැන නොවෙයි, මේ කියන්නේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා, පැහැදිලි කිරීම් නොවෙයි අවශ්‍ය වන්නේ, ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

නිවාස අධිකාරියේ සමහර නිලධාරින් ගරු කථානායකතුමනි, බෙල්ල තද කරලා බොහොම දරුණු විධියට මේ අයගෙන් මුදල් අය කර ගන්න යනවා. තව ගෙවන්න තිබෙන්නේ සොච්චම් මුදලයි සමස්ත ප්‍රමාණයෙන්. ඉතින් ඒ වාගේ මුදලක් නඩු මඟින් අය කර ගන්නේ නැතිව සුහදශීලීව වෙනත් ක්‍රියා මාර්ගයකට යන්න බැරිද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු මන්ත්‍රීතුමා, මම දන්නා විධියට නම් කාගේවත් බෙල්ල තද කරන්නේ නැහැ. ඔබතුමන්ලා ඔබතුමන්ලාගේ නායකතුමාගේ බෙල්ල තද කරන ආකාරයේ තද කිරීමක් නම් කිසි සේත්ම වන්නේ නැහැ. නමුත් මා බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, අධිකරණයට යන්නේ වෙනත් විකල්ප ක්‍රියා මාර්ගයක් නැතිම තත්ත්වයක් යටතේය කියන එක. අපි සාමාන්‍යයෙන් මේ ප්‍රශ්නය අධිකරණයට ගෙන යන්නේ නැහැ. අධිකරණයට යන්නේ වෙන ක්‍රියා මාර්ගයක් නැතිම තත්ත්වයක් යටතේයි. අධිකරණයේ තීන්දුව ආවත් සමහර වෙලාවට අපි නැවත සහනශීලී වැඩ පිළිවෙළවල් හදලා තිබෙනවා. ඉතින් ඔබතුමා දන්නා යම්කිසි පිරිසක් ඉන්නවා නම් ඒ අයගේ සාධාරණ දුක්ගැනවිල්ල අපට ඉදිරිපත් කරන්න. ඒ අවස්ථාවන්වලදී ඒකට උදවු වන්න පුළුවන්. හැබැයි, අපි පිළිගන්න ඕනෑ අර පොදු ක්‍රියා පටිපාටිය අනුව ඒ අයට ලොකු වරප්‍රසාදයක් ලැබිලා තිබෙන බව. රටේ වෙනත් අඩු ආදායම්ලාභීන්ට නොලැබුණු වරප්‍රසාදයක් ඒ අයට ලැබිලා තිබෙනවා. ඒ නිසා ඒ ගොල්ලන්ගේත් සාධාරණ වග කීමක් හා යුතුකමක් තිබෙනවා ඒ තමන් ගෙවිය යුතු වාරිකය ගෙවන්න. ඒක පැහැර හැරීමෙන් වන්නේ තවත් අසරණ මිනිහෙකුට ඒ අවස්ථාව සලසන්න තිබෙන හැකියාව නැති වන එකයි. ඒ නිසා ඒ අයව ඒ මුදල් ගෙවීමේ ක්‍රියාවලියට උනන්දු කරවා ගැනීම සඳහා අපි විශේෂ මැදිහත් වීමක් කරනවා. ඒක දැනට සාර්ථක වෙලාත් තිබෙනවා. නමුත් ඒ සඳහා දරන උත්සාහයේදී යම්කිසි කෙනෙක් අසරණ වනවා නම් ඒ අසරණභාවය ගැන සලකා බලා වෙනත් විකල්ප ක්‍රමවේදයක් හදන්න අපි ලෑස්තියි. ඔබතුමා එවැනි දුක්ගැනවිලි තිබෙනවා නම් අපට ඉදිරිපත් කරන්න. අපි ඒක සාධාරණව සලකා බලන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 14-1096/'11-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මට කාරුණිකව ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අතුරු ප්‍රශ්න තුනයි නේ අහන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එතුමාත්, මමත් නියෝජනය කරන කොළඹ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එහෙම කරන්න බැහැන්. එක එක් කෙනාට එක එක විධියට එහෙම ඉඩ දෙන්න බැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් වැය කළ මුදල: තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

## 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிச் செலவினம்: தொழில்நுட்ப, ஆராய்ச்சி அமைச்சு

## MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 201: MINISTRY OF TECHNOLOGY AND RESEARCH

1246/'11

**15. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில்நுட்ப, ஆராய்ச்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிக்காக தொழில் நுட்ப, ஆராய்ச்சி அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத் தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடு வாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக் களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற்கொள் ளப்பட்ட செலவு தனித்தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்க ளினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்ப தையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத் தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத் துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின் கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Technology and Research :

(a) Will he state the total amount of money spent by the Ministry of Technology and Research on the 'Deyata kirula' exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry out of which funds were allocated from the last Budget for the above mentioned expenses?

(d) If not, why?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (තාක්ෂණ හා පර්යේෂණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - தொழில்நுட்ப, ஆராய்ச்சி பிரதி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Deputy Minister of Technology and Research )

Hon. Speaker, I answer this Question on behalf of the Minister of Technology and Research.

(a) Total expenditure borne by this Ministry on "Deyata Kirula" 2011 exhibition amounts to Rs 5,588,029.20. (Rupees five million five hundred eighty eight thousand twenty nine and cents twenty.)

Sir, I will table* the answer for (b) (i), (ii) and (iii) because, it is a detailed answer.

**** සභාමේසය මත තබන ලද පිළිතුරේ කොටස:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் பகுதி :*
** Part of the Answer tabled:*

b) (i) 11 (eleven) Institutions are functioning within the purview of this Ministry and total expenditure borne by each institution on "Deyata Kirula" exhibition is as follows.

| | Institution | Total amount spent on "Deyata Kirula" exhibition |
|---|---|---|
| 01 | Institute of Fundamental Studies | Rs. 121,601.89 (Rupees One hundred twenty one thousand six hundred one and cents eighty nine) |
| 02 | Industrial Technology Institute | Rs. 579,181.00 ( Rupees Five hundred seventy nine thousand one hundred and eighty one) |
| 03 | Sri Lanka Accreditation Board | Rs. 252, 986.00 ( Rupees Two hundred fifty two thousand nine hundred and eight six) |
| 04 | National Science and Technology Commission | Rs. 11,520.00 ( Rupees Eleven thousand five hundred and twenty) |
| 05 | Sri Lanka Planetarium | Rs. 62, 400.00 (Rupees Sixty two thousand four hundred) |
| 06. | National Engineering Research and Development Centre of Sri Lanka | Rs. 635,700.00 ( Rupees Six hundred thirty five thousand seven hundred) |
| 07. | National Science Foundation | Rs. 332,054.27 ( Rupees Three hundred thirty two thousand fifty four and cents twenty seven) |
| 08 | Sri Lanka Standards Institution | Rs. 523,346.00 (Rupees Five hundred twenty three thousand three hundred and forty six) |
| 09. | National Research Council | Rs. 848,163.00 ( Rupees Eight hundred forty eight thousand one hundred and sixty three) |
| 10. | Sri Lanka Inventors Commission | Rs. 108,810.45 ( Rupees One hundred eight thousand eight hundred ten and cents forty five) |
| 11. | Arthur C Clark Institute for Modern Technology | Rs. 374,960.82 ( Rupees Three hundred seventy four thousand nine hundred sixty and cents eighty two) |

[ගරු ෆයිසර් මුස්තාපා මහතා]

Following are the functions carried out by the above said institutions coming within the purview of our Ministry at the "Deyata Kirula" Exhibition in 2011.

**01. Institute of Fundamental Studies**

Institute of Fundamental Studies had exhibited posters and distributed leaflets with the aim of disseminating new information found by them from the projects and research which had already been implemented and enlightening the public about these findings.

For example, the public had been made knowledgeable about the advantages and disadvantages of using geo thermal power, the method of using geo thermal power, substances unknown to us obtained from indigenous trees, Tuberculosis, contribution of cyano bacteria in the production of food and medicine and diseases caused by the said bacteria and bio fertilizer production. Also tests had been carried out to find out the quality of water in areas in the dry zone such as Buttala, Wellavaya and Thanamalwilla and filters used to remove excessive fluoride in water had been displayed.

**02. Industrial Technology Institute**

Samples of potable water obtained covering the Moneragala District by the mobile laboratory of this institutions had been tested for chemical and micro-bacterial contamination.

In addition to this, the technology of cultivating herbs which is unique to the Moneragala district had been provided to the public by this institution. Further, the public had been also made aware of how the farmers, manufacturers, entrepreneurs and businessmen could be linked via e-farms website.

With the objective of creating an interest for the subject of science in school students various programmes had been implemented.

In addition to this, among the functions carried out by this institution providing instructions and knowledge to resolve the technical problems encountered by entrepreneurs and making the public aware of technologies found and improved by the institution acquire a prime position.

**03. Sri Lanka Accreditation Board**

Programmes for making doctors and Laboratory Technicians in the Moneragala and Badulla districts knowledgeable about the process of accreditation had been implemented and during the exhibition period the general public had been enlightened about the process of accreditation.

**04. National Science and Technology Commission**

The public had been made aware of the Science and Technology Policies formulated by the commission through notice boards.

**05. Sri Lanka Planetarium**

Necessary astronomical knowledge had been provided to school students, teachers and the general public who participated in the exhibition by making use of the mobile planetarium of the Sri Lanka Planetarium.

**06. Sri Lanka National Engineering Research and Development Centre (NERDC)**

A concrete foot bridge introduced by the NERDC centre had been constructed in Moneragala District and a water tank with a capacity of 7000 liters had been constructed at the Hambegamuwa Debaraweva Viharaya, making use of the low cost ferro cement technology.

**07. National Science Foundation**

By conducting seminars on Nano Technology and bio-diversity the National Science Foundation had taken measures to enhance the knowledge of school students in the Buttala and Thanamalwila areas. Also the public had been made aware of the latest findings of researches undertaken by the institution through posters.

**08. Sri Lanka Standards Institution**

The general public as well as small, medium and large scale industrialists had been made knowledgeable about the services being provided by the Sri Lanka Standards Institution.

**09. National Research council**

The National Research Council had taken steps to enlighten the general public about matters pertaining to various fields with the contribution of university professors, doctors, foreign medical teams and university students from various faculties, and to create the necessary background in finding-out and treating the infants born with Down's Syndrome at the Moneragala District Hospital while providing the university students with the opportunity of liasing with and presenting information to various parties.

**10. Sri Lanka Inventors' Commission**

The Inventors Commission had taken measures to provide encouragement to inventors and to create the necessary background in this respect.

**11. Arthur C Clarke Institute for Modern Technologies**

Night observation camps had been conducted for school students by the Arthur C Clarke Institute prior to the exhibition and the public had been made knowledgeable about the institution during the period of the exhibition.

(b) (iii) The total amount of money spent on "Deyata Kirula" exhibition by each institution as I have mentioned in b (i), had been fully spent on the functions carried out by the respective institution.

(c) This expenditure had been borne under the Ministry of Science and Technology popularization vote subject no. 133-2-3-2-2502 (4) of the 2011 Budget.

(d) Does not arise.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය රුපියල් මිලියන 5 ක් -ලක්ෂ 50 ක්- 2011 දී දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් වෙන් කර තිබෙනවා. 2010 දී ඒ වෙනුවෙන් වෙන් කළ ප්‍රමාණයට සාපේක්ෂව ඒ වැඩි වීම කොපමණ ප්‍රමාණයක්ද කියා මා දැන ගන්න කැමැතියි.

දළ අවබෝධයකින් පුළුවන් නම් කියන්න මෙය වැඩි වීමක්ද? වැඩි වීමක් හැටියට ඔබතුමා දකිනවා නම් එය කොපමණ ප්‍රමාණයක්ද?

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

Hon. Speaker, I do not have those figures at the moment.

## ණය මුදල් ආපසු ගෙවීම: විස්තර
## கடன்களைத் திருப்பிச் செலுத்துதல்: விபரம்
## PAYBACK OF LOANS: DETAILS

0584/'10

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) පසුගිය වර්ෂ හතරක කාලය තුළ ද්විපාර්ශ්වික පදනම මත මිත්‍ර රටවලින් සහ බහුපාර්ශ්වික ආයතනවලින් ලබා ගන්නා ලද ණය මුදල් ආපසු ගෙවීමට ලබා දෙන කාලය සහ ණය ආපසු ගෙවීම සඳහා ලබා දෙන ලද සහන කාල සීමාව සම්බන්ධයෙන් කරන ලද අලුත් කිරීම් කවරේද;

(ii) එවැනි පහසුකම් ලබා දෙන ලද දිනය කවරේද;

(iii) එවැනි පහසුකම් ලබා දීමේ අරමුණ කවරේද;

(iv) ඉහත කී ණය මුදල් සම්බන්ධයෙන් කිසියම් ආරම්භක ගාස්තුවක්, පොරොන්දු ගාස්තුවක්, කළමනාකරණ හෝ පරිපාලන ගාස්තුවක්, රක්ෂණ වාරිකයක් හෝ වෙනත් කිසියම්

නම්වලින් හැඳින්වෙන පිරිවැයක් දැරීමට සිදු වී තිබේද;

(v) එක් වර ගෙවිය යුතු ගෙවීම් හෝ වාර්ෂිකව ගෙවිය යුතු ගෙවීම් තිබේද;

(vi) පිරිවැය සාධකයක් ලෙස රට කෙරෙහි බලපෑමක් ඇති කරන ඉහත කී ගෙවීම් සඳහා වර්ෂයකට ගෙවීමට තිබෙන මුදල් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த நான்கு வருடங்களாக பல்தரப்பு முகவர்களிடமிருந்தும் நட்பு நாடுகளிடமிருந்தும் இருதரப்பு அடிப்படையில் பெறப்பட்ட கடன்களை திருப்பிச் செலுத்துவதற்கான மேலதிக சலுகை காலத்திற்கு வழங்கப்பட்ட கால நீடிப்பையும் திருப்பிச் செலுத்தப்பட்ட அளவையும்;

(ii) அவ்வசதிகள் எப்போது வழங்கப்பட்டன என்பதையும்;

(iii) எந்நோக்கங்களுக்காகஅது வழங்கப்பட்டதென்பதையும்;

(iv) மேற்குறிப்பிடப்பட்ட கடனிற்காக முன்னெடுப்புக் கட்டணம், கடப்பாட்டுக் கட்டணம், முகாமைத்துவ அல்லது நிர்வாகக் கட்டணம், காப்புறுதிக் கட்டணம், அல்லது பல்வேறு பெயர்களில் வேறு ஏதாவது செலவுகள் இருந்தனவா என்பதையும்;

(v) இவை ஒரே தடவையில் செலுத்தப்பட வேண்டியனவாக இருந்தனவா அல்லது வருடாந்தம் செலுத்தப்பட வேண்டியனவாக இருந்தனவா என்பதையும்;

(vi) ஒரு செலவுக் காரணி என்ற ரீதியில் நாட்டின் மீது தாக்கம் செலுத்தக்கூடிய வருடாந்தம் செலுத்தப்பட வேண்டிய மேலேயுள்ள செலவுகளின் மொத்தத் தொகையினையும்

அவர் சபைக்கு அறியத் தருவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he inform this House-

(i) the renewal granted on the grace period and payback of loans taken from the multilateral agencies and friendly countries on bilateral basis for last four years;

(ii) as to when such facilities were granted;

(iii) the purpose it was given for;

(iv) whether there is any initiation Fee, Commitment Fee, Management or Administration Fee, Insurance Premium, and or any other costs in different names pertaining to the aforesaid loans;

(v) whether they are one off payments or annual payments; and

(vi) the total amounts to be paid per year on aforesaid costs which impacts on the country as a cost factor?

(b) If not, why?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )

(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මේ සම්බන්ධයෙන් කිසිදු අලුත් කිරීමක් කර නොමැත.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) ද්විපාර්ශ්වික පදනම මත හා බහුපාර්ශ්වික ආයතනවලින් ලබා ගන්නා ලද ඉහත සඳහන් ණය මුදල් සම්බන්ධයෙන් සඳහන් කර ඇති ගාස්තු වෙනුවෙන් පිරිවැයක් දැරීමට සිදු වී ඇත.

(v) ඔව්.

(vi) ඉහත (අ) (iv) පිළිතුරෙහි සඳහන් ගාස්තු ගෙවීම සඳහා වර්ෂයකට සාමාන්‍ය වශයෙන් රුපියල් 3,906,490,957 (එනම් රුපියල් මිලියන 3,9065) ක් දැරීමට සිදු වී ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු රවි කරුණානායක මහතා**

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Minister, I may not agree with the first part of the answer. Then, going on further now what is your answer for (iv) with regard to the commitment fee *et cetera*? I did not get a proper answer for that.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**

(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)

(The Hon. Gitanjana Gunawardena)

එයට පිළිතුර මෙසේයි. ද්විපාර්ශ්වික පදනම මත හා බහුපාර්ශ්වික ආයතනවලින් ලබා ගන්නා ලද ඉහත සඳහන් ණය මුදල් සම්බන්ධයෙන් සඳහන් කර ඇති ගාස්තු වෙනුවෙන් පිරිවැයක් දැරීමට සිදු වී ඇත.

ඒක තමයි අන්තිමට දෙන්න තිබෙන පිළිතුර ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

ඔබතුමා දී තිබෙන පිළිතුර බලා ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න නැවත අහන්නම්. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි. 2005 ජනවාරි මාසයේ 01 වන දා වන විට බිලියන 1,784 ක ණය ගැතිභාවයක් තිබුණු මේ රටේ අද මේ කථා කරන මොහොතේ එය බිලියන 5,010 දක්වා වැඩි වෙලා තිබෙනවා. (අ) (iv) කොටසට පිළිතුර නිසියාකාරව ලැබුණේ නැහැ. නමුත් චීන ණයෙහි - loan එකේ - commitment fees, annual fees යන මේ සියල්ලම දමා තිබෙන නිසා තමයි අපි බලන්න හැදුවේ, කොයි ආකාරයෙන්ද ණය ලබා ගන්නේ කියලා. චීනයෙන් ලබා ගන්නා ණයවල පොලියේ සියයට 7.8 ත්, සියයට 8ත් අතර වෙනසක් තිබෙනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඔබතුමාගේ අතුරු ප්‍රශ්නයට පිළිතුර දීර්ඝ ලැයිස්තුවක් නිසා ඔබතුමාගේ දැන ගැනීමට මා එය **සභාගත*** කරනවා.

එහි බැංකු ගාස්තු, කළමනාකරණ ගාස්තු සහ පොරොන්දු ගාස්තු ඇතුළු අදාළ සියලුම විස්තර තිබෙනවා. ද්වි පාර්ශ්වික, බහු පාර්ශ්වික සහ වාණිජ අපනයන යන සියල්ල තමයි මිලියන 15,625 හතරෙන් බෙදුවාම, සාමාන්‍ය කියා ප්‍රකාශ කළේ. මේ උත්තරයේ ඒ සියල්ල සඳහන් වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳයි, ඇමතිතුමා. ඔබතුමා කියන එක මා ඒ ආකාරයෙන් ප්‍රතික්ෂේප කරන්නේත් නැහැ; පිළිගන්නේත් නැහැ. නමුත් පළමුවන අතුරු ප්‍රශ්නය වශයෙන් මට දැන ගන්න අවශ්‍ය වන්නේ

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
දෙවන අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා ඇසූ පළමුවන අතුරු ප්‍රශ්නයට උත්තර ලැබුණේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ වෙලාවේ මොනවාද කළේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කමක් නැහැ. දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිවරයෙක් නැඟිටලා ඉන්නවා. ඉතින් අහක ඉන්න අය කෑ ගහන්න ඕනෑද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා ඒවාට ඇහුම් කන් දෙන්න එපා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා පළමුවන අතුරු ප්‍රශ්නයට උත්තර දුන්නාය කියා කියනවා නම් දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. සියයට හතේ, අටේ පොලියට ණය අරගෙන මේ රටේ තිබෙන ණය ගෙවන්න හදන්නේ කොයි ආකාරයෙන්ද? මේ වාගේ දේවල් තිබෙන නිසා තමයි අද ජීවන වියදම අඩු කරන්න බැරි වෙලා තිබෙන්නේ; තෙල් මිල එහෙමම තිබෙන්නේ. ඔබතුමන්ලා යුද්ධය අවසන් වීමේ ප්‍රතිලාභ තවම ජනතාවට දීලා නැත්තේ මෙවැනි දේවල් නිසායි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මැතිවරණ කථාවක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා මාසයෙන් මාසයට මැතිවරණ පවත්වන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය හරියට අහනවා නම් උත්තරයත් හරියට ලැබෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මැතිවරණ කාලයට තමයි ජනතාවට පෙන්වන්න ඕනෑ, රුපියල්10,000 ක පඩි දෙනවා වාගේ, දැන් ගෙවල් කඩන්නේ නැහැයි කියනවා වාගේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඕවා ප්‍රශ්නද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ජනතාවට පෙන්වන්න ඕනෑ, මොන වාගේ ගමනක්ද ඔබතුමන්ලා යන්නේ කියලා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

වැඩියෙන් කථා කරන කොට අතුරු ප්‍රශ්න තුනම ඇහෙනවා. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කොළඹ ඡන්දෙ නොවෙයි, රට හැම තැනම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ප්‍රශ්නයක් ඇහුවා. ගරු ඇමතිතුමා ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නය හරියට පැහැදිලි කළොත් ඒ ප්‍රශ්නයට වෙන දවසක උත්තර දෙන්නම්. මේ ප්‍රශ්නයට එය අදාළ නැහැ, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. එතුමා එහෙම කියනවා. දැන් තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තුන්වන අතුරු ප්‍රශ්නය මේකයි. අද රටේ ඡන්ද කාලයට මේ තිබෙන ජීවන වියදම අඩු කරන්න බැරි වන කොට, ගෙවල් කඩන කොට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමාගේ ප්‍රදේශයේ හම්බන්තොට වරායට නැව් එන්නේ නැති වන කොට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අවුරුද්දකට රුපියල් මිලියන 5,000 ක ණය ගෙවලා, සියයට අටේ පොලියට චීනයෙන් ණය ගත් නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සිරිකොතේ පාර හැදුවේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකත් කළාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා ලංකාවේ හිටියේ නැහැ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඔව්, ඔව්. කොහේද ගියේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ. මම හිටියා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කොහේද ගියේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ කියන්නේ ඔබතුමන්ලා දන්නවා කොළඹ පාරවල් කඩලා තිබෙන්නේ කියලා. ඒකවත් දන්නා එක හොඳයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
නැත්නම් ඔබතුමා නිසොල්මනේ ගියාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකද, සාමාන්‍යයෙන් හම්බන්තොට පාරවල් නේ හදන්නේ. [බාධා කිරීම්] ඒ නිසා- [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, this is a violation of the Standing Orders.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හම්බන්තොට - [බාධා කිරීමක්] ගරු කථානායකතුමා ලස්සනට හිනා වෙවී බලා ගෙන ඉන්නවා. [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒකට කමක් නැහැ. එතුමා හැමෝම එක්ක හිනා වෙනවා. ඒකෙ වැරැද්දක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතුමා ලස්සනට හිනා වෙවී බලා ගෙන ඉන්නවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි දන්නවා හම්බන්තොට වරායට නැව් එන්නේ නැහැ කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ සිනා මුසු මුහුණ බල බලා මේ ස්ථාවර නියෝගය මම තමුන්නාන්සේට උපුටා දක්වනවා.

Sir, the Standing Order No. 29(2) states, I quote:

"A question must not be made the pretext for a debate"

Sir, he is doing this from the day he came to this House. He violates the Standing Orders all the time. Therefore, Sir, as you stated to another Member the other day, there must be a special class held in order to educate him on how to ask questions, like in the House of Commons.

Thank you.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
All I can say, Mr. Speaker, is that older people can give the younger people better advice than these old

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

Every circus has to have a clown. He does that to the best of his ability. So, I guess, this is his way.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේගේ ඊ ළඟ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් මේ ප්‍රශ්නය අහපුවාම-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා කියපු එක හරි. එතුමා පෙන්වලා දීපු එක හරි. නමුත් ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අර බලන්න හරියි කියනවා. ගරු කථානායකතුමාගේ හම්බන්තොට වරායට නැව් එන්නේ නැති වන කොට, හැබැයි රුපියල් මිලියන 5,000ක ණයක් ගෙවන්න තිබෙන කොට මේ concessionary loans හැටියට මම අහලා තිබෙන්නේ අන්න ඒකයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දැන් පීල්ල පැනලා නේ යන්න හදන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අවුරුද්දකට සියයට දෙකක් ගෙවන්න තිබෙන කොට-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයට අදාළද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පීල්ල පැනලා අනා ගන්න හදනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ජනතාවගේ ඒකපුද්ගල ණය බරතාව රුපියල් 23,000 ඉඳන්-[බාධා කිරීම්] අද රුපියල් 225,000 දක්වා වැඩි වෙලා තිබෙනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මෙතුමා ප්‍රශ්නයක්ද, ප්‍රකාශයක්ද, කථාවක්ද කරන්නේ මේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා අදාළ නොවෙන ඒවා නේ කියන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාට අදාළ නැති වුණාට මේ අපේ රටේ අහිංසක ජනතාවට ගෙවන්න තිබෙන ණය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි ප්‍රශ්නය ඇහුවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා ප්‍රශ්නය අහන්න. මේක විවාදයක් නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අදාළද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, 2011 ජුලි මාසයේ 08වැනි දා ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා ප්‍රශ්න අංක 10 යටතේ ඇසූ ප්‍රශ්නයට, 1971 ඉඳලා ගත්තු ණය ආධාර සියල්ල පිළිබඳ පිටු 6ක පිළිතුරක් මේ හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. මෙවැනි උත්තර දීලාත් එය ප්‍රමාණවත් නැහැයි කියනවා නම් මම ඉතාම කනගාටු වෙනවා. මේ රට අවුරුදු 30ක් තිස්සේ සුබිත මුදිත රටක් හැටියට නොවෙයි තිබුණේ. මේ රට අවුරුදු 30ක් මහා ව්‍යසනයකට, ත්‍රස්තවාදයකට මුහුණ දීලා තිබුණේ. 2005 දී අතිගරු ජනාධිපතිතුමා පත්වෙලා 2009 දී ඒ ත්‍රස්තවාදය තුරන් කරලා අපි දිනා ගත්ත මේ සාමයත් සමඟ මේ රට දැවැන්ත සංවර්ධනයකට ගමන් කරනවා. ඒක මෙතුමා පිළිගත්තේ නැති වුණාට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව ඇතුළු සියලු ජාත්‍යන්තර ආයතන පිළිඅරගෙන හමාරයි. මේ රටේ පාරවල් මේ රටේ වරායවල් මේ රටේ ගුවන් තොටු පොළවල් ඇතුළු මේ රටේ අනෙකුත් සංවර්ධන ක්‍රියාදාමයන් සියල්ල මෙලෙස ඉදිරියට ගමන් කරවලා මේ රට සංවර්ධිත රටක් බවට පත් කිරීමයි අපේ මහින්ද චින්තන ගමන් මගේ අදහස සහ අරමුණ කියලා තමුන්නාන්සේලාට හඳුන්වලා දෙන්නට ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. ප්‍රශ්න අංක 2, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා, ඔබතුමාට ඇමතිතුමාගෙන්ම උත්තරය අහගන්න ඕනෑ කිව්වා නේද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ ප්‍රශ්නය මම අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා ( අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)
ගරු කථානායකතුමනි, මා රීති ප්‍රශ්නයක් මතු කරන්නට ඔබතුමාගෙන් අවසර ඉල්ලනවා.

ස්ථාවර නියෝග 84(vii) සහ (viii)ට මා ඔබතුමාගේ අවධානය යොමු කරනවා. එහි මෙසේ සඳහන් වනවා:

"(vii) කවර මන්ත්‍රීවරයකු විසින් හෝ වෙන මන්ත්‍රීවරයකු නමින් සඳහන් නොකළ යුතුය.

(viii) කවර මන්ත්‍රීවරයකු විසින් හෝ අන්‍ය මන්ත්‍රීවරයකුට අයුතු චේතනා ආරෝපණය කරමින් කථා නොකළ යුතුය."

එතුමා කියා සිටියා, මම පාර්ලිමේන්තුවේ කැන්ටිමේ කකා ඉන්නවා කියලා. අද මගේ මහජන දිනයයි. ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ගරු කථානායකතුමනි, ඒ කොටස හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්නය කියා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඇමතිතුමා කියන්නේ ඔබතුමායැ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මම තමයි උත්තර දෙන්නේ. මම තමයි උත්තර දීමේදී ඇමතිතුමා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. යමක් සඳහන් වෙලා තිබෙනවා නම් සොයලා බලලා ඉවත් කරනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා දැන් පිළිතුර දෙන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු මන්ත්‍රීතුමා, මම තමයි උත්තර දීමේදී ඇමතිතුමා. තමුන්නාන්සේ ඒක දැන ගන්න. [බාධා කිරීමක්]

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔබතුමා නියෝජ්‍ය ඇමතිතුමා නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
සූත්තර පුංචා වෙන්න එපා. ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා ඒ ප්‍රශ්නයට දැන් උත්තර දෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ගැන-[බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කොහොමත්, නම් සඳහන් කරන්න බැහැ. එහෙම සඳහන් වෙලා තිබෙනවා නම් එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා. [බාධා කිරීමක්]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ, නැහැ. මම තමයි පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නවලට උත්තර දෙන ඇමතිතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු අධ්‍යාපන ඇමතිතුමා කියලායි මම කිව්වේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කට වහගෙන අහගන්න. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හිටපු එක්කෙනෙක් ගැන කථා කරලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමා කලබල වෙන්න එපා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
පක්ෂය විනාශ කරනවා වාගේ තමුන්නාන්සේට අපිව විනාශ කරන්න බැහැ.

## පාසල් පරිගණක විද්‍යාගාර: ගුරු හිඟය
## பாடசாலை கணனி விஞ்ஞான ஆய்வுகூடங்கள்: ஆசிரியர் பற்றாக்குறை
## COMPUTER LABORATORIES IN SCHOOLS : TEACHER SHORTAGE

1083/'11

2\. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) පරිගණක විද්‍යාගාර ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) 2011 වර්ෂයේදී නව පාසල් පරිගණක විද්‍යාගාර පිහිටුවීමට සැලසුම් කර තිබේද;

(iii) ඒ සඳහා වර්ෂ 2011 අය වැය ප්‍රතිපාදනවලින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පරිගණක විෂයය ඉගැන්වීමට ස්ථිර පුහුණු ගුරුවරයෙකු නොමැති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් කවරේද;

(iii) ඉහත ගුරු හිඟය මග හරවා ගැනීම සඳහා නවක ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கணனி விஞ்ஞான ஆய்வுகூடங்களைக் கொண்ட அரச பாடசாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) 2011ஆம் ஆண்டில் புதிய பாடசாலை கணனி விஞ்ஞான ஆய்வுகூடங்களை அமைக்கத் திட்ட மிடப் பட்டுள்ளதா என்பதையும்;

(iii) இதற்கென 2011ஆம் ஆண்டு வரவு செலவுத்திட்ட நிதி ஏற்பாடுகளின்மூலம் ஒதுக்கப்பட்டுள்ள பணத் தொகை எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) கணனிப் பாடம் கற்பிப்பதற்கு நிரந்தர பயிற்சி பெற்ற ஆசிரியர்கள் இல்லாத அரச பாடசாலை களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) இப்பாடசாலைகள் யாவை என்பதையும்;

(iii) மேலே குறிப்பிடப்பட்ட ஆசிரியர் பற்றாக்குறையை நிவர்த்தி செய்வதற்காக புதிய ஆசிரியர்களை ஆட்சேர்ப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப் படுமா என்பதையும்;

(iv) அவ்வாறாயின் அது எப்போது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state-

(i) the number of government schools with computer laboratories;

(ii) whether plans have been made to establish new computer laboratories for schools in the year 2011; and

(iii) the amount of money that has been allocated from the budgetary allocations in the year 2011?

(b) Will he inform this House-

(i) the number of government schools which do not have a permanent trained teacher to teach the subject of computer science;

(ii) the names of those schools ;

(iii) whether action will be taken to recruit new teachers to overcome the aforesaid shortage of teachers; and

(iv) if so, the date on which it will be done ?

(c) If not, why ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා මේ ප්‍රශ්නයට උත්තර දෙනවා. මන්ත්‍රීතුමා උත්තරය අහගන්න.

(අ) (i)
- පරිගණක විද්‍යාගාර ඇති රජයේ පාසල් සංඛ්‍යාව 3,300ක් පමණ වේ. (පරිගණක 10ක් හෝ ඊට වැඩි හෝ සහිත කාමරයක් පරිගණක විද්‍යාගාරයක් සේ සලකා ඇත.)
- පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථාන 09ක් පළාත් මට්ටමින් පිහිටුවා ඇත. මෙම මධ්‍යස්ථාන පිහිටුවීමේදී එක් මධ්‍යස්ථානයක් සඳහා රු. මි. 50කට ආසන්න මුදලක් වැය කර ඇත.
- අවම වශයෙන් කලාපයකට එක බැගින් වන සේ පිහිටුවා ඇති කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථාන 97ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ. මෙම මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා එක් මධ්‍යස්ථානයක් සඳහා රු. මි. 15ක් පමණ වැය කර ඇත.
- පාසල පදනම් කර ගනිමින් ස්ථාපිත කර ඇති ඊ ගම්මාන (e-village) ව්‍යාපෘතිය යටතේ ඊ ගම්මාන 50ක් පාසල පදනම් කර ගනිමින් ක්‍රියාත්මක වේ.

- විදුලිය බලය නොමැති පාසල් සඳහා සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන පරිගණක විද්‍යාගාර 100ක් ලබා දී ඇත.
- ප්‍රාථමික පාසල් 13ක සියලුම සිසුන් හා ගුරු භවතුන් සඳහා XO Laptop ලබා දී ඇත. (One Laptop Per Child Project)
- මීට අමතරව පරිගණක 1ක් හෝ 2ක් හෝ සහිත පාසල් සංඛ්‍යාව 2000ක් පමණ වේ.

(ii) ඔව්.

(iii) රුපියල් මිලියන 323.65යි.

(ආ) (i) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය පාසල් පද්ධතිය තුළ මුලින්ම ආරම්භ කරන ලද්දේ තාක්ෂණික විෂයක් වශයෙනි. එම අවධියේ දී අදාළ විෂය ඉගැන්වීම සඳහා යොදා ගන්නා ලද්දේ වෙනත් විෂයන් සඳහා පත්වීම් ලැබූ ගුරු භවතුන්ය. ඔවුන් සඳහා ජාතික අධ්‍යාපන ආයතනය මගින් පුහුණුවීම් ලබා දී තොරතුරු තාක්ෂණ විෂය ඉගැන්වීම් සඳහා යොමු කරන ලදී.

2008 වසරේ සිට වාර්ෂිකව තොරතුරු තාක්ෂණ විෂය සඳහාම වූ විද්‍යා පීඨගුරුවරුන් පාසල් පද්ධතියට එකතු වේ.

සියලුම පාසල් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන තොරතුරු තාක්ෂණ විෂයය සඳහා පත්වීම් ලැබූ විද්‍යා පීඨ ගුරුවරයෙකු විසින් හෝ වෙනත් විෂයක් සඳහා පත්වීම් ලබා තොරතුරු තාක්ෂණ විෂය සඳහාම පුහුණුව ලැබූ ගුරුවරයෙකු විසින් හෝ පවත්වා ගෙන යනු ලැබේ.

(ii) අදාළ නොවේ.

(iii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සඳහා පත්වීමක් නොමැති ගුරුවරුන් සිටින පාසල් සඳහා වසරකට 250කට ආසන්න සංඛ්‍යාවක් විද්‍යා පීඨ මඟින් තොරතුරු තාක්ෂණ පාඨමාලාව හැදෑරූ ගුරුවරුන් පත් කරමින් පවතී. මීට අමතරව පාසල් 1000 වැඩසටහන ඉලක්ක කරමින් තොරතුරු තාක්ෂණ උපාධිධාරී ගුරුවරුන් 1000ක් බඳවා ගැනීම සඳහා දැනටමත් කටයුතු කර ඇත. පාසල් විෂය මාලාවේ වෙනත් විෂයන් ඉගැන්වීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිත කරවීම ප්‍රධාන අරමුණ වන හෙයින් ඒ සඳහා සියලුම ගුරුවරුන් හට මූලික තොරතුරු තාක්ෂණ පුහුණුව ලබා දීම විවිධ අවස්ථාවන්හිදී සිදු කර ඇති අතර එය දැනටත් ක්‍රියාත්මක වෙමින් පවතී.

(iv) 2010 වසරේදී ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සම්පූර්ණ කළ (විද්‍යා පීඨ) අභ්‍යාසලාභීන් 208 දෙනෙකු සඳහා 2011 ජූනි/ජූලි මාසවලදී පත්වීම් ලබා දී ඇත. 2011 වසරේ පුහුණුව සම්පූර්ණ කරන විද්‍යා පීඨ ගුරුවරුන් 270ක් පද්ධතියට එකතු වීමට නියමිතය. මෙම ගුරුවරුන් සඳහා පත්වීම් ලබා දීම 2012 වර්ෂයේදී සිදු කරනු ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, පළමුවෙනි වටයේදී ප්‍රශ්නය අහන කොට මම අධ්‍යාපන ඇමතිතුමා ගැනයි කිව්වේ. මම අධ්‍යාපන ඇමතිතුමා ඉන්නවා දැකපු කාරණයක් කිව්වේ. ඉතින් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා අහක යන ආයුබෝවන් බාර අරගෙන -

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

තමුන්නාන්සේගේ අතුරු ප්‍රශ්නය අහන්නකෝ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ජනාධිපතිතුමා ඉන්න වෙලාවේ තමුන්නාන්සේ මේ ගරු සභාවේ නොහිටියා කියලා දන්නවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

තමුන්නාන්සේ සූත්තර පුංචා කියලා අපි දන්නවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ප්‍රශ්නයට උත්තර දෙන්න ඇමතිතුමායි, නියෝජ්‍ය ඇමතිතුමායි දෙන්නාම හිටියේ නැතිව, ඒ වගකීම පැහැර හැරලා. ඒ නිසා දැන් ලකුණු කැපෙනවාට බයේ කෑගහනවාට මට කරන්න දෙයක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 4. එම්.ටී. හසන් අලි මන්ත්‍රීතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මේකයි. පළාත් මට්ටමින් පිහිටුවලා තිබෙන පරිගණක මධ්‍යස්ථාන

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්නය අහන්න. එහෙම කථා පවත්වන්න බැහැ මන්ත්‍රීතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

පළාත් මට්ටමින් පිහිටුවලා තිබෙන පරිගණක මධ්‍යස්ථාන,- [බාධා කිරීමක්]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඇහෙන්නේ නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පළාත් මට්ටමින් පිහිටුවලා තිබෙන මේ පරිගණක මධ්‍යස්ථාන නවය දිස්ත්‍රික්ක මට්ටමට හෝ අධ්‍යාපන කලාප මට්ටම දක්වා ව්‍යාප්ත කිරීමේ සැලැස්මක් තිබෙනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ, එහෙම අවශ්‍ය වන්නේ නැහැ. තමුන්නාන්සේ මේ මොනවා කථා කරනවාද මම දන්නේ නැහැ. පළාත් මට්ටමින් තිබෙන පරිගණක පුහුණු මධ්‍යස්ථාන පළාතේ ගුරුවරු පුහුණු කිරීම සඳහා තිබෙන්නේ. ඇයි ඒක දිස්ත්‍රික් මට්ටමට ගේන්නේ?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම ඇහුවේ පළාත් මට්ටමින් තිබෙන ඒ පුහුණු මධ්‍යස්ථාන -

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මේ පොළොව මත පය ගහලා නොවෙයි මෙතුමා ඉන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, එතුමාට ප්‍රශ්නය අහගන්න කියන්නකෝ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය තේරුම් ගන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නැවතත් ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මෙතුමාගේ පිළිතුර අනුව බලන විට පළාත් මට්ටමින් තිබෙන මධ්‍යස්ථාන සංඛ්‍යාව මදි මේ ගුරුවරු පුහුණු කරන්න. ඉතින් මම අහන්නේ ඒ මධ්‍යස්ථාන දිස්ත්‍රික් මට්ටමට ව්‍යාප්ත කරනවාද කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක ඔබේ මතය. මත ඉදිරිපත් කරන්න බැහැ. ඔබතුමාගේ අදහස් ඉදිරිපත් කරන්න බැහැ. ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය නැවතත් මම අහනවා. පළමුවෙනි ප්‍රශ්නය තුන්වෙනි සැරේටත් මම අහනවා. [බාධා කිරීමක්] මේක අහගන්න කියන්නකෝ ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කථා පැවැත්වීමට බැහැ. ප්‍රශ්නය අහන්න. එතකොට හොඳට තේරෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, නැහැ. කථාවක් නොවෙයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
කව කව ගාන්නේ නැතිව ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, අද නියෝජ්‍ය ඇමතිතුමාගේ වයර් මාරු වෙලා ඉන්නේ. මොකද ජනාධිපතිතුමා මේ ගරු සභාවට එන වෙලාවේ එතුමා හිටපු නැති හින්දා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ, නැහැ. මගේ වයර් හොඳට තිබෙනවා. තමුන්නාන්සේගේ තමයි වයර් පොඩි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම අහන්නේ පළාත් මට්ටමින් තිබෙන පරිගණක ගුරුවරුන් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව මදි නිසා දිස්ත්‍රික් මට්ටම දක්වා එම මධ්‍යස්ථාන සංඛ්‍යාව ව්‍යාප්ත කරන්න බලාපොරොත්තු වෙනවාද කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, මේ පරිගණක පුහුණුව සඳහා බඳවා ගන්නේ පරිගණක උගන්වන ගුරුවරු පමණක් නොවෙයි. අද පරිගණක පද්ධතිය ආශ්‍රයෙන් සෑම විෂයක්ම ඉගැන්වීම කරගෙන යනවා. ඒ නිසා පරිගණක ගුරුවරුන්ට පමණක් නොවෙයි, අනික් විෂයන් උගන්වන ගුරුවරුන්ටත් පරිගණක පිළිබඳ දැනුමක් තිබෙනවා. ඔවුන් අලුත් ලෝකයට බද්ධ වෙලා තිබෙනවා. එම නිසා ගරු කථානායකතුමනි, පළාත් නවයට මේ මධ්‍යස්ථාන නවය හොඳටම ප්‍රමාණවත්. ලක්ෂ 150 ගණනේ වැය කරලා සෑම කලාපයකටම පරිගණක මධ්‍යස්ථාන දෙකක් හෝ තුනක් හදලා තිබෙනවා. ඒවායේ ඉගැන්වීම් කටයුතු කරන්නට හැකියාව තිබෙනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, මේ රටේ පාසල් විශාල සංඛ්‍යාවකට පරිගණක 50කට වැඩි සංඛ්‍යාවකින් යුතු පරිගණක මධ්‍යස්ථාන මහින්ද චින්තනය යටතේ ලබා දීලා තිබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා කියන ආකාරයේ අවශ්‍යතාවක් මතු වන්නේ නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, එතුමා අද පොඩ්ඩක් upset පිට ඉන්න හින්දා මම ඒක තවත් දිගට ගෙන යන්නේ නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ, කිසිම upset එකක් නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
"කොහේද යන්නේ මල්ලේ පොල්" උත්තරයක් දුන්නේ. කමක් නැහැ.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. ලංකාවේ විද්‍යාපීඨවල පරිගණක ගුරුවරු පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වනවා වාගේම අපි දන්නවා, පොල්ගොල්ලේ ක්‍රීඩා පුහුණු කරන පීඨයක් තිබෙන බව.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමා ප්‍රශ්නය අහන්න කෝ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ වාගේ තොරතුරු තාක්ෂණයට අදාළවම විද්‍යාපීඨ කීපයක් ඇති කිරීම කෙරෙහි අමාත්‍යාංශයේ අවධානය යොමු කරනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, විද්‍යාපීඨවල පරිගණක ඉගැන්වීම කෙරෙනවා. නොකෙරෙන්නේ නැහැ. විද්‍යාපීඨවල පරිගණක ඉගැන්වීම කෙරෙනවා. එම නිසා ඔබතුමා හිතන ආකාරයට විශේෂ පරිගණක විද්‍යාපීඨ අවශ්‍ය වන්නේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඒ පිළිතුර ප්‍රමාණවත්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම හිතනවා, එවැනි විද්‍යාපීඨ අවශ්‍යයි කියලා ගරු කථානායකතුමනි. කමක් නැහැ. අද upset පිට නේ ඉන්නේ. කමක් නැහැ.

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මේකයි. ලංකාවේ විශේෂ අධ්‍යාපනය සම්බන්ධයෙන් ගුරු උපදේශකවරු, ගුරු අධ්‍යාපනඥයන් සහ අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් ඉන්නවා. ඒ වාගේ තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙනුත් ගුරු අධ්‍යාපනඥයන් සහ අධ්‍යාපන පරිපාලන නිලධාරින් -ඒ කියන්නේ විෂය පිළිබඳ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්- පත් කිරීම සහ පුහුණු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයට දැක්මක්, වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, මේ අධ්‍යාපනයට වෙලා තිබෙන ලොකුම ව්‍යසනය තමයි කළමනාකරුවන් වැඩිවීම. පරිපාලන නිලධාරින් සහ වෙනත් තනතුරු දරන පිරිස ගුරුවරුන්ට වඩා වැඩි වෙලා තිබෙනවා. අපි උත්සාහ කරන්නේ-

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු-

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
තමුන්නාන්සේ පොඩ්ඩක් අහගන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු, පළාත් ඇමතිවරු එක්කද ඔය කියන්නේ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ. ඒ අය වැඩි වෙලා නැහැ. ගරු කථානායකතුමනි, මේ තනතුරු, නිලතල, තානාන්තර වෙනුවට පාසලට යන, ගමට යන, ගමේ පාසලේ උගන්වන පන්ති කාමරයේ කටයුතු කරන වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න තමයි අපි උනන්දු වෙලා තිබෙන්නේ.

## සුනාමියෙන් හානියට පත්වූවන් හට නිවාස: සයින්දමරුදූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
சுனாமியால் பாதிக்கப்பட்டோருக்கு வீடுகள்:
சாய்ந்தமருது பிரதேசச் செயலாளர் பிரிவு
HOUSES FOR TSUNAMI VICTIMS: SAINTHAMARUTHU DIVISIONAL SECRETARY'S DIVISION

1201/'11

**4. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු එම්.ටී.හසන් අලි මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு எம்.ரி. ஹசன் அலி சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. M.T. Hasen Ali)
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4) :

(අ) 2004 සුනාමි ව්‍යසනයේදී සයින්දමරුදූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ විනාශයට පත් වූ නිවාස සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සුනාමියෙන් හානියට පත්වූවන්ගේ නිවාස අවශ්‍යතාවන් සපුරාලීම සඳහා නිවාස 460ක අවශ්‍යතාවක් තවමත් පවතින බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 7කට ආසන්න කාලයක් තිස්සේ තවමත් අවතැන් කඳවුරුවල සිටින සුනාමියෙන් විපතට පත් පුද්ගලයන් හට උපකාරවනු පිණිස ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(ii) සුනාමියෙන් විපතට පත් පුද්ගලයන්ගේ නිවාස අවශ්‍යතා සපුරා අවසන් කිරීම සඳහා නියම කළ හැකි අවසන් දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2004ஆம் ஆண்டு சுனாமி (ஆழிப்பேரலை) அனர்த்தத்தின் போது சாய்ந்தமருது பிரதேச செயலாளர் பிரிவில் அழிவடைந்த வீடுகளின் எண்ணிக்கையை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) சுனாமியால் பாதிக்கப்பட்டவர்களின் வீட்டுத் தேவை களைப் பூர்த்தி செய்வதற்கு 460 வீடுகள் இன்னும் தேவைப்படுகிறதென்பதை அவர் அறிவாரா?

(இ) (i) ஏறத்தாழ ஏழு வருடங்களாகத் தொடர்ந்தும் இடம்பெயர் முகாம்களில் உள்ள சுனாமியால் பாதிக்கப்பட்டவர்களுக்கு உதவி செய்வதற்கென மேற்கொள்ளப்படவிருக்கும் நடவடிக்கை பற்றியும்;

(ii) சுனாமியால் பாதிக்கப்பட்டவர்களின் வீடமைப்புத் தேவைகள் பூர்த்திசெய்யப்படுவதற்கான ஏதாவது காலக்கெடுவையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Will he inform this House of the number of houses destroyed in the Sainthamaruthu Divisional Secretary's Division during the Tsunami disaster in 2004 ?

(b) Is he aware that 460 houses are still needed to fulfil the needs of the Tsunami victims?

(c) Will he state -

(i) the action to be taken to help the Tsunami victims who are still in Camps for nearly 7 years; and

(ii) any possible deadline before which the housing requirements of the Tsunami victims are fulfilled?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) 2004 වර්ෂයේ සිදු වූ සුනාමි ව්‍යසනයෙන්, හානි වූ නිවාස යථා තත්ත්වයට පත් කිරීමේ කටයුතු මෙම අමාත්‍යාංශය මඟින් සිදු කර නොමැත. කෙසේ වුවද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් සයින්දමරුදු ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගත් තොරතුරු අනුව, සයින්දමරුන්දු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිවාස 1,723ක් සම්පූර්ණ වශයෙන් ද, නිවාස 1,638ක් අර්ධ වශයෙන් ද, විනාශයට පත් වී ඇති බව වාර්තා කර ඇත.

(ආ) සයින්දමරුදු ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාවට අනුව නිවාස 398ක අවශ්‍යතාවක් පවතිනු ඇත

(ඇ) (i) මෙම නිවාස ඉදිකිරීම් කටයුතු සහ අනෙකුත් පහසුකම් සඳහා රජය පහසුකම් සලසන්නෙකු ලෙස මැදිහත් වී ඇති අතර ඉදිරියට ද මැදිහත්ව කටයුතු කරයි. අනෙකුත් ආයතන සම්බන්ධ කර ගනිමින් නිවාස අවශ්‍යතාව ඉටු කිරීමට කටයුතු කරමින් පවතී.

(ii) ඉහත (ඇ) (i) හි පිළිතුරු පරිදි.

(ඈ) අදාළ නොවේ.

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් වැය කළ මුදල: ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය
## 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிச் செலவினம்: சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சு
MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 2011: MINISTRY OF CHILD DEVELOPMENT AND WOMEN'S AFFAIRS

1244/'11

5. **ගරු රවි කරුණානායක මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Sunil Handunnetti )

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්යය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிக்காக சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சு செல விட்டுள்ள மொத்தப் பணத் தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக்களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற்கொள்ளப்பட்ட செலவு தனித்தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்க ளினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவுசெலவுத் திட்டத்தில் மேற்படி செலவினத்துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின் கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Child Development and Women's Affairs:

(a) Will he state the total amount of money spent by the Ministry of Child Development and Women's Affairs on the "Deyata Kirula" exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry out of which funds were allocated from the last Budget for the above mentioned expenses?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) මුළු මුදල රු. 8,325,343.00
ප්‍රදර්ශන කුටිය සඳහා රු. 2,346,890.00
දිස්ත්‍රික් ඒකාබද්ධ සංවර්ධන
වැඩසටහන සඳහා රු 5,978,453.00

(ආ) (i)

| ආයතනය / අංශය | ප්‍රදර්ශනය සඳහා වියදම (රු.) | දිස්ත්‍රික් ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන සඳහා වියදම (රු.) |
|---|---|---|
| ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය සංවර්ධන අංශය | 1,967,231.00 | 521,000.00 |
| ළමා ලේකම් කාර්යාලය | | 2,614,202.00 |
| ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය | | 1,443,495.00 |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 29,591.00 | 1,323,500.00 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | 350,068.00 | 76,256.00 |
| උප එකතුව | 2,346,890.00 | 5,978,453.00 |
| මුළු එකතුව | 8,325,343.00 | |

(ii) සහ (iii)

| දෙපාර්තමේන්තුව / ආයතනය | ඉටු කරන ලද කර්තව්‍යය | වැය කරන ලද මුදල (රුපියල්) |
|---|---|---|
| ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය ❖ සංවර්ධන අංශය | ❖ ප්‍රදර්ශන කුටිය පවත්වාගෙන යාම ( ළමා ලේකම් කාර්යාලය, කාන්තා කාර්යාංශය සහ අමාත්‍යාංශය ඒකාබද්ධව) | ❖ 1,967,231.00 |
| | ❖ දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු ක්‍රියාත්මක කිරීම | ❖ 80,000.00 |
| | ❖ යුද්ධයෙන් හෝ වෙනත් හේතුවක් නිසා දුෂ්කරතාවලට ලක් වී ඇති/ ආර්ථික අපහසුතාවලින් පෙළෙන ළමුන් සඳහා අධ්‍යාපන ආධාර ලබාදීම. (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10, ළමුන් 76) | ❖ 441,000.00 |
| ❖ ළමා ලේකම් කාර්යාලය | ❖ පෙර පාසල් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම (ප්‍රා.ලේ.කො. 09, පෙර පාසල් ගොඩනැගිලි 19) | ❖ 1,887,235.00 |
| | ❖ පෙර පාසල් සඳහා අධ්‍යාපන උපකරණ/ සෙල්ලම් උපකරණ ලබාදීම. (ප්‍රා.ලේ.කො. 10, පෙර පාසල් 20) | ❖ 407,525.00 |
| | ❖ පෙර පාසල් සෙල්ලම් මිදුල් සැකසීම (ප්‍රා.ලේ.කො. 10, සෙල්ලම් මිදුල් 10) | ❖ 203,510.00 |
| | ❖ පෙර පාසල් ගෙවතු සැකසීම (ප්‍රා.ලේ.කො. 10, ගෙවතු 10) | ❖ 65,932.00 |
| | ❖ පෙර පාසල් අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම. (ප්‍රා.ලේ.කො. 02, අධ්‍යාපන චාරිකා 02) | ❖ 50,000.00 |
| ❖ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය | ❖ ස්වයං රැකියා ව්‍යාපාර පුහුණුව සහ උපකරණ ලබා දීම. (ප්‍රා.ලේ.කො. 04, වැඩසටහන් 04) | ❖ 519,490.00 |
| | ❖ ප්‍රජනන සෞඛ්‍ය වැඩසටහන් පැවැත්වීම. (ප්‍රා.ලේ.කො. 03, වැඩසටහන් 03) | ❖ 55,260.00 |
| | ❖ හිංසනය හා අපචාර පිළිබඳ කාන්තාවන් දැනුවත් කිරීම. (ප්‍රා.ලේ.කො. 06, වැඩසටහන් 06) | ❖ 96995.00 |
| | ❖ පශු සම්පත් පුහුණුව හා කිරි ගවයින් ලබාදීම. (ප්‍රා.ලේ.කො. 03, කාන්තාවන් 71, ගවයින් 13) | ❖ 710,000.00 |
| | ❖ ගෙවතු වගා පුහුණුව හා උපකරණ ලබාදීම. (ප්‍රා.ලේ.කො. 03, කාන්තාවන් 52) | ❖ 61,750.00 |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | ❖ ප්‍රදර්ශන කුටිය පවත්වාගෙන යාම | ❖ 29,591.00 |
| | ❖ හදිසි විපත් / පීඩා සඳහා ආධාර ලබාදීම. (ප්‍රා.ලේ.කො. 08, ළමුන් 56 ) | ❖ 292,000.00 |
| | ❖ ආර්ථික දුෂ්කරතාවලින් පෙළෙන ළමුන් සඳහා අධ්‍යාපන ආධාර ලබාදීම. (ප්‍රා.ලේ.කො. 08, ළමුන් 293 ) | ❖ 220,000.00 |
| | ❖ සැපකරු දෙගුරු වැඩසටහන ක්‍රියාවට නැංවීම. (ප්‍රා.ලේ.කො. 02, ළමුන් 77) | ❖ 211,500.00 |
| | ❖ ළමා සමාජ පිහිටුවීම. (ප්‍රා.ලේ.කො. 02, ළමා සමාජ 02) | ❖ 34,200.00 |
| | ❖ හොඳම ළමා හිමිකම් ආදර්ශ ගම්මානය තේරීමේ තරගය පැවැත්වීම. (සියලුම ප්‍රා.ලේ.කො.) | වියදම් නැත. |
| | ❖ ළමුන් අතරේ නව විද්‍යාත්මක සොයාගැනීම් තරගාවලියක් පැවැත්වීම. (ප්‍රා.ලේ.කො. 05, තරගාවලි 01) | ❖ 5,000.00 |
| | ❖ ළමා සුරක්ෂිතතාවය පිළිබඳ දැනුවත් කිරීම. (ප්‍රා.ලේ.කො. 02, වැඩසටහන් 02) | ❖ 19,800.00 |
| | ❖ බාල වයස් විවාහ වළක්වාගැනීම පිළිබඳ නව යොවුන්වියේ ළමුන් දැනුවත් කිරීම. (ප්‍රා.ලේ.කො. 11, ළමුන් 1650 ) | ❖ 506,000.00 |
| | ❖ ළමා නිවාසවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා කළමනාකරුවන් දැනුවත් කිරීම. (කළමනාකරුවන් 60 ) | ❖ 35,000.00 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | ❖ ප්‍රදර්ශන කුටිය පවත්වාගෙන යාම | ❖ 350,068.00 |
| | ❖ ළමා ආරක්ෂාව හා අපයෝජනය පිළිබඳ පාසල් සිසුන්, වැඩිහිටි ප්‍රජාව, කාන්තාවන්, ග්‍රාම නිලධාරීන් හා ගුරුවරුන් දැනුවත් කිරීම. (ප්‍රා.ලේ.කො. 05, ප්‍රතිලාභීන් 400 ) | ❖ 12,968.00 |

| | | |
|---|---|---|
| | ❖ ජංගම සේවා ප්‍රදර්ශන කුටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පවත්වාගෙන යාම හා ළමා ආරක්ෂාව පිළිබඳ පාසල් සිසුන්, වැඩිහිටි ප්‍රජාව, වෘත්තිකයන් සහ ගුරුවරුන් දැනුවත් කිරීම.<br>❖ ළමා විවාහ හා ළමා අපයෝජන පිළිබඳ දෙමව්පියන් හා වැඩිහිටි ප්‍රජාව දැනුවත් කිරීම. (ග්‍රාම නිලධාරී වසම් 02, ප්‍රතිලාභීන් 152 )<br>❖ ළමා නිවාස අධීක්ෂණය හා නියාමනය (ප්‍රා. ලේ. කො. 02 / ළමා නිවාස 02 ) | ❖ 43,284.00<br>❖ 3,754.00<br>❖ 16,250.00 |

(ඇ) 120-01-02-04-2502 (දීරිය කාන්තා වැඩසටහන) - ළමා සංවර්ධනය හා කාන්තා කටයුතු අමාත්‍යාංශය

120-01-02-01-2201 (ජාතික ළමා ආරක්ෂක අධිකාරිය)

217-01-01-2-1508 (පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව)

(ඈ) අදාළ නොවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6-1347/'11-(3), ගරු ශාන්ත බණ්ඩාර මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, ගරු ශාන්ත බණ්ඩාර මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 7-0993/'10-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම හත්වන ප්‍රශ්නයට උත්තරයක් බලා ගෙන සිටිනවා, ඡන්ද කාලය නිසා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன )
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය පළමුව ඛනිජ තෙල් අමාත්‍යාංශය වෙත යොමු කරලා ඊට පසු අප අමාත්‍යාංශය වෙත එවා තිබෙන්නේ. ඒ නිසා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් අමාත්‍යාංශයෙන් ගෑස් මිල 570කින් වැඩි කරනවාද නැද්ද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
Election එකට ඉස්සෙල්ලා උත්තර දෙනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## යූසුෆ් ලෙබ්බෙ උතුමා ලෙබ්බෙ මහතා: ඉඩම සඳහා වන්දි
## ஜனாப் யூசுப் லெப்பை உதுமா லெப்பை: காணி நட்ட ஈடு
## MR. YOUSUF LEBBE UTHUMA LEBBE : COMPENSATION FOR LAND

1368/’11

11. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු එම්.ටී.හසන් අලි මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு எம்.ரி. ஹசன் அலி சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. M.T. Hasen Ali)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) ඔලුවිල් වරාය සංවර්ධන කාර්යය සඳහා පවරාගත් ඉඩම් වෙනුවෙන් වන්දි ලබා දී තිබෙන, අංක PP/AM/3737 දරන මිනුම් සිතියමෙහි හඳුනාගෙන ඇති ඉඩම් හිමියන්ගේ නම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අංක PP/AM/3737 දරන මිනුම් සිතියමට අනුව යොමු අංක AD/DS/LD/LAOH/26 යටතේ කැබලි අංක 2 වශයෙන් හඳුනාගෙන, පවරා ගෙන ඇති ඉඩම වෙනුවෙන් අංක 4/11, මධ්‍යම කඳවුර, නවින්දවේලි හි පදිංචි යූසුෆ් ලෙබ්බෙ උතුමා ලෙබ්බෙ මහතාට වන්දි ගෙවා තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள்,நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) ஒலுவில் துறைமுக அபிவிருத்தி நோக்கத்திற்காக PP/AM/3737ஆம் இலக்க நில அளவை வரைபின் பிரகாரம் அடையாளம் காணப்பட்டு காணிகளை சுவீகரித்தமைக் காக நட்ட ஈடுகள் வழங்கப்பட்ட காணி உரிமையாளர் களது பெயர்கள் என்னவென்பதை அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(ஆ) AD/DS/LD/LAOH/26 ஆம் குறியீட்டு இலக்கத்தின் கீழ் PP/AM/3737ஆம் இலக்க நில அளவை வரைபின் பிரகாரம் 2ஆம் இலக்க காணித்துண்டை அடையாளம் கண்டு சுவீகரித்தமைக்காக நாவிதன்வெளி சென்றல்கேம்ப் 4/11ஆம் இலக்கத்தில் வசிக்கின்ற ஜனாப் யூசுப் லெப்பை உதுமா லெப்பை என்பவருக்கு நட்டஈடு வழங்கப்பட்டதா என்பதை அவர் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he inform this House of the names of land owners identified in Survey Map No. PP/AM/ 3737 who had been paid compensation for their lands acquired for the development purpose of Oluvil Port?

(b) Will he state whether Mr. Yousuf Lebbe Uthuma Lebbe of 4/11, Central Camp, Navithanvely, had been paid compensation for his land identified and acquired as Lot No: 2 :as per Survey Map No. PP/AM/3737 under reference No: AD/DS/LD/LAOH/26?

(c) If not, why?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)

(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Highways)

ගරු කථානායකතුමනි, ගරු වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) 01 මොහමදු ඉස්මායිල් මීරා මොහිදීන්

02 යුසුස් ලෙබ්බේ උදුමා ලෙබ්බේ

03 අබ්දුල්ලා සෙනම්බු

04 මොහොමඩ් හනීෆා පලීල් අහමඩ්

05 මොහොමඩ් හනීෆා තාගීර් අහමඩ්

06 මොහොමඩ් හනීෆා තයියුබ් අහමඩ්

07 මොහොමඩ් හනීෆා පුවාත් අහමඩ්

08 කලන්දර් ලෙබ්බේ මසායිනා උම්මා

09 පක්කීර් බාබා මීරා සාහිබු

10 මොහොම්මදු ඉස්රාහිම් මොහොම්මදු අන්හාර්

(ආ) වන්දි ගෙවා නොමැත

(ඇ) 2009 වසර තුළ සිදුවූ මෙම ඉඩම් කොටස් අත්පත් කර ගැනීම වෙනුවෙන් වන්දි මුදල් ගෙවීම සඳහා 2010 වසරේ අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් විසින් කැඳවා ඇති තක්සේරු වාර්තාවේ දැක්වෙන මිල ගණන්, මෙම කරුණ සම්බන්ධයෙන් අප විසින් 2002/2003 වසරවල කැඳවන ලද තක්සේරු වාර්තාවේ මිල ගණන් හා සැසඳීමේදී අසාමාන්‍ය ලෙස ඉහළ වටිනාකමක් ගෙන ඇත. එය 6000% ක් පමණ වටිනාකම වැඩිවීමක් පෙන්නුම් කළ හෙයින් මේ පිළිබඳ දැනට පරීක්ෂණයක් සිදුකරමින් පවතී. එම පරීක්ෂණය අවසන් වීමෙන් අනතුරුව වන්දි ගෙවීමේ කටයුතු සිදුකරන බව දන්වා සිටිමි.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### කාර්මික ආරවුල් (සංශෝධන) පනත් කෙටුම්පත
### கைத்தொழில் பிணக்குகள் (திருத்தம்) சட்டமூலம்
### INDUSTRIAL DISPUTES (AMENDMENT) BILL

"(131 අධිකාරිය වූ ) කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසිනි.***

***2011 සැප්තැම්බර් 06 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*தொழில், தொழில் உறவுகள் அமைச்சர் சார்பில் மாண்புமிகு தினேஷ் குணவர்தன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2011 செப்ரெம்பர் 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப் பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளை யிடப்பட்டது.*

*Presented by the Hon. Dinesh Gunawardena, on behalf of the Minister of Labour and LabourRelations,*

*to be read a Second time upon Tuesday, 06th September, 2011 and to be printed.*

## පාර්ලිමේන්තු සේවයේ ස්වාධීන තත්ත්වය ශක්තිමත් කිරීම පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීම පිණිස වන විශේෂ කාරක සභාව
## பாராளுமன்றச் சேவையின் சுயாதீனப் பண்பை வலுப்படுத்துவது பற்றி ஆராய்ந்து அறிக்கை சமர்ப்பிப்பதற்கான தெரிகுழு
## SELECT COMMITTEE TO INQUIRE AND REPORT ON STRENGTHENING THE INDEPENDENT CHARACTER OF THE PARLIAMENTARY SERVICE

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"පාර්ලිමේන්තු සේවයේ ස්වාධීන තත්ත්වය ශක්තිමත් කිරීම පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීම සඳහා 2010 ඔක්තෝබර් මස 21 වැනි දින ගරු කථානායකතුමා විසින් පත් කරන ලද විශේෂ කාරක සභාවට, තමා විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2011 මාර්තු 08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ගන්නා ලද යෝජනාව මගින් නියම කර ඇති කාල සීමාව ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට නොහැකි බැවින්, එම කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව අංක 96 දරන ස්ථාවර නියෝගය ප්‍රකාරව 2011 නොවැම්බර් මස 30 වැනි දින දක්වා දීර්ඝ කළ යුතුය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දිනට නියමිත කටයුතුවල පළමුවන යෝජනාවත්, දෙවන යෝජනාවත් එකවර සාකච්ඡා කිරීම සඳහා ඉදිරිපත් කරනවා ඇති.

ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමා.

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත: නියෝගය
## இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம்: கட்டளை
## SRI LANKA EXPORT DEVELOPMENT ACT: ORDER

[අ. භා. 1.59]

**ගරු මහින්ද සමරසිංහ මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க - பெருந்தோட்டக் கைத் தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Plantation Industries)
Sir, on behalf of the Minister of Industry and Commerce, I move,

"That the Order made by the Minister of Industry and Commerce with the concurrence of the Minister of Finance and Planning, under Section 14(1) of the Sri Lanka Export Development Act, No. 40 of 1979, relating to Cess, and published in the Gazette Extraordinary No. 1695/31 of March 04th 2011, which was presented on 22.07.2011, be approved."

ගරු කථානායකතුමනි, මේ යෝජනා දෙක දෙස බැලුවාම, පළමුවැනි යෝජනාව සම්බන්ධ වන්නේ රබර් නිෂ්පාදනයට. දෙවැනි යෝජනාව සම්බන්ධ වන්නේ කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් අපේ රජයෙන් ලබා දී තිබෙන සහන ගණනාවකට.

ගරු කථානායකතුමනි, රබර් පිළිබඳව කෙටි විග්‍රහයක් කරන්නත්, මේ සෙස් බද්ද පැනවීමත් සමඟ ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ පිළිබඳව ඔබතුමා මාර්ගයෙන් මේ ගරු සභාවට දැනුම් දෙන්නත් මා බලාපොරොත්තු වෙනවා.

පළමුවෙන්ම රබර් ක්ෂේත්‍රය දෙස බලන විට වර්තමානයේ රබර් වගා කර තිබෙන මුළු බිම් ප්‍රමාණය හෙක්ටෙයාර් 1,024,596ක් වෙනවා. මේ මුළු බිම් ප්‍රමාණයෙන් වැඩි හරියක් කිරි කපන වැවිල්ලක් හැටියට තිබෙනවාය කියන එකත් මා මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි. ඒ හෙක්ටෙයාර 124,596න් හෙක්ටෙයාර 95,300ක කිරි කපන වගාවක් තිබෙනවා. 2010 වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය දෙස බැලුවාම මෙට්‍රික්ටොන් 152,987යි නිෂ්පාදනය කරලා තිබෙන්නේ. 2010 වර්ෂයේ අපනයනය කරලා තිබෙන මුළු රබර් ප්‍රමාණය දෙස බැලුවාම මෙට්‍රික්ටොන් 51,503යි අපනයනය කරලා තිබෙන්නේ. මෙට්‍රික්ටොන් 152,987කින් සියයට 30ක ප්‍රමාණයක් පමණයි අපි අපනයනය කරන්නේ. ඒ වාගේම 2010 වර්ෂයේ අපි මෙට්‍රික්ටොන් 107,225ක ප්‍රමාණයක් දේශීයව පරිභෝජනය කර තිබෙනවා. ඒක සියයට 70ක ප්‍රමාණයක්. ගරු කථානායකතුමනි, මා මේ විග්‍රහය කළේ ඔබතුමා මාර්ගයෙන් ඒ කරුණු සභාවට දැනුම් දෙන්නයි.

අපි මේ සෙස් බද්ද පනවා තිබෙන්නේ අපනයනය කරන රබර් ප්‍රමාණයට පමණයි. රුපියල් 8ක් වූ ඒ සෙස් බද්ද රුපියල් 12 දක්වා වැඩි කරලා තිබෙනවා. සෙස් බද්ද වැඩි කිරීම අපනයන ක්ෂේත්‍රයට පමණක් සීමා කිරීමෙන් රජයේ මූලික පරමාර්ථය වුණේ -රජයේ බලාපොරොත්තුව වුණේ- අගය එකතු කිරීමේ නිෂ්පාදන තවදුරටත් දිරිමත් කිරීමෙන් දේශීය නිෂ්පාදකයන්ට, විශේෂයෙන්ම කුඩා රබර් වතු හිමියන්ට ඒ හරහා වැඩිපුර ආදායමක් ලැබෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නයි. අගය එකතු කිරීමේ නිෂ්පාදනවලට යම් කිසි සහනයක් දෙනවා කියන්නේ මේ රටේ රැකියා ප්‍රශ්නයටත් ඒ හරහා විසඳුමක් ලබා දෙන්න පුළුවන් කියන එකයි. රැකියා වැඩිපුර බිහි කරනවා කියන්නේ වැඩිපුර ආදායමක් ලැබෙන එකයි. මේ වාගේ අගය එකතු කිරීමේ ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක කිරීම තුළින් නිෂ්පාදනයට තිබෙන ඉල්ලුමත් විශාල වශයෙන් වර්ධනය කරන්න පුළුවන් කියලා හිතා ගෙන තමයි පසු ගිය අය වැයත් සමඟ මුදල් අමාත්‍යාංශය සෙස් බද්ද වැඩි කිරීමේ වැඩ පිළිවෙළට ගිහින් තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, රබර් ක්ෂේත්‍රය දෙස බැලුවාම අද රබර් මිල බොහොම ඉහළ මට්ටමක පවතිනවාය කියන එක අපි සඳහන් කරන්න ඕනෑ.

අද රබර් නිෂ්පාදනයේ වැඩි කොටසක් -සියයට 60ක් වාගේ ප්‍රමාණයක්- නිෂ්පාදනය කරන්නේ කුඩා රබර් වතු හිමියෝ. ඒ රබර් වතු හිමියන්ට අද වැඩිපුර ආදායමක් ලැබෙන වැඩ පිළිවෙළක් අපේ රජයෙන් ක්‍රියාත්මක කරන්න පටන් අරන් තිබෙනවා. හැබැයි ඒ එක්කම මම පෙන්වා දෙන්න ඕනෑ, රබර් මිල ඉහළ මට්ටමක තිබුණා කියලා අතිගරු ජනාධිපතිතුමා සහන ලබා දීමේ වැඩ පිළිවෙළ නතර කරන්න ගිහිල්ලාත් නැහැයි කියන එක. අද කුඩා රබර් වතු හිමියන්ට ඒ වාගේම මහා පරිමාණයෙන් රබර් වවන ව්‍යාපාරිකයන්ට දීලා තිබෙන සහන දිහා බැලුවාම, එය අතිවිශාල සහන ප්‍රමාණයක්. රබර් මිල ඉහළ මට්ටමක තිබෙන අවස්ථාවකදී වුවත් ඒ සහන දෙන්න ජනාධිපතිතුමා මැදිහත් වෙලා ක්‍රියා කර තිබෙනවා.

රබර් ක්ෂේත්‍රය ගැන කථා කරන කොට අපට තිබෙන විශාලම අභියෝගය තමයි, අගය එකතු කිරීමේ නිෂ්පාදනවල නිරත ව්‍යාපාරවලට අවශ්‍ය කරන රබර් ප්‍රමාණය ලබා දීමේ වැඩ පිළිවෙළක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීම. සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරලා කලින් එය පෙන්වා දුන්නා. රබර් මෙට්‍රික්ටොන්1,05,000ක වාගේ නිෂ්පාදනයක් තමයි දැනට ඒ අය මිල දී ගන්න කටයුතු කරන්නේ. එතකොට ඒ ප්‍රමාණය මුළු රබර් නිෂ්පාදනයෙන් සියයට 70ක්. හැබැයි අපේ සංඛ්‍යා ලේඛන දිහා බැලුවාම අපි දකිනවා, තව අවුරුදු පහකින්-2016 වන කොට- අගය එකතු කිරීමේ නිෂ්පාදනවල නිරත ව්‍යාපාරවලට තව මෙට්‍රික්ටොන් 50,000ක් වැඩිපුර මිලදී ගන්න හැකියාව ලැබෙනවා කියලා. මොකද, මේ වනකොටත් ඒ ව්‍යාපාර විශාල ආයෝජන කරලා, විශාල යන්ත්‍රෝපකරණ ඒ කර්මාන්තශාලාවල සවි කර ගෙන. දැන් ඒ අය බලාපොරොත්තු වන්නේ අපේ රටේ රැකියා සම්පාදනය කරලා, -රැකියා ඇති කරලා- වැඩිපුර ආදායම් ඒ අයට ලබා දෙන වැඩ පිළිවෙළකට හවුල් වෙලා, ස්වාභාවික රබර්වලට ජාත්‍යන්තරයේ ඇති වෙලා තිබෙන විශාල ඉල්ලුමට සරිලන පරිදි අපේ රටේ භාණ්ඩ නිෂ්පාදනය කරලා, තවදුරටත් ඒ නිෂ්පාදන කටයුතු සාර්ථකව ගෙන යන්නයි. එතකොට ඒ අය තක්සේරු කරලා තිබෙනවා, තව අවුරුදු පහකින් ජාත්‍යන්තර මට්ටමේ තිබෙන ඉල්ලුමත් එක්ක සංසන්දනය කළාම අපට තව විශාල ප්‍රමාණයක් නිමි භාණ්ඩ හැටියට අපනයනය කරන්න පුළුවන් කියලා. ඒ නිසා තමයි අපි දැන් අතිගරු ජනාධිපතිතුමාගේ සහයෝගය ඇතිව, එතුමාගේ ඒ අමාත්‍යාංශය හරහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගෙන ලොකු වැඩ පිළිවෙළකට යන්න ලෑස්ති වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මේ වැඩ පිළිවෙළ තව දුරටත් විග්‍රහ කරනවා නම් සාම්ප්‍රදායික රබර් වවන ප්‍රදේශවලින් පිට වෙලා

සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවලට ගිහිල්ලා විශාල වශයෙන් රබර් වගා කරන්න අපි දැන් පටන් අරගෙන තිබෙන බව කියන්න ඕනෑ. ඒකේ එක පියවරක් තමයි මොනරාගල දිස්ත්‍රික්කයට ගිහිල්ලා විශාල වශයෙන් රබර් වවන්න පටන් අරගෙන තිබීම. අපේ රජයෙන් ණයක් අරගෙන මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපි දැන් ඉලක්ක කර ගෙන තිබෙනවා. සමහරු හිතන්නේ පිට රටින් ඇවිල්ලා අපට මුදල් දෙන කොට මේවා ආධාර කියලා. ඒවා ආධාර නොවෙයි. ඇත්ත වශයෙන්ම අපි ගිහිල්ලා සාකච්ඡා කරලා, අපේ වැඩ පිළිවෙළවල් පැහැදිලි කරලා දුන්නාට පස්සේ අපි ණයක් ලබා ගන්නවා. "ඉෆාඩ්" කියන ඒ ජාත්‍යන්තර සංවිධානයෙන් අපේ රජය විශාල ණයක් ලබා ගෙන, මොනරාගල දිස්ත්‍රික්කයේ කුඩා රබර් වතු හිමියෝ 10,000ක් ඉලක්ක කර ගෙන හෙක්ටෙයාර 5,000ක් වවන්න මේ වෙන කොට අපි පටන් අරගෙන තිබෙනවා. අද මම කථා කරන මේ මොහොතේදී මට සන්තෝෂයෙන් කියන්න පුළුවන්, මේ හෙක්ටෙයාර 5,000න් හෙක්ටෙයාර 3,000ක් වවන්න මේ වෙන කොටත් අපි පටන් අරගෙන තිබෙනවා කියලා. ඉදිරි අවුරුදු දෙකේ අනෙක් හෙක්ටෙයාර 2,000ත් වවලා කුඩා රබර් වතු හිමියෝ 10,000කට ආදායමක් ලබා දීමේ වැඩ පිළිවෙළක් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වයෙන්, එතුමාගේ මඟ පෙන්වීම හරහා අපේ රජයෙන් කරන්න අපි දැන් අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.

ඊළඟට, වසර 2016 දී ඇති වන ඉල්ලුම දිහා බලා වෙනත් සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවලත් රබර් වවන්න දැන් අපි කටයුතු කර ගෙන යනවා. උදාහරණයක් හැටියට මගේ නියෝගයක් මත රබර් පර්යේෂණ ආයතනයෙන් වවුනියාවේ, කිලිනොච්චියේ සහ මුලතිව් ප්‍රදේශයේ රබර් වවන්න පුළුවන්ද කියන අත් හදා බැලීම කරන්න මේ වෙන කොටත් අපි ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම පොළොන්නරුව ප්‍රදේශයේ, අනුරාධපුර ප්‍රදේශයේ පටන් ගෙන තිබෙනවා. මේ අවුරුද්ද අවසාන වෙන කොට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා පදියතලාවේ හෙක්ටෙයාර 900ක් වවන්න අපි පටන් ගන්නවා ගරු කථානායකතුමනි. මම මැදිහත් වෙලා අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමාත් එක්ක කථා කරලා මේ වෙන කොට මහඔය ප්‍රදේශයේ හෙක්ටෙයාර 10,000ක් හඳුනා ගෙන තිබෙනවා රබර් වවන්න.

අපි ස්ථිර වැඩ පිළිවෙළක් පටන් ගෙන තිබෙනවා. ඒ වාගේම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් අලුත් ප්‍රදේශවලට අවශ්‍ය පැළ හොඳ ප්‍රමිතියකින් නිෂ්පාදනය කිරීමේ කටයුත්ත පටන් ගෙන තිබෙනවා. පිටින් රබර් පැළ ගෙනෙනවාට වඩා ඒ ප්‍රදේශවලම තවාන් පටන් අර ගෙන ඒ ප්‍රදේශයෙන්ම රබර් පැළ ලබා දීමේ වැඩ පිළිවෙළක් පටන් අර ගෙන තිබෙනවා කියන එක මම බොහොම සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න කැමැතියි. පදියතලාව, මහඔය ප්‍රදේශයේ තවාන් පටන් ගන්න අපි මේ වන කොටත් කටයුතු කර තිබෙනවා. ඒ වාගේම මේ අවුරුද්ද අවසාන වන කොට -දෙසැම්බර් 31 වෙනි දා වන කොට- රබර් පර්යේෂණ ආයතනයෙන් මට සංඛ්‍යා ලේඛන ලබා දෙනවා වව්නියාවේ, මුලතිව් ප්‍රදේශයේ, කිලිනොච්චිය ප්‍රදේශයේ සාර්ථකව රබර් වවන්න පුළුවන්ද බැරිද කියන එක සම්බන්ධයෙන්.

ගරු කථානායකතුමනි, අපට ලැබිලා තිබෙන සංඛ්‍යා ලේඛන දිහා බැලුවාම සමහර ප්‍රදේශවල හොඳ වගාවක් පටන් අර ගෙන තිබෙනවා කියන එකත් මම මේ අවස්ථාවේදී බොහොම සන්තෝෂයෙන් ඔබතුමා මූලාසනයේ සිටියදී මේ පාර්ලිමේන්තුවට -මේ ගරු සභාවට- කියන්න කැමැතියි ගරු කථානායකතුමනි. සාම්ප්‍රදායිකව රබර් වවන ප්‍රදේශවලින් පිට වෙලා වැසි වර්ෂාව වැඩිපුර නැති ප්‍රදේශ හඳුනා ගෙන, ඒවායේ පස පරීක්ෂා කර බලා, ඒ ප්‍රදේශවල කාලගුණ තත්ත්වය පරීක්ෂා කර බලා රබර් වගා කිරීමේ ලොකු වැඩ පිළිවෙළක් අපි පටන් ගෙන තිබෙනවා. මම මෙතැනට නිකම්ම ඇවිල්ලා ඒ ගැන ප්‍රකාශ කරන්නේ නැහැ. ඒ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් ගන්න තිබෙන පියවරයන්ද සහිතව තමයි අප ඒ වැඩ පිළිවෙළ පටන් ගෙන තිබෙන්නේ කියන එකත් මම බොහොම සන්තෝෂයෙන් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා පසු ගිය අය වැය ඉදිරිපත් කරපු අවස්ථාවේදී ප්‍රකාශ කළ පරිදි නැවත වරක් මේ ක්ෂේත්‍රය නඟා සිටුවීමේ අරමුණ මුල් කර ගෙන කුඩා රබර් වතු හිමියන්ටයි, මහා පරිමාණයෙන් වගා කරන වතු කොම්පැනිවලටයි වැසි ආවරණ ලබා දෙන්න විශාල මුදලක් මේ වෙන කොට අපේ අමාත්‍යාංශයට ලබා දීලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා රුපියල් මිලියන 160ක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට වෙන් කර දී තිබෙනවා, මේ වර්ෂයේ විශාල ප්‍රමාණයකට වැසි ආවරණ ලබා දෙන්න. අපි දැන් සමීක්ෂණ කරලා සංඛ්‍යා ලේඛන ලබා ගෙන තිබෙනවා, වැසි ආවරණ යෙදෙව්වොත් රබර් ගසේ නිෂ්පාදනය සියයට 30කින් වැඩි කරන්න පුළුවන් කියලා. අපි ඒක බොහොම පැහැදිලිව ඔප්පු කරලා ඉවරයි. ඒ වැඩ පිළිවෙළටත් එක්ක තමයි මේ විශාල මුදල වෙන් කරලා තිබෙන්නේ. නිෂ්පාදනය වැඩි කිරීමේ පරමාර්ථය එක පැත්තකින් තියා ගෙන, තව පැත්තකින් කුඩා රබර් වතු හිමියන්ට වැඩිපුර ආදායමක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා හිතා ගෙන, රටේ සමස්ත විදේශ විනිමය වැඩි දියුණු කිරීමේ පරමාර්ථය තව පැත්තකින් තියා ගෙන, තවත් පැත්තකින් අගය එකතු කිරීමේ පරමාර්ථය ඇතිව, ව්‍යාපාරවල අවශ්‍යතාව මත ඒ අයගේ ඉල්ලුම දිහා බලා, ඉදිරියටත් තිබෙන ඉල්ලුම සලකා බලා අතිවිශාල වැවිල්ලකට, නිෂ්පාදනය වැඩි කිරීමේ වැඩ පිළිවෙළකට, ඵලදායීතාව වැඩි කිරීමේ වැඩ පිළිවෙළකට අප මේ වෙන කොටත් ගිහින් තිබෙනවාය කියන එක මම බොහොම සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ඊට අමතරව අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පොහොර සහනාධාරය තවදුරටත් ක්‍රියාත්මක කරන්න අතිවිශාල මුදලක් මේ වන කොටත් වෙන් කර දීලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාට කියන්න තිබුණා, "අද රබර් මිල බොහොම ඉහළ තත්ත්වයක තියෙන්නේ, ඒ නිසා මේ මුදල වෙනින් තැනකට අපිට ගිහිල්ලා දෙන්න පුළුවන්" කියලා. මම හිතන්නේ නැහැ, ඒ වාගේ තර්කයක් ඉදිරිපත් කරන කොට කිසිම කෙනෙක් ඒක ප්‍රශ්න කරනවාය කියලා. මොකද ඇත්ත වශයෙන්ම අද වැඩිපුර ආදායමක් ඒ කුඩා රබර් වතු හිමියන්ට ලැබෙන නිසා. කුඩා අයට උදවු කරන්න ඕනෑ, කුඩා මිනිහාව නඟා සිටුවන්න ඕනෑ කියන අතිගරු ජනාධිපතිතුමාගේ ඒ දැඩි වුවමනාව පදනම් කර ගෙන රබර් ක්ෂේත්‍රයටත් පොහොර සහනාධාරය තවදුරටත් ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න එතුමා භාණ්ඩාගාරයෙන් අතිවිශාල මුදලක් වෙන් කරලා තිබෙනවා.

දැන් මේ වැඩ පිළිවෙළ අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත තවදුරටත් පහසු ක්‍රමයකට පරිවර්තනය කරලා තිබෙනවා. ඕනෑම කෙනකුට ඕනෑම තැනකට ගිහිල්ලා දැන් මිශ්‍ර පොහොර මිටියක් රුපියල් 1,300ක් ගෙවලා ගන්න පුළුවන්. මිශ්‍ර පොහොර ඕනෑ නැත්නම් රුපියල් 1,200ක් ගෙවලා පොහොර බෑග් එක අරගෙන ඒ අයගේ නිෂ්පාදනය වැඩි කිරීමේ වැඩ පිළිවෙළට යන්න පුළුවන්. මේ වැඩ පිළිවෙළ කලින් තිබුණේ නැහැ. කලින් රබර් පර්යේෂණ නිලධාරින් ගාවට ගිහිල්ලා, තේ පර්යේෂණ නිලධාරින් ගාවට ගිහිල්ලා සහතික තුනක් හතරක් අරගෙන ඇත්ත වශයෙන්ම ලොකු රස්තියාදුවක් වනවා. හැම තැනම ගිහිල්ලා තමයි ඒ පොහොර ටික ගත්තේ. අද බොහොම පහසු ක්‍රමයක් අතිගරු ජනාධිපතිතුමා ක්‍රියාත්මක කරලා තිබෙනවාය කියන එක මම බොහොම සන්තෝෂයෙන් මතක් කරන්න කැමැතියි. මේ වාගේ විවිධ ක්‍රම හරහා රබර් ක්ෂේත්‍රය නඟා සිටුවන්න මේ වන කොටත් අපි වැඩ පිළිවෙළවල් ගණනාවක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. මම හැම දෙයක්ම ගැන මේ අවස්ථාවේදී කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. හැබැයි මූලික දේවල් කීපයක් විතරයි මම අද ඉදිරිපත් කළේ.

[ගරු මහින්ද සමරසිංහ මහතා]

විශේෂයෙන්ම මේ සෙස් බද්ද වැඩි කිරීම අපනයන ක්ෂේත්‍රයට පමණක් සීමා කරලා තිබෙනවා. අපේ වියදම් දැරීමට පුළුවන්කම ලැබෙනවා මෙන්ම වැඩි පුර ආයෝජනයක් කරන මුදල ඒ පැත්තෙන් ලබා ගන්න පුළුවන්. නිමි භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තශාලා ව්‍යාප්ත කරන්න; වැඩිදියුණු කරන්න; ඒ අයට අවශ්‍ය ඉල්ලුම ලබා දීමේ වැඩ පිළිවෙළ තවදුරටත් ක්‍රියාත්මක කරන්න පටන් අරගෙන තිබෙනවාය කියන එක මම විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අපි තේ ක්ෂේත්‍රයට ගිහින් බැලුවොත් මොකක්ද පෙනෙන්නේ? තේ නැවත වගා කිරීමටත්, ඒ වාගේම පාළු සිටුවීමට වැඩිපුර සහන ලබා දීමටත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හරහා -Tea Small Holdings Development Authority හෙවත් TSHDA එක හරහා- ගැසට් නිවේදනයක් මඟින් අපි සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ වැඩ පිළිවෙළ දිහා බැලුවාමත්, වැවිලි කර්මාන්ත ඇමතිවරයා හැටියට අපි ඉදිරිපත් කළ ඉල්ලීම් අපට ලබා දීමට කටයුතු කිරීම පිළිබඳවත් අතිගරු ජනාධිපතිතුමාට මගේ විශේෂ ස්තුතිය පළ කරන්න කැමැතියි. වැවිලි කර්මාන්ත ඇමතිවරයා හැටියට තේ ක්ෂේත්‍රය තිරසාර දියුණුවක් කරා ගෙනි යන්න අපි කුමක්ද කරන්න ඕනෑ කියලා කවුරු හරි මගෙන් ඇහුවොත්, මම බොහොම සරල උත්තරයක් ඒ අයට දෙන්න සූදානම්. ගරු කථානායකතුමනි, ඒ උත්තර තමයි නැවත වගාව අපි හරියාකාරව කරන්න ඕනෑ කියන එක.

අද ජාත්‍යන්තරයේ වෙන්දේසි සියල්ලක් එක්කම අපේ තේ වෙන්දේසිය සන්සන්දනය කළාම අපේ තේ නිෂ්පාදනය පිළිබඳව අපට බොහොම ආඩම්බරයෙන්, සතුටෙන් කියන්න පුළුවන් ලංකාවේ කොළඹ තිබෙන වෙන්දේසියෙන් අපට ලැබෙන මුදල අනෙක් හැම වෙන්දේසියකටම වඩා ඩොලරයකින් -රුපියල් සියයකින්- වැඩියි කියලා. ඒ තත්ත්වය අවුරුදු ගණනාවක් තිස්සේ අපි පවත්වාගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ තත්ත්වය අපට ඇති වෙලා තිබෙන්නේ ලංකාවේ තේවල ගුණාත්මකභාවය ජාත්‍යන්තරය පිළිගෙන තිබෙන නිසායි.

අපි ඒ ගුණාත්මකභාවය තවදුරටත් තිරසාර ගුණාත්මකභාවයක් හැටියට පරිවර්තනය කරන්න බලාපොරොත්තු වෙනවා නම්, එක පැත්තකින් ඵලදායිතාව වැඩි කරන්න ඕනෑ; තව පැත්තකින් අපි නිෂ්පාදන වියදම අඩු කරන්න කටයුතු කරන්න ඕනෑ. ඊටත් වඩා නැවත වගා කිරීමේ වැඩ පිළිවෙළ සියයට 3ක ඉලක්කයක් හැටියට අරගෙන අපි ඒක මුළු මහත් රටේම ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළ පිරිසිදුව කරන්න ඕනෑ කියන එක මම පැහැදිලිව කියන්න කැමැතියි.

අපි අතිගරු ජනාධිපතිතුමාත් එක්ක ගිහිල්ලා මේ ගැන කථා කළා. කථා කරලා නැවත වගා කිරීමේ ඇති වැදගත්කම පිළිබඳව එතුමාට පෙන්වලා දුන්නා. ගරු කථානායකතුමනි, අපි හෙට අනිද්දා ගැන පමණක් හිතලා කටයුතු කරනවා නම් අපට මේ වාගේ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න වුවමනාවක් නැහැ. හැබැයි අපි බොහොම වග කීමකින්නුයි කටයුතු කරන්නේ. තව අවුරුදු 15කින්, අවුරුදු 20කින් මේ රටේ ඇති වන තත්ත්වය ගැන හිතලා තමයි නැවත වගා කිරීම සඳහා සහන ලබා දීමට අපි මෙවැනි ආයෝජනයක් කරන්නේ.

පසු ගිය අය වැයෙන් අතිගරු ජනාධිපතිතුමා රුපියල් 50,000ක් නැවත වගාවට වැඩි සහනයක් හැටියට ලබා දෙන්න යෝජනා කරලා, ඒ ගැසට් නිවේදනය තමයි අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. මෙතෙක් අපි නැවත වගා කිරීම සඳහා පහත රටට දුන්නේ රුපියල් 1,90,000යි. අතිගරු ජනාධිපතිතුමා මේ ගැසට් නිවේදනය හරහා මේ සහනය රුපියල් 2,40,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒක අපේ කුඩා තේ වතු හිමියන්ට විශාල සහනයක්; අති විශාල සහනයක්.

උඩ රටට සහ මැද රටට මෙපමණ කල් දීලා තිබෙන්නේ රුපියල් ලක්ෂ 2යි. ඒක අතිගරු ජනාධිපතිතුමා රුපියල් 2,50,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ අවස්ථාවේදී අතිගරු ජනාධිපතිතුමාට කියන්න තිබුණා, "අද තේ මිල හොඳ තත්ත්වයක තිබෙනවා" කියලා. මැද පෙරදිග තිබුණ ප්‍රශ්නය නිසා ඇත්ත වශයෙන්ම පසු ගිය මාස තුනේ තේ මිල ටිකක් අඩු වෙලා තිබුණා. අද මම සංඛ්‍යා ලේඛන දිහා බැලුවා. මා ළඟ සංඛ්‍යා ලේඛනත් තිබෙනවා. මේ සංඛ්‍යා ලේඛන දිහා බැලුවාම මොකක්ද පෙනෙන්නේ? ජනවාරි මාසයේ සිට මාර්තු මාසය දක්වා ඇත්ත වශයෙන්ම තේ මිල වැඩි වෙලා තිබෙනවා. අප්‍රේල්, මැයි, ජූනි සහ ජූලි මාසවල තමයි මැද පෙරදිග ප්‍රශ්නය ඇති වුණේ. ලිබියාව, ඉරානය, සිරියාව සහ ටියුනීසියාව වාගේ රටවල ප්‍රශ්නයක් ඇති වුණා. "Arab Spring" කියලා ඒකට කියන්නේ. ඒ තත්ත්වයත් එක්ක පොඩි බිඳ වැටීමක් වෙලා තිබෙනවා. ඒ වුණත් අද තේ මිල හොඳ තත්ත්වයක තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා ගිය අවුරුද්දේ අය වැය ලේඛනය ඉදිරිපත් කළ කාලයේ තේ මිල බොහොම ඉහළ තත්ත්වයකයි තිබුණේ. මේ අවුරුද්දේත් ජනවාරි, පෙබරවාරි සහ මාර්තු කියන මාස තුනේත් බොහොම ඉහළ මිලක තිබුණා. තේවලට හොඳ මිලක් ඒ කාලයේත් ලැබුණා. ඒ වුණත් අතිගරු ජනාධිපතිතුමා "අපි විශේෂයෙන් කුඩා තේ වතු හිමියන්ට වැඩිපුර සහනයක් දෙන්න ඕනෑ" කියලා තීරණය කළා. ඒ විධියට හිතලා තමයි නැවත වගාවටයි- [බාධා කිරීමක්] හරි. ඒ වුණත් ඒ තිබෙන අර්බුදයත් එක්ක ඒවා යැවීමේ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. මේක ඇත්ත වශයෙන්ම තාවකාලික ප්‍රශ්නයක්. තව කෙටි කාලයකින් මේ ප්‍රශ්නය විසඳුණාට පසුව, මා කලින් කියපු දේවලුත් අප ක්‍රියාත්මක කරන්න පටන් ගත්තාම නැවත වරක් තිබුණ තත්ත්වයටත් වඩා හොඳ තත්ත්වයකට අපට යන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, හොඳ මිලක් තිබුණත් වැඩිපුර සහන ලබා දීමේ වැඩ පිළිවෙළ අතිගරු ජනාධිපතිතුමා නතර කරලා නැහැ. අතිවිශාල මුදලක් නැවත වගා කිරීමට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම අපි ඵලදායීතාව -නිෂ්පාදනය- කෙටි කාලීනව වැඩි කරන්න බලාපොරොත්තු වනවා නම්, ගුණාත්මකභාවය වැඩි කරන්න බලාපොරොත්තු වනවා නම් ඊට හොඳම ක්‍රමය තමයි පාළු සිටුවීමට දෙන සහන වැඩි කරන එක. මොකද, අද කුඩා තේ වතු හිමියන්ගේ වතුවලට ගිහිල්ලා බැලුවාම ඇත්ත වශයෙන් පාළු සිටුවීම බොහොම ලේසියෙන් කරන්න පුළුවන් බව පෙනෙනවා. නැවත වගාවට යන කොට තමයි නොයෙකුත් ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ. මොකද, අර සියයට තුනේ ඉලක්කය අපි ක්‍රියාත්මක කරන කොට කෙටි කාලයකට ආදායමේ යම් කිසි බිඳ වැටීමක් වනවා. එතකොට ඒ කාලය තුළදී කුඩා තේ වතු හිමියන්ට විකල්ප ආදායමක් ලබා දීමේ වැඩ පිළිවෙළ ගැනත් අපේ අමාත්‍යාංශයෙන් දැන් කථා කරන්න පටන් අරගෙන තිබෙනවා. කොහොම වුණත් තව අවුරුදු දහයක්, පහළොවක්, විස්සක්, විසිපහක් ගැන හිතලා ඒ සියයට තුනේ ඉලක්කය අපි ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වනවා. පාළු සිටුවීම වෙනුවෙන් මෙතෙක් තේ පැළයකට ලබා දුන්නේ රුපියල් 10යි. අතිගරු ජනාධිපතිතුමා ඒක රුපියල් 25ක් දක්වා වැඩි කරලා තිබෙනවා ගිය අය වැයත් එක්ක. ඒ නියෝග තමයි අද අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ.

ගරු කථානායකතුමනි, තේ ක්ෂේත්‍රය ගැන අපි තවදුරටත් විග්‍රහයක් කරනවා නම් අද තේ ක්ෂේත්‍රය නඟා සිටුවන්න තවත් වැඩ පිළිවෙළවල් ගණනාවක් අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත අපේ රජයෙන්, අපේ අමාත්‍යාංශයෙන් දැන් ක්‍රියාත්මක කරන්න පටන් අරගෙන තිබෙන බව කියන්නට කැමැතියි. විශේෂයෙන් මා නැවත වරක් කියන්න කැමැතියි, පොහොර සහනාධාරය ගැන. තේ මිල ඉහළ මට්ටමක තිබුණත් අතිගරු

ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි තවදුරටත් තේ පොහොර සහනාධාරය ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපි තීරණය කරලා තිබෙනවා. මා හිතන විධියට බිලියන 7.5ක පමණ අතිවිශාල මුදලක් රජයෙන් වෙන් කරලා තිබෙනවා මේ පොහොර සහනාධාරය තවදුරටත් ක්‍රියාත්මක කරන්න. කුඩා තේ වතු හිමියන්ටත් දැන් එක එක තැන්වලට ගිහිල්ලා රිසිට් පත් කුවිතාන්සි ගන්න ඕනෑ නැහැ, තමන්ගේ තේ වත්ත අවට තිබෙන ඕනෑම කඩයකට ගිහිල්ලා තමන්ට උවමනා පොහොර බෑග් එකක් රුපියල් 1,300ක් ගෙවලා ගන්න පුළුවන් තත්ත්වයක් විනිවිදභාවයෙන් යුතුව අපි ක්‍රියාත්මක කර තිබෙනවා.

මම රට පුරා තිබෙන කුඩා තේ වතු සමිති සාමාජිකයන් හම්බ වෙන්න ගියාම ඒ අය මට ඉදිරිපත් කරපු පළමුවැනි ඉල්ලීම තමයි ඒ අයට දෙන පොහොරවල සංයුතිය මීට වඩා හොඳ තත්ත්වයකට පරිවර්තනය කරලා දෙන්නය කියන එක. ඒ කියන්නේ ඵලදායිතාව වැඩි කරන්න පුළුවන් පොහොර සංයුතියක් ලබා දෙන්නය කියලා මට ඉල්ලීමක් කළා. ඊට පස්සේ මම ඇවිල්ලා අතිගරු ජනාධිපතිතුමාත් එක්ක ඒ පිළිබඳව කථා කළාම අතිගරු ජනාධිපතිතුමා කිව්වා, අපි පොහොර දෙනවා නම් ඵලදායිතාව උපරිම වශයෙන් වැඩි කරන්න පුළුවන් පොහොර බෑග් එකක් තමයි දෙන්න ඕනෑ කියලා. ඒ නිසා ඒ පොහොරවල සංයුතියේ අඩු පාඩු තිබෙනවා නම් ඒවා හරිගස්සන්න තේ පර්යේෂණ ආයතනයට කියන්නය කියා එතුමා කිව්වා. අපි තේ පර්යේෂණායතනයට කතා කරලා, ඒ පොහොරවල සංයුතිය වෙනස් කළා. පසුගිය සැප්තැම්බර් මාසයේ පටන් පොහොරවල අලුත් සංයුතියක් තමයි තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, අලුත් පොහොර සංයුතියක් ඇති කිරීම සඳහා අපට වැඩිපුර මුදලක් ගෙවන්න සිද්ධ වුණා. ඒ වුණත් ජනාධිපතිතුමා ඒ සඳහා අනුමැතිය ලබා දී පොහොර සහනාධාරය සඳහා අතිවිශාල මුදලක් ලබා දී තිබෙනවා. එවැනි විවිධ මාර්ග හරහා තේ ක්ෂේත්‍රය නඟා සිටුවන්න විශාල පියවරක් අරගෙන තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

අපනයනය කරන තේ සඳහා වෙන්දේසියේදී වැඩිපුර මුදලක් ලබා ගැනීමේ පරමාර්ථය ඇතිව මේ වන කොට විශාල මුදලක් බද්දක් වශයෙන් අය කර තිබෙනවා. හෙට අනිද්දා වන කොට මම ඒ බද්ද පිළිබඳ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. මේ වන කොටත් ඒ බදු මුදල් එකතු කරන්න පටන් අරගෙන තිබෙනවා. පනත අනුව ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අපට කාල සීමාවක් තිබෙනවා. පහුගිය මාස හය හත තුළ පමණක් ඒ බද්ද හරහා මිලියන 800ක් අපි එක්කාසු කර තිබෙනවා, අපේ තේවල ගුණාත්මකභාවය තවදුරටත් ප්‍රචලිත කිරීම සඳහා ජාත්‍යන්තර වශයෙන් විශාල වැඩ පිළිවෙළක් ගෙන යන්න. ඒ වැඩ පිළිවෙළ හරියට ක්‍රියාත්මක කරන්න පටන් ගත්තාම අවුරුද්දකට ඇමෙරිකන් ඩොලර් මිලියන 10ක් එහෙම නැත්නම් රුපියල් බිලියන එකක් -මිලියන 1000ක්- තේ මණ්ඩලයට ලබා ගන්න පුළුවන්. ඒ වැඩ පිළිවෙළට අපි දැන් ගිහින් තිබෙනවා. භාණ්ඩාගාරයෙන් ඉල්ලන්නේ නැතිව අපි ඒ මුදල එකතු කර ගන්න මේ වන කොටත් පටන් අරගෙන තිබෙනවා.

තේ පිළිබඳ හොඳ වැඩ පිළිවෙළක් ලෝකයේ ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වනවා. රුසියාව තුළ අපේ තේ ප්‍රසිද්ධ කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා. මැද පෙරදිග රටවල අවශ්‍ය ප්‍රචාරක වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා. බටහිර රටවලට අවශ්‍ය ප්‍රචාරක වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වනවා. අපේ රටේ නිෂ්පාදනය කරන තේ සඳහා ඉදිරියේදී අතිවිශාල ඉල්ලුමක් ලැබේවිය කියා මා විශ්වාස කරනවා. මොකද, චීනයේ ජනගහනය, ඒ අයගේ ආර්ථික දියුණුව, ඒ අයගේ ආදායම දිහා බැලුවාම විශේෂයෙන්ම චීනයට අපේ තේ මිල දී ගැනීමේ හැකියාවක් තිබෙන බව අපට පෙනෙනවා. ඉදිරියේදී ඒක ඊටත් වඩා වැඩි වෙනවා. ඒ වැඩ පිළිවෙළට අවතීර්ණ වන්නටත් අපි බලාපොරොත්තු වෙනවා. අපේ තේ සඳහා ප්‍රචාරක වැඩ පිළිවෙළක් තවම ඇමෙරිකාවේ ආරම්භ කළේ නැහැ. ඒ නිසා ඇමෙරිකාවේත් එවැනි ප්‍රචාරක වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වනවා.

ගරු කථානායකතුමනි, මේ ඔක්කොම කරන කොට අපේ තේ ඉල්ලුම වැඩි වනවා. එතකොට ඒ රටවල වෙන්දේසියෙන් අපට ලැබෙන මුදලත් වැඩිදියුණු කරන්න පුළුවන්. දැනට අපි අනුගමනය කරන සූත්‍රය දිහා බැලුවාම වෙන්දේසියෙන් ලැබෙන මුදලින් සියයට 68ක් කෙළින්ම ලැබෙන්නේ කුඩා තේ වතු හිමියන්ටයි. කර්මාන්තශාලාවලට යන්නේ සියයට 32යි. වෙන්දේසියෙන් වැඩිපුර මුදලක් ලැබෙනවාය කියන්නේ ඒ වැඩිපුර මුදලින් සියයට 68ක් කුඩා තේ වතු හිමියන්ට යනවාය කියන එකයි. එතකොට ඒ හරහාත් කුඩා තේ වතු හිමියාගේ අතට වැඩිපුර මුදලක් ලැබීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්කම ලැබෙනවා.

ගරු කථානායකතුමනි, මේ හැම පැත්තක් සම්බන්ධයෙන්ම අපි බොහොම වග කීමකින් කටයුතු කරනවා. අපි ඉදිරියේදී විදේශ විනිමය වැඩි කරන්න කටයුතු කරනවා. ඇත්ත වශයෙන්ම මේ වන කොටත් තේවලින් පමණක් ඇමෙරිකන් ඩොලර් බිලියන 1.5ක විදේශ විනිමයක් ලංකාව ලබා ගන්නවා. පිට රට වැඩ කරන අපේ ශ්‍රමිකයන් තමයි වැඩිපුරම විදේශ විනිමය ප්‍රමාණයක් එවන්නේ.

ඊ ළඟට, නිමි ඇඳුම් ක්ෂේත්‍රය. හැබැයි නිමි ඇඳුම් ක්ෂේත්‍රය ගැන කථා කරන කොට ලංකාවේ නිෂ්පාදනයන්ගෙන් ලැබෙන වටිනාකමක් නොවෙයි ඒක. පිට රටින් නොයෙකුත් භාණ්ඩ ගෙන්වලා, මෙහිදී නිමි ඇඳුම් හදලායි පිට රට යවන්නේ.

තේ ක්ෂේත්‍රය ගත්තොත් අද තේ ක්ෂේත්‍රය තුන්වන තැනට ඇවිත් තිබෙනවා. රබර් ගත්තොත් අපි තවම සියයට 30යි පිට රට යවන්නේ. හැබැයි ඒ පැත්තෙනුත් අපනයන ක්ෂේත්‍රයෙන් වර්ෂයකට ඇමෙරිකානු ඩොලර් මිලියන 700ක්, 800ක් අපි ලබා ගන්නවා. ඉතින් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන කොට අපේ තේවලට වැඩිපුර මුදලක් ලබා ගන්න හැකියාව ලැබෙනවා. නිෂ්පාදනය වැඩි කරලා, ඵලදායිතාව වැඩි කරලා මීට වඩා විශාල ප්‍රමාණයක් පිට රට යවන කොට වැඩි කාලයක් යන්න කලින් අපේ විදේශ විනිමය අනිවාර්යයෙන්ම මීට වඩා ඉහළ යන තත්ත්වයක් අපට පෙන්වන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි. තේ ගැන කථා කරන කොට අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. ජනාධිපතිතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වනවා, එතුමා ප්‍රථම වතාවට අලුත් වගාවට රුපියල් 50,000ක සහනයක් ලබා දෙන්න පසු ගිය අය වැයෙන් යෝජනා කිරීම ගැන. දැන් අපි අලුත් වගාව ක්‍රියාත්මක කරනවා. අපි එතැනින් නැවතුණේ නැහැ, ගරු කථානායකතුමනි. ජනාධිපතිතුමා ගිය වර අය වැයෙන් එම යෝජනාව ඉදිරිපත් කරලා, ලොකු වතු කොම්පැනිවලට මාස හයක් කල් දුන්නා, වවා නැති හිස් ඉඩම්වල වවන්න පටන් ගන්න. ඒ මාස හය දැන් ඉවරයි. මේ වන කොටත් අපේ අමාත්‍යාංශයෙන් හැම වත්තකටම ගිහින් වැවිල්ලක් නැති ඉඩම් කොහේද තිබෙන්නේ කියලා ලේඛනයක් සකස් කළා. දැන් අපේ ළඟ එම සංඛ්‍යා ලේඛන තිබෙනවා. සමස්තයක් හැටියට මට කියන්න පුළුවන්, ලොකු වතු කොම්පැනිවල තවම වැවිල්ලක් නැති ඉඩම් හෙක්ටයාර 15,000ත්, 20,000ත් අතර ප්‍රමාණයක් තිබෙනවාය කියලා.

ජනාධිපතිතුමාගේ උපදෙස් මත හෙට, අනිද්දා වන විට විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වනවා හිස් ඉඩම්වල වැවිලි කටයුතු කරන්න. තේ වවන්න පුළුවන්, රබර් වවන්න පුළුවන්, පලතුරු වවන්න පුළුවන්, එළවලු වවන්න පුළුවන්, අපට ඕනෑ කරන්නේ හැම ක්ෂේත්‍රයකින්ම රටේ නිෂ්පාදනය වැඩි කරන්නයි. රටේ නිෂ්පාදනය වැඩි කිරීම රටේ උද්ධමනයට දෙන්න තිබෙන හොඳම උත්තරයයි. ජනාධිපතිතුමාගේ උපදෙස් මත හිස්

[ගරු මහින්ද සමරසිංහ මහතා]

වතු ඉඩම්වල යම් කිසි වැවිල්ලක් කරන්න සූදානම් අයට එම හිස් ඉඩම් බෙදා දීමේ වැඩ පිළිවෙළක් අපේ රජයෙන් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වනවා. ඒ වැඩ පිළිවෙළත් එක්ක තමයි අලුත් වැවිල්ල සඳහා ජනාධිපතිතුමා පළමුවන වතාවට රුපියල් 50,000ක් ලබා දෙන්න මේ වන කොටත් කටයුතු කරලා තිබෙන්නේ.

අපි දැන් අලුතින් තවාන් පටන් ගෙන තිබෙනවා. මොකද, අලුත් වැවිල්ලට යන කොට හොඳ ප්‍රමිතියක් තිබෙන තේ පැළ ලබා දෙන්න සිද්ධ වනවා. ඉතින් හැම පැත්තකින්ම හොඳ සම්බන්ධීකරණයකින් අපි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න මේ වන කොටත් පටන් ගෙන තිබෙනවාය කියන එක බොහොම සන්තෝෂයෙන් ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ. භා. 2.32 ]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, මා හිතන හැටියට අද අපේ ශ්‍රී ලංකා ආර්ථිකයට ඉතා වැදගත් මාතෘකාවක් වන තේ හා රබර් වතු සංවර්ධනය ගැන කථා කරන්නට නියමිතව තිබෙනවා.

තේ හා රබර් කර්මාන්තය දියුණු කරන්නේ කොහොමද, ඒවාට අවශ්‍ය සහන සපයන්නේ කොහොමද කියලා අපේ ඇමතිතුමා දීර්ඝ විස්තරයක් කළා. මේ රජය පත් වෙලා දැන් දීර්ඝ කාලයක් වෙනවා. නමුත් මේ දීර්ඝ කාලය තුළ මේ සංවර්ධනය ක්‍රියාත්මක කරන්නට එතුමන්ලා අපොහොසත් වෙලා තිබෙනවා. අද වන කොට මැදපෙරදිග ලිබියාව වාගේ රටවල ඇති වෙලා තිබෙන යුද්ධය නිසා අපේ තේ කර්මාන්තයට විශාල පහරක් වැදිලා තිබෙනවා.

ඇමතිතුමා ඒ කරුණු සියල්ලම අද කිව්වත් තේ වතුවලට බලපාන එක් කාරණයක් කියන්නට එතුමාට අමතක වුණා. ඒක තමයි වතුකරයේ පැතිරී ගෙන යන "ග්‍රීස් යකාගේ" භීතිකාව. අද වන කොට බදුල්ල දිස්ත්‍රික්කයේ වතුවල පුද්ගලයෝ ඝාතනය වෙලා තිබෙනවා. ඒක දැන් නැඟෙනහිර පළාතට, ඒ වාගේම පුත්තලම් දිස්ත්‍රික්කයට පැතිරිලා තිබෙනවා. පෙරේදා වන කොට කල්පිටිය ප්‍රදේශයේදී පෙරුමාල් සිවකුමාර් කියන පුද්ගලයාට හමුදාව විසින් පහර දීලා ඔහු මිය ගිහිල්ලා තිබෙනවා. ඔහුගේ නෑදැයෝ, හිත මිතුරෝ ගිහිල්ලා ග්‍රීස් යකෙක් ඒ පළාතේ ඉන්නවා කියලා ඒ පොලීසියට පැමිණිලි කළත් පොලීසිය නීතිය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වෙලා තිබෙනවා. ඉතින් අපට අහන්න සිද්ධ වෙනවා මේ රජය මොකක්ද මේ පිළිබඳව ගන්නා පියවර කියලා. අද වන කොට අපේ මුස්ලිම් සහ දෙමළ ජාතීන් ඉන්න ප්‍රදේශවල විශාල වශයෙන් මේ භීතිකාව පැතිරෙන්න පටන් අරගෙන තිබෙනවා. අද රජයේ උත්තරය වෙලා තිබෙන්නේ, හමුදාව ඒ පැතිවලට යවලා අහිංසක ජනයාගේ කටවල් වහලා මේක යටපත් කිරීමයි. ඉතින් මා හිතන්නේ- [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
තමුන්නාන්සේ වැරැදියි.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මොකක්ද වැරැද්ද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
No, no. You speak later. This is not your turn.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා කථා කරනවා. එතුමාගේ කථාව කරන්න ඉඩ දෙන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
එතුමා "බාධා කරන මන්ත්‍රී" කියලා අපි කියනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා කථා කරන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ග්‍රීස් යකා කියලා කිව්වේ මන්ත්‍රීතුමාට නොවෙයි.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ග්‍රීස් යකා කියලා මන්ත්‍රීතුමාට නොවෙයි කිව්වේ. ඒ හින්දා පොඩ්ඩක් අහගෙන ඉන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඔබතුමා-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔය පැත්තෙ ග්‍රීස් යකා ඔබතුමා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ග්‍රීස් යකා හොයා ගන්නවා වෙනුවට අද ග්‍රීස් යකා ගැන කථා කරන පුද්ගලයෝ නවත්වන්න කටයුතු කරලා තිබෙනවා. මම හිතන්නේ ඔබතුමන්ලාත් දකින්න ඇති, මෑතක ඉඳලා මාධ්‍යයේ සමහර නම් කියැවෙන කොට ඒක වහන්න "බීප්, බීප්" කියන ශබ්දය යනවා. මම හිතන්නේ තව ටිකක් දවස් යන කොට ග්‍රීස් යකා කියන කොටත් "බීප්, බීප්" කියන ශබ්දය යයිද දන්නේ නැහැ. මේ රජය කටයුතු කරන්නේ ඒ වාගේ තමයි. ඉතින් මම හිතන්නේ අද- [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ග්‍රීස් යක්කු ඉන්නේ සිරිකොතේ.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
සිරිකොතේද? ඇයි පුත්තලමේ නැද්ද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මේ පැත්තෙන් පැන්නුවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
පුත්තලමෙත් ඉන්නවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මේ පැත්තෙ ඉඳලා අපි ඔය පැත්තට පැන්නුවා. දැන් ඔය පැත්තෙ ඉන්නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
තවමත්- [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔය කෑ ගහන්නේ ග්‍රීස් යක්කු තමයි.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ග්‍රීස් යක්කු තමයි කෑ ගහන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ග්‍රීස් ගහක ඉඳලා තමයි පැන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අපි හොයන්නේ බූරු යකා නොවෙයි ග්‍රීස් යකාව.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, අද වන කොට ශ්‍රී ලංකාවේ ජනතාවට විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා කවුද මේක පිටු පස්සේ ඉන්නේ කියලා. මේ පිටුපස ඉන්නේ රජයේ පාර්ශ්වයක්ද නැත්නම් වෙනත් හස්තයක්ද කියලා අද රටට හෙළි කරන්න මේ රජයට බැරි වෙලා තිබෙනවා.

මෙච්චර විශාල පොලිස් හමුදාවක්; ආරක්ෂක හමුදාවක් ඉන්න රටක අද මේ ග්‍රීස් යකා අල්ලා ගන්න බැරිව උදේ ඉඳලා රෑ වෙනකන් එක එක ප්‍රවෘත්ති මවා පානවා. ඊයේ රාත්‍රියේත් කල්පිටිය ප්‍රදේශයේදී හමුදාව පැනලා පාරේ යන වැසියන්ට පවා ප්‍රහාර එල්ල කරන්නට පටන් අරගෙන තිබෙනවා. ඒ වැසියන්ට තමන්ගේ එදිනෙදා කටයුතුවත් කර ගන්නට බැහැ. රෑ වෙනකොට ඔවුන්ව ගෙවල් තුළට කිරීමේ සූදානමක් වැඩ පිළිවෙළක් අද ක්‍රියාත්මක වෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
නේ, රබර් ගැන කථා කරන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
නේ, රබර් ගැන තමයි කථා කරන්නේ. [බාධා කිරීමක්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බූරු යකා නොවෙයි ග්‍රීස් යකා. [බාධා කිරීමක්]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ඒක ගැන තමයි කථා කරන්නේ. ගරු කථානායකතුමනි, මේ වෙලාවේදී අපනයනය ගැන විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මොකද, අපට නේ දළු කඩන්න බැහැ. [බාධා කිරීමක්] මවා ගන්නවා නොවෙයි. ඔය ගොල්ලනුයි මවලා තියෙන්නේ. ඒකයි වැඩේ වෙලා තියෙන්නේ. ඔය ගොල්ලනුයි මවලා තියෙන්නේ. අපේ සැකයක් තිබෙනවා, හදිසි නීතිය දීර්ඝ කිරීමට මේ ග්‍රීස් යකා මැව්වාද කියලා. අපේ ජනතාව තුළ මේ ග්‍රීස් යකා ගැන විශාල බියක් තිබෙනවා. වතුකරයේ ජනතාව අතර විශාල භීතියක් පතුරුවලා හදිසි නීතිය දීර්ඝ කිරීමට ඒ වැඩ පිළිවෙළ යනවා නම් අපි ඒක හෙළා දකින බව මා මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, according to the Standing Orders -

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Do not disturb him.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්] එතුමා බාධා කරනවා. මේක වතුකරයට බලපාන ප්‍රශ්නයක්. එතුමාව මෙතැනට එවලා තිබෙන්නේ අපට බාධා කරන්නයි. එක්කෝ එතුමාට ඇමතිකමක් දීලා -"බාධා ඇමති" කියලා- වෙන කොහාට හරි යවන්න ඕනෑ. මෙතැනට ඇවිල්ලා අපට බාධා කරනවා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පුත්තලම ගැන කථා කරන්න. ඔබතුමා පුත්තලමේ පුද්ගලයෙක්. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපනයනයට මේක බලපානවා. මොකද, ග්‍රීස් යක්කු නිසා තේ දළු කඩන්න මිනිස්සු බය වෙලා ඉන්නවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
හවස 4.00න් පස්සේ තේ දළු කඩන්න බැහැ. ග්‍රීස් යක්කුයි තාර යක්කුයි හැම එකාම පාරට බහිනවා. [බාධා කිරීමක්] අපි නොවෙයි ඔබතුමිය. ග්‍රීස් යකා ඔබතුමිය. [බාධා කිරීමක්]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
එතුමා පුත්තලමෙන් ඇවිල්ලා අද පුත්තලමේ තිබෙන ප්‍රශ්න ගැන කථා කරන්නේ නැතිව අද ආණ්ඩුවට කඬේ යන මන්ත්‍රීවරයෙක් බවට පත් වෙලා තිබෙනවා. එතුමා ඒක නිවැරදි කර ගන්න ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ගරු මන්ත්‍රීතුමාගේ කරුණු ඉදිරිපත් කරන්න බැරි වෙනවා. කථා කරන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, මට බාධා කරනවා. එතුමා හැමදාම ඇවිල්ලා අපට බාධා කරනවා. මේකේ ඉවරයක් තියෙන්න ඕනෑ. ඒකයි අපි කියන්නේ. [බාධා කිරීමක්] ග්‍රීස් යකාට මොනවා හරි - [බාධා කිරීමක්] බූරු යකා කෑ ගහනවා. ඒකයි වැඩේ වෙලා තියෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව මිනිත්තු දෙකයි තියෙන්නේ.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, අපට දැනට වාර්තා වෙලා තිබෙනවා, මේ ග්‍රීස් යක්කු පංගුවක් වෙලාවට මේ වැසියන්ව බිය කරලා නාවික හමුදා කඳවුරු පැත්තට දුවනවා කියලා. මා හිතන්නේ රජය ඒ ගැන කිසිම පරීක්ෂණයක් කරන්නේ නැතිව අපේ ජනතාවට නොයෙකුත් තාඩන පීඩන එල්ල කරමින් ඒ ජනතාව නිශ්ශබ්ද කිරීමේ ව්‍යාපාරයක් අද කර ගෙන යනවා. අද ලංකාවේ නොයෙක් කටකතා පැතිරිලා තිබෙනවා. සමහරු කියනවා, අපලයක් දුරු කර ගන්න කාන්තාවන්ගෙන් ලේ අරගන්න මේ ග්‍රීස් යක්කු නිර්මාණය කර තිබෙනවාය කියලා; ඒ වාගේ එක එක වැඩ කරන්න මේ ග්‍රීස් යක්කු නිර්මාණය කර තිබෙනවාය කියලා. මේ ග්‍රීස් යක්කු රජය විසින්ම නිර්මාණය කර තිබෙන බවට අද කට කතා පැතිරිලා තිබෙනවා. ඔබතුමන්ලා ඒ ගැන අවධානයක් යොමු කරන්නේ නැතිව ඒ ග්‍රීස් යක්කු අල්ලා ගන්න කිසිම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැතිව ප්‍රවෘත්ති සාකච්ඡා පවත්වමින් ඉන්නවා.

මේ වෙලාවේ ලංකාවේ නීතිය හා සාමය බිඳ වැටිලා තිබෙනවාය කියන එක අපි අවධාරණය කරන්න ඕනෑ. මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ විශේෂයෙන්ම ස්වාධීන කොමිෂන් සභා මේ රජය විසින් අහෝසි කරපු හින්දායි. ඒ ස්වාධීන කොමිෂන් සභාවලින් කරන්න තිබෙන කාර්ය භාරය අද අපේ රටට අහිමි වෙලා තිබෙනවා. ඒ වගකීම රජයේ සිටින සියලු දෙනාම - විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ ඉඳලා සියලු දෙනාම- බාර ගත යුතුයි කියලා මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. [බාධා කිරීම්] ඔව්, ඔව්. ග්‍රීස් යකා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ඒ නිසා මේ අවස්ථාවේ ඒ සියලුම කරුණු ගැන නැවතත් මතක් කරමින්, විශේෂයෙන්ම අපේ ජනතාවට අසත්‍ය චෝදනා දමලා අත් අඩංගුවට ගන්න එපා කියමින් මගේ කථාව අවසන් කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ අවස්ථාවේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව පැවැත්වෙනවා. ඔය කරුණු කියන්න ඒකට ගියා නම් හොඳයි.

[අ. භා. 2.43]

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ කාරණය කියනවා. දැන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව පැවැත්වෙනවා. ග්‍රීස් යක්කු ගැන ඔබතුමන්ලා කියපු බොරු ගැන දැන ගන්න එතැනට යන්න. [බාධා කිරීම්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එතැනට යන්න බැහැ.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ඒ රැස්වීමේ ජනාධිපතිතුමාත් ඉන්නවා. ඒ නිසා යන්න. [බාධා කිරීම්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please!

කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார் ] தலைமை வகித்தார்கள்.*
*Whereupon MR. SPEAKER left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR ] *took the Chair.*

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රබර් සම්බන්ධයෙන් මෙතෙක් කිලෝග්‍රෑමයකට රුපියල් 8ක්ව තිබුණු සෙස් බද්ද රුපියල් 12ක් දක්වා වැඩි කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන නියෝග සම්බන්ධයෙන් සහ විශේෂයෙන්ම අද අපේ රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙන තේ වගාකරුවන්ට ලබා දෙන සහන පිළිබඳවත් වචන කිහිපයක් කථා කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මා පළමුවෙන්ම සන්තෝෂ වනවා.

විශේෂයෙන්ම රබර් සඳහා වන සෙස් බද්ද අපනයනට පමණක් සීමා වන පරිදි පැනවීම තුළින් අපේ රටේ රබර් ගොවියාට විශාල සහනයක් ලැබෙනවා වාගේම, ආර්ථිකයට ලොකු රුකුලක් ලැබෙන බව උදාහරණ සහිතව පෙන්වා දෙන්නට කැමැතියි. කුඩා රබර් වතු හිමියන්ට මෙමඟින් සහන රාශියක් ලැබෙන බව විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ.

පසු ගිය අය වැය අවස්ථාවේදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අපේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දීමේ අදහසින් අපේ රටේ අපනයන භෝග වගා කරන ගොවීන් ශක්තිමත් කිරීම සඳහා සහන රාශියක් ලබා දීමේ වැඩ පිළිවෙළක් දිවයින පුරාම ක්‍රියාත්මක කළා. ඒ වැඩ පිළිවෙළ තුළ මේ වන විට අපේ ප්‍රදේශවල -මොණරාගල වැනි දිස්ත්‍රික්කවල- ඉතාම සාර්ථකව රබර් වගාව සහ තේ වගාව කර ගෙන යනවා. ඒ අයට මේ වගාවන් සාර්ථකව කර ගෙන යන්නටත්, ඒ තුළින් විශාල ආදායමක් ලබා ගන්නටත් හැකි වන පරිදි ඒ සහන දිගින් දිගටම ලබා දෙන්නට අතිගරු ජනාධිපතිතුමා කටයුතු කර තිබෙනවා. පොහොර සහනාධාරය ලබා දෙන්නේ රබර් සහ තේ සඳහා විතරක් නොවෙයි. පොල් වගාවේ සංවර්ධනයටත් පොහොර සහනාධාරය ලබා දෙනවා. මේ වන විට පොහොසත් දුප්පත් කියලා භේදයක් නැතිව සියලුම ගොවීන්ට ලබා ගත හැකි ආකාරයට රුපියල් 1,200ක මිලකට පොහොර මිටියක් ලබා දෙන්නට කටයුතු කර තිබෙනවා. ඒ වාගේම රුපියල් 1,300කට මිශ්‍ර පොහොර මිටියක් ලබා ගන්නටත් අද හැකියාව ලැබී තිබෙනවා.

මම විශේෂයෙන්ම සඳහන් කරන්නට කැමැතියි, ලැබෙන පහසුකම් වැඩි නිසා මොණරාගල දිස්ත්‍රික්කයේ රබර්, තේ සහ පොල් වගා කළ හැකි ඉඩම්වල ඒ වගා කටයුතු කරන්නට ගොවීන් විශාල වශයෙන් නැඹුරු වෙලා සිටින බව. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ මේ වන විට මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර් 10,000කට වැඩි ප්‍රමාණයක් අලුතින් රබර් වගා කර තිබෙනවා.

කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ IFAD ව්‍යාපෘතිය මඟින් මේ වෙන කොට හෙක්ටයාර 5,000ක් වගා කිරීමට සැලසුම් කර තිබෙනවා. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව දෙනවාටත් වඩා වැඩි සහනාධාර ප්‍රමාණයක් මේ IFAD ව්‍යාපෘතිය යටතේ ගොවීන්ට ලබා දීලා තිබෙනවා. ඒ යටතේ හෙක්ටයාර 3,000ක් මේ වෙන කොට වගා කරලා තිබෙනවා. මේ ව්‍යාපෘතිය යටතේ වගා කිරීමට තවත් ගොවීන් රාශියකට මේ වෙන කොට ඉඩම් ලබා දෙමින් අපේ ප්‍රදේශයේ ඒ කටයුතු කරගෙන යනවා.

ඒ වාගේම වගා කිරීම සඳහා ගොවියකුට හෙක්ටෙයාර එකකට රුපියල් 1,25,000ක සහනාධාරයක් රජය මඟින් මේ ව්‍යාපෘතිය යටතේ ලබා දීලා තිබෙනවා. මේ වෙන කොට අක්කර එකකින් ගොවියකුට රුපියල් 50,000ක ආදායමක් ලබා ගන්නට පුළුවන්කම ලැබිලා තිබෙනවා. තව වසර තුනක පමණ කාලයකදී මොනරාගල දිස්ත්‍රික්කයේ සුළු ගොවීන් 10,000ක් පමණ ඉහළ ආදායම් ලබන පිරිසක් බවට මෙමඟින් පත් වෙනවා. මේ ව්‍යාපෘතිය යටතේ ගොවීන් ශක්තිමත් කරනවා වාගේම ඒ ප්‍රදේශවල යටිතල පහසුකම් නඟා සිටුවීමත් -විශේෂයෙන්ම මාර්ග, ළිං, ප්‍රජා ශාලා ඉදි කිරීම්- සුළු ව්‍යාපාරිකයන් පුහුණු කිරීමේ කටයුතු හා ණය ආධාර ලබා දීමේ කටයුතුත් කරනවා. ප්‍රදේශයේ දුප්පත්කම තුරන් කිරීම සඳහා රබර් වගාව තුළින් විශාල මෙහෙයක් මේ වෙන කොට සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ දිස්ත්‍රික්කය ගත්තාම, වැල්ලවාය, සියඹලාණ්ඩුව වැනි ප්‍රදේශ දැඩි නියඟය නිසා බොහෝ අවස්ථාවලදී පීඩාවට පත් වන ප්‍රදේශයක්. නමුත් මේ රබර් වගාව වැඩි වශයෙන් ව්‍යාප්ත වීම තුළ විශාල දේශගුණික වෙනස්වීමක් ඇති වෙලා, වියළි කාලගුණය අඩු වෙලා අපේ ප්‍රදේශවලට හොඳ දේශගුණික තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මොනරාගල දිස්ත්‍රික්කයේ තවදුරටත් රබර් වගාව ව්‍යාප්ත කරන්න පුළුවන් රජයේ ඉඩම් තිබෙනවා. වන වගාවකටත් ඉතාම සුදුසු වගාවක් හැටියට රබර් වගා කරන්න පුළුවන්කම තිබෙන නිසා මේ වෙන කොට රජයට අයත් සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වලිනුත් ගොවීන් සඳහා ඉඩම් ලබා දීමට කටයුතු කරනවා, විශේෂයෙන්ම ඒ තුළින් දේශගුණික තත්ත්වය ආරක්ෂා වන නිසා. දැනට ගැටලුව වී ඇත්තේ රබර් පැළ හිඟයක් තිබෙන එකයි. මීට වඩා උනන්දුවකින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව රබර් පැළ තවාන් වැඩිදියුණු කළොත් විශාල ප්‍රදේශයක ගොවීන් සඳහා ඒ රබර් පැළ ලබා දෙන්නට පුළුවන්කම තිබෙනවා.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය මොනරාගල ප්‍රදේශයෙන් දැනට මාසිකව මිලියන 50ක ආදායමක් මේ තුළින් ලබනවා. මෙය ඉහළ මට්ටමක ආදායමක් හැටියට අප දකිනවා. අපේ රටට අවශ්‍ය රබර් නිෂ්පාදනයෙන් දැනට සම්පූර්ණ වෙලා තිබෙන්නේ සියයට 65ක් පමණයි. ඒ නිසා රබර් වගාවට අවශ්‍ය යටිතල පහසුකම් තවත් සංවර්ධනය කළ යුතුයි. දැනට අපේ රටේ නිෂ්පාදනය වන රබර්වලින් සියයට 70ක් පමණ අපේ රටේ ප්‍රයෝජනයට ගන්නා අතර, සියයට 30ක පමණ ප්‍රමාණයක් තමයි අපි අපනයනය කරන්නේ. අපේ රබර් වගාව ඉදිරියේදී සංවර්ධනය වෙන කොට මීට වඩා වැඩි ප්‍රමාණයක් අපනයනය කරන්නට අපට පුළුවන්කම ලැබෙයි. විශේෂයෙන්ම කුඩා වැවිලි ව්‍යවසායකත්ව වැඩසටහන තවදුරටත් දීර්ඝ කරලා, මීට වඩා සහන ලබා දෙමින් කටයුතු කළොත් අපේ රටේ වැඩිම ආදායමක් ලබන වගාවක් හැටියට රබර් වගාව ඉතාම ඉහළින් දියුණු කරන්න පුළුවන්කම තිබෙනවා.

අපේ ගරු අමාත්‍යතුමා ප්‍රකාශ කළ ආකාරයට දකුණු ප්‍රදේශයට සහ උඩරට ප්‍රදේශයට මෙන්ම අනිකුත් ප්‍රදේශවලටත් නැවත වගාව සඳහා පසු ගිය වර්ෂවල ලබා දුන්න මුදල් ප්‍රමාණයට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් තේ වගාව සඳහා මේ වසරේ ලබා දීලා තිබෙනවා. අපේ අතිගරු ජනාධිපතිතුමා කුඩා තේ වතු හිමියන්ගේ වගාව දියුණු කිරීම සඳහාත්, එමඟින් අපට ලැබෙන විදේශ විනිමය වැඩි වශයෙන් ලබා ගැනීමේ හැකියාව ඇති කර ගැනීම සඳහාත් bud කරපු අලුත් පැළ වගා කිරීමට මේ වර්ෂවල වැඩි මුදලක් ලබා දීලා තිබෙනවා. කලින් තිබුණු සහනාධාරය ලක්ෂ දෙක, දෙලක්ෂ හතළිස්දාහ, දෙලක්ෂ පනස්දාහ දක්වා ඒ ඒ ප්‍රදේශ අනුව වැඩි කරලා තිබෙනවා.

කුඩා තේ වතු හිමියන් ගැන බැලුවත් අපේ රටේ නොයෙකුත් ප්‍රදේශවල -විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කයේ- තිබුණු මුඩු බිම් වගා කිරීමේ ප්‍රවණතාව වැඩි කරමින් ගරු අමාත්‍යතුමා මේ වනකොට අමාත්‍යාංශයේ එම වැඩ පිළිවෙළ රට පුරාම ක්‍රියාත්මක කරන්නට කටයුතු කර තිබෙනවා. එතුමා සෑම දිස්ත්‍රික්කයකටම ගිහිල්ලා දිස්ත්‍රික්ක මට්ටමින් ඒ අදාළ නිලධාරින්ට උපදෙස් දෙමින්, ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාගේත් උපදෙස් ලබා ගනිමින්, අතිගරු ජනාධිපතිතුමා මඟින් සහනාධාර රාශියක් ගොවීන්ට ලබා දෙමින් ඒ සඳහා කටයුතු කර තිබෙනවා. මේ වැඩ පිළිවෙළ ශක්තිමත්ව ඉදිරියට ගෙන යන්නට එතුමා කටයුතු

[ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය ]

කරමින් සිටිනවා. මේ වනකොටත් විශාල ආදායමක් සාමාන්‍ය සුළු ගොවීන්ට සහ අනෙකුත් කර්මාන්තකරුවන්ට ලැබුණත්, ඔවුන්ට ලබා දෙන සහනාධාර ඇත්තෙන්ම අඩු කළේ නැහැ; එකක්වත් නතර කළේ නැහැ. ඒ ආධාර එකක්වත් නතර කරන්නේ නැතිව එලෙසින්ම ලබා දෙමින් ගොවියා තෘප්තිමත් වන විධියේ ආදායමක් ලබා ගත හැකි ආකාරයට කටයුතු කර තිබෙනවා.

තේ, රබර් වාගේම පොල් වගාව සඳහාත් ඒ විධියටම ආධාර ලබා දෙමින් කටයුතු කර තිබෙන නිසා අපේ රටේ ගොවීන් විශාල ආදායමක් ලබා ගන්නවා. ඒ වාගේම අපනයනය මත අය කරන සෙස් බද්ද - විශේෂයෙන්ම දැනට පවතින රුපියල් 8ක පමණ වන බද්ද - රුපියල් 12ක් දක්වා වැඩි කිරීම තුළින් ගොවියාට මීටත් වඩා සහන ලබා ගන්නට පුළුවන්කම තිබෙනවාය කියලා මා හිතනවා. ඒ නිසා ඒ තුළින්ද අපේ රටේ ආර්ථිකයට දායකත්වයක් ලැබෙනවා.

අපේ රටේ දසක ගණනාවක් තිස්සේ පැවැති යුද්ධය හමාර කරපු අතිගරු ජනාධිපතිතුමා මේ වනකොට රටේ මහා මාර්ග සහ අනෙකුත් යටිතල පහසුකම් සම්බන්ධයෙන් දැවැන්ත සංවර්ධනයක් ඇති කරමින් සිටිනවා. සෑම කටයුත්තක් සඳහාම අපට අවශ්‍ය වන දේවල් තමයි මහා මාර්ග පද්ධතිය, ඒ වාගේම ග්‍රාමීය මාර්ග පද්ධතිය සහ අනෙකුත් යටිතල පහසුකම්. මේ වනකොට ඒ යටිතල පහසුකම් සියල්ලත් සම්පූර්ණ කරමින් අපේ රජයේ වැඩ පිළිවෙළ ඉතාම සාර්ථකව ඉදිරියට ගෙන යමින් තිබෙනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරුන් අද කියන්නට දෙයක් නැතිව ඊයේ පෙරේදා මවා ගත්තු දෙයක් වන "ග්‍රීස් යකුන්" පිළිබඳව මෙතැන කෑගහනවා. රටේ සිදු වන සංවර්ධනය හෝ අනෙකුත් හොඳ වැඩ පිළිවෙළවල් පිළිබඳව කවදාවත් කථා කරන්නේ නැහැ. ඇත්තටම එතුමන්ලා ගිහිල්ලා බලනවා නම් හොඳයි, මොකක්ද මේ ගෙන යන වැඩ පිළිවෙළ කියලා. මේක පෞද්ගලික දෙයක් නොවෙයි. හැම කෙනෙකුටම බලපාන දෙයක්. එහෙම නම් ඒ පිළිබඳව එතුමන්ලාත් මැදිහත් වෙලා කටයුතු කරන්නට ඕනෑය කියලා එතුමන්ලාගෙන් මා මේ අවස්ථාවේ දී ඉල්ලීමක් කරනවා.

අපේ ගරු මහින්ද සමරසිංහ අමාත්‍යතුමා අද ඉදිරිපත් කර තිබෙන,විශේෂයෙන්ම අපේ රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය - සෙස් බද්ද- සහ කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ නියෝග අපි කවුරුත් එකඟ වෙලා සම්මත කොට අපේ රටේ සංර්ධනය පුළුල් කරන්නට, දියුණු කරන්නට කටයුතු කරමු කියා යෝජනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

[පි. ප. 2.56]

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டத்தின்கீழான கட்டளை மற்றும் தேயிலை சிறுபற்று நில அபிவிருத்திச் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மிகுந்த மகிழ்ச்சியடைகின்றேன். கிழக்கு மாகாணத்தைப் பொறுத்தவரை அங்கிருந்து கடல் மீன், வெற்றிலை, முத்து, கடலட்டை, முந்திரிப் பருப்பு போன்ற பொருட்கள் ஏற்றுமதி செய்யப்பட்டு வருகின்றன. ஆனால் இன்று முந்திரிப் பருப்பின் ஏற்றுமதி மிகவும் குறைவடைந்துள்ளது. காரணம் கடந்த கால யுத்த சூழ்நிலையால் பெருந்தொகையான முந்திரி மரங்கள் அழிக்கப்பட்டுவிட்டன. அதன் காரணமாக முந்திரி மரங்களை உருவாக்கி, அதனை அபிவிருத்தி செய்ய வேண்டிய அவசியம் எழுந்துள்ளது. அத்துடன் கிழக்கு மாகாணத்தில் குறிப்பாக மட்டக்களப்பு மாவட்டத்தில் அதிகரித்துக் காணப்பட்ட முந்திரிப் பருப்பின் ஏற்றுமதி, இப்பொழுது அடிமட்டத்துக்குச் சென்றுள்ளது.

அதுமட்டுமன்றி, எமது மட்டக்களப்பு மாவட்டத்தில் வெற்றிலை ஏற்றுமதியும் அதிகரித்துக் காணப்பட்டது. குறிப்பாக பாகிஸ்தான் போன்ற நாடுகள் எமது நாட்டு வெற்றிலையை விரும்பிப் பெறுகின்றன. இப்பொழுது இந்த வெற்றிலையை ஏற்றுமதி செய்வதில் சில தடங்கல்கள் ஏற்பட்டுள்ளன. காரணம், வெற்றிலைக் கொடி படரவிடப்படும் அலம்பல் கம்புகளை வெட்ட முடியாமையினால் வெற்றிலை உற்பத்தியாளர்கள் மிகுந்த சிரமப்படுகின்றனர். வனபரிபாலனச் சட்டத்தின்கீழான சில கட்டுப்பாடுகளால் அலம்பல் கம்புகளை வெட்டுவது மிகுந்த கஷ்டமாக இருப்பதனையும் இங்கு சுட்டிக்காட்ட விரும்பு கின்றேன். அடுத்ததாக, கடல் அட்டை பிடிக்கின்ற நிகழ்வு திருகோணமலையில் கூடுதலாகக் காணப்படுகின்றது. அதேபோன்று மட்டக்களப்பிலும் கடலட்டைகள் இருக்கின்றன. அவற்றையும் பெற்று இந்த ஏற்றுமதி வேலைத்திட்டத்தை அபிவிருத்தி செய்ய வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அத்துடன் இன்று திருகோணமலை மாவட்டத்திலிருந்துதான் அதிகளவிலான மீன் ஏற்றுமதி செய்யப்படுகின்றது. மட்டக்களப்பு மாவட்டத்திலிருந்தும் மீன் ஏற்றுமதி செய்யப்படுகின்றது. ஆனால், இன்று பெருந்தொகையான மீனவர்கள் பாரிய அசௌகரி யங்களை எதிர்நோக்கியிருக்கின்றனர். அதாவது, கடலுக்குச் சென்று மீன்பிடித்தொழிலை மேற்கொண்டிருந்த மீனவர்கள் இன்று அப்பிரதேசங்களில் மர்ம மனிதர்களின் நடமாட்டத்தின் காரணமாகத் தொழிலுக்குச் செல்ல முடியாத நிலையில் உள்ளார்கள். அங்குள்ள மக்கள் பயங்கரமான சூழலில் இருந்து கொண்டிருக்கின்றார்கள். அங்கு கடந்த 12ஆந் திகதி நடைபெற்ற சம்பவம் தொடர்பாக நாங்கள் 13 ஆந் திகதி மட்டக்களப்பிலுள்ள கழுவன்கேணி என்னும் பிரதேசத்துக்குச் சென்றிருந்தோம். அங்குள்ள நூறு வீதமான மக்களும் மீனவர்கள்தாம். அவர்கள் அன்று தொழிலுக்குச் செல்லாமல் இருந்தார்கள். அவர்கள், "இந்தப் பிரச்சினையைத் தீருங்கள்; நீங்கள் இந்தப் பிரச்சினையைத் தீர்த்த பின்னர்தான் நாங்கள் தொழிலுக்குச் செல்லலாம்; நாங்கள் எங்களுடைய மனைவியையும் வளர்ந்த பெண் பிள்ளைகளையும் வீட்டில் விட்டுவிட்டுத் தொழிலுக்குச் செல்ல அஞ்சுகின்றோம்" என எங்களிடம் தெரிவித்தார்கள். எனவே, இந்த மர்ம மனிதர்களின் பிரச்சினை பாரிய பிரச்சினையாக இருக்கின்றது. இதன் காரணமாக மட்டக்களப்பு மாவட்டத்திலுள்ள மக்களின் இயல்பு வாழ்க்கை பலவாறு பாதிக்கப்பட்டுள்ளது. நாங்கள் எவரையும் குறை கூற வரவில்லை. ஆனால், இத்தகைய பிரச்சினைகள் வருகின்ற பொழுது அவற்றைத் தீர்க்க வேண்டியது ஆளுங்கட்சி யினதும் எதிர்க்கட்சியினதும் கடமையாகும். நாங்கள் அனைவரும் ஒற்றுமையாக இருந்து ஒரு தீர்மானத்தை எடுத்து இந்தப் பிரச்சினையைத் தீர்க்க வேண்டும். இன்று இந்த மர்ம மனிதன் பிரச்சினையால் மட்டக்களப்பு மாவட்ட மக்கள் பாரிய கஷ்டங்களை எதிர்நோக்கிக்கொண்டிருக்கின்றார்கள். ஆனால், இந்த மர்ம மனிதர்கள் யார்? இவர்களை உருவாக்கியவர்கள் யார்? என்ற கேள்விகள் எழுந்துள்ளன. இன்று இந்த மர்ம மனிதர்களின் செயற்பாட்டின் காரணமாக பெண்கள் வீதிகளில் நடமாட முடியாத நிலைமையும் மாணவர்கள் பிரத்தியேக கல்வி நிலையங்களுக்குச் சென்று கல்வி கற்க முடியாத நிலைமையும் காணப்படுகிறது. சில தொழில் நிலையங்களுக்குக்கூட செல்வதற்குப் பெண்கள் பயப்படுகின்றார்கள். [இடையீடு] பிரபாகரனுடைய கதை தேவையில்லை. அது முடிந்த கதை! ஆனால், அரசாங்கத் தரப்பினர் மர்ம மனிதன் கதையை ஆராய்ந்து பார்க்க வேண்டுமென்று தீர்மானிக்காமல், அதற்கு எதிராகவே குரல்

கொடுப்பவர்களாக இருந்தால், அதன் பின்னணி அவர்களா? என்ற கேள்வி எழுகின்றது. இன்று மக்கள் தொழில்களுக்குச் செல்லமுடியாமல் பதற்றத்தில் உள்ளனர். கடந்த ஒரு சில நாட்களுக்கு முன்னர், மட்டக்களப்பு ஆதார வைத்தியசாலையின் தாதிமார் விடுதியில் இவ்வாறானதொரு பிரச்சினை ஏற்பட்டதன் காரணமாக அங்கிருந்து தாதியர்கள் வெளியேறியதனால் பல பிரச்சினைகள் ஏற்பட்டன. இவ்வாறு பல பகுதிகளில் பயங்கரமான சூழ்நிலை காணப்படுகின்றது. பெண்கள் மர்ம மனிதர்களால் தாக்கப்படும்போது, பொதுமக்கள் அம்மர்ம மனிதர்களைப் பிடிப்பதற்கென துரத்திச் சென்றால், அவர்கள் பொலிஸ் நிலையங்களுக்குள்ளும் இராணுவ முகாம்களுக்குள்ளும் நுழைகின்றார்கள் என்று மக்கள் எங்களிடம் முறையிடு கின்றார்கள். இவ்வாறு மர்ம மனிதனைப் பிடிப்பதற்காகத் துரத்திச் சென்ற வர்கள் பொலிஸாரினாலும் இராணுவத்தினராலும் தாக்கப் பட்டு, நீதிமன்றத்தில் நிறுத்தப்படுகின்றார்கள்; அவ்வாறான வர்களில் தற்பொழுது 50க்கும் மேற்பட்டவர்கள் பிணையில் விடுதலை செய்யப்பட்டிருக்கின்றார்கள். மட்டக்களப்பு மாவட்டத்தில் இதுவரை கிட்டத்தட்ட 16 பெண்கள் மர்ம மனிதர்களால் தாக்கப் பட்டிருக்கின்றார்கள். பாதுகாப்பு வழங்கவேண்டிய பொலிஸாரும் இராணுவமும் மக்களுக்குப் பாதுப்பு வழங்கத் தவறியதன் காரணமாக இன்று மக்கள் தற்பாதுகாப்புக் கருதி, பொல்லுகளை கைகளில் ஏந்தவேண்டிய நிலைக்குத் தள்ளப்பட்டுள்ளனர். மக்கள் சட்டத்தை கையில் எடுக்கமுடியாது; அதற்கு இடமளிக்க -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நான் ஒழுங்குப் பிரச்சினையொன்றை எழுப்புகின்றேன்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please!

**ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே,-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, ஒரு நிமிடம் பொறுங்கள்!

There is a point of Order being raised. Hon. Alhaj A.H.M. Azwer, what is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
சுவாமி அவர்களே, ஒரு நிமிடம் தாருங்கள்! தற்பொழுது, நான் ஒரு விடயத்தை இங்கே குறிப்பிட வேண்டும். அதாவது, இங்கு பாராளுமன்ற நிலையியற் கட்டளைகளுக்கு அமைவாகத்தான் பேசமுடியும்; அதற்குப் புறம்பாக பேசமுடியாது. தற்பொழுது நாங்கள் இங்கு விவாதிப்பது, தேயிலை சிறுபற்றுநில அபிவிருத்திச் சட்டத்தின் கீழான விடயங்கள் பற்றியதாகும். இது சம்பந்தமான பிரேரணை கௌரவ அமைச்சர் மாண்புமிகு மஹிந்த சமரசிங்க அவர்களால் முன்வைக்கப்பட்டது. கௌரவ உறுப்பினர் அவர்களே, இச்சபையில் மக்களுடைய பிரச்சினைகள் பற்றியோ அல்லது உங்களுடைய விடயங்கள் பற்றியோ பேசுவதற்கு எந்தவித தடையும் கிடையாது. ஆனால், நீங்கள் குறிப்பிட்ட விடயம் இப்பிரேரணைக்கு உட்பட்டதல்ல. மாறாக, இது சம்பந்தமாக வேறொரு பிரேரணையைச் சமர்ப்பித்து நீங்கள் பேசமுடியும். ஆகவே, நீங்கள் இன்றைய பிரேரணைகள் சம்பந்தமாகப் பேசினால் நன்று; இல்லாவிட்டால், நிலையியற் கட்டளையை மீறியவராவீர்கள்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay. Thank you.

கௌரவ உறுப்பினர் அவர்களே, இயலுமானவரை விடயத்து டன் சம்பந்தப்படுத்தி பேசுங்கள்!

**ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
அப்படியென்றால், நான் ஆரம்பத்தில் பேசியது மாண்புமிகு அஸ்வர் அவர்களுக்கு விளங்கவில்லை என்று நினைக்கின்றேன். நான் இலங்கை ஏற்றுமதி அபிவிருத்தியுடன் தொடர்புடைய தாகத்தான் பேசுகின்றேன். இன்று அங்குள்ள மீனவர்கள் தொழிலுக்குச் செல்லமுடியாத நிலைமை தோன்றியிருக்கின்றது. அங்கு பலர் வெற்றிலைத் தோட்டங்களை வைத்திருக்கின்றார்கள். அவர்கள் தனது மனைவி, பிள்ளைகளை விட்டுவிட்டுத் தோட்டங் களுக்குச் செல்ல முடியாத நிலைமை உருவாகி இருக்கின்றது. இதன் பின்னணியில் யார் இருக்கின்றார்கள்? நாங்கள் பாதுகாப்புத் தரப்பினருடன் - இராணுவ உயரதிகாரிகள், பொலிஸ் உயர் அதிகாரிகளுடன் - நேரடியாகக் கதைத்து, மக்க ளுக்கும் இராணுவத்தினருக்கும், மக்களுக்கும் பொலிஸா ருக்கும் இடையில் ஏற்படுகின்ற பல பிரச்சினைகளை இலகுவாகத் தீர்த்து வருகின்றோம். எனினும், இந்த மர்ம மனிதன் பிரச்சினை தீர்ந்தபாடில்லை. இதனால் அம்மக்கள் பொருளாதார ரீதியாகப் பாதிக்கப்பட்டிருக்கின்றனர், அவர்கள் மேற்கொள்கின்ற தொழில்கள் பாதிக்கப்பட்டிருக்கின்றன என்பதையே நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். அதில் மீன்பிடித் தொழில் மிக முக்கியமானது. ஏனென்றால், கிழக்கு மாகாணத்தில் மீன் ஏற்றுமதியானது மிக முக்கிய இடத்தைப் பெற்றிருக்கின்றது. இதனை கௌரவ உறுப்பினர் அவர்கள் புரிந்துகொள்ள வேண்டும்.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, we would like to raise this issue for the second time. The Hon. Member's speech is totally irrelevant to the subject under discussion. The subject is about plantations: rubber and tea. The Hon. Member is repeating himself and the subject that he is trying to deal with is totally irrelevant to the subject that is being discussed.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
It is against the Standing Orders.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

It is against the Standing Orders. You should not allow this. This is a wrong convention that we are going to create at this rate.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

மாண்புமிகு யோகேஸ்வரன் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளைகளுக்கு அப்பாற் சென்று உரையாற்ற வேண்டாம். நிலையியற் கட்டளைகளுக்கு உட்பட்ட விடயங் களைப் பேசுங்கள்!

**ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய ஒழுங்குப் பத்திரத்தில் முதலாவது தினப் பணியாகக் குறிப்பிடப் பட்டுள்ள பிரேரணையில் 'இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம்' என்று குறிப்பிடப்பட்டுள்ளதே தவிர, 'இறப்பர் ஏற்றுமதி' என்று குறிப்பிடப்படவில்லை. ஆகவே, நான் இலங்கையின் ஏற்றுமதிகள் சம்பந்தமாகத்தான் பேசுகின்றேன். நான் குறிப் பிடுவது மீன்பிடி ஏற்றுமதி! இது இலங்கையினுடைய ஏற்றுமதிக்குள் அடங்குகின்றது. இது தொடர்பாக இங்கு பேசுவ தற்கு இடமில்லையென்றால், நான் எனது பேச்சினை நிறுத்துகின்றேன். ஆனால், இன்று இலங்கையின் ஏற்றுமதித் துறையிலே-

**ගරු පී. පියසේන මහතා**
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! There is a point of Order being raised by the Hon. P. Piyasena.

**ගරු පී. පියසේන මහතා**
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)

தற்பொழுது, இந்த நாட்டிலே தேவையில்லாத ஒரு வதந்தியை எதிர்க்கட்சியினர் பரப்பி வருகின்றார்கள் என்று நாங்கள் சந்தேகிக்கின்றோம். இந்த நாட்டைப் பாதுகாத்த அரசானது, இன்று மிகவும் உன்னதமான அபிவிருத்தித் திட்டங்களை மேற் கொண்டு வருகின்றது. இந்த வேளையில், இவர்கள் தேவையற்ற விதமாக மக்களைத் தூண்டி, வதந்திகளைப் பரப்பி, மீண்டும் மீண்டும் ஒரு பிழையான வழியில் இந்த நாட்டையும் அரசையும் மக்களையும் கொண்டு செல்வதற்கு முயற்சிக்கின்றார்கள். 'கிறீஸ்' மனிதன் என்பது, எமது அம்பாறை மாவட்டத்திலும் -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Member, that is not a point of Order. Please sit down. Hon. Yoheswaran, you can carry on with your speech.

**ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நான் இங்கு ஏற்றுமதி தொடர்பான விடயங்களைக் குறிப்பிட்டு விட்டுத்தான் மர்ம மனிதன் தொடர்பான விடயங்களைச் சுட்டிக் காட்டினேன். ஆனால், அரச தரப்பினர் அதனை வேறு விதமாகத் திசை திருப்பி, தங்களது மர்ம மனிதன் சதித்திட்டத்தை மறைக்க முற்படுகின்றார்கள். ஆகவே, இதில் அரச தரப்பினருக்குப் பூரண தொடர்புண்டு; அவர்களுடைய கட்டுப்பாட்டின் கீழ்தான் இது நடைபெறுகின்றது. இதனை உடனடியாக நிறுத்தவேண்டும் என்று கேட்டு, நான் எனது உரையை மேலும் தொடராமல் நிறுத்திக்கொள்கின்றேன்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

நன்றி.

The next speaker is the Hon. T. Ranjith De Zoysa. Before that, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராச னத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 3.06 ]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ වූ නියෝග සම්බන්ධව අපි ඉතාම සතුටු වනවා. මේ රටේ ජාතික ආදායමට වැදගත් මෙහෙවරක් කරන තේ සහ රබර් වගාව සම්බන්ධව අපේ රජය ප්‍රතිපත්තිමය, සංවර්ධනාත්මක හා සාධනීය තීන්දුවක් අරගෙන එය මේ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා.

මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ රක්වාන මැතිවරණය කොට්ඨාසය වාගේම වැවිලිකරය නියෝජනය කරන අනෙකුත් දිස්ත්‍රික්කවලත් එදා මේ රටේ සුද්දන් -බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්- සතුව තිබිච්ච තේ, රබර් සහ පොල් යන වැවිලි ආර්ථිකය ජනතාව සතු කිරීම සඳහා 1975 වර්ෂයේදී ගරු

සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ නායකත්වයෙන් යුත් සමඟි පෙරමුණ ආණ්ඩුව කුඩා තේ වතු සංවර්ධන පනත ඉදිරිපත් කිරීම ඉතාම වැදගත් තීන්දුවක් විධියට අපි දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාලවකවානුව වෙන කොට මේ රටේ තිබුණේ බ්‍රිතාන්‍යයන් සතු වැවිලි අධිරාජ්‍යයක්; වැවිලි ක්‍රමයක්. අන්න ඒ වතු අධිරාජ්‍යයට යටත් වෙච්ච ගම්මානවල ජනතාව ජීවත් වුණේ කුලී ශ්‍රමිකයන් හැටියටයි. සුද්දාගේ වත්තේ දලු කඩලා, උදලු ගාලා, කිරි කපලා, බිම් කොටලා ඒ මත වැටුපක් අරගෙන ජීවත් වූ ජනතාවක් තමයි එදා වැවිලිකරය ආශ්‍රිත කුඩා ගම්මානවල ජීවත් වුණේ. එහෙම ජීවත් වුණු මිනිස්සුන්ට එදා තේ වත්තක් තිබෙනවාය කිව්වාම, රබර් වත්තක් තිබෙනවාය කියලා කිව්වාම ඒක තමන්ගේ ප්‍රභූත්වය එහෙම නැත්නම් තමන්ගේ වත්පොහොසත්කම, පවුලේ වැදගත්කම කියාපාන සාධකයක් වුණා. එක්කෝ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී වැවිලිකරුවන් එහෙම නැත්නම් ස්වදේශීය ධනපතියන් සතුව තමයි එදා මේ ප්‍රධාන වගාවන් තුන තිබුණේ.

1975 ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ ආණ්ඩුවෙන් -එවකට තිබිච්ච සමඟි පෙරමුණු ආණ්ඩුවෙන්- කුඩා තේ වතු සංවර්ධන පනත ඉදිරිපත් කරලා එය නීතිගත කිරීමත් එක්ක සුද්දාගේ වත්තට ආසන්න ගම්මානවලත් කුඩා තේ, රබර් සහ පොල් වතු ඇති වුණා. විශේෂයෙන්ම රබර් සහ තේ වතු ඇති වුණා.

1975 වර්ෂයේදී ඒ ගත්ත ජනතාවාදී ප්‍රතිපත්තිය, ජනතාවාදී තීන්දුව නිසා 2011 අවුරුද්ද වන කොට මේ රටේ සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 68ක් නිෂ්පාදනය කරනු ලබන මහා දැවැන්ත නිෂ්පාදන ප්‍රභවය බවට කුඩා තේ වතු හිමියන් පත් වෙලා තිබෙනවා. අද රටේ වැවිලි සමාගම් කොතෙක් තිබුණත් ඒ වැවිලි සමාගම්වල නිෂ්පාදනයට වඩා වැඩි නිෂ්පාදනයක් කරමින් සමස්ත නිෂ්පාදනයෙන් සියයට 68ක් කුඩා තේ වතු හිමියන් විසින් නිෂ්පාදනය කරන තත්ත්වයකට නිෂ්පාදනය ඉහළ ගිහිල්ලා තිබෙනවා. අන්න එවැනි තත්ත්වයක් ඇති කරන්න පුළුවන් වුණේ එදා ඇති වුණු කුඩා තේ වතු සංවර්ධන ආධිකාරිය මඟිනුයි, ඒ අධිකාරිය මඟින් ගත්ත විවිධ ජනතාවාදී ප්‍රතිපත්තිත් එක්කයි.

කුඩා තේ ඉඩම් හිමියන් හැටියට, වැවිලිකරයට යට වෙච්ච පළාත්වල ජීවත් වන ජනතාව හැටියට, මහජන නියෝජිතයන් හැටියට අතිගරු ජනාධිපතිතුමා මේ වර්ෂය සඳහා ඉදිරිපත් කරපු - 2011 වර්ෂය සඳහා ඉදිරිපත් කරපු- අය වැය ලේඛනයෙන් දීපු පොරොන්දු අනුව එදා කුඩා තේ ඉඩම් හිමියන්ට දීපු නැවත වගා කිරීමේ සහනාධාරය ලක්ෂ දෙකහමාර දක්වා ඉහළ නැංවීමට ක්‍රියා කිරීම ගැන එතුමාට ස්තුතිවන්ත වන්න ඕනෑ. ලක්ෂ දෙකහමාර දක්වා ඉහළ නැංවීමත් එක්කම කුඩා තේ ඉඩම් හිමියන් තව, තවත් සවිබල ගැන්විලා, වගාව සඳහා යොමු වීමේ පරාසය වේගයෙන් වැඩි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ එක්කම කුඩා රබර් ඉඩම් හිමියන් සඳහා විශාල වශයෙන් සහනාධාර පහසුකම් ලබා දෙමින් පවතිනවා. අපට මතකයි, එක්තරා අවස්ථාවක නියඟයෙන් කුඩා තේ වගාව විනාශ වෙලා ගිහිල්ලා දලු කිලෝව රුපියල් 35ට බහින කොට, එදා ඉරාකයට එල්ල වුණු ඇමෙරිකන් ප්‍රහාරයත් එක්ක තේ වෙළෙඳ පොළ බැහැලා දලු කිලෝ එක රුපියල් 35ට වැටෙන කොට මේ රටේ කුඩා තේ වතු හිමියන්ට තේ වතු පවත්වා ගෙන යාමේ දැඩි අපහසුතාවක් ඇති වුණ බව. අන්න ඒ වෙලාවේ ආණ්ඩුව ඉදිරිපත් වෙලා පොහොර සහනාධාරය ගොවීන්ට දෙන්න සූදානම් වීමත් එක්ක කුඩා තේ වතු හිමියා යන්තම් දිවි ගැට ගන්නා තත්ත්වයට පත් වුණා. පොහොර සහනාධාරය ලබා දීමත් එක්ක ඔහු ශක්තිමත් වුණා. එදා දළු කිලෝ එක රුපියල් 35ට තියෙද්දී දුන්නු පොහොර සහනාධාරය අද තේ දළු කිලෝ එක රුපියල් 60ට යන කොටත් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාට අපි නැවත වරක් ස්තුතිය ප්‍රකාශ කළ යුතුයි.

මේ වන කොට අපි දකිනවා, උඩ රට, පහත රට, මැද රට තේ ඉඩම් හිමියන්ගේ තේ දළුවලට ඉතා ඉහළ මිලක් ලැබෙන බව. අද වෙළෙඳ පොළේ තේ දළු කිලෝවක් සඳහා රුපියල් 58ක 60ක මිලක් ලැබීමත් සමඟ කුඩා තේ ඉඩම් හිමියන් ශක්තිමත් වෙලා තිබෙනවා. අන්න එවැනි වෙලාවක නැවත වගාව සඳහා දෙන සහනාධාර මුදල තව තවත් වැඩි දියුණු කිරීම තුළින් විශේෂයෙන්ම තේ ඉඩම් හිමියා තවත් ශක්තිමත් වෙලා තිබෙන බව අපි ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ එක්කම මේ මඟින් දීර්ඝ කාලීන, විද්‍යානුකූල, හොඳ තීන්දුවක් අරගෙන තිබෙන බව අපි දකිනවා. නියඟය හෝ වෙනත් විවිධ හේතු නිසා හෝ අක්කර පහට වඩා අඩු කුඩා තේ ඉඩම් හිමියාගේ තේ පැළ මැරිලා ගිහින් පාළු ඇති වුණාට පසු නැවත වගාව සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරය එක පැළයකට රුපියල් 10 ගණනේයි මුදල් ලබා දුන්නේ. නමුත් අද වන කොට ඒක රුපියල් 25 දක්වා වැඩි කිරීම තුළ, කුඩා තේ ඉඩම් හිමියාගේ ඉඩම්වල තිබෙන පාළු ස්වභාවය නැති කරලා නැවතත් යථා තත්ත්වයට පත් කිරීමෙන් අස්වැන්න වැඩි කිරීමේ විද්‍යාත්මක ක්‍රමවේදයකුත් එක්ක දීර්ඝකාලීන විසඳුමක් මේ තේ වගාව සඳහා ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම පාළු වගාව සඳහා දෙන සහනාධාරය රුපියල් 10 ඉඳලා රුපියල් 25 දක්වා වැඩි කිරීම ඉතාම විද්‍යාත්මක සංවර්ධනාත්මක තීන්දුවක් හැටියට මා සලකනවා.

වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මැතිතුමා විසින් ඉතාම වැදගත් තීන්දුවක් ඉදිරිපත් කිරීමත් එක්ක එහි මොනවා හරි අඩු පාඩුවක් තිබෙනවා නම්, මේ දෙන සහනාධාර මිල මුදල්වල මොනවා හරි අඩු පාඩුවක් තිබෙනවා නම් විපක්ෂය විසින් අපට ඒක පෙන්වා දෙයි කියා අපි සිතුවා. මීට කලින් පුත්තලම් දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීවරයෙක් කරපු කථාව අපි අහගෙන හිටියා. ද්‍රවිඩ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරයෙක් කරපු කථාව අපි අහගෙන හිටියා. අපි හිතුවේ ඒ කථාවලින් මේ පනතේ තිබෙන අඩු පාඩුකම් සම්බන්ධව කරුණු ඉදිරිපත් කරලා මේ රටේ කුඩා තේ ඉඩම් හිමියන්ට, රබර් ඉඩම් හිමියන්ට මීට වැඩිය සහනාධාර දෙන්න යෝජනාවක් ඉදිරිපත් කරයි කියායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අය කරුණු ඉදිරිපත් කළේ, යන්නේ කොහෙද ඇහුවාම, මල්ලේ පොල් කියනවා වාගෙයි. තේ, රබර් ගැන කථා කරන වෙලාවේ ග්‍රීස් යකෙක් ගැන මෙතැන කථා කළා. අද කියා ගන්න දේවල් නැතුව ග්‍රීස් යක්කු ගැන කථා කරනවා. පසු ගිය සතියේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා විහාර මහා දේවි උද්‍යානයේ බෝඩ් අල්ලා ගෙන හිටියා, "ග්‍රීස් යකා අපිට එපා", "කිං හන්තර් අපිට එපා" කියා. ඒ පින්තූර අපි ළඟ තිබෙනවා. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා සමඟ හිටපු කණ්ඩායම එහෙම බෝඩ් අල්ලා ගෙන සිටියා. මේ ග්‍රීස් යකා කවුද කියලා අපි ඒ කණ්ඩායමෙන් අහනවා. විපක්ෂ නායකතුමාත් එපා කිව්වා. එක්සත් ජාතික පක්ෂයේ ග්‍රීස් යකා රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමාද? එහෙම බෝඩ් අල්ලා ගෙන හිටපු මන්ත්‍රීවරු මෙතැනට ඇවිත් කියනවා, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවෙන් ග්‍රීස් යකා මවනවාය කියා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

Sir, I rise to a point of Order. මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කරමින් මෙතුමා කථාවක් කළා. කරුණාකර, ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා කියනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නම් සඳහන් කිරීමෙන් බැහැරව කථාව කර ගෙන යන්න.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පුවත් පත් වාර්තාවේ මුහුණුත් එක්ක පළ වුණු පින්තූර අනුවයි මම කථා කළේ. ඒවා ඉවත් කරනවා නම් ඒකේ වැරැද්දකුත් නැහැ. හැබැයි, අපි දැක්කා, එදා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු ග්‍රීස් යකා පන්නන්න විහාර මහාදේවි උද්‍යානයේ පෙළපාළි ගිය හැටි.

රටේ සංවර්ධනාත්මක තීන්දු තීරණ පිළිබඳව මේ උත්තරීතර සභාවේ කථා කරන වෙලාවේ අනවශ්‍යා ප්‍රශ්න ගැටලු දමා ගෙන අනවශ්‍යා තැනකට මේක ගෙන යන්නේ නැතුව ඉතාම වැදගත් ගෞරවණීය මහජන නියෝජිතයෝ හැටියට ඒ නියෝග පිළිබඳව කථා කරලා, එහි අඩු පාඩු පෙන්වා දුන්නා නම් බොහොම හොඳයි. පුත්තලම් දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමා, තේ රබර් ගැන කථා කරන්නේ නැතුව ග්‍රීස් යක්කු ගැන කථා කරලා එතුමා පුත්තලමේ මන්ත්‍රීවරයෙක් බව ඔප්පු කළා.

ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමා අද ඉදිරිපත් කළ මේ නියෝගවලින් මේ රටේ තේ සහ රබර් වතු හිමියන්ට, කුඩා තේ වතු හිමියන්ට සහ කුඩා රබර් වතු හිමියන්ට ඉතා වැදගත් කාල පරිච්ඡේදයක් උදා වෙලා තිබෙනවා.

අප මතක් කරන්න ඕනෑ, එදා පසු ගිය ආණ්ඩුව කාලයේ -පසු ගිය කාල සීමාව වන කොට - රුපියල් 30ට දෙන්න බැරිව තිබුණු රබර් කිලෝ එක අද වන කොට මේ ආණ්ඩුව යටතේ රුපියල් 580ට මිල නියම වෙලා තිබෙනවාය කියන එක. එදා රුපියල් 10ට දෙන්න බැරිව තිබුණු ඔට්ටපාලු කිලෝ එක අද රුපියල් 300ට යන කාලයක්. ලංකා ඉතිහාසයේ සුද්දා වතු වගා කළ කාලයේවත් එහෙම තිබුණේ නැහැ. සුද්දාටවත් ඒ මුදලට රබර් සහ ඔට්ටපාලු දෙන්නට බැරි වුණා. රටේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් වන මොහොතක මේ ගත් තීන්දු තීරණත් එක්ක රබර් සහ තේ වතු හිමියන්ට ඉතාමත් හොඳ කල දසාවක් ඇති වේවිය කියා අප විශ්වාස කරනවා.

එ වාගේම පසු ගිය අය වැයේදී අතිගරු ජනාධිපතිතුමා ඉතාම වැදගත් පොරොන්දුවක් ජාතිය හමුවේ තැබුවා. වැවිලි සමාගම් සතු වගා නොකළ සියලු ඉඩම් 2011 ජුනි මාසයේ 30 වෙනි දායින් පස්සේ ක්‍රමවත් සැලැස්මක් යටතේ නැවත පවරා ගෙන ගම්මානවල ඉන්න රැකියා විරහිත, වගාව සඳහා සුදුසුකම් හා දක්ෂතා ඇති කොටස් අතර බෙදා දෙන බව එදා අය වැයේදී ප්‍රකාශ කළා.

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
වතුවල වැඩ කරන කම්කරුවන්ට බෙදා දෙනවා ද?

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
වතුවල වැඩ කරන කම්රුවන්ට දෙනවාටත් අප සියයට සියයක් එකඟයි ගරු මන්ත්‍රීතුමනි. වැවිලිකරය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට ඒ කම්කරුවන්ට ලබා දීම ගැන අප එකඟයි. අතිගරු ජනාධිපතිතුමාත් ඒ තීන්දුව අර ගෙන තිබෙනවා. එම නිසා ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාට අප මේ කරුණත් මතක් කරනවා. වගාව සඳහා යොදා නොගත් වැවිලි සමාගම් සතු වතු අක්කර දහස් ගණනක් තිබෙනවා. සමහර වැවිලි සමාගම් හිමියෝ බොරු සංඛ්‍යාලේඛන ආණ්ඩුවට දෙනවා එච්චර ඉඩම් නැහැයි කියා. මෙගොල්ලෝ දැන් කඩිමුඩියේ ඒවා වගා කරනවා. හැබැයි, ඒ ඉඩම් ටිකේ තේ හෝ රබර් හෝ මොනවා හෝ සිටුවනවා නම් හොඳයි. මේ වැඩ පිළිවෙළ මේ මාසයේදී -මේ 08වෙනි මාසයයි යන්නේ- ක්‍රියාත්මක කර, වගා කරන්නට බැරි වෙච්ච සියලු ඉඩම් ප්‍රමාණය ජාතිය සතු කර වතුකරයේ සහ අනෙකුත් ජනතාව අතර බෙදා දීමේ ඉක්මන් ක්‍රියාමාර්ග ගත යුතුය කියා අප නැවත නැවතත් ආණ්ඩුවට යෝජනා කර සිටිනවා. එය එසේම සිදු වන බවට අපේ විශාල විශ්වාසයක් තිබෙනවා. මේ රටේ කුඩා තේ වතු හිමියන්ගේ අයිතිය, ඒ පරාසය වැඩි කර, නිෂ්පාදනය වඩාත් වැඩි වී රටට බරපතළ ලෙස අවශ්‍යම කරන විදේශ විනිමය ප්‍රමාණය එතෙරින් ගෙන්වා ගන්න; උපයා ගන්න අපට හැකි වන ඉතාම සාධනීය තීන්දුවක් විධියට ඒ තීන්දුවත් අප මේ වෙලාවේ අගය කරනවා.

විශේෂයෙන් කුඩා රබර් වතු හිමියන් හා කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් අප තවත් යෝජනාවක් කරනවා. ඒ වතුවල පොඩි පොඩි ගැටලු තිබෙනවා. සේවක නිල නිවාසවල යම් යම් අඩු පාඩු තිබෙනවා. සේවකයන්ට කෑම ටිකක් කන්න, වැස්සට ඉන්න, තේ ටිකක් උණු කර ගෙන බොන්න පහසුකම් ඇති විශ්‍රාම ශාලා නැහැ, අපහසුතා තිබෙනවා. පාළු වගා සහනාධාරය වැඩි කර දුන්නා වාගේම කුඩා වතුවල ගොඩනැඟිලි අවශ්‍යතාවත් සපුරන්නට මුදල් ලබා දීමට යම් කිසි ක්‍රමවේදයක් සකස් කළොත් වැවිලිකරයේ කම්කරුවන්ට තිබෙන ලොකු අපහසුතාවයක් මඟ හරවා ගන්නට හැකිවේය කියා අප විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ තේ පර්යේෂණායතනය මගින් ලබා දුන් පොහොර වර්ගවල ගුණාත්මක තත්ත්වය සම්බන්ධයෙන් යම් යම් ප්‍රශ්න තිබුණු බව කුඩා තේ වතු හිමියන් හැටියට අප දැක්කා. වීපීඑල්සී - 880 කියා පොහොර වර්ගයක් එදා දුන්නා. මේ පොහොර යෙදීමත් එක්ක දළු කඩන්න පුළුවන් වුණේ වාර එකයි, දෙකයි. ඊට පසුව දළු නැති වනවා. කුඩා තේ වතු හිමියන් හැටියට අපි මේ කාරණය ගරු මහින්ද සමරසිංහ අමාත්‍යතුමාට ඉදිරිපත් කළා. එතුමා වහාම තේ පර්යේෂණායතනයට නියෝග කර, ගුණාත්මක තත්ත්වයෙන් උසස්, ඉහළ ප්‍රමිතියෙන් යුක්ත පොහොර හඳුන්වා දීමත් එක්ක අද දවසේ සහනාධාර පොහොර හැටියට ලබා දෙන පොහොරවලින් වැඩි ඵලදායිතාවයත් සමඟ, වැඩි අස්වැන්නක් ලැබීමත් එක්ක කුඩා තේ වතු හා කුඩා රබර් වතු හිමියන්ට ඉතාම හොඳ කල දසාවක් උදා වී තිබෙනවා. ඒ වාගේම කිසිම තැනකට ගිහින් දළු බිල් ඉදිරිපත් කරන්නේ නැතිව, කර්මාන්තශාලාවලින් ගත් ලියුම් ඉදිරිපත් කරන්නේ නැතිව තමන්ගේ වත්තට යාබදව තිබෙන පොහොර අළෙවි සැලෙන් රුපියල් 1,300කට පොහොර හොණ්ඩරයක් ලබා ගැනීමේ අයිතිය කුඩා තේ හා රබර් ඉඩම් හිමියන්ට ලැබී තිබෙනවා.

ඒ ආකාරයට සහන ලබා දීම තුළ අතිගරු ජනාධිපතිතුමාගේ රජය කුඩා තේ වතු හා රබර් වතු හිමියන් පිළිබඳව ගත් ඒ සාධනීය තීන්දුවට, ඒ ප්‍රතිපත්තිමය තීන්දුවට වැවිලිකරය නියෝජනය කරන මහජන නියෝජිතයන් හැටියට අපේ ස්තුතිය සහ ගෞරවය නැවත නැවතත් ප්‍රකාශ කරනවා. එසේම සහනාධාර මුදල වහාම වැඩි කිරීමටත්, පාළු සඳහා දෙන සහනාධාරය රුපියල් 10 සිට රුපියල් 25 දක්වා වැඩි කිරීමටත් ගත් තීන්දුව තුළ අනාගතයේ දීර්ඝ කාලීන වශයෙන් මේ රටේ තේ සහ රබර් වගාව ස්ථාවර මට්ටමකට, ශක්තිමත් මට්ටමකට පත් වන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. இப்பொழுது, உரைநிகழ்த்துபவர் மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள்!

[3.20 p.m.]

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Thank you, Mr. Presiding Member. We welcome this proposal to increase the subsidy given for replanting of tea. The Hon. Minister and the Hon. Member who spoke before me mentioned in this House that 68 per cent of the tea is being produced by smallholders. This has come about mainly because of this subsidy that has been extended to the smallholders. It has been very useful and it has helped to increase the yield in the smallholder sector. That is why the production from the smallholders is twice the quantity produced by the RPCs and the State plantations though the acreage cultivated by them is smaller than the acreage cultivated by the RPCs and the State plantation companies. The smallholders are producing as much as 2,300 kilos per hectare whereas the RPC-managed companies are producing 1,200 kilos per hectare. The reason that this RPCs are not coming up to the level of the smallholder is because they have not indulged in any replanting for the 19 years that they have been holding these estates. The plantation companies were brought in because the State found that it will not be able to invest in these plantations any further and they were sustaining losses at that time. So, to reduce the losses the Government decided to privatize the estates. At that time, the late Hon. Savumyamoorthy Thondaman, though a trade union leader, supported privatization because he felt the need for more investment in the plantations. However, the RPCs have not invested in these estates but they are only taking the profits of these estates.

Yesterday, my Colleague, the Hon. Ravi Karunanayake, questioned the Minister about the recent wage increase and its impact on the estates. The plantation companies are trying to make out that they are running at a loss because of this wage increase. I am glad that the Hon. Minister of Plantation Industries yesterday stood by the unions and said that the wage increase was necessary under the Collective Agreement and that was due to the workers and that nobody should grumble about it, but ways and means should be found to overcome the losses of the plantation companies. The plantation companies are complaining that the productivity in their estates is low. But, I do not accept this claim by the plantation companies because in 1992 when the RPCs took over the management of these estates, the number of workers in these 21 companies was 430,000. They have now reduced that to 220,000. However, the total production from the plantation companies has increased by 25 per cent during these 19 years. That means, 25 per cent more is produced by 50 per cent of the workers who were employed in 1992. So, the worker productivity has more than doubled whereas the production in the estates has increased by 25 per cent and they cannot complain about the workers not being productive. The productivity is lacking because the big companies have not invested in replanting like the smallholders. We all know that the life of a tea plant to yield the maximum is about 50 years. Many of the tea plants in the estates owned by the RPCs are about 100 years old. These companies were expected to replant so that they also could have increased the yield to 2,300 kilos per hectare. If they had increased the yield to 2,300 kilos, the cost of production per kilo would have been much less than now and they would have been able to have good profits. When the estate is productive, the workers have never refused to bring out the yield. There are norms set on estates. In the upcountry, it is between 16 to 18 kilos per day per worker, but in the South where replanting has been done and there is green leaf to pluck, the production is as much as 22 to 24 kilos per day per worker and they have never grumbled to do that because the leaves are available to pluck. So, under these circumstances, the companies painting a story of their being almost compelled to increase wages and having to face losses, is untenable. The Ministry of Plantation Industries should understand this. The companies which were given a 53-year lease on the understanding that they would invest and develop these estates should come forward today to invest, improve and get profits and not just to maintain the estates and make profits.

After all, each of these estates or RPCs was sold to the present owners for a mere Rs. 100 million. Today, you cannot buy 100 acres for Rs. 100 million whereas they got as much as 6,000 to 8,000 hectares or 15,000 to 20,000 acres for a mere Rs. 100 million. The expectation of the Government then was that they would each invest up to maybe Rs. 1 billion at that time, so that the yield could have been increased and the estates could have been sustained. I am sure everyone would understand that as much as the sustainability of the estate is important, the sustenance of the workers on the estates is also important. With inflation eating into the living standards of the workers, it is necessary to increase the wages every two years as per the Collective Agreement. In 2007, there was a wage increase of 40 per cent negotiated by the trade unions. In 2009 again, the wage increase that was negotiated came up to 42 per cent. However, in 2011, we were able to obtain only a 27 per cent increase in wages.

Hence, there is no reason for the companies to complain about the increase in wages. Taking the sustenance of the people in the plantations into consideration, the poverty index was calculated in 1992, which year coincides with the privatization of the plantations and it was calculated at 22 per cent in 1992. However, 10 years later, in 2002, the poverty index in the plantations was estimated at 32 per cent. So, since the plantation companies took over the estates, the poverty in the plantations had increased by as much as 10 per cent.

However, there is another aspect that we have to look into. In 2007, the poverty index continued to be 32 per cent and in 2009, suddenly the Department of Census and Statistics announced that poverty had dropped to 9 per

[ගරු ආර්. යෝගරාජන් මහතා]

cent. If the poverty index can drop from 32 per cent to 9 per cent within two years, there should have been an economic revolution in the plantation industry and in the lives of the plantation people. But, we did not see it. So, how are we to believe the statistics put out by the Department of Census and Statistics? This is the question that arises. Hence, I believe that the plantation workers are not getting their dues.

The increase in wages will definitely increase the cost of production. But, the prices of tea have been improving continuously and the price of Sri Lanka tea or Ceylon tea is unique compared to other competitive countries. The price of Ceylon tea in 2010 was US Dollars 3.25 and it has increased to US Dollars 3.48 in 2011. So, prices have increased by as much as 7 per cent in dollar terms. Unfortunately, in rupee terms, however, it has increased by only one rupee: from Rs. 370 in 2010 to Rs. 371 in 2011. Generally, the plantation industry compares the cost of production and prices in South India with that of Sri Lanka. The price of tea in the Cochin Auctions in 2011 is US Dollars 1.84 and in 2010 it was US Dollars 1.67, whereas at the Colombo Auctions, the price is US Dollars 3.48 in 2011 and US Dollars 3.25 in 2010. When you compare these two, the price of tea sold in the Colombo Auctions is almost double than that of South India, which is a comparable tea producing area.

So, under these circumstances, the companies complaining that they are unable to sustain the estates by increasing wages is not acceptable to the industry or to the workers in the industry. The companies themselves are aware that they have to replant to get a better yield because as I said, if the age of a tea plantation is over 50 years, to sustain the industry at least 2 per cent of the acreage must be replanted each year. But, the average replanting during the last 19 years of the companies taking over is in the region of 0.2 per cent which is far below the expected area that should be replanted and it is against the expectation of the Government when it gave these estates on lease to these companies. So, they too have to do their part; without only exploiting what is available on the estates, they must do replanting.

Out of the 21 companies, there are two companies which are showing large profits. One is the Malwatte Valley Plantations PLC and the other is Watawala Plantations Limited. How are they able to show a large profit? It is because they have invested in their estates during the past few years and they are getting higher yields and bigger profits and they are entitled to that. There are other companies owned by some people who only play in the share market; whether the industry is running well or the plantations are doing well is not important to them. They only watch the indices in the stock exchange and feel satisfied when their share values are going up. For them, it is another investment and not a commitment to an industry that is important to this country. So, if we are to sustain the tea industry, it is important that these companies become more responsible and invest more to make money and not expect to just make money by exploiting what has been given to them at a throwaway price. In 1992, when these estates were given to these companies, they were sold at a mere Rs. 100 million, I was told. So, for them, today, making Rs. 200 million or in that range is quite a lucrative profit. So, they should not be complaining about giving higher wages to workers, but must do their part to improve the estates.

The Hon. Minister spoke about fallow lands within the estates.

He also said that they were doing a survey and it is between 15,000 to 20,000 hectares. Hon. Minister, it was told in this House by the Hon. Basil Rajapaksa, I believe, that the extent is around 65,000 hectares and not 20,000. As the Hon. Member who spoke before me, the Hon. Ranjith De Zoysa said, the companies are not disclosing the real acreage available, unutilized or uncultivated. So, we have to do a strict survey and there is more than 65,000 hectares.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
Can I make a clarification?

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Okay.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
We have sent teams to every estate. There were teams sent from the Ministry of Plantation Industries, all graduates, and they have gone to every estate and personally looked at the lands and it is those statistics that I brought before the House today. The 65,000 hectares that was mentioned earlier may have been also the smallholder extents and Government lands identified as being available. But, I can tell you that as far as the RPCs are concerned, there are 23 RPCs; we have now a full report and I will be presenting it to His Excellency the President in a day or two. It is approximately 15,000 to 20,000 hectares. And, I also want to tell you that - I am sorry for taking your time but I think it is important that you know this - as a result of His Excellency the President making the announcement last year when he presented the Budget that he is giving six months for these RPCs to cultivate uncultivated lands, nearly 6,000 hectares have already been cultivated. That was also a very advantageous position that we derived as a result of this announcement but certainly it is around 15,000 to 20,000 hectares.

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

I do welcome the fact that you have sent graduates to look into it. It maybe that they have been taken for conducted-tours in the estates and have not been shown all the fallow lands. I think that aspect also has to be looked into. Further, whatever land that is there, Hon. Minister, you said that those will be cultivated with vegetables or some other plants. I request that it should not be done that way. If it is a rubber estate, cultivate only rubber, if it is a tea estate cultivate only tea so that the whole estate remains a plantation for the future. Otherwise, people who cultivate vegetables would do it for two seasons or three seasons and then they may abandon it or convert it into a housing land. But, if it is tea or rubber, once planted, for 50 years they could take yield and they would not attempt to abandon or convert it for any other purpose. So, it is important that it should be tea or rubber and nothing else.

Further, when I spoke in this House during the debate following the Budget Speech of His Excellency the President, I mentioned this issue. The Hon. Basil Rajapaksa, Minister of Economic Development was in the House and he was commenting on the speech that I was making. I spoke about the subsidy at that time and said that they were paying only two and a half per cent of the total cost. I also said, “I am very glad that you are here to listen to this so that you will do something about it because you are the only person in this Government who understands matters and works". "There are other Ministers too," he said. Then, I said, "No, I have not seen a single Minister except you". He further said that if the tea plantation companies do not cultivate the fallow lands that they hold now which is 65,000 hectares, he will take over them and give them to the smallholders. Sir, 65,000 hectares is going to work out to about 170,000 acres. There are enough workers in the estates who have the experience and capacity to replant them. I said, "Give these lands to those workers to replant because 80 per cent of cost for replanting goes for labour. They have it and they can put it free”. Then the Hon. Basil Rajapaksa said, “That is what His Excellency the President told”. The Hon. Basil Rajapaksa stated in this House that these lands would be given to those estate workers who live within the estate and who can look after these plots. They can replant and they can be given an acre each. As I said earlier, the cost of replanting today is about Rs. 800,000. Out of this, the companies say, Rs. 600,000 goes as labour cost and it is only Rs. 200,000 left for inputs such as the plants and the fertilizer. Rs. 600,000 is available with the worker, the labour, he is willing to invest it free. If he can be given a loan of Rs. 100,000 per acre - that is out of the subsidy of Rs. 250,000 you are extending - that will subsidize half the cost of other goods. If he can be given a loan of Rs. 100,000, he can replant his one-acre land. He has the knowledge and the love for the plantations. His sustenance is dependent on the sustainability of the plantations.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, you time is up.

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Okay. So, the best thing would be to give the land to the worker in the estate. If you bring outsiders who are tea smallholders, you are also creating a social problem in the estate. Therefore, I would request the Hon. Minister to accept what the Hon. Basil Rajapaksa said, that the President wanted to give it to the plantation workers. Follow that and give these lands to the plantation workers so that they will be able to look after these estates, replant and grow the tea. Thereby, they will also be able to contribute to the economy of this country while looking after and sustaining themselves.

Thank you.

[අ. භා. 3.45 ]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනතේ තිබෙන වගා කිරීමේ සහනාධාර නියෝග සංශෝධනය කිරීම විශේෂයෙන්ම අද සිදු වනවා. මෙය ඉතාම වැදගත් කාරණාවක්. මොකද, අපේ රටේ දේශීය ආර්ථිකයේ විශාල දායකත්වයක් දරන තේ වගාව සඳහා නැවත වගා කිරීමේ සහනාධාර වැඩිපුර ලබා දීම තුළින් අපේ රටේ ජාතික නිෂ්පාදනයට දීර්ඝ කාලීනව විශාල දායකත්වයක් ලැබෙනවාය කියායි මා හිතන්නේ. අපි ස්තුතිවන්ත වෙනවා අතිගරු ජනාධිපතිතුමාට, ඒ වාගේම අපේ ගරු මහින්ද සමරසිංහ අමාත්‍යතුමාට. විශේෂයෙන්ම දක්ෂ ඒ වාගේම අවබෝධයක් තිබෙන, වැවිලි කර්මාන්තය ගැන උනන්දුවක් තිබෙන ඇමතිවරයෙකුට මේ විෂයය භාර වීම පිළිබඳව අපි සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා තේ වගාව ගැන පසුවයි කථා කරන්නේ. ඊට කලින් අපේ ආර්ථික බෝගයක් වන රබර් වගාව ගැන යමක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. ඉල්ලීම් කීපයකුත් කරන්න තිබෙනවා ගරු ඇමතිතුමාගෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපේ රටේ සාමාන්‍ය මතය වෙලා තිබෙන්නේ මොනරාගල දිස්ත්‍රික්කය බොහොම ශුෂ්ක, කර්කශ දිස්ත්‍රික්කයක් හැටියටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අධිරාජ්‍යවාදින් දැන ගෙන සිටියා අපේ රටේ තිබෙන භූගෝලීය තත්ත්වයන් පිළිබඳව. ඒ සම්බන්ධයෙන් ඔවුන්ට මනා අවබෝධයක් තිබුණා. ඒ නිසා තමයි සුද්දා රුවල් නැවෙන් කොළඹට ඇවිල්ලා කොළඹින් පිටත් වෙලා කඩුගන්නාවේ ගල විද ගෙන ගිහින් මහවැලි ගඟෙන් එගොඩ වෙලා බිබිලට ගිහිල්ලා ලංකාවේ ලොකුම රබර් වත්ත බිබිලේ වැව්වේ. නමුත් අපේ අයට මේ භූ ගෝලීය තත්ත්වය පිළිබඳව අවබෝධයක් තිබුණේ නැහැ. එම නිසා තමයි උක් වගාව නිර්දේශ කරන්නේ, උක් වගාව කරන්න හදන්නේ.

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

බිබිලේ විතරක් නොවෙයි. මොනරාගල ලැකසීස් වත්ත, ගමේවෙල වත්ත, මොනරාගල වත්ත ආදි වශයෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ විශාල රබර් වතු ප්‍රමාණයක් අධිරාජ්‍යවාදි යුගයේදී වගා කළා. නමුත් කනගාටුවට කරුණ මොකක්ද? වතු ජනසතු කිරීම තුළින් අපේ රටේ වැවිලි කර්මාන්තයට එක පැත්තකින් විශාල පාඩුවක් වුණා. අපේ දේශපාලන දර්ශනය අනුව ජනසතු ව්‍යාපාරය එක්තරා ආකර්ෂණීය මාතෘකාවක් වුණත් ඒ ජනසතුව තුළ මේ රටේ තේ වගා කරපු විදේශීය සමාගම් කෙන්යාව වාගේ අප්‍රිකානු රටවලට ගිහිල්ලා තේ වගා කරලා අද අපේ තේ වගාවට, තේ කර්මාන්තයට අභියෝගයක් බවට පත් වෙලා තිබෙනවා. ලෝක වෙළෙඳ පොළේ අපේ තේ සමඟ තරග කිරීමට තරම් ඔවුන් සවි බල ගැන්විලා තිබෙනවා. සමහර වතු නඩත්තු කිරීම අඩු වීම නිසා වතුකරයේ වගාවන්හි තිබුණු සශ්‍රීක බව නැති වෙලා ගියා. ඒ වාගේම වැඩ කරන ජනතාවටත් තිබුණු යම් යම් පහසුකම් අහිමි වුණා. ඒ වතුවල වැඩ කරපු ලැයිම්වල ජනතාව අතර මං වෙලා ගියා. ඔවුන්ට රැකියා අහිමි වුණා. මෙවැනි සිදුවීම් රාශියක් වුණා. නමුත් පසු කාලීනව මේ අපනයන ද්‍රව්‍යවල මිල ඉහළ යැම තුළ අපේ දේශීය වගාකරුවෝ උනන්දු වුණා. ඔවුන් දිරිගැන්වීම ඉතාම අමාරු කාර්යයක් වුණා. මේ අමාරු කාර්යය ඉෂ්ට කරන්න විශේෂයෙන්ම අද ගත්තා වූ මේ උත්සාහය පිළිබඳව අපි සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි තව කාරණයක් මතක් කරන්න ඕනෑ. ඩන්ලොප් සමාගම තමයි බිබිලේවත්ත වගා කළේ. සුද්දා නැවත බිබිලේ රබර් වවලා ඒ රබර් අර විධියටම රුවල් නැවෙන් එංගලන්තයට අර ගෙන ගියා. අර ගෙන ගිහිල්ලා ඩන්ලොප් සමාගම ටයර් හදලා මුළු ලෝකයටම විකුණුවා. මේ යථාර්ථය හරියට අවබෝධ කර ගත්තු නායකයෙක් තමයි මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා. මොකද, මේ රටේ ප්‍රධාන ගංගා එකසිය ගණනක් තියෙද්දී ඒ ගංගා දිහා නොබලා බිබිලේ තිබුණු ගල්ඔය දිහා බලලා ගල්ඔයෙන් මහා විශාල සමුද්‍රයක් හැදුවා. ඒ තමයි සේනානායක සමුද්‍රය. එහි ජල පෝෂක ප්‍රදේශය තමයි මේ බිබිල ප්‍රදේශය. මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තමයි අද බොහොම ජලය තියෙන, සශ්‍රීක වනාන්තර තියෙන, ඒ වාගේම සෞම්‍ය දේශගුණයක් තිබෙන ප්‍රදේශ.

මේ කලාපය ආර්ථික භෝගවලට සුදුසු කලාපයක්. නමුත් අපි මතක් කරන්න ඕනෑ, මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා 1818 කැරැල්ලෙන් පලා ගිය සටන්කාමීන් ජීවත් වුණු නැඟෙනහිර පළාතේ බක්මීටියාව, තෝට්ටම, මාන්තෝට්ටම, වෙහෙරගල, පන්නල්ගම ආදී ප්‍රදේශවලට ජලය ලබා දීලා කෘෂි කර්මාන්තය දියුණු කළ බව. නමුත් අපි දන්නවා, පසු ගිය කාලයේ අපේ රටේ තිබුණු ත්‍රස්තවාදී ප්‍රශ්නය නිසා ඒ ගොවි ජනතාවට ගොවි බිම් අහිමි වෙලා තිබුණු බව. අපි අගය කරන්න ඕනෑ, වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමාගෙන් පස්සේ මේ රටේ බිහි වුණු ප්‍රඥාවන්තම නායකයා කියලා. ඒ ප්‍රඥාවන්ත නායකයා ත්‍රස්තවාදය අවසන් කරලා නැවත ගොවි බිම් අක්කර දහස් ගණනක් මේ ගොවි ජනතාවට උරුම කරලා දෙන්න තරම් දක්ෂ නායකයෙක්; ප්‍රඥාවන්ත නායකයෙක් බවට පත් වෙලා තියෙනවා.

මේ වාගේ තත්ත්වයක් තුළ ඉහත කී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල තියෙන ප්‍රශ්නය තමයි වන අපරාධ, වනාන්තර ගිනි තැබීම් සහ ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය නොකිරීම. මේ කාරණාවලට හේතුවක් තිබෙනවා. මොකද දිසාපති කැලය සහ වන සංරක්ෂකගේ ඉඩම් පාවිච්චි කරමින් අපේ ප්‍රදේශවල ජනතාව හේන් ගොවිතැනේ නියැළුණා. ඒ නිසා අද මේ හේන් ගොවියා ආර්ථික වගාවට නැඹුරු කිරීම ජාතික අවශ්‍යතාවක් බවට පත් වෙලා තිබෙනවා. එහෙම ආර්ථික වගාවට මේ හේන් ගොවියා නැඹුරු කිරීමට අපට තියෙන ලොකුම ඉඩකඩ සහ හැකියාව තමයි ඉතිහාසයෙන් උරුම වෙච්ච රබර් වගාවට හේන් ගොවියා නැවත පුරුදු පුහුණු කිරීම. අද ඒකට මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව සූදානම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වනාන්තරය මායිමේ, දිසාපති කැලේ, වන සංරක්ෂකගේ ඉඩමේ රබර් වගාව කරනවා නම් වන අපරාධ අඩු වෙනවා. කැලෑ ගිනි තැබීම්වලට ඉඩ තැබෙන්නේ නැහැ. ගොවි ජනතාව ඒ වනාන්තර ආරක්ෂා කරනවා. රබර් වගාව ආරක්ෂා කරනවා. හේන් ගොවීන් සාම්ප්‍රදායික හේන් ගොවිතැනින් රබර් වගාවට යොමු කරලා, බදු ක්‍රමයක් සකස් කරලා හෙක්ටෙයාරයක් හේන් ගොවියෙකුට ලබා දීලා ඒ වැඩ පිළිවෙළ මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ අද අපේ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වනවා. අපේ ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මම මේකේ පොඩි ගැටලු ටිකක් තිබෙනවාය කියලා මතක් කරන්න ඕනෑ. එය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. වන සංරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ පවත්නා ඉඩම් රබර් වගා කරුවන්ට ලබා දීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් නොමැතිකම ගැටලුවක් වෙලා තිබෙනවා. ඒ නිසා නිලධාරින්ගේ අඩුවකුත් තිබෙනවා. මේ වැඩේ ක්‍රියාත්මක වෙනවා, නමුත් බොහොම පසුගාමී තත්ත්වයකින්. මේක වේගයෙන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මම හිතනවා අද අපේ ඉඩම්වල ආර්ථික වටිනාකම ඉහළ යැම තුළ රබර් ඉඩම්, පොල් ඉඩම් බොහොම අඩු වෙමින් පවතින්නේ කියලා. ඒ නිසා මොනරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර, බිබිල, මැදගම, මඩුල්ල කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ලොකු ඉඩකඩක් තියෙනවා.

අද මේ බදු ක්‍රමය යටතේ රබර් වගාව ක්‍රියාත්මක වනවා. මේ බදු ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන ඉඩම්වලට විධිමත් යාන්ත්‍රණයක් ලබා දෙන ලෙස අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා. ඒ වාගේම නිලධාරින්ගේ හිඟතාවක් තිබෙනවා. ඒ නිලධාරින්ගේ හිඟතාවත් අකා මකා දාලා මේ වැඩේ ඉතාමත්ම කඩිනම්ව කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ අනුබලය, අනුග්‍රහය ලබා දෙන ලෙස මම ඉල්ලීමක් කරනවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
පොල්?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
පොලුත් එහෙම තමයි. පොලා නැහැ නේ. ඔහොම එකක් තමයි තමුන්නාන්සේ මතක් කරන්නේ. තමුන්නාන්සේ ඉතින් දක්ෂ කෙනා නේ, පොලුවලට. පොලුද කිව්වේ? [බාධා කිරීමක්] පොලු කියලා නේ කිව්වේ. ඊ ළඟට, මොනරාගල දිස්ත්‍රික්කය තුළ කුඩා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන මඟින් රබර් වගාකරුවන්ට ආධාර ලබා දෙන අතර, පොහොර, ස්වයං රැකියා ආධාර, පාරවල් සහ වෙනත් ආධාරත් ලබා දෙනවා. ගරු ඇමතිතුමනි, නමුත් මෙම වසර අවසාන වෙන කොට මෙම ව්‍යාපෘතිය ඉවත්වෙන බව දැන ගන්නට ලැබෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ප්‍රදේශයේ ජනතාවගේත්, රබර් වගාවේත් ශුභ සිද්ධිය සඳහා එය ඉදිරියටත් පවත්වා ගෙන යා යුතුයි කියලා.

ඊ ළඟට, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරින් කුඩා වැවිලි ව්‍යවසායකත්ව වැඩසටහනට අවශ්‍ය සහයෝගය ලබා දීම බොහොම මන්දගාමීව සිදු වන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක්

කරනවා, මේ වැඩසටහනට අවශ්‍ය සහයෝගය ලබා දීම සිදු කරන්න කියලා. රබර් ගැන කියන්න තිබෙන්නේ ඒ ටික තමයි.

තේ ගැන කථා කරනවා නම් ඌව පළාත කියන්නේ තේ වගාව ඉතාමත් සශ්‍රීක ලෙස කෙරුණු පළාතක්. නමුත් අද එය බොහොම දුර්වල තත්ත්වයක තිබෙන්නේ. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය බණ්ඩාරවෙල තිබෙනවා. හාලිඇල, දියතලාව, වැලිමඩ උප කාර්යාල තිබෙනවා. ප්‍රාදේශීය ව්‍යාප්ති මධ්‍යස්ථාන නිලධාරි බල ප්‍රදේශ බණ්ඩාරවෙල, ලියන්ගහවෙල, ඇල්ල, බල්ලකෙටුව, හපුතලේ, හල්දුම්මුල්ල, වැලිමඩ, බොරලන්ද, ලුණුවත්ත, බඹරපාන, හාලිඇල, ඇටම්පිටිය, වැපස්සාවෙල, බදුල්ල, පස්සර සහ ලුනුගල තිබෙනවා. එතකොට තේ ශක්ති කර්මාන්තශාලා දෙකක් තිබෙනවා, කැප්පෙටිපොල සහ පස්සර.

දැන් අපි දකිනවා මේ සා විශාල බල ප්‍රදේශයක දැවැන්ත ප්‍රමාණයේ සමාගම් වතු විශාල ප්‍රමාණයක් තිබෙන බව. අද සමාගම් වතු කඩා වැටෙමිනුයි පවතින්නේ. සමාගම් වතුවල නිෂ්පාදන ධාරිතාව අඩු වෙලා, factories විශාල ප්‍රමාණයක් වහලා. ඒක නිසා බදුලු ප්‍රදේශයේ, බණ්ඩාරවෙල ප්‍රදේශයේ මේ තේ වගාව අසාර්ථකභාවයට පත් වෙමින් පවතිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වතුකරය ආශ්‍රිතව අපි දකින දෙයක් තමයි හෙක්ටෙයාර 3,000කට වැඩි ප්‍රමාණයක් මේ වතු සමාගම්වල භූමිය පාවිච්චි නොකර, මේ භූමිය තේ වගාවට යොදා ගන්නේ නැතිව මුඩු බිම් බවට, සෝදා පාළුවට ලක් වෙමින් තිබෙන තත්ත්වය. මම හිතන හැටියට ඔබතුමාත් එය දන්නවා.

අද වතුකරේ ජනගහනය වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම උඩ රට ජනගහනය වැඩි වෙලා තිබෙනවා. මේ සිංහල, දෙමළ සාමග්‍රාමී ගම්මාන ඇති කරලා, කුඩා තේ වතු වශයෙන් මේ බිම් කැබලි ලබා දෙන්න පුළුවන්කමක් තිබෙනවා නම්, තේ නිෂ්පාදනයට දැවැන්ත දායකත්වයක් බදුල්ල ප්‍රදේශයෙන් ලබා දෙන්න පුළුවන්කමක් තිබෙනවා කියලා අපි හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතකොට රැකියා ප්‍රශ්නය එක පැත්තකින් විසඳෙනවා; තේ නිෂ්පාදනය තව දුරටත් තීව්‍ර වෙනවා. ඒ නිසා අපි දැකලා තිබෙනවා, යැපීම් පදනම මත කරන්නා වූ කෘෂි කර්මාන්තය තමයි අද ලෝකයේ ඉතාමත්ම සශ්‍රීක වෙලා තිබෙන්නේ, එලදායී වෙලා තිබෙන්නේ කියලා. මේකට හොඳම නිදර්ශනය තමයි පහත රට පුංචි පවුලක් විසින් කුඩා වපසරියක තේ වගාව සශ්‍රීක ලෙස කරලා වැඩි නිෂ්පාදනයක් ලබා ගැනීම. මම හිතනවා ඒ න්‍යාය තමයි අපේ අද අසාර්ථක වූ තේ වගාව පවතින බදුල්ල දිස්ත්‍රික්කයේත්, මොනරාගල දිස්ත්‍රික්කයේත් තිබෙන තේ වතුවලටත් ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේ වගාව සඳහා අවබෝධය තිබෙන මේ දමිළ සහ සිංහල පිරිස තව කාලයකින් මිය පරලොව යනවා. එවිට ඒ අයගේ තාක්ෂණය, ඒ අයගේ තිබෙන මේ දැනුම් සම්භාරයත් නැති වෙලා යනවා. මේ වගාවන්වලට මිනිස්සු නැති වෙලා යනවා. ඒ නිසා තේ වගාව දියුණු කරන්න අවශ්‍ය නම්, අපට අර රබර් වගාවට වන සංරක්ෂකගේ භූමිය ලබා දෙනවා වාගේ මොනරාගල දිස්ත්‍රික්කයේත්, බදුල්ල දිස්ත්‍රික්කයේත් දෙමළ වතු කම්කරුවන්ට සහ ඒ වාගේම සිංහල අයට කුඩා තේ වතු වශයෙන් මේ බිම් කැබලි ලබා දීලා, ආධාර ලබා දීලා තේ කර්මාන්තය දියුණු කරන්න ක්‍රියා කිරීම වැදගත් කියලා මම විශ්වාස කරනවා.

තව කාරණා කීපයක් තිබෙනවා. කුඩා තේ වතු හිමියන් වර්තමානයේ මුහුණ දෙන ගැටලු ඉන් එකක්. විශේෂයෙන් ඌව පළාතේ තේ අස්වැන්න වැඩි කාලයේදී දළු ලබා දීම සඳහා කම්හල්වල ධාරිතාව ප්‍රමාණවත් නොවීම එක් ගැටලුවක්. ගරු ඇමතිතුමනි, නිෂ්පාදනය වැඩි කාලයට මේ දළු ප්‍රමාණය ලබා ගැනීමට කම්හල්වල ධාරිතාව ප්‍රමාණවත් නැහැ. විශාල කම්හල් ප්‍රමාණයක් වැහිලා තිබෙනවා.තේ කර්මාන්තශාලාවලට තව විශාල ඉඩකඩක් තිබෙනවා. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, අන්න ඒ ඉඩකඩ තුළ නව තේ කර්මාන්තශාලා ඇති කිරීම සඳහා බදුල්ල දිස්ත්‍රික්කයට අවස්ථාව ලබා දෙන්න කියලා.

ඒ වාගේම මොනරාගල දිස්ත්‍රික්කයේ පහළ කඳුකරයේ හෙක්ටයාර 250ක පමණ නව තේ වගාව කරලා තිබෙනවා. මැටිගහතැන්න ප්‍රදේශයේ තේ දළු විකිණීමට නොහැකි තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා මේ කාරණාව ගැන කල්පනා කරලා බදුල්ල දිස්ත්‍රික්කයේ නව තේ කම්හල් සඳහා ව්‍යාපාරිකයන්ට, ආයෝජකයන්ට, වතු සමාගම්වලට සහ පුද්ගලයන්ට අවස්ථාව ලබා දිය යුතුයි කියලා මම යෝජනා කරනවා. කුඩා තේ වතු හිමියන් සඳහා දරන වියදමට, ශ්‍රමයට සාපේක්ෂව තේ දළු අඩු වීම හේතුවෙන් ඔවුන්ට ලැබෙන ලාභය ප්‍රමාණවත් නොවෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉල්ලීමක් කරන්න කැමැතියි. ෆින්ලේස් සමාගම වැනි සමාගම් තමයි තේ දළු මිලදී ගන්නේ. නමුත් බදුල්ල දිස්ත්‍රික්කයේ රුපියල් 45කට තමයි තවමත් තේ දළු කිලෝ එකකට මිල නියම වෙලා තිබෙන්නේ. ඒක හොඳ තත්ත්වයක් නොවෙයි. නිෂ්පාදන වියදමට අනුව ලැබෙන ආදායම ඒ නිෂ්පාදකයාට දරා ගැනීමේ හැකියාවක් නැහැ. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා මේ සඳහාත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා. මම මීට වඩා යමක් කථා කරන්නේ නැහැ. මගේ කාලය අවසන් කියලා ඔබතුමා මට signal එක දීලා තිබෙනවා.

මම අවසාන වශයෙන් කියන්න කැමැතියි, බදුල්ල දිස්ත්‍රික්කයේ කුඩා තේ ඉඩම් වපසරිය හෙක්ටයාර 8,470ක් තිබෙනවාය කියලා. ඒ නිසා අපි මේ සමස්ත ආර්ථික බෝගය වගා කිරීම සඳහාත්, රැකියා උත්පාදනය සඳහාත්, මේ රටේ ජාතික නිෂ්පාදනය වැඩි කිරීම සඳහාත් ඔබතුමා ගන්නා වූ උත්සාහයට අපේ ප්‍රශංසාව හා ගෞරවය පුද කරනවා. ඒ වාගේම අපේ ඉල්ලීම් ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියන කාරණාව මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි. දැන් ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම ගරු ආර්. යෝගරාජන් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ආර්. යෝගරාජන් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எம்.எச். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

[අ. භා. 4.01]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවෙන් අනතුරුව මට කථා කරන්නට ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. ඩී.එස්. සේනානායක මැතිතුමාගෙන් පටන් ගත් එක්සත් ජාතික පක්ෂ සමය තුළ තේ, පොල්, රබර් කර්මාන්තය දියුණු වුණු හැටිත්, ඒ වාගේම රටේ අති දුෂ්කර ප්‍රදේශවලට ජලය අරගෙන ගිහිල්ලා ඒ ප්‍රදේශ සශ්‍රීක කරන්නට ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළ, ඒ ගත් වෑයම පිළිබඳවත් ප්‍රශංසාත්මකව කථා කිරීම පිළිබඳව විජිත් විජයමුණි ද සොයිසා මැතිතුමාට මා ස්තුතිය පුද කරනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඒ බව ඉතාම විවෘතව, බොහොම පැහැදිලිව ප්‍රකාශ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හැම කෙනෙක්ම ඉතිහාසයේ ඉඳලාම, පාසල් අධ්‍යාපන සමයේ ඉඳලාම දන්නා කාරණයක් තමයි අපේ රටේ ප්‍රධාන අපනයන ආදායම වශයෙන් තිබුණේ තේ, පොල්, රබර් බව. අපි එම තේ, පොල්, රබර් කර්මාන්තය තුළ යැපෙමින් සිටි අතර, 1977 දී එක්සත් ජාතික පක්ෂ රජය එම කර්මාන්තය පුළුල් කරන්නට ක්‍රියා කළා. එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තේ කර්මාන්තය, රබර් කර්මාන්තය, ඒ වාගේම පොල් කර්මාන්තය තව තවත් වැඩි දියුණු කරමින් එම කර්මාන්තවල නිෂ්පාදන විදේශ රටවලට යවලා විදේශ විනිමය උපයා ගැනීමේ මහත් වූ වැඩසටහනක් මේ රට තුළ ක්‍රියාත්මක කළා.

එම වැඩසටහන ඉදිරියට අරගෙන ආපු ආර්. ප්‍රේමදාස මැතිතුමාගේ සමය වෙන කොට අද අපේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රී ධුරයක් හොබවන ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා වශයෙන් පත් කරලා තේ කර්මාන්තය ක්‍රියාත්මක කළ හැකි රටේ කඳුකර ප්‍රදේශයේ පමණක් නොවෙයි, දකුණු ප්‍රදේශයේත් තේ කර්මාන්තය දියුණු කරන්නට සුවිශාල වැඩ කොටසක් කළා. ඒ වැඩ කොටස තුළ තේ කර්මාන්තයේ යෙදිලා ඉන්න උදවියට, රබර් කර්මාන්තයේ යෙදිලා ඉන්න උදවියට සහනාධාර ලබා දෙන්නට, පොහොර සඳහා සහනයක් ලබා දීමට, වගාව සඳහා සහනයක් ලබා දීමට, ඒ වාගේම කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සහනයක් ලබා දීමට වැඩසටහන් දියත් කළා; දිරිමත් කිරීම් කළා. ඒ දිරිමත් කිරීම තුළ අලුතින් කර්මාන්ත ඇති වුණා, අලුතින් වගාව දියුණු වුණා. ඒ වගාව දියුණු වෙලා කර්මාන්ත ඇති වෙනවාත් එක්කම අලුතින් රැකියා උත්පාදනයක් සිද්ධ වුණා. එවැනි ඉතිහාසයක් තිබෙන තේ සහ රබර් කර්මාන්තය විශේෂයෙන්ම අද මේ සභාවේ විවාදයට භාජනය කරලා තිබෙන කාරණයක්.

එක්සත් ජාතික පක්ෂයෙන් ආණ්ඩුවට සම්බන්ධ වුණු, එක්සත් ජාතික පක්ෂයෙන් පන්නරයක් ලබපු අපේ ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමාට අද එම කර්මාන්තය භාර දීලා තිබෙනවා. එතුමා එදා එක්සත් ජාතික පක්ෂයේ ඉන්න කොටත් තමන්ට පැවරුණු විෂය පිළිබඳව මනා හැඟීමකින්, කැපවීමකින් වැඩ කළා. තමන්ට අදාළ විෂයයට අමතරව පාර්ලිමේන්තුවේ තමන්ගේ මන්ත්‍රීවරුන්ගේ සුභසාධනය පිළිබඳවත් එතුමා සොයලා බැලුවා. එතුමා ඒ වාගේ කැපවීමෙන් වැඩ කළ ඇමතිවරයෙක් කියන එක නිර්ලෝභීව අපි මේ සභාවේදී මතක් කරනවා.

ගරු ඇමතිතුමනි, අද මේ සියලු කර්මාන්ත කරලා, තේ වගාව දියුණු කරලා, පොල් වගාව දියුණු කරලා, රබර් වගාව දියුණු කරලා ඒ නිෂ්පාදන පිට රටවලට යවලා විදේශ විනිමය සොයා ගැනීම අපේ එක අරමුණක්. එය රටේ ආර්ථිකයට ඉතාමත්ම වැදගත් වෙනවා. මෑතක සිට ඇති වෙලා තිබෙන මහා කනගාටුදායක තත්ත්වය උඩ මේ කර්මාන්ත ඉදිරියට පවත්වා ගෙන යෑමේ අවදානමක් අපට දැන් පෙනී යනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකක්ද අවදානම? විශේෂයෙන්ම මේ තේ කර්මාන්තයේ නියැළී සිටින්නේ වැඩි වශයෙන් ද්‍රවිඩ ජනතාව.

අද රටේ ඒ ද්‍රවිඩ ජනතාව ඉන්න ප්‍රදේශවලත් ඒ වාගේම බහුතරය මුස්ලිම් ජනතාව ඉන්න ප්‍රදේශවලත් සාමය පිළිබඳව යම් ප්‍රශ්නයක් උද්ගත වෙලා තිබෙනවා. ඒ තත්ත්වය නිර්මාණය වෙන්න හේතු වුණේ මොකක්ද? මේ වාගේ ප්‍රශ්න ඇති වන විට, කලහකාරී තත්ත්වයන් ඇති වන විට, සාමය බිඳ වැටීම් ඇති වන විට තේ කර්මාන්තය දියුණු කරන්නේ කොහොමද? රබර් කර්මාන්තය දියුණු කරන්නේ කොහොමද? පොල් කර්මාන්තයේ වැඩි නිෂ්පාදනයක් ලබා ගන්නේ කොහොමද? ජනතාව අතර අසමඟිය ඇති වෙලා, ජනතාව අතර අවිශ්වාසය ඇති වෙලා, ජනතාව අතර කලබැගෑනි ඇති වෙලා ජනතාව කලහකාරි ලෙස හැසිරෙන තැනට ඇවිල්ලා තිබෙනවා. මේවා ඇති වන්නට හේතුව මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේදී අපි මේ පිළිබඳව දිගින් දිගටම කිව්වා. මේ සභාවෙන් පිටතත් අපි දිගින් දිගටම කිව්වා. රටක නීතිය ක්‍රියාත්මක නොවන විට, රටේ නීතිය යම් යම් උදවියගේ අතට ගන්නා විට, රටේ ජනතාව ඒ පිළිබඳව අවිශ්වාසයෙන්, සැකයෙන් බලන තැනකට ඇවිල්ලා තිබෙනවා. අද අපේ රටට වෙලා තිබෙන්නේ ඒකයි. අද රටේ ජනතාව නීතිය ක්‍රියාත්මක වෙනවාද කියන එක පිළිබඳව දැවැන්ත සැකයක් ඇති කර ගෙන ඉන්නවා. ඒ වාගේ දැවැන්ත සැකයක් ඇති කර ගෙන තිබෙන නිසා තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රිය අනතුරක් සිදු වෙලා එයින් පුද්ගලයෙක්ව මරණයට පත් වුණා නම් ජනතාව නීතිය අතට අර ගෙන ඒ වාහනය ගිනි තබන්නට, රියදුරාට පහර දෙන්නට, රියදුරා මරා දමන්නට යන තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ. ජනතාව තුළ නීතිය සාධාරණව ක්‍රියාත්මක වනවාද කියන එක පිළිබඳව දැඩි අවිශ්වාසයක් ඇති වෙලා තිබෙනවා. ඒ අවිශ්වාසය පොලිස් නිලධාරින් කෙරෙහි බලපා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අවිශ්වාසය අධිකරණය කෙරෙහි බලපා තිබෙනවා. මේ වාගේ තත්ත්වයක් උඩ ජනතාව නැවතත් කැලඹිලි තත්ත්වයකට එනවා නම් මේ කර්මාන්ත දියුණු කරලා, මේ කර්මාන්ත රටේ සංවර්ධනයට, ආර්ථිකයට දායක කර ගන්නේ කොහොමද? එතැන නැවතත් විනාශයක් ඇති වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා රබර් කර්මාන්තය, තේ කර්මාන්තය කර ගෙන යන විට විශේෂයෙන් ඒ ජනතාව ඉන්න ප්‍රදේශවල කැලඹීම් ඇති වීමට හේතු කාරණා දැන් උත්පාදනය වෙලා තිබෙනවා. එහෙම වුණොත් මේ කර්මාන්තයේ අනාගතයට දැවැන්ත බලපෑමක් ඇති වෙනවා. ඒ නිසා නීතිය කඩා වැටීමට ඉඩ නොදිය යුතුයි. අපි දිගින් දිගට කිව්වා මේක කඩා වැටෙන්න දෙන්න එපා, නීතිය ආරක්ෂා කරන්නන් කෙරෙහි ජනතාවගේ විශ්වාසය තබා ගන්න කියලා. නමුත් ඒක වුණේ නැහැ.

අද ග්‍රීස් යක්කු කතන්දරයක් ඇවිල්ලා තිබෙනවා. ඇයි? රටේ ජනතාව බලන් හිටියා ගරු ඇමතිතුමනි, රටේ නීතිය බරපතළ විධියට කඩා වැටෙනවා. අධිකරණයට පුද්ගලයෙක් ඉදිරිපත් කළාම, නීතිපතිතුමා වෙත ගොනුවක් යවපුවාම නීතිපතිතුමා නඩු ගොනුවේ මුල ඉඳන් අගට බලලා, අග ඉඳන් මුලට බලලා අධි චෝදනා පත්‍ර ගොනු කරන්න කියලා තීන්දුවක් දෙනවා. අසවල්, අසවල් චෝදනා යටතේ අධි චෝදනා පත්‍ර ගොනු කරන්න කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විධියට අධිකරණයේදී අධි චෝදනා පත්‍ර ගොනු කළාම ටික කාලයක් යන විට නැවත නීතිපතිතුමා විසින්ම කියනවා ඒ අදාළ තැනැත්තාට විරුද්ධව චෝදනා සනාථ කරන්නට සාක්ෂි ප්‍රමාණවත් නැහැ, ඒ නිසා ඔහුව ඒ චෝදනාවලින් මුදා හරින්න කියලා. මම උදාහරණයක් කියන්නම්. ස්ත්‍රී දූෂණ නඩුවක් තිබුණා. ඒ නඩුව විභාග කරන්න නීතිපතිතුමා නියෝග දීලා තිබෙනවා. නීතිපතිතුමා විසින් කෙටුම්පත් කරලා අධි චෝදනා පත්‍රය භාර දීලා තිබෙනවා. එහෙම තිබියදී නීතිපතිතුමාම සාක්ෂි ප්‍රමාණවත් නැහැ, කරුණු නැහැ, ඒ නිසා මොහුව නිදහස් කරන්න කියලා ඒ අධි චෝදනා පත්‍රය නැවත අධිකරණයේ විනිශ්චයකාරතුමා වෙත යොමු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට නාන්පමුණුව මිනී මැරුම් නඩුව විභාග වී නඩුව අවසාන වීගෙන යන විට නැවතත් නීතිය ක්‍රියාත්මක නොවන තැනට යනවා. නීතිපතිතුමා මුලින් යවපු නියෝගය නැවත වෙනස් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට සමෘද්ධි මුදල් වංචාවක් පිළිබඳව නඩුවක් තිබුණා.

ඒ නඩුවත් විභාග වීගෙන යන කොට නීතිපතිතුමා මුලින් දුන්නු නියෝගය ඉවත් කරලා දැම්මා. දැන් බලන්න, මේවා තුළ අවිශ්වාසයයි ඇති වන්නේ. ඊළඟට එක්තරා ඇමතිවරයකුට විරුද්ධව චෙක් ගනුදෙනු සම්බන්ධ ප්‍රශ්නයක් තිබුණා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නඩුවත් විභාග වීගෙන යන කොට අවසානයේදී නීතිපතිතුමා නියෝගයක් දුන්නා, "මේ නඩුව විභාගයට ගන්න එපා. මේක අවසන් කරන්න. මේකට කරුණු මදි" කියලා. ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම හමුවේ එක්තරා අමාත්‍යවරයෙක් කෝටි ගණනක මුදල් ඉපැයීමක් පිළිබඳව පැමිණිල්ලක් තිබුණා. අවසානයේදී වෙච්ච දෙයක් නැහැ. ගොනුවත් ඉවරයි. විභාග කරපු නිලධාරින් විතරක් මාරු කරලා තිබෙනවා. මා මේ එකින් එකට සඳහන් කළේ කරුණු කිහිපයක් ගැනයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙම ක්‍රියාවලිය තුළ නීතිය පිළිබඳව දිගින් දිගටම ජනතාවගේ විශ්වාසය කඩ වෙනවා. නීතිය ක්‍රියාත්මක කරවන නිලධාරින් පිළිබඳව විශ්වාසය නැති වනවා. අන්න එතකොට සමාජයේ විනය නැති වනවා. සමාජයේ විනය නැති වන කොට තේ කර්මාන්තයටත් ඒක බලපානවා. සමාජයේ විනය විනාශ වන කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රබර් කර්මාන්තයටත් ඒක බලපානවා. මොකද, ජනතාව තමයි මේ ක්‍රියාවලියේ යෙදිලා ඉන්නේ; සේවකයන් වශයෙන් මේවායේ වැඩ කටයුතු කරන්නේ. අර අවිශ්වාසය තුළ රටේ ඇති වන අසහනකාරී වාතාවරණයත් එක්ක ඒ කණ්ඩායම තුළ කලබලකාරී තත්ත්වයක් ඇති වනවා නම්, අවිශ්වාසයක් ඇති වනවා නම්, නීතිය අතට ගන්න තත්ත්වයක් ඇති වනවා නම් අපේ ගරු ඇමතිතුමා කොච්චර දක්ෂයෙක් වුණත්, අපේ ගරු ඇමතිතුමා කොච්චර මානව හිතවාදියෙක් වුණත්, අපේ ගරු ඇමතිතුමා කොච්චර සූක්ෂ්ම පුද්ගලයෙක් වුණත් මේ කර්මාන්තයේ දියුණුව සඳහා ජනතාව යොමු කර ගන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

දැන් බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය වකවානුවේ සිද්ධ වෙච්ච දේවල්. බාල පෙට්‍රල් ගෙනාවා. වාහන දෙදහසකට වැඩිය මහ පාරේ නතර වුණා. වාහන හිමියන් අතින් වියදම් කර ගෙන ඒවා යථා තත්ත්වයට පත් කර ගත්තා. මේකට වග කිව යුත්තන් සම්බන්ධයෙන් කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. ඒ වග කිව යුත්තන් අල්ලන්න යන කොට ඒ ගොල්ලනුත් ලිස්සලා යනවා ග්‍රීස් යකා වාගේ. දැන් අල්ලන්න බැරි එකා තමයි ග්‍රීස් යකා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බාල පෙට්‍රල්වලට වග කිව යුතු පුද්ගලයාත් අල්ලන්න බැහැ. ලිස්සලා යනවා ග්‍රීස් යකා වාගේ. අනෙක බලන්න, හෙජින් නඩුවට වෙච්ච දේ. හෙජින් ගනුදෙනුවේ අද වනකම් වග කිව යුත්තෙක් නැහැ. ඊට විරුද්ධව ක්‍රියාමාර්ගයක් නැහැ. අල්ලන්න ගියොත් ඒත් ග්‍රීස් යකා වාගේයි. ඊළඟට සේලයින් ගෙනාපු සිද්ධිය බොහොම කාලයක් ගත වෙච්ච සිද්ධියක්. කල් ඉකුත් වූ සේලයින් ගෙනැල්ලා කෑ කෝ ගැහුවා. ඊළඟට ඊයේ පෙරේදා මේ රටේ වුණු අලුත්ම සිද්ධිය තමයි බාල සිමෙන්ති ගෙන ඒමේ සිද්ධිය. රේගුවෙන් පැනලා තේ එකක් බිබී තමයි මේ මිනිස්සු සිමෙන්ති ටික පැටෙව්වේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ බාල සිමෙන්ති ගෙනාපුවාම ප්‍රමිතිය දෙන්න බැහැ කිව්වාම, ප්‍රමිති කාර්යාංශය පැත්තකට දාලා, රේගුවේ නීති රීතිත් අභිභවා ගිහිල්ලා සිමෙන්ති රටට බෙදලා තිබෙනවා. දැන් මේ තත්ත්වය උඩ මොකක්ද ඇති වෙලා තිබෙන්නේ?

මේ තත්ත්වය තුළ නීතිය කෙරෙහි, පාලනය කෙරෙහි රටේ මිනිස්සුන්ගේ තිබුණු විශ්වාසය සම්පූර්ණයෙන්ම කඩා වැටුණා. මෙන්න මේ කඩා වැටීම තුළ තමයි තේ කර්මාන්තයේ ඉන්න ජනතාවත්, රබර් කර්මාන්තයේ ඉන්න ජනතාවත් කලබලයට පත් වන්නේ. අන්න එතැනදී තමයි රටේ විශාල විනාශයක් ඇති වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්න පුත්තලම දිස්ත්‍රික්කය තුළ ඊයේ පෙරේදා ඇති වෙච්ච තත්ත්වය. පසු ගිය 21 වැනි දා මනල්ගුන්ඩුව කියන ප්‍රදේශයේ- [බාධා කිරීමක්] ඉන්නවා, ඉන්නවා. එතුමා විතරක් නොවෙයි, අපිත් අයිතිකාරයෝ. [බාධා කිරීමක්] හරි, එතුමාත් අයිතිකාරයෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුත්තලම මනල්ගුන්ඩුව ප්‍රදේශයේ යම් අසහනකාරී, කලබලකාරී තත්ත්වයක් ඇති වුණා. පුත්තලම අනුරාධපුර මාර්ගයේ, පුත්තලම නගරයේ ඉඳලා කිලෝ මීටර් දෙකක් විතර ඈතින් තිබෙන ඒ ප්‍රදේශය ගැන අපේ ගරු පියංකර ඇමතිතුමාත් දන්නවා. ඒ ප්‍රදේශයේ කලබලකාරී තත්ත්වයක් ඇති වුණාම ග්‍රාම නිලධාරි මහත්මයාත්, අනෙක් ජනතාවත් ඒකරාශි වෙලා ඒ ප්‍රශ්නය බේරුම් කර ගත්තා. සාමය කඩ වීම වළක්වා ගන්න පුළුවන් වුණා. ඒ තත්ත්වය වළක්වා ගත්තාට පස්සේ එතැනට ගියා නගරාධිපතිතුමා. එතුමා ගිහිල්ලා කිව්වා, සියලු ජනතාවට පුත්තලම නගරයේ තිබෙන මුස්ලිම් මහ පල්ලියට එන්නය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියලු ජනතාව පුත්තලම මුස්ලිම් මහ පල්ලියට ආවා, කිලෝ මීටර් දෙකක් ගෙවා ගෙන. එහෙම ආපුවාම, "විරුද්ධ පක්ෂය විසින් ජනතාව කුපිත කරවීම සඳහායි මේක කරලා තිබෙන්නේ. කිසි දෙයකට භය වෙන්න එපා, ඕනෑ දෙයක් කරන්න. මම ඉන්නවා තමුන්නාන්සේලා බේරා ගන්න" කියලා මුස්ලිම් මහ පල්ලිය තුළදී නගරාධිපතිවරයා ප්‍රකාශයක් කළා.

නගරාධිපතිවරයාගේ ඒ ප්‍රකාශය ජනතාව හිතට ගත්තා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ හයිය ඇඟට ගත්ත ජනතාව එළියට ආවා. ජනතාව එළියට එනකොට ඩබ්ලිව්.එම්. නවරත්න බණ්ඩාර පොලිස් කොස්තාපල්වරයා, සැකකටයුතු පුද්ගලයෙක් සම්බන්ධ තොරතුරක් ලැබී ඒ පුද්ගලයා පොලිසියට අරගෙන එන්නට ගිහින් සිටියා. අනේ! ජනතාව පාරට බැහැලා ඉන්නකොට ඔහු හිතන්න ඇති, මේ රාමසාන් කාලය නිසා නෝම්බි උපවාසය අවසන් කරලා ජනතාව පාරට ඇවිල්ලා ඉන්නවාය කියලා. ඒ ජනතාව අසලින් නවරත්න බණ්ඩාර පොලිස් කොස්තාපල්වරයා එනකොට ඔහුව අල්ලා ගත්තා. ඔහු අල්ලාගෙන ඔහුට පහර දීලා තිබෙනවා. ඒ වෙලාවේ ඔහු වැඳ වැඳ කියා තිබෙනවා, "මට ගහන්න එපා; මම පොලිසියේ රාළහාමි කෙනෙක්"ය කියලා. ඔහුගේ මෝටර් සයිකලය පුච්චා දැම්මා. ඔහු වඩිද්දීත් කඩු, කැති, පොලු අරගෙන ආයුධ සන්නද්ධව හිටපු ඒ උදවිය කොස්තාපල්වරයාට පහර දුන්නා විතරක් නොවෙයි නවරත්න බණ්ඩාර පොලිස් කොස්තාපල්වරයා පෙතිවලට කපලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have only one more minute.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
විනාඩියකින් මගේ කතාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නවරත්න බණ්ඩාර පොලිස් කොස්තාපල්වරයා ඝාතනයට ලක් වුණා. ඔහුගේ මාස හතරක ගැබිනි බිරිඳ අද මේ සමාජය තුළ තනි වුණා. ඒ කාගේ ක්‍රියාවලියක් නිසාද? කවුද ඒ මනල්ගුණ්ඩුවේ ජනතාව මුස්ලිම් පල්ලියට ගෙන්වලා ඔවුන්ව කුපිත කළේ? කාටද ඒ වගකීම යන්නේ? අද ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව පැවැත්වෙන අවස්ථාවේදී

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

මම අතිගරු ජනාධිපතිතුමාගේත්, ආරක්ෂක ලේකම්තුමාගේත් අවධානය යොමු කරනවා ජනතාව කුපිත වන විධියට මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරවන්න මැදිහත් වෙලා තිබෙන්නේ කවුද කියන එක පිළිබඳව විශේෂ පරීක්ෂණයක් පවත්වන්නය කියා.

අද පත්තරේ තිබෙනවා, ග්‍රීස් යකා නිසා කල්පිටිය ප්‍රදේශයෙන් 14 දෙනෙකුත්, පුත්තලම ප්‍රදේශයෙන් 16 දෙනෙකුත් අත් අඩංගුවට අරගෙන තිබෙනවාය කියා. ඇත්තෙන්ම කවුද මේ ග්‍රීස් යකාගේ කතාව පුත්තලම නගරයට ගෙනාවේ? මනල්ගුණ්ඩුවේ ජනතාව පුත්තලම මුස්ලිම් පල්ලිය දක්වා ගෙන්නුවේ කවුද? නගරාධිපතිවරයායි. එහෙම නම් ඒ පොලිස් කොස්තාපල්වරයාගේ මරණයේ වගකීම නගරාධිපතිවරයාට අනියමින් හෝ පැවරෙනවාය කියන එක ඒ ප්‍රදේශයේ ජීවත් වෙන පුරවැසියෙක් වශයෙන් මම ඉතාමත් වග කීමෙන් යුතුව කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පසුගිය 22වැනි දා හැන්දෑවේ 6.30ට රාමසාන්උපවාසය අවසන් කරලා නාරක්කල්ලියේ පල්ලිය ළඟ ජනතාව ඒකරාශී වෙලා හිටියා. නාරක්කල්ලියේ පල්ලිය ළඟ ජනතාව රැස් වෙලා හිටපු තැනට ආරක්ෂක අංශයේ වාහන තුනක් ගියා. ඒකෙන් බැහැපු නිලධාරින් පොලු අරගෙන පහර දීගෙන, පහර දීගෙන ගියා. පී. සිවකුමාර් කියන පුද්ගලයාත් ඒ පහර කෑමට ලක් වුණා. පලා ටිකක් කඩා ගෙන ගිහින් විකුණා ජීවත් වුණු ඔහු දරුවන් තුන් දෙනෙකුගේ පියෙක්. බිරිඳත්, දරුවන් තුන් දෙනාත් ගෙදර ඉන්දැද්දි පලා වෙළඳාමේ ගිහින් පල්ලිය ළඟට ගිය ඒ පුද්ගලයාත් ඒ පහර කෑමට ලක් වුණා. එදා රාත්‍රී 11.00ට විතර ඒ පුද්ගලයා පුත්තලම රෝහලට ඇතුළත් කළා. ඊයේ දහවල් 11.00 වෙනකොට පුත්තලම රෝහලේදී ඒ පුද්ගලයා මිය ගියා. මගේ කතාව විනාඩියකින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සිවකුමාර් මිය ගියාට පසුව ඔහුගේ පවුලේ උදවියටත්, ඒ සිද්ධිය දැකපු උදවියටත් තර්ජනය කර තිබෙනවා, පොලීසියට ප්‍රකාශ දෙනකොට, මහෙස්ත්‍රාත්තුමා ඉදිරියේ ප්‍රකාශ දෙනකොට ආරක්ෂක අංශයේ උදවිය පහර දුන්නාය කියන කතාව කියන්න එපාය කියා. කවුද එතකොට මේ ග්‍රීස් යක්කු කියන්නේ? මේ අපරාධ කරන, අහු වෙන්නේ නැති ග්‍රීස් යක්කු කවුද?

දැන් රටේ මිනිස්සුන්ගේ මතයක් තිබෙනවා, ගමේ ජනතාව පහර දෙනකොට, අල්ලා ගන්න යනකොට මේ ග්‍රීස් යක්කු සියල්ලෝම දුවගෙන යන්නේ හමුදා කඳවුරටය, පොලීසියටය කියා. විනාතවිල්ලුවේ නාවික හමුදා කඳවුරේ එවැනි සිද්ධියක් වුණා. ජනතාව ගිහින් වට කරලා ගිනි තියන්න හැදුවා. කල්පිටිය කඳවුරට එහෙම වුණා. කල්පිටිය පොලීසියේ කොස්තාපල්වරයකුට එහෙම පහර දුන්නා. අද "ලංකාදීප" පුවත් පතේ එවැනි ප්‍රවෘත්තියක් තිබෙනවා, "නාඳුනන අයෙකු ඇවිත් යැයි තොරතුරකට ගිංතොටට ගිය පොලිස් පිරිසකට පහර දෙති" කියා. ඇයි? අන්න අර විධියට දිගින් දිගටම නීතිය කඩා වැටීම නිසා, රටේ විනය කඩා වැටීම නිසා අද ජනතාව තුළ නීතිය පිළිබඳවත්, නීතිය ක්‍රියාත්මක කරන පාර්ශ්වය පිළිබඳවත් විශ්වාසය නැතුව ගිහින් තිබෙන නිසායි. ඒ විශ්වාසය කඩා වට්ටන්න කටයුතු කර තිබෙන්නේ අවුරුදු 18ක පාලනයක් ගෙන යන මේ ආණ්ඩුවය කියන එක අපි මේ සභාවට ඉතා වග කීමෙන් කියනවා. මේ තත්ත්වය මෙහෙම ගියොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරියේදී පොලිස් නිලධාරියෙකුට එළියට බැහැලා රාජකාරියක් කරන්න, හමුදා නිලධාරියෙකුට එළියට බැහැලා රාජකාරියක් කරන්නට බැරුව යාවි.

ඒ තත්ත්වයත් එක්ක රටේ අනෙකුත් අංශවලට, එනම් රබර් නිෂ්පාදන අංශවල උදවියට, රබර් කර්මාන්තයේ යෙදෙන උදවියට ඒ වාගේම තේ කර්මාන්තයට අදාළ රජයේ නිලධාරින්ට එළියට බැහැලා රාජකාරියක් කරන්න බැරි වේවි; ඒ උදවියත් ග්‍රීස් යකුන් විධියට පිළිගනීවි; ඒ විධියට සලකලා කටයුතු කරාවි. අන්න ඒ භයංකාර තත්ත්වයට, රටේ නීතිය කෙරෙහි තිබෙන විශ්වාසය බිඳ දමන තත්ත්වයට මේ රට තවදුරටත් ගෙන යන්න එපා කියන කාරණය රජයට මතක් කරමින් මම නවතිනවා. ඔබතුමාට බොහොම ස්තුතියි.

[අ. භා. 4.20]

**ගරු වෛද්‍ය රෝහණ පුෂ්ප කුමාර මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ரோஹண புஷ்பகுமார)
(The Hon. (Dr.) Rohana Pushpa Kumara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාමත් වැදගත් නියෝග දෙකක් ඉදිරිපත් කර තිබෙන මොහොතේ විරුද්ධ පාර්ශ්වයේ, එක්සත් ජාතික පක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන් මේ වැදගත් කටයුත්ත ගැන කථා කරනවාට වඩා මේ රටේ ග්‍රීස් යකෙක් ගැන කථා කරලා, මේ රටේ ජනතාව මුළා කරන සභාවක් බවට මේ ගරු සභාව පත් කිරීම පිළිබඳව මම පෞද්ගලිකව කනගාටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ, මීට සතියකට ඉස්සෙල්ලා මගේ බණ්ඩාරවෙල ආසනයේ අහිංසක තරුණ දරුවන් දෙන්නෙක්, -වතුකරයේ ජනතාවට වෙළෙඳාම් කරන තරුණයන් දෙන්නෙක්- ඔවුන් කරපු වෙළෙඳාමේදී ණයට දුන් භාණ්ඩවල මුදල් ගන්න වතුකරයේ වැටුප් දවසේ ගිය අවස්ථාවේදී අමු අමුවේ ගහලා මරලා දැම්මාය කියන කාරණය. පොලීසියටවත්, ත්‍රිවිධ හමුදාවටවත් කිසි කෙනකුට ළං වන්න බැරි තත්ත්වයකට පත් වෙමින් ඒ මිනීස් ඝාතන සිදු වුණා. ඒ අවස්ථාවේදීත් කථා වුණේ, "මේ ග්‍රීස් යක්කු දෙන්නෙක් ඇවිල්ලා. ඒ නිසා ඔවුන් මැරුවා" කියන එකයි. පසුව කළ විමසුමේදී අපි පැහැදිලිව දැක්කා, එදා වේල හොයා ගෙන ජීවත් වන අහිංසක තරුණයින් දෙදෙනකු එදා ඒ වතුකරයට ගිය අවස්ථාවේදී ඒ වාගේ ශෝකජනක අවස්ථාවකට පත් වෙලා, ඔවුන්ගේ අහිංසක බිරින්දෑවරුන්, දරුවන් අතරමං කරලා මේ සමාජයෙන් ඔවුන්ට අයින් වන්න සිදු වුණාය කියන එක.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ මේ රජය අවුරුදු තිහක යුද්ධය අවසන් කරලා, මේ රටේ සාමය නිර්මාණය කර, මේ රටේ සංවර්ධනය ගැන කටයුතු කරන මොහොතක, මේ රටේ සංවර්ධනය තුළින් මහජනතාවගේ ආර්ථිකය නංවන්න කටයුතු කරන මොහොතක, නැවතත් එක එක මාධ්‍යවලින් එක එක රූපවලින් යම් කිසි කණ්ඩායමක් එය වළක්වන්න උත්සාහ කරනවා නම්, ඔවුන් දේශපාලනයේ මොන පක්ෂයක වුණත් අප ඒ අයගෙන් එක ඉල්ලීමක් කරනවා. මේ රටේ ජනතාව මේ ගරු කටයුතු පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් විධියට අපව පත් කර එවා තිබෙන්නේ මේ රටේ සැබෑ ජනතාවගේ අවශ්‍යතාවන් සම්පූර්ණ කරනවා වාගේම ඔවුන්ගේ දියුණුව සඳහා කථා කරන්නත්, ඒ සඳහා කටයුතු කරන්නත්. ඒ නිසා මේ රට සංවර්ධනය වන මේ අවස්ථාවේදී මේ රජය අප්‍රසාදයට පත් කරන්න යම් කිසි කෙනකු මේ පාර්ලිමේන්තු ගැබේ කටයුතු කරනවා නම් ඒ අයගෙන් මම ඉල්ලීමක් කරනවා, "මේ දේ කරන්න එපා" කියලා. "ග්‍රීස් යක්කු" කියන මේ සංකල්පය තුළින් මේ රටේ අහිංසක ජනතාව තළා පෙළනවා මිසක්, ඒ වාගේම අහිංසක ජීවිත විනාශ වනවා මිසක් එතැනින් එහාට දෙයක් සිදු වන්නේ නැහැයි කියන එක මම මතක් කරන්න කැමැතියි. ඒ නිසා වග කීමක් තිබෙන ගරු කටයුතු මන්ත්‍රීතුමන්ලාගෙන් මම කාරුණික ඉල්ලීමක් කරනවා, මේ ප්‍රකාශ තුළින් මේ කිසිම තේරුමක් නැති කාරණයක් මිනිස් හදවත් තුළට ගිහිල්ලා අද සාමයෙන් සිටින ජනතාව නැවතත් භයෙන් ජීවත් වන ජනතාවක් බවට පත් කරන්න කටයුතු කරන්න එපායි කියා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම දැන් අදට අදාළ විෂයයට එන්න කැමැතියි. කලින් සඳහන් කළා වාගේ වැවිලි කර්මාන්ත පිළිබඳ අපේ ගරු අමාත්‍යතුමා දූර දක්නා නුවණක් ඇතුව කටයුතු කරන ඉතාම දක්ෂ අමාත්‍යවරයකු විධියට මම දකිනවා. ඒකට හේතුව තමයි එතුමා මෙම අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ හැම දිස්ත්‍රික්කයක්ම, හැම ආසනයක්ම පාසා ගිහිල්ලා වතුකරයේ ඉන්නා අය ඒ වාගේම කුඩා වතු හිමියන් හමු වෙලා ඔවුන්ගේ අවශ්‍යතාවන් මෙන්ම ඔවුන්ට තිබෙන ගැටලු පිළිබඳවත් කථා කරලා, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ජනතාව වෙනුවෙන් එදා කරපු සේවය. මා මේ අවස්ථාවේදී එය සිහිපත් කරන්නට ඕනෑ.

අද ඉදිරිපත් කර තිබෙන මේ නියෝග යටතේ 1989 දී පහත රට කොට්ඨාසයට ලබා දුන් රුපියල් 41,000ක තේ නැවත වගා සහනාධාරය රුපියල් 2,40,000 දක්වා වැඩි කර තිබෙනවා. 1989 දී උඩ රට සහ මැද රට තේ වගාව සඳහා ලබා දුන් රුපියල් 48,000ක සහනාධාරය අද රුපියල් 2,50,000 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම පාළු සිටුවීමේ සහනාධාර වශයෙන් 1989 දී එක් පැළයක් සඳහා ලබා දුන් රුපියල් 4.00ක මුදල අද රුපියල් 25 දක්වා වැඩි කර තිබෙනවා. ඒ අනුව කුඩා තේ වතු හිමියන් දිරි ගන්වන්න වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ගෙනාපු මේ නියෝග ඉතා වැදගත් වන බව මම මතක් කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට හේතු කාරණා කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම අද මේ රටේ කුඩා තේ වතු හිමියන් මුළු තේ නිෂ්පාදනයෙන් සියයට 74ක දායකත්වයක් ලබා දෙනවාය කියන එක මම මතක් කරන්න ඕනෑ. මීට කලින් ගරු මන්ත්‍රීවරු සඳහන් කළ පරිදි FAO - Food and Agriculture Organization of the United Nations වැඩ සටහන යටතේ ඉන්දියාවේ නවදිල්ලියේ දී ඉදිරිපත් කළ කාරණය ගැන මා ළඟ සටහනක් තිබෙනවා. ඒකයි මම මේ පෙන්වන්නේ. එහි මෙසේ සඳහන් කර තිබෙනවා:

"The total extent of tea in Sri Lanka is around 221,968ha out of which 132,329ha (59 percent) belongs to tea small holders and they contribute about 74 per cent of national production. Therefore, tea small holders play a major role in the tea production of Sri Lanka."

මෙම වාර්තාව මම **සභාගත*** කරන්න කැමැතියි.

අද මේ රටේ තේ වගාව ගැන කථා කරන කොට ඒ සඳහා කුඩා තේ වතු හිමියන් විශාල දායකත්වයක් ලබා දෙනවාය කියන එක අපට කියන්න පුළුවන්. එදා වතුකරයේ ජනතාවට තිබුණු, නමුත් පෞද්ගලීකරණය කිරීම නිසා පෞද්ගලික ආයතනවලට හිමි වුණු, ඒ ආයතන මඟින් පවත්වා ගෙන යන තේ වගාවලට සිදු වුණු හානිය සහ ඒ තුළින් ඒ ජනතාවට වුණු හානිය ගැන කලින් කථා කරපු සමහර මන්ත්‍රීවරු කරුණු පැහැදිලි කළේ නැහැ. ඔබතුමා දන්නවා, මේ රජය පත් වුණාට පස්සේ පසු ගිය අවුරුදු කිහිපය තුළ විශේෂයෙන්ම මම ජීවත් වන බදුල්ල දිස්ත්‍රික්කයේ වතුකරයේ ජනතාවගේ අධ්‍යාපනය නංවන්න රජයත්, පළාත් සභාවත් විශාල වශයෙන් කටයුතු කර තිබෙන බව. ඒ නිසාම අද ඔවුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු වෙලා තිබෙනවා. එදා වතුකරයේ අහිංසක දමිළ ජනතාව තේ දළු කඩලා ජීවත් වුණාට, ඒ ජනතාවගෙන් බිහි වුණු දෙවැනි පරම්පරාව අද හොඳ රැකියා කරන තත්ත්වයට පත් වී තිබෙනවා. ඒ නිසා, තේ දළු ටික නෙළා ගන්න කණ්ඩායමක් සොයා ගන්න බැරි තත්ත්වයට අද ඒ වතු සමාගම්වලට පත් වෙලා තිබෙනවා.

***** **පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ වාගේම ඔබතුමා දන්නවා එදා හැම වත්තකටම සෞඛ්‍ය පහසුකම්, මාර්ග පහසුකම්, අධ්‍යාපන පහසුකම් ලබා දුන්නේ ඒ වතු අයිති පුද්ගලයන් හරහා බව. නමුත් අද රජය විධියට, පළාත් සභා විධියට වතුකරයේ තිබෙන ඒ පාසල් දියුණු කරනවා වාගේම රෝහල් පවා දියුණු කර තිබෙනවා. එදා රෝහල්වල හිටියේ EMA -Estate Medical Assistants- කියන වෛද්‍යවරු. ඔවුන්ට කිසිම සුදුසුකමක් නැහැ, ඒ ජනතාවට බෙහෙතක් කරන්න. නමුත් එදා තිබුණු තත්ත්වය අනුව EMAලා තමයි වතුකරයේ ජනතාවට බෙහෙත් ටික දුන්නේ. අද ඌව පළාතේ රෝහල් 20ක් රජයට පවරා ගෙන, ඒවාට MBBS වෛද්‍යවරු පත් කරලා වතුකරයේ ජනතාවගේ සෞඛ්‍ය නංවන්න කටයුතු කරලා තිබෙනවා.

"ගම නැඟුම" හරහා තමයි අද වතුකරයේ මාර්ග පද්ධතිය සකස් වන්නේ. වතුකරයේ ජනතාව වෙනුවෙන් ඒ වතු හිමියන් කරන්න ඕනෑ යුතුකම් අද රජය විසින් භාර ගෙන ඉටු කරනවාය කියන එක මා මතක් කරන්න ඕනෑ. මා හිතනවා, අපි නොදැක්කා වුණත් ගරු ඇමතිතුමා දූර දැකලා තිබෙනවා කියලා. තව අවුරුදු 5ක්, 6ක්, 10ක් යන කොට වතු හිමියන්ට තේ දළු කඩා ගන්න වතුකරයෙන් ජනතාව සොයා ගන්න හම්බ වන්නේ නැහැ. මොකද, ඔවුන්ගේ ආර්ථිකය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය වැඩිදියුණු වන විට ඔවුන් එතැනින් ඉවත් වෙලා රජයේ රැකියාවලට හෝ වෙනත් රැකියාවලට යන නිසා. මේක තමයි ඉදිරියට ඇති වන ඇත්ත තත්ත්වය. එම නිසාම තමයි කුඩා තේ වතු හිමියන්ගේ තත්ත්වය නංවලා, ඒ තුළින් මේ රටේ සංවර්ධනය වාගේම ග්‍රාමීය ජනතාවගේ සංවර්ධනය වැඩිදියුණු කරන්න මේ පහසුකම් ලබා දෙන්න ඇමතිතුමා කටයුතු කළේ කියන එක මා මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතුකරයේ තිබෙන ප්‍රශ්න දිහා බැලුවාම විශේෂයෙන් ජල ප්‍රශ්නයක් තිබෙන බව මා මතක් කරන්න ඕනෑ. බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා මෙම ගරු සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති, අපි නිරන්තරයෙන් කථා කරන විශාල ජල ප්‍රශ්නයක් තිබෙන බව. ජල මූලාශ්‍රය තිබෙන්නේ වතුකරයේ. විශේෂයෙන්ම උඩ රට වතුකරයේ ජල මූලාශ්‍රයේ ප්‍රශ්නයක් තිබෙනවා. වතුකරයේ මැද තිබෙන ගමේ ඉන්න ජනතාවට අද ඒ ජල මූලාශ්‍රයෙන් ජලය ලබා ගන්න බැරි ක්‍රමවේදයක් සකස් වෙලායි තිබෙන්නේ. එයට හේතුව මොකක්ද? අද ඒ ජල මූලාශ්‍රය වටා තේ වගාවට අමතරව ලීක්ස්, කැරට් වැනි භෝග වර්ග වගා කරලා, ඒවාට බෙහෙත් ගහලා ඒ ජලය අපිරිසිදු තත්ත්වයට පත් වෙලායි තිබෙන්නේ. ඒ ජලයට රසායනික ද්‍රව්‍ය එකතු වීම නිසා අද ඒ පානීය ජලය අපිරිසිදු තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එම ජලය පානය කිරීමෙන් පාචනය, සංගමාලය, ඒ වාගේම වෙනත් දිගු කාලීන chronic diseasesවලට ගොදුරු වන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එම නිසා රජයත්, ගරු අමාත්‍යතුමාත් මේ පිළිබඳව යම් ක්‍රියාමාර්ගයක් ගන්නවා ඇතැයි කියා මා බලාපොරොත්තු වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have one more minute

**ගරු වෛද්‍ය රෝහණ පුෂ්ප කුමාර මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ரோஹண புஷ்பகுமார)
(The Hon. (Dr.) Rohana Pushpa Kumara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව කාරණා කිහිපයක් කියන්න කාලය දෙන්න. බදුල්ල දිස්ත්‍රික්කයේ ජීවත් වන කුඩා තේ වතු හිමියන් ගැන කියන කොට මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, ඊයේ පෙරේදා දෙමෝදර වතු සමාගමේ සිදු වූ සිදු වීම පිළිබඳව. එහිදී අහිංසක දමිළ කම්කරුවෝ දෙදෙනෙක් මිය ගියා. එයට හේතුව තමයි -

**මුලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. R. YOGARAJAN *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

**ගරු වෛද්‍ය රෝහණ පුෂ්ප කුමාර මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ரோஹண புஷ்பகுமார)
(The Hon. (Dr.) Rohana Pushpa Kumara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

I think your time is over.

**ගරු වෛද්‍ය රෝහණ පුෂ්ප කුමාර මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ரோஹண புஷ்பகுமார)
(The Hon. (Dr.) Rohana Pushpa Kumara)

Please give me one more minute.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, එදා දෙමෝදර සිදු වූ සිදු වීම ගැන කවුරු කෙසේ කථා කළත්, දේශපාලන නායකයන් විධියට අපි එදා ඒ ස්ථානයට ගියේ නැත්නම් ඒ හේතුව ජාති භේද ප්‍රශ්නයක් බවට පත් වන්න ඉඩ තිබුණු බව. බොයිලේරුවක් පිපිරීමෙන් තමයි එම සිද්ධිය සිදු වී තිබෙන්නේ. Production එකට මේවා බලපානවා. එම නිසා සමාගම් යටතේ තිබෙන වතුවල පාවිච්චි කරන පරණ මැෂින් පිළිබඳව නැවත සලකා බලා, ඒවා නවීකරණය කරලා, production එක වැඩිදියුණු කර ගන්න ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු වනවා ඇතැයි කියා මා බලාපොරොත්තු වනවා.

ඒ විතරක් නොවෙයි, ගරු ඇමතිතුමනි. බදුල්ල දිස්ත්‍රික්කය ගත්තාම අපට තේ දළු කිලෝවකට ලැබෙන මුදල අඩුයි. පහත රට තේ දළු කිලෝවකට ලැබෙන මුදලට වඩා අඩු ප්‍රමාණයක් තමයි අපට ලැබෙන්නේ. එම නිසා තේ දළු කිලෝවකට අවම වශයෙන් රුපියල් 50ක මුදලක් ලබා දෙන්න යම් කිසි ක්‍රමවේදයක් සකස් කර දෙනවා නම් හොඳයි කියන එක මා මතක් කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, ඒ එක්කම නිෂ්පාදනය කරන තේවල ප්‍රමිතිය ඉහළ නැංවීමට බදුල්ල දිස්ත්‍රික්කයේ වතු සමාගම්වලට අයත් කර්මාන්තශාලාවල යන්ත්‍රෝපකරණ -අර කලින් කිව්වා වාගේ- ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව ප්‍රතිසංස්කරණය කළ යුතු වෙනවා. මෙම කටයුත්තේදී අධීක්ෂණය කිරීම සඳහා දැනට පිහිටුවා තිබෙන SLS ආයතනය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිළිවෙළ තව ටිකක් පණ නංවලා, තේ නිෂ්පාදනයේදී උපරිම ප්‍රයෝජනය ලබා ගන්න අවශ්‍ය කටයුතු කරලා දෙන්න කියන ඉල්ලීම මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

**ගරු වෛද්‍ය රෝහණ පුෂ්ප කුමාර මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ரோஹண புஷ்பகுமார)
(The Hon. (Dr.) Rohana Pushpa Kumara)

ගරු ඇමතිතුමනි, අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනය තුළින් අවශ්‍ය පරිසරය නිර්මාණය කරන්න මේ නියෝග ඉතාමත් වැදගත් බව සඳහන් කරමින්, ඔබතුමාටත් රජයටත් මගේ ස්තුතිය පිරිනමමින් මගේ කථාව මෙයින් නිම කරනවා.

[අ. භා. 4.35]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් කර තිබෙන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය පිළිබඳව මම යම් කිසි විධියකට කථා කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් පසු ගිය කාල වකවානුවේ මේ රටේ ආර්ථිකයේ වර්ධනය සම්බන්ධව කථා කරනවා අපි දැක්කා. ඇත්ත වශයෙන්ම ඒ වර්ධනය වෙළෙඳ ආර්ථික වර්ධනයක් බවට පත් වෙලා තිබෙනවා. අපි 1977 ඉඳලා 1994 දක්වා ආර්ථිකයේ වර්ධනය නිෂ්පාදන ආර්ථිකයක් තුළින් අරගෙන ඇවිත්, 1994 ඉඳලා යම් කිසි කාලයක් ඒ විධියට තිබුණත් අද වන කොට ඒක එහෙම පිටින්ම සේවා ආර්ථිකයක් බවට පත් වෙමින් තිබෙනවා. අද අපිට දකින්න තිබෙන යථාර්ථය ඒක බවට පත් වෙනවා. මේ කාරණා සංඛ්‍යා ලේඛනත් සමඟ ඔප්පු කර පෙන්වන්න මා සූදානම්.

සාමාන්‍යයෙන් අපේ රටේ 330,000ක් පමණ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට ලියන වාතාවරණයක් තිබෙන්නේ. ඒකෙන් 20,000ක් විශ්වවිද්‍යාලවලට තේරුණාට පස්සේ විශ්වවිද්‍යාලයට නොතේරෙන විශාල පිරිසක් -310,000ක් විතර- රක්ෂා හොයා ගෙන එළියට යන තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා ඇත්තටම අද අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ සේවා අංශයේ රක්ෂාවලට අමතරව නිෂ්පාදන අංශයේ විශාල රැකියා ප්‍රමාණයක් උත්පාදනය කර ගැනීමයි. විශේෂයෙන්ම අද දකින්නේ, අපි හැම දෙයක්ම ලංකාවට ආනයනය කරන තත්ත්වයක් තිබෙනවා මිසක ලංකාව තුළ නිෂ්පාදනය කරන තත්ත්වයෙන් බැහැර වෙමින් තිබෙන බවයි. ලංකාවේ ආර්ථික වර්ධන වේගය අපි ගණනය කරන්නේ කෘෂිකර්මය, කාර්මික හා සේවා කියන අංශ තුනම එකතු කරලා. ලංකාවේ ආර්ථික වර්ධන වේගය සියයට 8ක් තිබුණාය කියලා කිව්වාට වර්ධනය සිද්ධ වෙන්නේ සේවා අංශයෙන් කියලා තමයි අපිට දකින්න ලැබෙන්නේ. අපි ජංගම දුරකථනයක් ගත්තත් ඒක ලංකාවට ගෙනෙන තත්ත්වයක් තිබෙන්නේ. ඊ ළඟට විදුලි උපකරණ ගත්තත් ලංකාවට ගෙනෙන තත්ත්වයක් තිබෙන්නේ. බෙහෙත් ද්‍රව්‍ය ගත්තත් ලංකාවට ගෙනෙන තත්ත්වයක් තිබෙන්නේ. වාහන ගත්තත් ලංකාවට ගෙනෙන තත්ත්වයක් තිබෙන්නේ. මේ සියල්ලම අද මේ තත්ත්වයට මූලික වශයෙන්ම බලපාලා තිබෙනවා.

අපට පසු ගිය කාල වකවානුව තුළ Micro Cars Limited එකට අමතරව අඩුම තරමේ කුඩා ද්‍රව්‍යයක ඉඳලා මේවා එකලස් කරන තැනකට නැත්නම් නිෂ්පාදනය කරන තැනකට තවමත් යන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසාම 2009 US Dollars 601 million තිබුණු සෘජු විදේශ ආයෝජන 2010 වන කොට US Dollars 516 million දක්වා, සියයට 14කින් අඩු වෙලා තිබෙනවා කියලා අපිට බොහොම පැහැදිලිව ඔප්පු කර පෙන්වලා තිබෙනවා අද ඉදිරිපත් කරපු මේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවෙන්.

මේ වර්ධනය තුළ නිෂ්පාදන අංශය වර්ධනය වෙලා තිබෙන්නේ සියයට 31යි . ඉතිරිය ගත්තාම සියයට 70ක පමණ වර්ධනයක් තිබෙන්නේ කෘෂිකර්මය සහ සේවා අංශයෙන්.

මෙයින් සියයට 50ක් විතර සේවා අංශයේ වර්ධනය වීමක් තමයි අපිට දකින්න ලැබෙන්නේ. ඒ වාගේම අපි ආයෝජන සම්බන්ධව ගත්තොත් 2009 දී, -17 හා 18 වන වගන්ති යටතේ- ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති 422ක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒක 2010 දී 427ක් දක්වා තමයි වර්ධනය වෙලා තිබෙන්නේ. ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව ගත්තොත් 5කින් තමයි 2010 වන කොට වර්ධනය වෙලා තිබෙන්නේ. මේ ආයෝජනවලින් විදේශ ආයෝජකයෝ විධියට ගෙනැල්ලා තිබෙනවා 135 දෙනෙක්. දේශීය ආයෝජකයෝ ඉන්නේ 183ක්. බොහොම පැහැදිලියි, ඒකෙන් අදහස් වන්නේ මොකක්ද කියලා. ලංකාව තුළ සිටින දේශීය ආයෝජකයන් ප්‍රමාණය 183ක් වනකොට විදේශ සෘජු ආයෝජකයන් ප්‍රමාණය -ලංකාව තුළට ලැබෙන ප්‍රමාණය- 135 දක්වා පහත වැටීමක් -දැවැන්ත කඩා වැටීමක්- සිදු වෙලා තිබෙන තත්ත්වයක් අපි දකිනවා. ඒ විතරක් නොවෙයි, 2009 ආයෝජන වටිනාකම රුපියල් බිලියන 565ක් දක්වා වර්ධනය වනකොට, 2010 දී රුපියල් බිලියන 209ක් දක්වා සෘජු ආයෝජනවල වටිනාකම් ප්‍රමාණය එහෙම පිටින්ම කඩා වැටිලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ආයෝජන සම්බන්ධව ගත්තාම විශේෂයෙන් ආයෝජන මණ්ඩලයේ 2009 ව්‍යාපෘති සංඛ්‍යාව 182යි. එයින් රුපියල් බිලියන 423යි ලැබිලා තිබෙන්නේ. 2010 වනකොට මේ ව්‍යාපෘති සංඛ්‍යාව වර්ධනය වනවා 262ක් දක්වා. හැබැයි, ආයෝජන ප්‍රමාණයේ වටිනාකම රුපියල් බිලියනවලින් ගත්තොත්, රුපියල් බිලියන 222යි තිබෙන්නේ. ඒකෙන් අදහස් වන්නේ මොකක්ද? ව්‍යාපෘති වැඩි වෙලා තිබෙනවා. ආයෝජන මණ්ඩලයේ දහහත්වන වගන්තිය යටතේ 2009 දී 182ක් තිබුණු ව්‍යාපෘති සංඛ්‍යාව 2010 වනකොට 262ක් දක්වා වැඩි වෙලා තිබෙනවා.හැබැයි රුපියල් බිලියන සංඛ්‍යාවලින් මේ ආයෝජනවල වටිනාකම ගත්තාම ඇත්ත වශයෙන්ම රුපියල් බිලියන 423 ඉඳලා රුපියල් බිලියන 222 දක්වා අඩු වෙලා තිබෙන තත්ත්වයක් තමයි අපි අත් දකිමින් සිටින්නේ.

අද අපනයන සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වය ගැනත් මම කියන්න කැමැතියි. ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමා අවධානය යොමු කළා නම් හොඳයි, 2010 මහ බැංකු වාර්තාවේ 117 වන පිටුවට. එම මහ බැංකු වාර්තාවේ බොහොම පැහැදිලිව තිබෙනවා, තේ අපනයන දායකත්වය 2009 වර්ෂයේ දී සියයට 16.7 ඉඳලා, 2010 වර්ෂය වනකොට සියයට 16.6 දක්වා සියයට දශම 1කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම පොල් අපනයන දායකත්වය සියයට 2.4 ඉඳලා, සියයට 2.1 දක්වා අඩු වෙලා තිබෙනවා. රබර් අපනයන දායකත්වය සියයට 1.4 ඉඳලා සියයට 2.1 දක්වා වැඩි වෙලා තිබෙනවා. රබර්වල විතරයි ලංකාවේ අපනයන වෙළෙඳාම සම්බන්ධව යම් කිසි විධියට වර්ධනයක් ඇති වෙලා තිබෙන්නේ. බලන්න, රෙදි පිළි හා ඇඟලුම් පිළිබඳව ගත්තාම 2009 වර්ෂයේ දී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ සියයට 46.2ක් වෙලා තිබුණු දායකත්වය 2010 වර්ෂයේ දී සියයට 42.2 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ගමන් මලු හා පාවහන්වල අපනයන දායකත්වය 2009 වර්ෂයේ දී සියයට 0.2 ඉඳලා, 2010 වර්ෂය වනකොටත් සියයට 0.2 දක්වා ස්ථාවර මට්ටමක තිබෙනවා. විශේෂයෙන් තමුන්නාන්සේලා පසුගිය අය වැයේ දී විශාල වැඩ පිළිවෙළක් සකස් කළා, ලංකාවේ රත්‍රන් කර්මාන්තය වර්ධනය කරන්නට. ඒ වාගේම දියමන්ති කර්මාන්තය, මැණික් කර්මාන්තය වර්ධනය කරන්නට. හැබැයි, ඇති වෙලා තිබෙන තත්ත්වය තමයි දියමන්ති හා ස්වර්ණාභරණ සඳහා ලංකාවේ අපනයන දායකත්වය සියයට 4.7 සිට සියයට 4ක් දක්වා අඩු වීමක් සිදු වෙලා තිබීම. ඒ විතරක් නොවෙයි, සියයට 1ක් තිබුණු මැණික් අපනයනය සියයට 0.9 දක්වා අඩු වෙලා තිබෙනවා.

මේ කාරණා සියල්ල එකට එකතු කළාම අපට බොහොම පැහැදිලිව පෙනෙන තත්ත්වයක් තමයි, අපේ සම්පූර්ණ අපනයනවල කඩා වැටීමක් සිදුවෙලා තිබෙනවා විතරක් නොවෙයි, අපේ ප්‍රධානම වැවිලි බෝග අපනයනයේ දී පවා යම් කිසි අඩුවක් නැත්නම් කඩා වැටීමක් සිදු වී තිබෙන බව. එතකොට අපනයනය සම්බන්ධව සියයට 17.3ක වර්ධනයක් තිබෙද්දී, ආනයනය සම්බන්ධවත් සියයට 32.4ක වර්ධනයක් පෙන්නුම් කරනවා. මෙකේ අවසාන ප්‍රතිඵලය තමයි සියයට 6ක, සියයට 7ක ප්‍රමාණයක තිබුණු වෙළෙඳ හිඟය අද වනකොට සියයට 10.5ක් දක්වා දැවැන්ත විධියට වර්ධනය වෙලා තිබීම. ඒ නිසා මා විශේෂයෙන්ම කියන්න කැමැතියි, අද මේ ආණ්ඩුවේ ක්‍රියාකාරකම් තුළ - මා මුල ඉඳලා කියා ගෙන ආවේ ඒකයි. - නිෂ්පාදනය වෙනුවට සේවා අංශයේ වර්ධනය දවස ගණනේ වැඩි වෙලා, අවසාන වශයෙන් ආනයන සහ අපනයනවල දැවැන්ත හිඟයක් ඇති වෙලා, දැවැන්ත වෙළෙඳ හිඟයකට අපට යන්නට සිදු වුණු තත්ත්වයක් ඇති වෙලා තිබෙන බව.

ඊළඟට, මා විශේෂයෙන්ම මේ කාරණය ගැනත් කියන්න කැමැතියි. දැන් මේ ආනයන සහ අපනයන සම්බන්ධයෙන් ගත්තාම, ඔබතුමන්ලා මහා ව්‍යාපෘති ගැන පසුගිය කාලයේ දිගින් දිගටම කථා කළා. මේ පාර්ලිමේන්තුවේ අපි දිගින් දිගටම පෙන්වා දුන්නා, මේ ආනයන සහ අපනයන සම්බන්ධව තමුන්නාන්සේලාගේ ව්‍යාපෘතිවල තිබුණු ප්‍රධානම ප්‍රශ්න ගණනාවක් ගැන. මේ පාර්ලිමේන්තුව නොමඟ යවන ප්‍රකාශ පසුගිය කාල වකවානුවේ මේ පාර්ලිමේන්තුවේ සිදු කරලා තිබෙනවා. අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියපු ප්‍රකාශවල තිබෙන සත්‍ය අසත්‍යතාවය මා හෙට අනිද්දා වනකොට ඉදිරිපත් කරන්නම්. අධීක්ෂණ මන්ත්‍රීවරුන් පත් කිරීම සම්බන්ධව නම් ගම්, තොරතුරු සියල්ලත් එක්ක මා හෙට අනිද්දා වනකොට හෙළි කරන්නම්. දැන් එතැනින් එහාට ගියාම, මේ හම්බන්තොට වරායේ ගලක් තිබෙනවා කියලා අපි දවසගානේ මේ පාර්ලිමේන්තුවේ කිව්වා විතරක් නොවෙයි, ඒ සම්බන්ධයෙන් විවාදයකුත් කළා. වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍ය ගරු රෝහිත අබේගුණවර්ධන මැතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, "මේක එහෙම පිටින්ම බොරුවක්, එහෙම ගලක් මේ වරායේ නැහැ." කියලා.

ඒ වරායේ ගලක් නැති නිසා කිසිම ප්‍රශ්නයක් නැතිව අපට පටන් ගන්න පුළුවන් කියලාත් එතුමා කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කාරණය කියන්න කැමැතියි. ලංකාවේ හම්බන්තොට වරායේ ප්‍රධාන ඉංජිනේරු අගිල් හේවගීගන කියන මහත්මයා බොහොම පැහැදිලිව මෙහෙම කියා තිබෙනවා:

"Sri Lanka has sought US Dollars 85 million from China for this purpose"

මොකටද මේ කියන්නේ? මේක ඇතුළේ තිබෙන ගල කැඩීම සඳහා වුවමනා කරලා තිබෙන මුදල් ප්‍රමාණය ඩොලර් මිලියන 85ක් කියලා එතුමා කියා තිබෙනවා. අපි දැක්කා, ඊයේ විදේශ වාර්තාවල ඔවුන් බොහොම පැහැදිලිව කියා තිබුණා මේ සම්බන්ධව ලංකාව චීනයෙන් ඩොලර් මිලියන 40ක තව ණයක් ඉල්ලලා තිබෙනවා කියලා. ඒ ණය ඉල්ලලා තිබෙන්නේ මේ ගල කැඩීම සඳහාය කියලාත් තිබුණා. කාරණය බොහොම පැහැදිලියි. මේ රටේ ජනතාවට, ඒ වාගේම මේ පාර්ලිමේන්තුව තුළ පාර්ලිමේන්තුව නොමඟ යවන විධියේ වැරදි ප්‍රකාශ කරලා, පසු ගිය කාල වකවානුවේ හම්බන්තොට වරායේ ගලක් තිබුණේ නැහැ කියලා කියපු ආණ්ඩුවට අද සිද්ධ වෙලා තිබෙනවා නොතිබුණු ගලක් කඩන්න ඩොලර් මිලියන 40ක ණයක් ගන්න. මේක තමයි අද ඇති වෙලා තිබෙන ඇත්ත තත්ත්වය. ඒ නිසා අද- [බාධා කිරීමක්] ගල තිබෙන එක තමයි අප කිව්වේ, ගල තිබෙනවා කියලා පිළිගන්න කියලා. නමුත් මේ ගල තිබෙනවාය කියලා පිළි නොගනිමින්, මේ පාර්ලිමේන්තුව නොමඟ යවමින් පසු ගිය දිනවල දිගින් දිගටම කළ ප්‍රකාශවලට අප කියපු කථා අද ඇත්තක් බවට පත් වෙලා තිබෙනවා. ඒ ගල කැඩීම සඳහා ඩොලර් මිලියන 40ක් දැන් ණයක් විධියට ගන්න බලාපොරොත්තු වෙනවා. ඩොලර් මිලියන 40ක් මදි, ඩොලර් මිලියන 85ක් මේ ගල කැඩීම සඳහා අවශ්‍යයි කියන එක බොහොම පැහැදිලිව පේනවා.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද හම්බන්තොට වරායට යන අය එතැන ඉඳලා අපට telephone එකෙන් කථා කරනවා. ඔවුන් කියනවා, "ඔබතුමා කියපු කථාව හරි, ඔබතුමාගේ කටට මසුරන් දමන්න ඕනෑ, ඔබතුමන්ලා මේ කියපු කථාව හරියට හරි, එක නැවක් තියා අඩුම තරමේ රුවල් ඔරුවක් ඒක ඇතුළේ නැහැ" කියලා. ඒකයි මම මේ ආණ්ඩුවට කියන්නේ. කරුණාකරලා තමුන්නාන්සේලා මේ හම්බන්තොට වරාය දැන් නැව් ගේන්න පාවිච්චි කරන්න එපා. ඒකට නැව් ගේන්න ඕනෑ නැහැ. එතැනට බැසිල් රාජපක්ෂ මහත්තයාගේ ව්‍යාපෘතියක් අරගෙන ගියා නම් හරි seaplanes බාන්න, හම්බන්තොට සුද්දෝ ටික අරගෙන යන්න. නැත්නම් තමුන්නාන්සේලාට වුවමනා නම් රුවල් ඔරු තරගයක් පවත්වන්න හම්බන්තොට වරාය පාවිච්චි කරන්න පුළුවන්. තමුන්නාන්සේලා මේක විවෘත කරලා මේ වෙන කොට අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. නැව් ඇවිල්ලා නිකම් touristsලා වාගේ හරවලා යනවා, අපට පෙන්වන්න. මේ සම්බන්ධව දවස ගණනේ පාර්ලිමේන්තුවේ කථා කරන කොට, පහුවෙනි සතියේ ආපහු එවනවා නැවක්. ගිය සතියේ ආවා තව නැවක්-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
නැව් එනවා. ඔබතුමා ගිහින් බලන්න කථා කරන්නේ නැතිව.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්, නැව් එනවා. නැවේ ගණනයි අපි අහන්නේ.

නැව් එනවා තමයි. දැන් මීට සති කිහිපයකට කලින් නැවක් ආවා. ඒ නැව ආවේ පොත් ප්‍රදර්ශනයකට. මේ බලන්න, මේ ඡායාරූපයේ තිබෙන්නේ ඒ ආපු නැව. "හම්බන්තොට වරායට පැමිණි නැවේ පොත් ප්‍රදර්ශනයක්" කියලා තමයි තිබෙන්නේ. කෝටි 5,000ක් පාවිච්චි කරලා, අපේ අහිංසක දුප්පත් මිනිසුන්ගේ සල්ලිවලින් හම්බන්තොට වරාය හැදුවේ මේ පොත් ප්‍රදර්ශන තියන්නද? ඒකයි මම කියන්නේ, මේක අර seaplanes බාන වැඩ පිළිවෙළකට යෙදුවා නම් ඊට වැඩිය හොඳයි කියලා. එහෙමත් නැත්නම් හම්බන්තොට වරායේ රුවල් ඔරු තරග පවත්වන්න, අර Commonwealth Games එකත් ළඟ එන නිසා. ඒ ක්‍රීඩා උළෙලත් ආවාම ඒකට ලේසියි. මේ පොත් ප්‍රදර්ශනය තියලා හම්බ වුණු මුදල් ප්‍රමාණය කොපමණද කියලා කරුණාකරලා මට කියන්න. ලංකාවේ මේ හම්බන්තොට වරායට කිසිම දෙයක් හම්බ වුණේ නැහැ. මතක තියා ගන්න, මේක ඉස්සරවෙලා පටන් ගත්තේ තෙල් ගහන්න -bunkeringවලට- කියලා. ඒක තමයි මේකේ මූලික අරමුණ බවට පත් වුණේ. ගිය සතියේ තව නැවක් ආවා. නැවක් ආවා තමයි, අපිත් පිළිගන්නවා. ඒ නැව ආවේ මොකටද? ඒක හම්බන්තොට වරායට ආවේ ඉතුරු වෙලා තිබ්බව වැලි ටික පටවා ගෙන යන්න. ඉතින් වැලි පටවන්න ඕනෑ නම් හදන්නකෝ එහෙනම් වැලි ගන්න වෙන විධියක එකක්. [බාධා කිරීමක්] හරි. කොළඹ බඩු පටවනවා. එහේ වැලි පටවනවා.

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)
ඒකේ ඇති වැරැද්ද මොකක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක ඉතින් තමුන්නාන්සේට තේරුණේ නැති වුණාට අපට තමයි ප්‍රශ්නය. ඔතැන ඉන්න කොට ඒක තේරෙන්නේ නැහැ. බලය තිබෙන කොට මොළය නැහැ කියන්නේ ඕක තමයි.

දැන් නැවක් ආවා කිව්වා නේ. ඔව්, නැවක් ආවා, වැලි පටවන්න. වැලි පටවන්න ආපු නැවෙන් හම්බ වුණු ගණන කීයද කියලා අපට කරුණාකරලා කියන්න. අඩුම තරමේ වැලි කියුබ් එකක් රුපියල් තුන් හාරදහසකට විකුණන්න පුළුවන්. අඩුම තරමේ ඒ වැලිවලින් හම්බ වුණු ගණන කරුණාකරලා අපට කියන්න. මේ රටේ මිනිසුන්ගේ සල්ලියි වියදම් කරන්නේ. ඒක නිසා තමයි මම එදත් කිව්වේ, "අනේ අපේ සල්ලි කියලා දැන් අපට හිතෙනවා" කියා. ඊට අමතරව හම්බන්තොට වරාය ආශ්‍රිත ආයෝජන කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් one billion ආයෝජන ඇවිල්ලාය කියනවා. මම අහනවා කොහාටද ඔය ආයෝජකයන් ආවේ, කවුද කැමති වෙලා තිබෙන්නේ, පස් පිඩැල්ලක් කපලා තිබෙනවාද, අඩුම තරමේ මුල් ගලක් තියලා තිබෙනවාද කියා. ආයෝජකයන් එන්න කලින් වරායට නැව් ටික ඇවිල්ලා තිබෙන්න ඕනෑ. එතැනින් පස්සේ තමයි -වරායට නැව් ආවට පස්සේ තමයි- මේ වැඩ කටයුතු ටික පටන් ගන්න පුළුවන්. කිසි වැඩ පිළිවෙළක් නැහැ. අවුරුද්දක් වෙන කල් අඩුම තරමේ ආර්ථික ගනුදෙනුවක් විධියටවත් -commercial operations විධියටවත්- අවශ්‍ය කරන නැවක් හම්බන්තොට වරායට ගෙන්වා ගන්න පසු ගිය කාලයේ තමුන්නාන්සේලාට බැරි වුණා.

ඊ ළඟට ගෙනැල්ලා තිබෙන යෝජනාව ගැන බලන්න. වාහන අරගෙන එන නැව් ටික ගේන්නලු හම්බන්තොට වරායට. මේක මොන තරම් විහිළු සහගත කථාවක්ද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොළඹ වරායට එන නැව් ටික හරවලා හම්බන්තොට වරායට ගෙන්වා ගන්න නම් අපට අලුතෙන් හම්බන්තොට වරායක් ඕනෑ නැහැ. ඒකට තමයි අර ජැටි තුන-හතරක් ගහන්නේ. ඒ ජැටි ගහන්නේ ඒකට තමයි. ඒ, ඒකේ වැඩි ටික අඩු කරලා එහාට මෙහාට කර ගන්න. මම ඒ ගැනත් පස්සේ කථා කරන්නම්. අද මොක්කද කරන්නේ? කොළඹ වරායේ බාන්නේ නැතුව වාහන ගේන නැව් ටික හම්බන්තොට වරායට ගේනවා. ගෙනැල්ලා හම්බන්තොට වරායේ බානවා. හැබැයි ඒකේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නය වන්නේ මෙයයි.

වාහන ගෙනෙන නැවක් සාමාන්‍යයෙන් පැයට හැතැක්ම 15ත්, 20ත් අතර වේගයකින් තමයි වරාය ඇතුළට ගන්න පුළුවන් වන්නේ. ඒ වාගේම කාර් නැත්නම් රථ වාහන ගෙන්වන නැව්වල දිග ප්‍රමාණය සාමාන්‍යයෙන් මීටර් 200ක්. ඒ වාගේම මීටර් තිස්දෙකහමාරක් පළල නැව් එන්නේ. මේ නැව් එන කොට වතුරෙන් උඩට තිබෙන ප්‍රමාණය වැඩියි. ඒ නිසා මේක පැද්දෙන ප්‍රමාණය වැඩියි. ඒ නිසා අද මේ ආණ්ඩුව මොකක්ද කරන්නේ? මීටර් 320ක් විතර ගැඹුර තිබෙන්න ඕනෑ canal එකේ පොඩි ඉඩ ප්‍රමාණයක් අතරිනුයි අද නැව් එන්න තිබෙන්නේ. මොකද මැද ගල තිබෙන නිසා, පොඩි කැල්ලක් කපලා අර නැව යන්තම් එන්න පුළුවන් විධියට හදලා තිබෙන්නේ. එතකොට මේ නැව අරගෙන එන කොට පැද්දෙන ප්‍රමාණය වැඩි වනවා. ඒක නිසා මේකේ තිබෙන අනතුර වැඩියි. ඒ කියන්නේ මේ වාහන අරගෙන එන නැවේ වතුරෙන් උඩ තිබෙන ප්‍රමාණය වැඩියි. ඒ නිසා මේක පුළුවන් තරම් පැද්දෙන්න බලනවා. ඒ නිසා මෙතැන දැවැන්ත අර්බුදයක් තිබෙනවා.

දෙවැනි කාරණය තමයි, හම්බන්තොට නැව අරන් ආපුවාම ආපසු කොළඹට වාහන ටික ගේන්න ඕනෑ. මේවාට කවුද වියදම් කරන්නේ? මේ ප්‍රවාහන ගාස්තු කවුද ගෙවන්නේ? ඉතින් මෙන්න මේ වාගේ තත්ත්වයකුයි තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, වරාය ඇතුළේ තනිකර ගලක් තිබෙන්නේ. ඒ නිසා-

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
( மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised.

**ගරු ලලිත් දිසානායක මහතා**
( மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අද දින න්‍යාය පත්‍රයට අනුව සාකච්ඡා කරන්න තිබෙන්නේ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝග සහ කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ නියෝගයි. ස්ථාවර නියෝග 84(v) අනුව මාතෘකාවට අදාළවයි කථා කළ යුතු වන්නේ. නමුත් මෙතුමා මාතෘකාවට අදාළව නොවෙයි කථා කරන්නේ. හම්බන්තොට වරාය ගැන වෙනම කථා කරමු. අපි උත්තර දෙන්නම්. මේ මාතෘකාවට අදාළව කථා කරන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Anyway, your time is over. Please wind up.

**ගරු ලලිත් දිසානායක මහතා**
( மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අද කථා කරන්න තිබෙන එකයි, මේ කථා කරන එකයි අතර සම්බන්ධය මොකක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා අහගෙන ඉන්න කෝ. ආනයන, අපනයනවලට කොහොමද නැව් පාවිච්චි කරන්නේ කියන එක ගැනයි මම කථා කරන්නේ. මම කථා කරන්නේ ආනයන, අපනයන ගැනයි. ආනයන, අපනයන කරන කොට මොකෙන් ගේන්න, ගෙනයන්න කියලාද තමුන්නාන්සේ කියන්නේ? නැව්වලින් නැතුව මොකෙන් අරගෙන එන්න කියලාද කියන්නේ? [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Your time is over. Please wind up.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කරුණාකරලා මට බාධා කරන්න එපාය කියන්න. මොකද මම කථා කරන්නේ ආනයනය, අපනයන සම්බන්ධවයි. එතුමා වෙන එකක් හිතා ගෙන ඇති. [බාධා කිරීම්] මම කථා කරන්නේ ආනයනය, අපනයන සම්බන්ධවයි. [බාධා කිරීමක්] මම ග්‍රීස් යක්කු ගැන කථා කළේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
( மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බාධා ඇමතිලා. අද ජනාධිපතිතුමා ආව නේ. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Alhaj Azwer, please sit down. [බාධා කිරීමක්] කරුණාකරලා වාඩි වන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කථා කරන්නේ බොහොම පැහැදිලිව ආනයන, අපනයන රෙගුලාසි පිළිබඳවයි. එහි කිසිම වැරැද්දක් නැහැ. ඒක තනිකරම මාතෘකාවට සම්බන්ධයි. ආනයන, අපනයන නැව්වලින් කරන්නේ නැත්නම් වෙන මොනවායින්ද කරන්නේ? අහස් ගුංඩුවලින් යවන්නද? බරකරත්තවලින් කරන්නද? ඒක නිසා මම කියනවා,-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Dayasiri Jayasekara, your time is over.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට විනාඩියක් දෙන්න. මොකද බාධා කරනවා නේ.

මම ග්‍රීස් යක්කු ගැන කථා කළේ නැහැ. ඒ නිසා මම කියනවා- [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Alhaj Azwer, please sit down.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ නිසා මම පැහැදිලිව කියනවා, අද රටේ ඇති වෙමින් තිබෙන තත්ත්වය බොහොම පැහැදිලියි. අද කොළඹ වරායේ මොකක්ද වන්නේ? කොළඹ දකුණු වරාය දැන් ගිය සතියේ චූන්නාය කිව්වා චීන සමාගමකට. මොකක්ද මේ සිදු වන්නේ? Jaya Container Terminal එකේ තිබුණු එක අනික් ඒවාවලට දාපු නිසා අද වෙන කොට ඇති වෙලා තිබෙන තත්ත්වය මොකක්ද කියන එක ගැන අපි දන්නවා. Jaya Container Terminal එකේ ඒ කරන වැඩ කටයුතු ටික තමයි අනෙක් පෞද්ගලික කොම්පැනිවලට දෙමින් ඉන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හෙට අනිද්දා චීන කොම්පැනියට මේක දුන්නායින් පස්සේ මේ ගෙනෙන අලුත් කොම්පැනිවල කාර්යක්ෂමතාව වර්ධනය වන කොට අනිවාර්යයෙන්ම අපේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට පත් වී තිබෙන ලංකා නැව් සංස්ථාවට අයිති අපේ ජැටියෙන් තව දුරටත් ආදායම් ලබා ගන්නට බැරි තත්ත්වයකට පත් වෙනවා. එම නිසා බොහොම දැවැන්ත අර්බුදයකුයි මේ ක්‍රමය තුළ ඇති වෙලා තිබෙන්නේ. අපේ රාජ්‍යයට අයිති ජැටියක් තිබෙන කොට අනෙක් ඒවා පෞද්ගලික අංශයට දැන් දී ගෙන දී ගෙන යනවා. එම නිසා තව වැඩි කලක් යන්නට කලින් කොළඹ වරායේ අපට තිබෙන, ආණ්ඩුවට මුදල් ගේන්න පුළුවන් ඒ ජැටියත් අවසන් කරන වැඩ පිළිවෙළක් තමයි චීනයට අද මේවා ලියලා දීලා කරන්නට හදන වැඩ කටයුතු ටිකෙන් පේන්නේ. චීනයෙන් නැව් එනවා නම් කමක් නැහැ. අපට වැඩි ප්‍රමාණයක් නැව් එන්නේ ඉන්දියාවෙන්. ඉන්දියාවෙන් එන නැව් ටික තමයි යාන්තම් අප මේ පැත්තට ඇදලා ගන්නේ. අද චීනයේ තිබෙන කොම්පැනි මෙහි ඇවිත්

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ජැටියක් හදා ගෙන ඒ ජැටිය තුළ අපට තිබෙන ඉතිරි ටිකත් අවසන් කරන්නට හදන වැඩ කටයුත්තක් තමයි තිබෙන්නේ කියන එක ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. ග්‍රීස් යක්කු අනාගතයේ නැති වේවායි අප ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 4.56]

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ ගරු සභාවේ සාකච්ඡාවට මාතෘකාව වී තිබෙන්නේ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගයක් සහ කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ නියෝග කිහිපයකුයි.

මේ නියෝග ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අප රජයට ස්තුතිවන්ත වන්නට ඕනෑ. අපේ අර ගරු මන්ත්‍රීතුමාත් කිව්ව ආකාරයට අපේ ස්වාභාවික ද්‍රව්‍ය ඉවහල් කර ගෙන නිමි අගයන් එකතු කරන නිෂ්පාදන දියුණු කරන්නට කටයුතු කළොත් තමයි අපේ කර්මාන්ත අංශය දියුණු වන්නේ. රබර් අමු ද්‍රව්‍යයක් හැටියට තමයි අප විදේශ රටවලට යැව්වේ. ඒ තුළින් අපට පාඩු කිහිපයක් වුණා. එකක් තමයි, අපට රබර් සඳහා ඉහළම මිලක් ලබා ගන්නට බැරි වීම. තවත් එකක් තමයි, ඒ වාගේම අමු ද්‍රව්‍යයක් හැටියට රබර් යොදා ගන්නා දේශීය කර්මාන්තවලට අවශ්‍ය රබර් ප්‍රමාණය නැති වීම. එම නිසා තමයි මේ සෙස් බද්ද පනවා තිබෙන්නේ. සියයට 4ක්ව තිබුණු සෙස් බද්ද සියයට 8 දක්වා වැඩි කර කිලෝග්‍රෑම් එක රුපියල් 12 දක්වා වැඩි කර තිබෙනවා. මෙහි මූලික පරමාර්ථය වෙලා තිබෙන්නේ, අමු ද්‍රව්‍යයක් හැටියට රබර් පිට රට පටවන එක නවත්වා, මේ රටේ නිෂ්පාදිත නිමි භාණ්ඩයක් - value-added production එකක්- හැටියට විදේශගත කිරීමයි. ඒ කටයුත්ත අද සාර්ථක වී තිබෙනවා. මෙයින් මේ රජය බලාපොරොත්තු වන්නේ නිමි භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත අංශයේ පුළුල් වීම තුළින් රැකියා අවස්ථා වැඩි කිරීමයි; ඒ වාගේම අමු ද්‍රව්‍යයක් හැටියට රබර් අපනයනය කිරීමට වඩා රබර්වලින් නිෂ්පාදිත නිමි භාණ්ඩ අපනයනය කිරීමයි. වැඩි රැකියා අවස්ථා ප්‍රමාණයක් ලබා ගන්නට නම් අප ඒ පැත්තට යන්නට ඕනෑ. රබර් සඳහා මේ සෙස් බද්ද පැනවීම තුළ රජයේ අපේක්ෂාව එයයි.

අපි බලමු, ඒ අපේක්ෂාව කොයි ආකාරයෙන් අපට ඉටු කර ගන්නට පුළුවන් වී තිබෙනවා ද, ඒ ඉලක්කය ලබා ගන්නට පුළුවන් වෙලා තිබෙනවා ද කියන එක. මේ සෙස් බද්දෙන් ලැබෙන ආදායම රබර් කර්මාන්තයේ දියුණුව සඳහා තමයි යොදවා තිබෙන්නේ. පසු ගිය කාලය ගත්තාම රබර් නැවත වගා කිරීම සඳහා ලබා දෙන සහනාධාර රුපියල් 50,000කින් වැඩි කර තිබෙනවා. ඒ වාගේම නව වගාවන් සඳහා දෙන සහනාධාරය රුපියල් 25,000කින් වැඩි කර තිබෙනවා. මේ විධියට රබර් වගාව වැඩි දියුණු කිරීමට වාගේම, රබර් වගාව සහ තේ වගාව අතර මැදි වගාව සඳහා දෙනු ලබන සහනාධාරයත් වැඩි කිරීමට පියවර ගෙන තිබෙනවා. මේ විධියට බලන විට රබර් කර්මාන්තයේ ඵලදායිතාවය වැඩි කිරීම තමයි අර සෙස් බද්දෙන් ලැබෙන ආදායමෙන් කර තිබෙන්නේ. සෙස් බද්ද රජය අය කර තිබෙනවා. එය නැවත වතාවක් රබර් නිෂ්පාදය වැඩි කිරීම සඳහා සහ රබර් වගාව දිරිමත් කිරීමට යොදවා තිබීම ගැන අප සතුටු වන්නට ඕනෑ.

සෙස් බද්ද පැනවීම තුළින් රබර් අමු ද්‍රව්‍යයක් හැටියට පිට රට යැවීමට වඩා නිමි භාණ්ඩ හැටියට පිට රට යැවීම තුළින් අපේ රටේ අපනයන කටයුතු සාර්ථක වෙලා තිබෙනවා ද කියා අප බලන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2010 වර්ෂයේදී දේශීය රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 153 දක්වා සියයට 12කින් අප වැඩි කර ගෙන තිබෙනවා. ඒ කියන්නේ, 2010 වර්ෂයේදී දේශීය රබර් නිෂ්පාදනය අමු ද්‍රව්‍ය හැටියට අපනයනය කළාට වඩා සෙස් බද්ද පැනවීම තුළ රජයේ අපේක්ෂාව ඉටු කරමින් 2010 වර්ෂයේදී දේශීය රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 153 දක්වා සියයට 12කින් වැඩි කර තිබෙනවා. ඒ වසරේදී හෙක්ටයාර් 1,403ක රබර් නැවත වගා කිරීමටත්, ඒ වාගේම අලුතෙන් හෙක්ටයාර් 1,537ක රබර් වගා කිරීමටත් රජය සහාය ලබා දී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අලුත් වගාවන් සඳහාත්, අම්පාර, ඌව-වෙල්ලස්ස, වවුනියාව, මුලතිව් වැනි ප්‍රදේශවල රබර් නැවත වගා කිරීම සඳහාත් අලුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. මේ කටයුතු සඳහා යොදවා තිබෙන්නේ සෙස් බද්දෙන් ලැබෙන ආදායමයි.

ඊළඟට අපි බලන්න ඕනෑ, රබර් නිෂ්පාදන සම්බන්ධයෙන් අපි අන්තර්ජාතික වෙළෙඳ පොළට පිවිසිලා තිබෙන්නේ කොයි ආකාරයෙන්ද කියන එක. අප 2010 වසරේදී අපනයනය කළ ස්වාභාවික රබර් ප්‍රමාණය බැලුවාම ඊට පෙර වසරට වඩා එය සියයට 7ක් අඩු වෙලා තිබෙන බව පෙනෙනවා. ඒ අඩු වීමට හේතුව තමයි රට තුළ රබර් ආශ්‍රිතව නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම. දේශීය වෙළෙඳ පොළ ඉවහල් කර ගෙන රබර් අමු ද්‍රව්‍යයක් හැටියට යොදා ගෙන අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, අපනයන සඳහා අගය එකතු කළ නිමි භාණ්ඩයක් අපනයනයට ඉදිරිපත් කරන්න. මෙන්න මේක තමයි ඉතාම වැදගත් වන්නේ. කෙළින්ම අමු ද්‍රව්‍ය අපනයනය කරන්නේ නැතුව නිමි භාණ්ඩයක් හැටියට අපනයනය කරන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

පසු ගිය අවුරුද්දේ ඇමෙරිකන් ඩොලර් මිලියන 565ක වටිනාකමකින් යුක්ත රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ ඇමෙරිකාව, යුරෝපා සංගමය සහ ඉන්දියාව වාගේ රටවල්වලට අපනයනය කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සෙස් බද්දෙන් අපි බලාපොරොත්තු වන්නේ ඒ දේයි. මෙතුමන්ලා කියනවා, රැකියා අවස්ථා දෙන්නේ නැහැයි කියලා. ඒ රැකියා අවස්ථා දෙන්න තමයි රබර් ටික නිකම්ම රට පටවන්නේ නැතුව සෙස් බද්දක් පනවලා මේ අමු ද්‍රව්‍ය නිමි භාණ්ඩයක් බවට පත් කරලා වෙළෙඳ පොළට යවා තිබෙන්නේ. පසු ගිය අවුරුද්ද තුළ ඒ සෙස් බද්ද පැනවීම තුළින් අපේ අපේක්ෂාව ඉටු කර ගෙන ඇමෙරිකන් ඩොලර් මිලියන 565ක පමණ වටිනාකමින් යුක්ත වූ නිමි භාණ්ඩ ඇමෙරිකාවට වගේම යුරෝපා සංගමයටත් අපි යවා තිබෙනවා. ඒ කියන්නේ 2009 වර්ෂයත් එක්ක සංසන්දනය කරන කොට සියයට 47ක කැපී පෙනෙන වර්ධනයක් ඇති කරලා තිබෙනවා.

දැන් මෙතුමන්ලා කිව්වා, අපි සේවා අංශයෙන් විතරයි ඉහළට යන්නේ කියලා. ඒක අසත්‍යයක්. ඒ වාගේ අසත්‍ය කථා තමයි මෙතැනට ඇවිත් කියන්නේ. වරායක් හදන කොට වරාය හොඳ නැහැ, ගල් තිබෙනවායි කියලා කියනවා. මහ පොළොවේ ගල් තිබෙනවා, මහ පොළොවේ වැලි තිබෙනවා, පාරවල්වල වංගු තිබෙනවා. අධිවේගී මාර්ග ඉදි වන කොට හෙට අනිද්දා කියයි, එහි වංගු තිබෙනවා කියලා. මොකද, හේතුව? අධිවේගී මාර්ගයක්වත් මෙතුමන්ලාට හදා ගන්න බැරි වුණා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ නිසා හැම වෙලාවේම දකින්නේ මේවායේ අනෙක් පැත්ත.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඒක තමයි ශක්‍යතා වාර්තා ගන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
( மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ඊළඟට 2011 මුල් හය මාසය තුළදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රබර් නිමි භාණ්ඩ අපනයනයෙන් ලත් ආදායමේ සියයට 82ක වර්ධනයක් අපි ලබා ගෙන තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා, මෙම ආදායම 2015 දී ඇමෙරිකන් ඩොලර් බිලියනයක් දක්වා වැඩි කර ගන්න. ඉතින් මෙන්න මේක තමයි රජයේ ප්‍රතිපත්තිය. රජය නිකම්ම මේ වැඩ කරලා නැහැ. මේ සෙස් බද්ද පැනවීම තුළ, රබර් නිෂ්පාදනය තුළින් රජය බලාපොරොත්තු වන ප්‍රතිඵලය රටට ගලා ගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වනවා, ඇමෙරිකන් ඩොලර් බිලියනයක ආදායමක් ඉදිරියේදී ලබා ගන්නත්, විදේශ විනිමය අපට එකතු කර ගන්නත්. එදා ජනතාවට මාස තුනක් කන්න දෙන්න සල්ලි අපට තිබුණේ නැහැ. අද ඩොලර් බිලියන හතයි දශම ගණනක තරමේ ප්‍රමාණයක වත්කම් ප්‍රමාණයක් අපේ විදේශ සංචිත ගිණුමේ තිබෙනවා. මාස හත අටකට ජනතාවට කන්න දෙන්න පුළුවන් විධියට අද අපගේ ආර්ථිකය ශක්තිමත් වෙලා තිබෙනවා. ආර්ථිකය ශක්තිමත් නැහැ කියලා මේ අය විවිධ දේ කියනවා. ආර්ථිකය වර්ධනය වන කොටත් සේවා අංශයෙන් දියුණුවක් නැහැ, කර්මාන්ත අංශයෙන් දියුණුවක් නැහැ කියලා මේ කට්ටිය කියනවා. නමුත් මම පැහැදිලිව කියනවා, අද මේ විධියට රබර් සඳහා සෙස් බද්ද පැනවීම තුළ රබර් නිමි භාණ්ඩයක් හැටියට විදේශ වෙළෙඳ පොළට යැවීමේ කටයුතු අපි ඉටු කර තිබෙන බව. එහෙම නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇමෙරිකන් ඩොලර් මිලියන 565ක වටිනාකමක් ඇති රබර් නිමි භාණ්ඩ නිෂ්පාදනය වන කොට ඒ ආශ්‍රිතව රැකියා වෙළෙඳ පොළක් ඇති වනවා. රබර් අමුවෙන් යැව්වා නම් මෙලෙස රැකියා වෙළෙඳ පොළක් රටේ ඇති වන්නේ නැහැ. මෙසේ ක්‍රියා කිරීම තුළින් අපි බලාපොරොත්තු වන රැකියා අවශ්‍යතා ඉටු කර ගන්න දේශීය රැකියා වෙළෙඳ පොළක් ඇති වෙනවා. අන්න ඒක තමයි මේ තුළින් අපි බලාපොරොත්තු වන්නේ.

ඊළඟට මේ සෙස් බද්ද පැනවීම තුළින් රජය ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වූ එක කාරණයක් වන අමු ද්‍රව්‍යයක් ලෙස අප අපනයනය කළ රබර් ප්‍රමාණය සියයට 7කින් අඩු වී තිබෙනවා. ඒ කියන්නේ 2010 වර්ෂයේ ඊට කලින් අවුරුද්දට වඩා රබර් අමු ද්‍රව්‍යයක් හැටියට අපනයනය කිරීම සියයට 7කින් අඩු කර ගන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ අනුව මෙම රබර් නිමි භාණ්ඩයක් හැටියට අපනයනය කිරීම තුළ අප බලාපොරොත්තු වන දේ අපි ඉටු කර ගෙන තිබෙනවායි කියලා කියන්න ඕනෑ.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සඳහන් කළා ආදායම ගැන. ආදායමේ වර්ධනයක් වෙලා තිබෙනවා. කර්මාන්ත අංශය ගත්තාම 2009 අවුරුද්දේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ලියා පදිංචි වෙලා තිබෙන කර්මාන්ත ගණන 1,876 යි. 2010 දී ඒ ප්‍රමාණය 1,940 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේ මේ රජයේ ආයෝජන 2010 දී සියයට 9.2කින් වැඩි වෙලා තිබෙනවා. මේ විධියට රටේ ආයෝජන, ඒ කියන්නේ නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා රටේ සංවර්ධනයක්, ආර්ථිකයේ වර්ධනයක් ඇති වෙලා තිබෙනවායි කියන එක අපි කියන්න ඕනෑ. විවිධ කථා ආශ්‍රයෙන් මෙය වැරදි පැත්තකට යොමු කරන්න හදනවා.

අපනයනය ගත්තාම 2010 වර්ෂයේ මුල් කාර්තුවට වඩා 2011 පළමු කාර්තුව තුළ අපනයන ඉපැයීම් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් 2,721 දක්වා එනම් සියයට 54.3කින් ප්‍රසාරණය වෙලා තිබෙනවා. කෘෂිකර්ම අපනයන ඉපැයීම් ප්‍රමාණය 2011 පළමු කාර්තුව තුළදී ඇමෙරිකානු ඩොලර් මිලියන 593 දක්වා එනම් ගිය අවුරුද්දට වඩා සියයට 26කින් වැඩි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාගේ බැලුවාම අපනයනවලින් අපි විශාල ආදායමක් ලබනවා. තේවලින් ලබන අපනයන ඉපැයීම් ප්‍රමාණය සියයට 21කින් වැඩි වෙලා තිබෙනවා. ඒ විධියට බලන විට ඇමෙරිකානු ඩොලර් මිලියන 2,078 දක්වා එනම් සියයට 63.8කින් සැලකිය යුතු වැඩි වීමක් කාර්මික හා කෘෂි කාර්මික අපනයනයන්ගෙන් ඇති වෙලා තිබෙනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කථා කරලා කිව්වා, මේ රටේ සංවර්ධනයක් වෙලා නැහැ කියලා. එහෙම නම් මොකක්ද මේ සංවර්ධනය? මොනවාද මේ ආදායම්? මේවා නිකම් කොළද? නැහැ. මේවා ඇමෙරිකානු ඩොලර්වලින් තමයි ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා තමයි මාස තුනක් දක්වා රජයේ තිබුණු සංචිත ප්‍රමාණය මාස 7 දක්වා වැඩි කරලා තිබෙන්නේ; උද්ධමන වේගය අඩු වෙලා තිබෙන්නේ; විරැකියාව අඩු වෙලා තිබෙන්නේ.

අතිගරු ජනාධිපතිතුමා පොහොර සහනාධාරය තේ වගාවටත් ලබා දුන්නා. මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් රජයට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. විශේෂයෙන්ම 2006 - 2008 කාලය තුළ තේ පොහොර සහනාධාරය වැඩි කළා. මොකද ඒ කාලයේදී තේ මිල විශාල වශයෙන් අඩු වුණා. ඒ අවස්ථාවේදී තේ පොහොර බෑගය රුපියල් 1,200ට දෙන්න රජයක් හැටියට අතිගරු ජනාධිපතිතුමා කටයුතු කරලා තිබෙනවා. 2010 අවුරුද්දේදි සහන මිලට මිශ්‍ර පොහොර මෙට්‍රික්ටොන් 113,975ක් මේ රජය සපයා තිබෙනවා. එහි වෙළඳ පොළ වටිනාකම ගත්තාම රුපියල් මිලියන 6,257ක් වෙනවා. මෙවැනි ආධාරයක්, මෙවැනි ශක්තියක් මේ රජය මේ රටේ තේ නිෂ්පාදනයට, නැත්නම් තේ ගොවියාට, කුඩා තේ වතු හිමියන්ට ලබා දීලා තිබෙනවා. ඇයි එහෙම ලබා දෙන්නේ? මොකද මේ රටේ අද තුන්වැනි ස්ථානයට විදේශ විනිමය උපයන්නේ, එහෙම නැත්නම් අපනයන ආදායමෙන් සියයට 16.5ක් අද මේ රටට ගෙනැල්ලා තිබෙන්නේ තේ නිෂ්පාදනයෙන්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1.5ක් වෙනවා. එතකොට මේ රටේ දළ දේශීය නිෂ්පාදනයට තේ කියන දේ අද විශාල දායකත්වයක් ලබා දෙනවා. මොකද රජයක් හැටියට තේ සහනාධාරය එහෙම නැත්නම් තේ වගා කිරීමට ලබා දෙන ආධාරය අද වැඩි කරලා තිබෙනවා. රජය හැටියට අපි ඒ ගැන සතුටු වෙන්න ඕනෑ. රුපියල් 190,000 දක්වා තිබුණු ඒ ආධාර ප්‍රමාණය රුපියල් 240,000 - 250,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම පාළු සිටුවීම වෙනුවෙන් එක තේ පැළයක් සඳහා ගෙවන ගණන රුපියල් 10 සිට 25 දක්වා වැඩි කරලා තිබෙනවා.

එතකොට මේ රජය විශාල වශයෙන් සහනාධාර දෙන රජයක්. දරුවාගේ පාසල් පොත් ටික නොමිලේ දෙනවා; නිල ඇඳුම නොමිලේ දෙනවා. ඒ වාගේම දහම් පාසල් ගුරුවරයාගේ ඇඳුම් ටික දෙනවා; පොත් ටික දෙනවා. පොහොර සහනාධාරය 2005 ඉඳන් දෙනවා; වී වලට දුන්නා; ඊ ළඟට ඒක තේ වලට දුන්නා. තේ මිල පහළ බහින කොට, රබර් මිල පහළ බහින කොට ඒවාට පොහොර සහනාධාරය දුන්නා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද එළවලු වගාවටත් සහනාධාර දීලා 1948 ලැබුණු නිදහසෙන් පස්සේ තිබුණු රජයන් අතරින් සුභසාධනය වෙනුවෙන් ඉතා විශාල මුදල් ප්‍රමාණයක් වැය කරන රජයක් බවට මේ රජය පත් වෙලා තිබෙනවා කියන එක අපි කියන්න ඕනෑ. විපක්ෂය කියන්නේ මේවා නැහැ කියලායි. අද රජය මේ රටේ ජනතාවගේ සුභසාධනය වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් වැය කරලා තිබෙනවා කියලා පැහැදිලිව අපි කියනවා.

ඊ ළඟට කෑගලු දිස්ත්‍රික්කයට මගේ අවධානය යොමු කරනවා. කෑගලු දිස්ත්‍රික්කය තුළ තේ වගා බිම් ප්‍රමාණය ගත්තාම හෙක්ටෙයාර 6,093ක් තිබෙනවා. මෙයින් කුඩා තේ වතු හිමියන් 20,000ක් පමණ අපේ දිස්ත්‍රික්කය තුළ ජීවත් වෙනවා. නැවත වගාව සඳහා දෙනු ලබන දිරි දීමනාව අද වැඩි කරලා තිබෙනවා.

[ගරු ලලිත් දිසානායක මහතා]

පාළු සිටුවීම වෙනුවෙන් එක තේ පැළයකට ලබා දෙන මුදල රුපියල් 10 සිට 25 දක්වා අද වැඩි කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද කුඩා තේ වතු සාමාජිකයෝ 14,500ක් විතර ඉන්නවා. කුඩා තේ වතු සමිති 120ක් විතර අපට තිබෙනවා. මේ රජයෙන් ලබා දෙන මේ සහනාධාරය අද මේ ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන්ට ලබා ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. එතකොට දිස්ත්‍රික්කයේ ජනතාවට තමයි ඒ ශක්තිය ලැබෙන්නේ. මේක තමයි මේ රජයේ තිබෙන ප්‍රතිලාභය. මම පදිංචි,මගේ දිස්ත්‍රික්කය තුළ මේ කුඩා තේ වතු හිමියන් විශාල ප්‍රමාණයකට, එහෙම නැත්නම් හෙක්ටෙයාර 6,093ක බිම් ප්‍රමාණයකට මේ පොහොර ටික ලැබෙනවා; මේ සහනාධාරය ලැබෙනවා. ඒ තුළින් රටේ නිෂ්පාදනය වැඩි වෙනවා. මෙන්න මේක තමයි මේ රජයේ මූලික බලාපොරොත්තුව. වෙනත් ක්‍රමවේදයකට යනවාට වැඩිය මේ දිරි දීමනාව තුළින් අප බලාපොරොත්තු වන මේ රටේ තේ නිෂ්පාදනය, ඒ වාගේම එහි ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා අපි කටයුතු කරන්න ඕනෑ. ඒ මඟින් තමයි අපට ඉහළ මිලක් ලබා ගන්න පුළුවන්කම ලැබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තේ ගැන කථා කරනවාට අමතරව තවත් දෙයක් ගැන පැහැදිලිව කියන්න ඕනෑ. ඒ යක්කු ගැනයි. අපේ ඉන්දික බණ්ඩාරනායක මන්ත්‍රීතුමාත් ඒ ගැන කථා කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාතෘකාවෙන් පිට වුණත් මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න ඕනෑ. එදා මේ රටේ රීරි යකෙක් හිටියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමාට නම වැරදුණා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔව්, වැරදුණා. ඒක තමයි. අපේ පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා තමයි යකුන් ගැන කිව්වේ. මේ රටේ රීරි යකෙක් හිටියා ප්‍රභාකරන් කියලා. ප්‍රභාකරන් කියන රීරි යකා මේ රටේ සමාජයෙන් අයින් කරලා දැම්මා. එදා අම්පාර වාගේ දිස්ත්‍රික්කවල ළමයි හවස හතරෙන්, පහෙන් පස්සේ කැලෑවලයි ජීවත් වුණේ. නමුත් මීට අවුරුදු දෙකහමාරකට කලින් ප්‍රභාකරන් කියන රීරි යකා මේ රටෙන් අයින් කරලා දාලා, ඒ තත්ත්වය නැති කරලා මේ රටේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය, අපේ නායකතුමා, ආරක්ෂක ලේකම්තුමා ඇතුළු සියලු දෙනාම මේ රටේ ජනතාවට සාමය ගෙනැවිත් දුන්නා. අන්න ඒ සාමය නැති කරන්න විවිධ කුමන්ත්‍රණ මේ රටේ ක්‍රියාත්මක කරනවා. දැන් ග්‍රීස් යකෙක් ගැන කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පැහැදිලිව කියනවා ප්‍රභාකරන් කියන රීරි යකා නැති කරපු අතිගරු ජනාධිපතිතුමා ඇතුළු ත්‍රිවිධ හමුදාව සහ පොලීසියට මේ ග්‍රීස් යකා කජ්ජක් නොවන බව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප තවත් දෙයක් කියන්න ඕනෑ. මේ අය මේ මතයේ ඉන්නේ ඇයි? අද ඒ අයට වෙන කියන්න දෙයක් නැහැ. ප්‍රධාන විපක්ෂය යැයි කියා ගෙන ඒ ගොල්ලෝ අද තමන්ගේ නායකයා එළවන්න කටයුතු කරනවා. අපි ඊයේ මාධ්‍ය තුළින් දැක්කා, ඒ අය තමන්ගේ නායකතුමාගේ කාර්යාලය ඉස්සරහ පන්දම් පත්තු කරලා තොවිල් නටනවා. ඒකෙන් කියන්නේ මොකක්ද? ඒ අයට පත් කර ගන්න නායකයෙක් නැහැ කියන එකයි. අද විපක්ෂයක් නැහැ. විපක්ෂය බෙදිලා. කොළඹ නගර සභා ඡන්දය එනවා, මහනුවර නගර සභා ඡන්දය එනවා. අපි පැහැදිලිව කියනවා තමන්ගේ නායකයා පත් කර ගන්න බැරි, තමන්ගේ නායකයා එළවන්න තොවිල් නටන විපක්ෂයකට අප මේ යන ගමන ග්‍රීස් යකකු ගෙනැල්ලා, එහෙම නැත්නම් වෙනත් දෙයක් කරලා නවත්වන්න බැහැ කියා.

අපේ නායකතුමා වන අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට විශාල ශක්තියක් තිබෙනවා. ඒ නිසා ග්‍රීස් යකුන් නොවෙයි වෙන ලෙඩ රෝග මොනවා ගෙනෙන්න හැදුවත් මේ රටේ ජනතාව නිවැරැදි තීන්දු ගන්නවා. හේතුව මේකයි. තමන්ගේ පක්ෂයේ නායකයාට විරුද්ධව තොවිල් නටන, තමන්ගේ පක්ෂයේ නායකයා තෝරා ගන්න බැරි, තමන්ගේ පක්ෂයේ නායකයා ගැන වැටහීමක් නැති, අවබෝධයක් නැති, ඒ වාගේම තමන්ගේ නායකයාගේ කාර්යාලය ඉස්සරහා පිකට් කරන, උද්ඝෝෂණය කරන තත්ත්වයට විපක්ෂයේ එක්සත් ජාතික පක්ෂය අද පත් වෙලා තිබෙනවා. එහෙම නම් ඒ අයට මේ රටේ නායකත්වය භාර දෙන්න ජනතාව කැමැති නැහැ. ඒ නිසා වරායේ ගල් ගැන නොවෙයි මොනවා ගැන කිව්වත් වැඩක් නැහැ. වරායේ ගල් තිබෙන්න පුළුවන්. නමුත් ඒ ගල් කඩන එක එච්චර ප්‍රශ්නයක් නොවෙයි. අද වරායවල් පහක් සංවර්ධනය වෙනවා. කොළඹ, ඔලුවිල් වගේ වරායවල් අද සංවර්ධනය වෙනවා. ඇමෙරිකන් ඩොලර් බිලියන 427කට වැඩි ආයෝජනයක් අද කොළඹ වරායේ කරලා තිබෙනවා. ඔය කථා කරන අය ගිහිල්ලා බැලුවොත් එය තේරේවි. ඒ නිසා අපි කියන්න ඕනෑ මේ සංවර්ධනයට ඊර්ෂ්‍යා කරලා වැඩක් නැති බව. මේකට දායකත්වය දෙන්න ඕනෑ. හම්බන්තොට වරාය විතරක් නොවෙයි, තව අවුරුද්දක් දෙකක් යන කොට අපි මත්තල ගුවන් තොටුපොළ හදනවා. එහි runway එකේත් ගල් තිබෙනවා කියලා ඕනෑ නම් කියන්න. මේ රටේ ජනතාව ඒවා විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලාට හැමදාම ගල් තමයි කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. (Mrs.) Anoma Gamage. You have 10 minutes.

[අ. භා. 5.13 ]

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
( மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත මඟින් ලබා දී ඇති බලතල ප්‍රකාරව ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිතුමා විසින් නියෝගයක් ඉදිරිපත් කර තිබෙන මෙම අවස්ථාවේ පාර්ලිමේන්තුවේ විපක්ෂය වෙනුවෙන් පමණක් නොවෙයි ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් වෙනුවෙනුත් ශ්‍රී ලංකා වාසීන් වෙනුවෙනුත් අදහස් කීපයක් ප්‍රකාශ කිරීමට ලැබීම ගැන මම සතුටු වෙනවා. ඒ වාගේම මා එය ගෞරවයක් ලෙස සලකනවා.

1948 වර්ෂයේදී එක්සත් ජාතික පක්ෂයේ නිර්මාතෘ මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මහතාගේ තීක්ෂණ ඥානය හා දක්ෂතාව නිසා ශ්‍රී ලංකාව නිදහස ලබා ගත් දා පටන් අප නිතර අසන්නේ ශ්‍රී ලංකා ආර්ථිකය අපනයනය මුල් කර ගත් ආර්ථිකයක් ලෙසටයි. එදා තේ, පොල්, රබර් අපනයන ආර්ථිකය ලෙස විරුදාවලිය ලැබූ ශ්‍රී ලංකාවේ ආර්ථිකය අතිගරු ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ දුර දක්නා නුවණ තුළින් ඇති කළ කර්මාන්ත පුරයන් සහ වෙළඳ කලාප නිසා කාර්මික භාණ්ඩ අපනයනය කරන රටක් බවට පත් වුණා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ පාලන යුගය ගැන අපට කවදාවත් අමතක කරන්න බැහැ. මේ රටේ වේගවත්ම සංවර්ධන යුගය නිර්මාණය කරන්න එතුමා

දක්ෂයන් තෝරා ගනිමින් වගකීම් භාර දුන්නා. ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමා විවෘත ආර්ථිකය ඉදිරියට ගෙන යමින් වරාය සංවර්ධනය ඇතුළු යටිතල පහසුකම් ඇති කිරීම තුළින් අපේ රටේ නිෂ්පාදන අපනයන වෙළඳ පොළට හඳුන්වා දීමටත්, ඒවාට තරගකාරි ලෙස වෙළඳ පොළට ඇතුළු වීමටත් දුන් සහාය අපට කියා නිම කරන්න බැරි තරම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගාමිණී දිසානායක මැතිතුමා එදා පැවති ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය වසර තිහකින්වත් නිම කරන්නට බැහැයි කියපු මහවැලි ව්‍යාපෘතිය අභියෝගාත්මකව භාර ගෙන වසර හයකින් නිමා කරමින් අපේ රටේ විදුලි බලය නැති ප්‍රදේශවල සිටිය දුප්පත් අහිංසක ජනතාවට සිහිනයක් බඳු වූ විදුලි බලය ගමට ගෙන ගොස් ආලෝකය ලබා දීලා, භූමිතෙල් ලාම්පුවෙන් පොත පත කියවූ අහිංසක ගැමි දරුවන්ට විදුලි ආලෝකයෙන් පොත පත කියවන්නට අවස්ථාවක් ලබා දුන්නා. ඒ වාගේම අපනයන ක්ෂේත්‍රයට අවශ්‍ය කරන කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කරන්නට අත්‍යවශ්‍ය වන විදුලි බලය අද වාගේ දරන්නට බැරි අධික මිලකට නොව ඉතා සාධාරණ මිලකට ලබා දීම තුළින් අපනයන වෙළෙඳ පොළේ තරගකාරීත්වයට මහඟු සහනයක් ලබා දුන්නා. මහවැලි ව්‍යාපාරය තුළින් ඇති කරන ලද ගොවි ජනපදවලින් රටට අවශ්‍ය කරන බත සපයන්න කටයුතු කළා. පරාක්‍රමබාහු රජතුමාගෙන් පසු, වාරි සම්පත් වැඩිදියුණු කළේ වී ගොවිතැනට පමණක් නොවෙයි. දිගාමඩුලු දිස්ත්‍රික්කයේ සහ බදුල්ල දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය, මහියංගනය, ගිරාඳුරුකෝට්ටේ වැනි ප්‍රදේශවල බඩ ඉරිඟු, කෙසෙල් සහ තවත් නොයෙකුත් කෘෂි කාර්මික භෝග විශාල ප්‍රමාණයක් දේශීය කෘෂි කර්මාන්තයට එක් කරමින් ඒවායේ නිමි භාණ්ඩ ගැමි ආර්ථිකයට පුනරුදයක් ලබා දෙමින් අපනයන ක්ෂේත්‍රයට එකතු කළා.

එපමණක් නොවෙයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා යොවුන් බළකාය ඇති කරමින් යෞවනයන්ගේ අවශ්‍යතාවන් සහ අඩු පාඩු හඳුනා ගෙන ඔවුන්ට අවශ්‍ය කරන දැනුම සහ පුහුණුව ලබා දෙන්නට කාර්මික වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන සහ අධ්‍යාපන විද්‍යාපීඨ ස්ථාපිත කළා. බියගම වැනි වෙළෙඳ කලාප ඉතාම කෙටි කාලයකින් ගොඩ නඟමින් පිට රට ආයෝජකයන්ට මෙරටට පැමිණීමට අවශ්‍ය කරන විශ්වාසය තහවුරු කිරීමට අඩිතාලමක් දමමින්, අනෙක් සංවර්ධනය වන රටවල් සමඟ ලෝක වෙළෙඳ පොළේ කරට කර තරග කරන්නට හැකි වටපිටාවක් සකස් කළ ආකාරය අද කර්මාන්තකරුවන්ට පවා අමතක වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික අපනයන අතර නිදහස ලැබූ දා සිටම මුල් තැන ගෙන ඇත්තේ එකම භාණ්ඩයක්. ඒ තමයි තේ. 2010 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව මුළු අපනයන වටිනාකමින් සියයට 24.6ක් කෘෂි කාර්මික භාණ්ඩ උපයා දී තිබෙනවා. එයින් සියයට 70ක්ම තේ අපනයන ආදායමයි. කාර්මික භාණ්ඩ අපනයනයෙන් සියයට 56ක් ලැබිලා තියෙන්නේ ඇඟලුම් නිෂ්පාදනවලින්. ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිතුමා මේ තත්ත්වය ගැන සතුටු වනවාද කියලා දැන ගන්න කැමැතියි. තව කොපමණ කාලයක් අපේ අපනයන අතර මේ භාණ්ඩවලට ඇති ආධිපත්‍ය පවත්වාගෙන යන්න පුළුවන් වෙයිද?

තේවලට අමතරව රබර් අපනයනවලටත් ශ්‍රී ලංකාව ප්‍රසිද්ධියක් ලැබුවා. එක්සත් ජාතික පක්ෂ රජය විසින් ඇති කරන ලද "ආයෝජන ප්‍රවර්ධන" වැඩ පිළිවෙළ යටතේ මේ රට තුළ රබර් භාණ්ඩ නිපදවීම ආරම්භ වුණා. දේශීය රබර් දැන් ශ්‍රී ලංකාව තුළම නිමි භාණ්ඩවලට හැරෙනවා. 2010 වර්ෂයේදී මුළු අපනයන ආදායමෙන් රබර් උපයා දී තිබෙන්නේ සියයට 2.1 ක් පමණයි. සම්පූර්ණ අපනයනයෙන් උපයා ඇති ආදායම ඒ වාගේ තුන් ගුණයටත් වැඩියි. එය සියයට 6.8 ක්. කාර්මික භාණ්ඩ අපනයන අතර ඇඟලුම් නිෂ්පාදනවලට පසුව දෙවැනි ස්ථානය හිමි කරගෙන තිබෙන්නේ රබර් නිමි භාණ්ඩයි. ගෝලීය ආර්ථික ක්‍රමය තුළ සිදු වන මිල චලනයන්ට කෘෂි කාර්මික අපනයන නිතරම ගොදුරු වනවා. මෙයින් ගැලවීමට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් කාර්මික භාණ්ඩ අපනයනය දිරිමත් කළා. ඒ නිසා තමයි අද කාර්මික භාණ්ඩ අපනයනය විසින් කෘෂි කාර්මික භාණ්ඩ අපනයනය අභිබවා තියෙන්නේ. ඒ නිසාම තමයි අද ඇඟලුම් නිෂ්පාදන ලංකාවේ අංක එකේ අපනයන බවට පත් වී තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මඟින් ලැබෙන විශාල විදේශ විනිමය ආදායමට අමතරව සපයා ඇති රැකියා ප්‍රමාණය මෙන්ම එම කර්මාන්තශාලා පිහිටා ඇති අතිදුෂ්කර ප්‍රදේශ තුළ ඇති වී තිබෙන යටිතල පහසුකම් සංවර්ධනයත් අතිවිශාලයි. ගරු ඇමතිතුමා කළ යුත්තේ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතින් එතුමාට ලැබී ඇති බලතල අනුව නියෝග හා නියම නිකුත් කර, සෙස් බදු තුළින් විදේශ විනිමය රටට උපද්දවන රබර් කර්මාන්තයේ නියැළී සිටින කර්මාන්තකරුවන්ගේ බඩට ගසා රජයේ ආදායම වැඩි කිරීමද කියා මම අහන්න කැමැතියි.

ඇත්තටම අපේ වැවිලි කර්මාන්ත ඇමතිතුමා එක්සත් ජාතික පක්ෂ රජයේ හිටිය නිසා අපි භය නැතිව කථා කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
එතුමා පරණයි. කොයි කාලයේද හිටියේ?

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
( மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
පරණ නැහැ. එහෙනම් ඇස් දෙක බලන්න වෙනවා. ඒ ආකාරයට දුර දිග බලලා අඩුම වශයෙන් 2010 මහ බැංකු වාර්තාවෙන් පෙන්වා දෙන ආකාරයටවත් ගෝලීය ආර්ථිකයේ සිදු වන වෙනස්කම්වලට මුහුණ දිය හැකි අපනයන ව්‍යූහයක් සකස් කිරීම කළ යුතු බව මම කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1994 වර්ෂයේ රබර් හෙක්ටෙයාර් 160,910ක් වගා කර තිබූ අතර එය 2005 වර්ෂය වන විට 116,478 දක්වා අඩු වුණා.

ලෝක වෙළෙඳ පොළේ රබර් මිල ශීඝ්‍ර ලෙස අඩු වීම තුළ, රබර් කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන වියදම 1994 දී රුපියල් 39.35ක් වූ අතර, එය 2005 වන විට රුපියල් 76.12 දක්වා වැඩි වුණා. අපේ රබර් නිෂ්පාදනය 2005 දී ටොන් 104,352ක් වුණා. 2009 වර්ෂයේදී රබර් නිෂ්පාදන වියදම කිලෝග්‍රෑම් එකක් සඳහා රුපියල් 115. 50ක් වුවත්, ලෝක වෙළෙඳ පොළේ රබර් මිල ශීඝ්‍ර ලෙස ඉහළ යාම තුළ රබර් වතු හිමියන්ට රබර් අපනයනය කිරීම තුළින් විශාල ආදායමක් ලබා ගන්න හැකි වුණා. රජයේ උදව්වක් නැතිව රබර් වතු හිමියන්, රබර් කර්මාන්තයේ නියැළී සිටින වැවිලිකරුවන් සහ ව්‍යාපාරිකයන් වගාවට පොහොර දැමීමටත්, වගාව නඩත්තු කිරීමටත්, අලුතින් බිම් සකස් කර නැවත සිටුවීමටත් ඔවුන්ගේ ලාභයෙන් කොටසක් යෙදූ අතර, රබර් නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහාත් ආයෝජනය කරන්න යෙදුණා.

මේ රජය පසු ගිය අය වැය ලේඛනයේදී රබර් කර්මාන්තය නැවත නංවන්නට, නැවත රබර් වගා කරන උදව්යට අක්කරයකට රුපියල් 6,986ක් ගෙවන්න පොරොන්දු වුණා. එම මුදල් ආසියානු සංවර්ධන බැංකුවෙන් හෝ ලෝක බැංකුවෙන් දීර්ඝ කාලීන ණය හැටියට ලබා ගන්න සැලසුම් කළ බවත් ප්‍රකාශ කළා. දැන් ආණ්ඩුව හදන්නේ විශාල සෙස් බද්දක් දාලා රටේ ආර්ථිකයට යමක් එකතු කරන ව්‍යාපාරිකයන්ගේ ලාභයට විදින්නටයි. මෙම බදු තුළින් රුපියල් මිලියන 618ක් පමණ රජයට ලබා ගැනීමට හැකි වෙයි කියලා ගණන් බලා තිබෙනවා. එම මුදල්වලින් අක්කර 88,462කට සහන ලබා දෙන්න රජය බලාපොරොත්තු වෙනවා. කර්මාන්තකරුවන් ලෝක වෙළෙඳ පොළේ රබර් මිල පහළ

[ගරු අනෝමා ගමගේ මහත්මිය]

යැමේදී වගාව නඩත්තු කර ගැනීමට නොහැකිව, වගාවේ සේවකයන්ට පඩි ගෙවා ගැනීමට නොහැකිව, බැංකුවෙන් ලබා ගත් ණය ගෙවා ගැනීමට නොහැකිව සිටි අවස්ථාවේදී ඔවුන්ට කිසිම ආකාරයකින් උදව් නොකරපු රජයට මෙවැනි සෙස් බද්දක් ලබා ගැනීමට අයිතියක් නැති බව මේ සභාවට මම අවධාරණය කරන්න කැමැතියි. මේක හරියට, තිබෙන උදව්යගෙන් කොල්ල කා නැති උදව්යට ලබා දෙන්න සරදියෙල් කටයුතු කරපු ආකාරයේ එකක් හැටියට තමයි මම දකින්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2008 සහ 2009 වර්ෂවලදී ලෝක වෙළෙඳ පොළේ [බාධා කිරීමක්] රබර් මිල ශීඝ්‍රයෙන් අඩු වීම නිසා මෙරට රබර් වගාකරුවන්ට, විශේෂයෙන්ම කුඩා ඉඩම් හිමියන්ට විශාල පහරක් වැදුණු බව මා අමුතුවෙන් කිව යුතු නොවේ. එහෙත් මෙවැනි වගාකරුවන්ට සහන ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ආණ්ඩුව අපොහොසත් වුණා. එයින් වගාකරුවන්ට සිදු වූ විශාල පාඩුවෙන් යාන්තම් ගොඩ ඒමට සැරසුණු විට රබර් අපනයනය මත සෙස් බද්දක් පැනවීමට ගරු අමාත්‍යතුමා කඩිමුඩියේ සූදානම් වීමෙන් පෙනී යන්නේ, රබර් වගාව හා නිෂ්පාදනය රැක ගැනීමට වඩා, කුඩා ඉඩම් හිමියා සුළු වෙළෙඳ වාසියක් ලබන විට ඒ කොටස ඩැහැ ගැනීමට ආණ්ඩුව සූදානම් වන බවයි. සෙස් බද්ද පැනවීමේ යටි අරමුණ මෙය වුවත්, 2011 වර්ෂය සඳහා ඉදිරිපත් කළ වාර්ෂික අය වැය වාර්තාවේ සඳහන් වෙන්නේ අගය එකතු කරන ලද රබර් නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධන කිරීම සඳහා අපනයනය කරනු ලබන අමු රබර් සඳහා වන සෙස් බද්ද වැඩි කරන බවයි. රබර් නිෂ්පාදන සඳහා අවශ්‍ය වන රබර් වගාව වැඩි දියුණු කිරීමට සහනාධාර ලබා දෙන බවත්, ඒ සඳහා සෙස් බද්ද මඟින් උපයා ගන්නා මුදල් යොදවන බවත් එහි දක්වා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ මේ ප්‍රකාශය මහින්ද චින්තනයේ සඳහන් කරුණු සමඟ සලකා බලමු. රබර් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා නැවත වගා කරන ඉඩම් ප්‍රමාණය වාර්ෂිකව වැඩි කරන බවත්, සාම්ප්‍රදායිකව රබර් වගා නොකරන දිස්ත්‍රික්කවල හෙක්ටෙයාර 45,000ක රබර් වගා කරන බවත්, නව රෝපණ ද්‍රව්‍ය හඳුන්වා දෙන බවත්, පෞද්ගලික සහ පොදු පැළ තවාන් පිහිටුවන බවත්, නව රෝපණ තාක්ෂණ ක්‍රම හඳුන්වා දෙන බවත්, රබර් ඵලදාව සහ ඵලදායිතාව වැඩි කරන බවත් මහින්ද චින්තනයේ 44වැනි පිටුවේ පැහැදිලිව දක්වා තිබෙනවා. අපේ වැවිලි කර්මාන්ත ඇමතිතුමා එතුමාගේ කථාවේදී පැවසුවා, අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව සහ මහඔය ප්‍රදේශයේ රබර් වගාව ප්‍රචලිත කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන බව. ඒක කර ගෙන යනවා කියලාත් මම දන්නවා. මම ඒක මේ සභාවට පැවසුවා. ඒවා ඒ අයුරින්ම ක්‍රියාත්මක කිරීමට හැකි වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. නමුත් රබර් වගාවට සුදුසු ඉඩම්වල වෙනත් කටයුතු, වෙනත් වගාවන් සිදු වන බව මම මේ ගරු සභාවට කියන්න කැමැතියි. සමහර ඉඩම් ගොඩනැඟිලි, මංමාවත් සහ වෙනත් ඉදි කිරීම්වලට යොදා ගෙන තිබෙනවා. අනෙක් ඉඩම්වල අයිතිය තහවුරු කර ගෙන නැහැ. ඒ නිසා රබර් වගාව කිරීමේ අපහසුතාවන් තිබෙනවා. ඒ වාගේම රබර් වගාව සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍යවල විශාල හිඟයක් පවතිනවා. මේ තත්ත්වය යටතේ අලුතින් රබර් වගා කරන්නේ කොහොමද? රබර් වගාවේ ඵලදායිතාව එන්න එන්නම අඩු වෙනවා. නිෂ්පාදන වියදම වැඩි වෙනවා. ඒ මදිවාට නිර්යාත කරන රබර්වලට සෙස් බදු අය කරන්න කියලා අපේ ගරු ඇමතිතුමා නියෝග පනවනවා.

කෙසේ වෙතත්, මේ සෙස් බද්ද මීට වඩා අඩු කිරීමට මා යෝජනා කරනවා. මෙම බද්ද රබර් කර්මාන්තයේ දියුණුව සඳහා දේශීය කර්මාන්තකරුවන්ට අත දීම සඳහා පමණක් යොදා ගත යුතු බවත්, එක්සත් ජාතික පක්ෂයේ නායකයන් එදා දුන් ආදර්ශය අධ්‍යයනය කර රබර් පමණක් නොව සියලුම අපනයන ආර්ථිකය වැඩි දියුණු කිරීමට ගරු ඇමතිතුමාටත්, මේ රජයටත් ධෛර්ය, ශක්තිය ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

අපනයනය ගැන කථා කරන මේ අවස්ථාවේදී අපේ අපනයන, ආනයනය ගැනත් අනෙකුත් දේවල් ගැනත් සුළුවෙන් හෝ කථා කළ යුතුයි කියා මා සිතනවා. මහ බැංකු වාර්තාවේ 8 වෙනි පිටුවේ තවත් වැදගත් කරුණක් සඳහන් වෙනවා. 2010 වර්ෂයේ අපේ වෙළෙඳ ශේෂයේ ඇමෙරිකානු ඩොලර් බිලියන 5.2ක හිඟයක් ඇති වුණා. අපේ අපනයන ආදායම සියයට 17.3කින් වැඩි වන විට ආනයන වියදම 32.8කින් වැඩි වුණා. අපනයන ආදායම වැඩි වන වේගයට වඩා දෙගුණකියන් අපේ ආනයන වියදම වැඩි වනවා නම් අවුරුදු ගණනාවකින් අපේ රටට මොකද වෙන්නේ? හිඟමනට පත් වෙන එක. දැනටමත් අපි ඒ තත්ත්වයට පත් වෙලා ඉවරයි. එහෙම නම් අපි අපනයන ආදායම වැඩි කරන අතරේ ආනයන වියදම අඩු කර ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කර ගත යුතුයි.

මෙහිදී විශේෂයෙන්ම ආණ්ඩුව සැලකිල්ලට ගත යුතු කරුණක් තිබෙනවා. ආණ්ඩුව විසින්ම ආනයනය කරන ලද සිමෙන්ති, පෙට්‍රල් වැනි බාල භාණ්ඩවලට අමතරව පෞද්ගලික අංශය විසිනුත් තත්ත්වයෙන් බාල බෙහෙත් සහ වෛද්‍ය උපකරණ වැනි දේවල් ගෙන්වා ඇති බව සෞඛ්‍ය ඇමතිතුමා විසින්ම සඳහන් කරලා තිබෙනවා. ඒවා නැවැත්විය යුතුයි. ඒ වාගේම මේ රටේ නිපදවන එළවලු, අල, ලූනු වැනි ද්‍රව්‍ය ආනයනය කිරීම නවත්වන්න ඕනෑ. එක අතකින් "අපි වවමු - රට නඟමු" සහ "දිවි නැඟුම" වාගේ නොයෙක් නම්වලින් හඳුන්වන වැඩ සටහන් යටතේ ආහාර බෝග නිෂ්පාදනයට විශාල ධනස්කන්ධයක් ආණ්ඩුව වියදම් කරනවා. අනෙක් අතින් මහ බැංකු වාර්තාවේම දැක්වෙන ආකාරයට විශාල වශයෙන් මිල ඉහළ යන කෘෂි භාණ්ඩ ආනයනය කිරීම සඳහා ධනස්කන්ධයක් වියදම් කරනවා. මම අපේ කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා රටට නොගැළපෙන, අනවශ්‍ය, තත්ත්වයෙන් බාල භාණ්ඩ ආනයනය කිරීම නැවැත්වීමට කටයුතු කරන්න කියලා.

නිමි ඇඳුම් සහ ඇඟලුම් අපනයනය සම්බන්ධයෙනුත් මේ වෙලාවේ සුළු වශයෙන් හෝ සඳහන් කළ යුතුයි කියා මම හිතනවා. 2010 වර්ෂය ඇඟලුම් කර්මාන්තයට හිතකර වර්ෂයක් වුණේ නැහැ. යුරෝපා හවුල අපේ ඇඟලුම් අපනයනයට මෙතෙක් ලබා දී තිබූ GSP Plus සහනය ඉවත් කර ගත්තා. එහෙම තිබියදීත් යුරෝපා හවුලට ශ්‍රී ලංකාව අපනයනය කළ නිමි ඇඳුම්වල වටිනාකම සියයට 3කින්ද, ඇමෙරිකානු එක්සත් ජනපදයට අපනයනය කළ වටිනාකම සියයට 5.5කින්ද වැඩි වුණ බව මහ බැංකු වාර්තාව සඳහන් කරනවා. එය සිදු වූ ආකාරයත්, එයට හේතුත් මහ බැංකු වාර්තාව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරනවා. පෞද්ගලික නිමි ඇඳුම් නිෂ්පාදකයින් තම අපනයන වටිනාකම වැඩි කිරීමට ගනු ලැබූ ක්‍රියා මාර්ග රැසක් ගැන සඳහන් වෙනවා. ඒ අතරම නිමි ඇඳුම් අපනයනයට සිදු වූ අභාග්‍ය සම්පන්න තත්ත්වයෙන් ගොඩ ඒමට ආණ්ඩුව විසින් ගනු ලැබූ එකම පියවරක් ගැනවත් සඳහන් වන්නේ නැහැ. මේ ගැන සම්පූර්ණ ගෞරවය පෞද්ගලික නිමි ඇඳුම් නිෂ්පාදකයින්ට මහ බැංකු වාර්තාව පිරිනමනවා. Page 106 of the Annual Report 2010 of the Central Bank states, I quote:

"….many manufacturers improved the quality of their products and enhanced productivity enabling them to face the new competition. They achieved higher levels of value addition by incorporating design aspects into the production process, focusing on branded products and catering to the high end customers."

මෙයින් අදහස් වන්නේ කුමක්ද? ආණ්ඩුවේ අදූරදර්ශී, අපැහැදිලි ක්‍රියා පිළිවෙත නිසා අපේ ඇඟලුම් අපනයනයට ලබා දී තිබුණ GSP Plus සහනය අහිමි වූ බවත්, මෙම තත්ත්වයෙන් ගොඩ ඒමට ආණ්ඩුව විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් නොගන්නා ලද බවත් නොවේද?

ශ්‍රී ලංකාවේ අපනයනය ගලා යන්නේ කුමන දිශාවකටද? මහ බැංකු වාර්තාව අනුව අමෙරිකාව සහ බටහිර රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ අපනයන වෙළඳ පොළවල් බව සඳහන් වී තිබියදී අපේ ආණ්ඩුව මේ රටවල් සමඟ ඇති කර ගන්නා විරසක භාවය අපේ රටේ සියලුම අපනයන කර්මාන්තකරුවන්ට පමණක් නොවෙයි ඒවායේ රැකියාවේ නියුතු වී ජීවිකාව කර ගෙන යන ලක්ෂ ගණන් සේවක සේවිකාවන්ගේ රැකියාවලට අවදානම් තත්ත්වයක් උදා වෙමින් පවතින බව මම මේ ගරු සභාවට අවධාරණය කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහ බැංකුව තද කළු අකුරින් සටහන් කරන මෙම යථාර්ථය කෙරෙහි ගරු ඇමතිතුමා කොයි තරම් වැදගත්කමක් දී තිබෙනවාද? අපි අපේ ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වා ගැනීමේදී මෙම යථාර්ථය ගැන කල්පනා කරනවාද? බටහිර ලෝකයේ රටවල් අප රට තුළ ආණ්ඩුව සිදු කරන අකටයුතුකම්, මානව නිදහස උල්ලංඝනය කිරීම්, මාධ්‍ය නිදහසට බාධා කිරීම් පිළිබඳව කථා කරන විට අපි දක්වන ප්‍රතිචාරය කුමක්ද? අපේ අපනයන භාණ්ඩවලට වෙළඳ පොළ සපයන බටහිර රටවලට අපහාස, උපහාස කිරීමයි. ඔවුන්ට තර්ජනය කිරීමයි. ඔවුන්ව විහිළුවට ලක් කිරීමයි. ලංකාවේ දේශපාලන ස්ථාවරය ගැන අපේ ප්‍රධානතම වෙළඳ පාර්ශ්වකරු වන ඉන්දියාව කලකිරීමට පත් වී සිටිනවා. මේ තත්ත්වය ගැන මීට වඩා බුද්ධිමත්ව කටයුතු කරන ලෙසට මා මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වග විභාගයකින් තොරව නිදහසේ ඕනෑම කුණු ගොඩක් ආනයනය කිරීමට ඉඩ දීම නිසා අහස උසට ඉහළ යන, දරා ගත නොහැකි ආනයන වියදමත්, අදූරදර්ශී බව නිසා, වැඩසටහනක් නොමැති නිසා අපට අහිමි වන අපනයන ආදායමත් අතර පරතරය විදේශ රටවල රැකියාවලින් ලැබෙන සොච්චම නිසා යන්තම් පියවා ගැනීමට පුළුවන් වූ බව මහ බැංකු වාර්තාව සඳහන් කරනවා. ශ්‍රී ලංකාව තුළට විදේශ මුදල් ලබා දෙන වැදගත්ම, ස්ථාවර මාර්ගය බවට විදේශ රැකියා පත් වී ඇති බව තවදුරටත් සඳහන් වනවා.

Page 95 of the Annual Report 2010 of the Central Bank states, I quote:

“The Middle Eastern region continued to dominate the foreign employment market, accounting for more than 90 per cent of the departures for foreign employment, with the majority consisting of housemaids”.

මේකද, අපේ විදේශ වෙළඳ ප්‍රතිපත්තිය? එක අතකින් විදේශ රැකියා මඟින් ලැබෙන ආදායමේ වැදගත්කමයි, ස්ථාවරබවයි ගැන උදම් අනනවා. අනෙක් අතින් විදේශීය රැකියාවලට විශාල වශයෙන් යන අපේ කාන්තාවන්ට සිදුවන හිරිහැර, අකටයුතුකම් ගැන නිතර කථා කරනවා. මේකට වෙනම නිලධාරින්, කාර්යාංශයක් පවතිනවා. ඒ මදිවාට වෙනම අමාත්‍යාංශයක් හා අමාත්‍යවරයෙක් සිටිනවා. අවුරුදු ගණනාවකට පෙර වංචනික ලෙස අඩු වයසින් විදේශ රැකියාවට යැවූ "රිසානා" නමැති අයගේ රැකියා ඒජන්තවරු සිරභාරයට ගැනීමට අවුරුදු කීයක් රජයට ගත වුණාද? රිසානා ගැන පැය ගණන් කථා කළත්, පොත් ගණන් ලිව්වත්, අමාත්‍යවරු අමාත්‍යාංශ කාර්යාංශ නිලධාරින් තානාපතිවරු සිටියත්, රිසානා නිදහස් කර ගෙන අපේ රටට ගෙන ඒමට බැරි වීම ගැන රජයක් හැටියට පමණක් නොව රටක් හැටියට, ශ්‍රී ලාංකික ජාතියක් හැටියට අපි කනගාටු වනවා. [බාධා කිරීමක්] අපනයනය ගැන කථා කරන්නේ. [බාධා කිරීමක්] අපනයනය කළා නේ, රිසානා.

අපට විදේශ මුදල් ලබා දෙන ස්ථාවර, වැදගත් මාර්ගය වන විදේශ රැකියා ගැන රජයේ ප්‍රතිපත්තිය කියාපාන හොඳ නිදර්ශනයක් මේක.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have only one more minute.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
( மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
අපේ කාන්තාවන් විදේශ රැකියාවන්ට යෑම නිසා ඔවුන්ට පෞද්ගලිකව සිදු වන හිරිහැර, අකටයුතුකම් හා දූෂණ අති මහත්. ඔවුන්ගේ පවුල්අවුල් වෙලා. ඔවුන් පිට රට යවන මුවාවෙන් මුදල් ගරා ගන්නා ජොබ් ඒජන්සිවල දූෂණ පිරිලා. විදේශ රැකියා අද සමාජ ව්‍යසනයක් බවට පත් වෙලා. එයින් රජයට ලැබෙන ආර්ථික වාසියට වඩා අපේ කාන්තාවන්ට සිදු වන අයහපත ගැන අප මීට වඩා අවධානය යොමු කළ යුතුයි.

කාන්තාවන් පිට රට යවා මුදල් සොයා ගැනීමටත්, ඔවුන් ඉතාම මහන්සියෙන් ලේ කඳුළු බිබී සොයා ගන්නා සොච්චම සොරකම් කිරීමටත් මාන බලන ජොබ් ඒජන්සිකාරයින්, තැරැව්කරුවන් කටුනායක ගුවන් තොටුපොලේ පිරිලා. රැකියාවලට යන කාන්තාවන්ගේ පිළිසරණට කිසිම කෙනෙක් නැහැ. මමත් කාන්තාවක්. මෙම ගරු සභාවේ කාන්තාවන් රැසක් සිටිනවා. මේ තත්ත්වයන් නිවැරදි කිරීම සඳහා වහාම රජය නිරවුල් ප්‍රතිපත්තියක් සකස් කළ යුතු බව මා කියා සිටිනවා.

කාල වේලාව මදිකම නිසා ආනයන අපනයන ගැන ප්‍රකාශ කිරීමට බැරි වූ කරුණු බොහෝයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාවේ ඉතිරි කොටස හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி:*
*Rest of the speech tabled:*

නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, “මහින්ද චින්තනය” මුලින්ම ඉදිරිපත් කළේ 2005 වර්ෂයේදී. 2005දී බිලියන 253.1ක් වූ වෙළෙඳ ශේෂ හිඟය 2010 දී බිලියන 588.9ක් දක්වා 100%කටත් වඩා වැඩි ප්‍රමාණයකින් වැඩි වී තිබෙනවා. ඔන්න මහින්ද චින්තනයේ වාණිජ කේන්ද්‍රය ලෙසට ශ්‍රී ලංකාව පත් වී තිබෙන හැටි.

මේ තත්ත්වය වෙනස් කිරීමට ආණ්ඩුව කටයුතු නොකළහොත් ගෝලීය ආර්ථික විසින් ගිලගත් ප්‍රථම ආසියානු රට බවට ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යයක් බවට පත් වීමට වැඩි කල් ගත වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1994 වර්ෂයේ රබර් හෙක්ටෙයාර 160,910ක් වගා කර තිබූ අතර එය 2005 වර්ෂය වන විට 116,478 දක්වා අඩු විය. ලෝක වෙළෙඳ පොළේ රබර් මිල ශීඝ්‍රවම අඩු වීම තුළ සහ රබර් නිෂ්පාදන වියදම 1994 දී රුපියල් 39.35ක් ව තිබූ අතර එය 2005 වන විට 76.12 දක්වා වැඩි විය. අපේ නිෂ්පාදනය 2005 දී ටොන් 104,352ක් වුණි. 2009 වර්ෂයේදී නිෂ්පාදන වියදම රුපියල් 115.50ක් වූවත් ලෝක වෙළෙඳ පොළේ රබර් මිල ශීඝ්‍ර ඉහළ යාම තුළ රබර් වතු හිමියන්ට රබර් අපනයනය කිරීම තුළ විශාල ආදායමක් ලබා ගැනීමට හැකි වුණි. රජයේ උදවුවක් නැතිව රබර් වතු හිමියන් සහ රබර් කර්මාන්තයේ නියැළී සිටින වැවිලිකරුවන් සහ ව්‍යාපාරිකයන් ඔවුන්ගේ ලාභ වගාවට පෝර දැමීමට සහ වගාව නඩත්තු කිරීමටත් අලුතින් බිම් සකස් කර නැවත සිටවීමටත් කොටසක් යෙදවූ අතර රබර් නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීමට ආයෝජනය කරන්නට යෙදුණි. මේ රජය ගිය අයවැය ලේඛනයේදී රබර් කර්මාන්තය නංවන්නට රබර් නැවත වගා කරන උදවියට අක්කරයකට රුපියල් 6,986ක් ගෙවන්නට පොරොන්දු වූ අතර එම මුදල් ආසියානු සංවර්ධන බැංකුවෙන් හෝ ලෝක බැංකුවෙන් දීර්ඝකාලීන ණය හැටියට ලබා ගැනීමට සැලසුම් කළා.

දැන් ආණ්ඩුව හදන්නේ විශාල සෙස් බද්දක් දැමීම තුළ රටේ ආර්ථිකයට යමක් එකතු කරන ව්‍යාපාරිකයන්ගේ ලාභයට විදින්නයි. මෙම බදු තුළින් රුපියල් මිලියන 618ක් පමණ රජයට ලබා ගැනීමට හැකි වන අතර එම මුදල් තුළින් අක්කර 88,462කට සහන ලබා දීමට රජයට හැකි වනවා. කර්මාන්තකරුවන් ලෝක වෙළෙඳ පොළේ රබර් මිල පහළ යාමේදී වගාව නඩත්තු කර ගැනීමට නොහැකිව වගාවෙන් සේවකයන්ට පඩි ගෙවා ගැනීමට

[ගරු අනෝමා ගමගේ මහත්මිය]

නොහැකිව බැංකුවල ලබා ගත් ණය ගෙවීමට නොහැකිව සිටි අවස්ථාවේදී කිසිම ආකාරයෙකින් උදවු නොකරපු රජයට මෙවැනි සෙස් බද්දක් ලබා ගැනීමට අයිතියක් නැති බව මෙම මේ සභාවට අවධාරණය කරනවා. මෙය හරියට සරදියෙල් තියෙන උදවියගෙන් කොල්ල කා නැති උදවියට ලබා දුන් සේ ක්‍රියා කරන ආකාරයයි මා දකින්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2008 හා 2009 වර්ෂවලදී ලෝක වෙළෙඳපොලේ රබර් මිල ශීඝ්‍රයෙන් අඩු වීම නිසා මෙරට රබර් වගාකරුවන්ට විශේෂයෙන් කුඩා ඉඩම් හිමියන්ට විශාල පහරක් වැදුණු බව මා අමුතුවෙන් කිව යුතු නොවේ. එහෙත් මෙවැනි වගාකරුවන්ට සහන ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට වර්තමාන ආණ්ඩුව පොහොසත් නොවීය. එහෙත් එයින් තමන්ට සිදු වූ විශාල පාඩුවෙන් යන්තම් ගොඩ ඒමට සැරසෙන විට රබර් අපනයනය මත සෙස් බද්දක් පැනවීමට ගරු අමාත්‍යතුමා කඩිමුඩියේ සූදානම් වීමෙන් පෙනී යන්නේ ආණ්ඩුවේ අවධානය රබර් වගාව හා නිෂ්පාදනය රැක ගැනීමට වඩා කුඩා ඉඩම් හිමියා සුළු වෙළෙඳ පොළ වාසියක් ලබන විටම කොටසක් ඩැහැ ගැනීමට සූදානම් වන බවය.

සෙස් බද්ද පැනවීමේ යටි අරමුණු මෙය වුවත් 2011 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද වාර්ෂික අයවැය වාර්තාවේ සඳහන් වන්නේ අගය එකතු කරන ලද රබර් නිෂ්පාදනය අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා අපනයනය කරනු ලබන අමු රබර් සඳහා වන සෙස් බද්ද වැඩි කරන බවයි. රබර් නිෂ්පාදන සඳහා අවශ්‍ය වන රබර් වගාව වැඩි දියුණු කිරීමට සහනාධාර ලබා දෙන බවත් ඒ සඳහා සෙස් බද්ද මඟින් උපයා ගන්නා මුදල් යොදවන බවත් තව දුරටත් එහි දක්වා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප මේ ප්‍රකාශය මහින්ද චින්තනයේ සඳහන් කරුණු සමඟ සලකා බලමු. රබර් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වාර්ෂිකව නැවත වගා කරන ඉඩම් ප්‍රමාණය වැඩි කරන බවත්, සාම්ප්‍රදායිකව රබර් වගා නොකරන දිස්ත්‍රික්කවල හෙකටෙයාර 45,000ක රබර් වගා කරන බවත්, නව රෝපණ ද්‍රව්‍ය හඳුන්වා දෙන බවත්, පෞද්ගලික සහ පොදු පැළ තවාන් පිහිටුවන බවත්, නව රෝපණ තාක්ෂණය හඳුන්වා දෙන බවත්, රබර් ඵලදාව සහ ඵලදායීතාවය වැඩි කරන බවත් මහින්ද චින්තනයේ 44 වන පිටුවේ පැහැදිලිව දක්වා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහින්ද චින්තනයේ සඳහන් මෙම ක්‍රියාකාරකම්වලින් එකක්වත් මේ වන විට ක්‍රියාවට නංවා තිබෙනවාද? අඩුම තරමේ රබර් වගාවට සුදුසු රබර් වගා කළ හැකි ඉඩම් හෙක්ටෙයාර 45,000ක් හඳුනාගෙනවත් නැහැ. රබර් වගාවට සුදුසු ඉඩම්වල වෙනත් කටයුතු දැනටමත් සිදු වනවා.

සමහර ඉඩම් ගොඩනැඟිලි මංමාවත් සහ වෙනත් ඉදිකිරීම්වලට යොදා ගෙන. අනිත් ඉඩම්වල අයිතිය තහවුරු කරගෙන නැහැ. ඉතින්, කොහොමද වගාවට සුදුසුයි කියන ඉඩම්වල රබර් වගා කරන්නේ.

අනිත් පැත්තෙන් රබර් වගාව සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍යවල දැනටමත් විශාල හිඟයක් පවතිනවා. මේ තත්ත්වය අලුතින් රබර් වගා කරන්නේ කොහොමද? රබර් වගාවේ ඵලදායීතාවය එන්න එන්නම අඩු වෙනවා. නිෂ්පාදන වියදම වැඩි වෙනවා. ඒ මදිවාට නිර්යාත කරන රබර්වලට සෙස් බදු අය කරලා අපේ ගරු ඇමතිතුමා නියෝග නිකුත් කරනවා.

කෙසේ වෙතත් මෙම සෙස් බද්ද මීට වඩා අඩු කිරීමට මා යෝජනා කරන අතර මෙම බද්ද රබර් කර්මාන්තයේ දියුණුව සඳහා දේශීය කර්මාන්තකරුවන්ට අත දීම සඳහා පමණක් යොදා ගත යුතු බවත් එ.ජා.ප. නායකයන් එදා දුන් ආදර්ශය අධ්‍යයනය කර රබර් පමණක් නොවෙයි සියලුම අපනයන ආර්ථිකය වැඩිදියුණු කිරීමට ගරු ඇමතිමාටත් මේ රජයටත් ධෛර්යය ශක්තිය ලැබේවායි කියමින් මා නිහඬ වෙනවා.

[අ. භා. 5.32]

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**

( மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)

(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අනෝමා ගමගේ මන්ත්‍රීතුමියගේ කථාව එතුමියගේ මාමා වූ එච්.ජී.එස්.රත්නවීර මැතිතුමා අහගෙන හිටියා නම්, නැවත වරක් අද මේ සභාවේ ඉඳ ගෙන වහ බොනවා. එතුමිය මහ ලොකුවට පුරාජේරු කථා කරපු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාව වේදිකාවේ පට්ට ඇරියේ ඒ දවස්වල රත්නවීර මහත්මයාලා තමයි. එතුමියගේ කථාව ගැන මා වැඩිය උත්තර දෙන්න යන්නේ නැහැ. මොකද, එතුමියගේ කථාව පදනම් කර ගත්ත ආර්ථික ප්‍රතිපත්තියත් මේ රජයේ ආර්ථික ප්‍රතිපත්තියත් එතුමිය නොකියා කිව්වා. එතුමිය කිව්වා, "මේ ආණ්ඩුව කරන්නේ තියෙන මිනිහාගෙන් අරගෙන අනෙක් අයට සමසේ බෙදලා දෙන එක" කියා. එතුමියගේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වුණේ, සල්ලිකාරයෝ බදු ගෙවන්නේ නැතුව බදු හොරුන් වන විට ඒ බදු හොරුන්ට සමාව දීපු එක; සල්ලි තිබෙන බදු හොරුන්ට සමාව දීපු එක. අපේ ප්‍රතිපත්තිය වන්නේ බදු හොරුන්ට සමාව දෙන එක නොවෙයි, තියෙන මිනිහාගේ වැඩියෙන් තියෙන ටික අරගෙන අනෙක් අයට සමසේ බෙදලා දෙන එක. එතුමියගේ කථාවෙන්ම ඒක ප්‍රකාශයට පත් කළා. ඇඟලුම් කර්මාන්තශාලා හිමියෙක්ගේ හෝ කොන්ත්‍රාත්කරුවෙක්ගේ හෝ office එකක ඉන්න ලිපිකරු මහත්මයෙක් ලියපු කථාව එතුමිය කියවා ගෙන යනකොට එතුමිය මේ කථා කරන්නේ මේ රටේ ජනතාව වෙනුවෙන්ද එහෙම නැත්නම් ව්‍යාපාරිකයෝ වෙනුවෙන්ද කියා අවසානයේ එතුමියටම අමතක වුණා. එතුමියගේ කථාවේදී සම්පූර්ණයෙන්ම කිය වුණේ ව්‍යාපාරිකයා ආරක්ෂා කිරීම පමණයි. ඒ ගැන එතුමියට මා උත්තර දෙන්න යන්නේ නැහැ.

රිසානා නෆීක් සම්බන්ධයෙන් එතුමිය මතක් කළ නිසා ඒ ගැනත් කියන්න ඕනෑ. මේ රටේ වාගේම රිසානා නෆීක් සිටින රටෙත් නීතියක් තිබෙනවා. ඒ නීතිය "ෂරිආ" නීතිය. ඉස්ලාම් භක්තිකයන් විශ්වාස කරන විධියට "ෂරිආ" නීතිය කියලා කියන්නේ දෙවියන් දීපු නීතිය. ඒ රටේ නීතියටත් අපි ගරු කරනවා. ඒ රටේ රජතුමා රිසානා නෆීක්ගේ සිද්ධිය සම්බන්ධයෙන් මේ වෙලාව වන විට ඉතාම හොඳ ප්‍රතිචාර දක්වා තිබෙනවා. ඒ රටේ නීතියට ගරු කරමින් ඒ රටත් සමඟ තියෙන්නාවූ ඉතාම හොඳ සම්බන්ධතාවයන් ඒ විධියටම ආරක්ෂා කර ගනිමින් රිසානා නෆීක්ට සමාව ලබා දීමේ කටයුතු සඳහා දැන් අපි අවතීර්ණ වෙලා තිබෙනවා.

ඒ නිසා බුරන අයට බුරන්න දීලා, අපි සාකච්ඡා මාර්ගයෙන් ඒ කාරණා කටයුත්ත කරන්න උත්සාහ කරන බව පමණක් මා එතුමියට ප්‍රකාශ කරන්නට ඕනෑ, එතුමියටත් කිසිම අපහාසයක් නොවන විධියට. මොකද, මම හිතුවේ නැහැ මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් බුරන සමහර අය වාගේ එතුමියත් ඒ ගණයට වැටෙන්න ක්‍රියා කරයි කියලා. නමුත් අද ඒ ගණයට වැටුණා. රිසානා නෆීක්ගේ සිද්ධිය අරගෙන රිසානාගේ ජීවිතයත් එක්ක විතරක් සෙල්ලම් කරන්න එපා. වෙන ඕනෑ දෙයක් එක්ක සෙල්ලම් කරන්න. රිසානාගේ ජීවිතයත් එක්ක සෙල්ලම් කරන්න උත්සාහ කරන්න එපා. සෞදිඅරාබියේ ලංකාවේ තානාපති කාර්යාලය ඉදිරිපිටට ගිහිල්ලා, තැන් තැන්වලට ගිහිල්ලා කෑ ගැහුවාට රිසානා නෆීක්ට සමාව ලැබෙන්නේ නැහැ. ඒකෙන් වන්නේ රිසානා නෆීක්ගේ ජීවිතය තවත් අනතුරේ වැටෙන එකයි. ඒ නිසා එක එක නෝනලා නුවර පළාතේ හෝ කොහේ හරි ගිහිල්ලා boards අල්ලා ගෙන තප්පුලෑවාට රිසානා නෆීක්ට සමාව ලැබෙන්නේ නැහැ. රිසානා නෆීක්ට සමාව ලබා ගත යුත්තේ ඒ රටේ තිබෙන නීතියටත් ගරු කරමින්, ඒ රටේ තිබෙන රජයත් එක්ක, රජතුමාත් එක්ක කථා කරමින් ඒ හරහා පමණයි. ඒ හරහා කටයුතු කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ මා ගොනු කරනවා.

**ගරු අජිත් කුමාර මහතා**

(மாண்புமிகு அஜித் குமார)

(The Hon. Ajith Kumara)

***නැඟී සිටියේය.***

*எழுந்தார்.*

*rose.*

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

එක එක් කෙනා ප්‍රශ්න අහලා මගේ කථාවට බාධා කළාට මම ඉඩ දෙන්නේ නැහැ. ඒ අයගේ ප්‍රශ්නවලට මම අනන්තවත් උත්තර දී ඇති නිසා. මට පෙනෙන විධියට ග්‍රීස් යක්කු මවාපු, ග්‍රීස් යක්කුන්ට උර දෙන කට්ටිය තමයි තවත් තැන්වලින් නැඟිටින්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මං මාතෘකාවට එන්නම්. මොකද, රජයේ අපට ඒ සම්බන්ධයෙන් කථා කරන්න ගොඩක් දේවල් තිබෙනවා. ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමාට මං ස්තුතිවන්ත වන්න ඕනෑ, මේ රබර් සහ තේ වගාකරුවන් පිළිබඳව ඉතාම හොඳින් කල්පනා කරලා අද මේ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙන ඒම සම්බන්ධයෙන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලංකාවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගත්තාම කුඩා තේ වතු හිමියන් වැඩිම ප්‍රමාණයක් ඉන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තමයි මා නියෝජනය කරන හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය. ඒ නිසා කුඩා තේ වතු හිමියන්ට ඔබතුමා මේ කරලා තිබෙන්නේ මහා පුණ්‍ය සම්භාරයක් ලැබෙන්නා වූ කටයුත්තක් ගරු ඇමතිතුමනි. කුඩා තේ වතු හිමියන් මීට අවුරුදු තුනකට විතර ඉස්සෙල්ලා තමාගේ තේ මිල පහළ බැහැලා විශාල අර්බුදයකට පත් වෙච්ච වෙලාවේ, මම රිසානා ගැන කථා කරන කොට සමහර වෙලාවට මෙතැනින් jack-in-the-box වාගේ නැඟිටින මන්ත්‍රීවරුන් කුඩා තේ වතු හිමියන්ගේ ප්‍රශ්නය අරගෙන ගිහිල්ලා ගාල්ල ප්‍රදේශයේ තේ ගෝනි පාරවල්වල දාලා ගිනි තියලා පටු දේශපාලන වාසි අරගෙන ඒ තිබෙන ප්‍රශ්නය වෙනත් පැත්තකට හරවන්න උත්සාහ කරන කොට, ඌවේ ඉන්න කුඩා තේ වතු හිමියන් තමයි බස් තුනකින් මහා භාණ්ඩාගාරයට ඇවිල්ලා මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා හම්බ වෙලා, ගරු රංජිත් සියඹලාපිටිය නියෝජ්‍ය ඇමතිතුමා හම්බ වෙලා අතිගරු ජනාධිපතිතුමාට ඒ ප්‍රශ්නය කිව්වේ. අතිගරු ජනාධිපතිතුමා පැය 48ක් ඇතුළත ඒ ප්‍රශ්නයට පිළිතුරු දුන්නා විතරක් නොවෙයි, වී ගොවියාට දුන්නු පොහොර සහනාධාරය වැනි සහනාධාරයක් තේ ගොවියාටත් දුන්නා. එදා ඉඳලා තමයි කුඩා තේ වතු හිමියන් නැවත නැඟිටින්න පටන් ගත්තේ. එදා තේ කිලෝ එක රුපියල් 17 මට්ටමට වැටෙන කොට අද ඔය කෑ ගහන, දඟලන කවුරුත් ඒ කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් කථා කරන්න ආවේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා එදා කුඩා තේ වතු හිමියන්ගේ ප්‍රශ්නයට මැදිහත් වුණා විතරක් නොවෙයි, පොහොර සහනාධාරයත් ලබා දුන්නා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද තේ කිලෝ එකක මිල රුපියල් 50, 51, 52 මට්ටමේ තිබෙනවා. සමහර තැන්වල 60 සීමාවටත් ගිහිල්ලා තිබෙනවා. ඒක තමයි ඇත්ත. ඒ ඇත්තට මුහුණ දෙන්න ඕනෑ. ගරු අනෝමා ගමගේ මන්ත්‍රීතුමිය රබර් ගැන කියා ගෙන කියා ගියා. හැබැයි වෙළෙඳ පොළේ අද රබර්වල තිබෙන මිල ගැන කථා කරන්න ගියේ නැහැ. 2010 ජනවාරි මාසයේ රුපියල් 342ට තිබුණු රබර් කිලෝ එකක මිල අද රුපියල් 611ට ගිහිල්ලා තිබෙනවා. මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නිසා තමයි මේ කාරණා කටයුතු වෙලා තිබෙන්නේ. ඒවා හංගනවා. ඒවා වහලා ගහනවා. කුඩා තේ වතු හිමියාට ලැබෙන මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. රබර් වවන කෙනාට ලැබෙන මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. හැබැයි ඒක ගැන කථා කරන්නේ නැහැ, වහලා ගහනවා. එහෙම කරන්න එපා. මේක දිහා ඇත්ත විධියට බලන්න. අද මේ රටේ තේ වවන අයගෙන් සියයට 68ක් කුඩා තේ වතු හිමියන්. කුඩා තේ වතු හිමියන් ගැන කියන කොට එහා පැත්තේ ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ඉන්නවා. ඒ වාගේම ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමියත් දැන් මේ ගරු සභාවට ආවා. දෙදෙනා විරුද්ධ පක්ෂය තුළ පැති දෙකක ඉන්නවා කියලා මට හිතුණාට, ඒ දෙදෙනාම ඒ කර්මාන්තයට බොහොම සෘජුව සම්බන්ධ වෙච්ච උදවිය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කුඩා තේ වතු හිමියන්ගේ තේ වගාවෙන් හෙක්ටයාරයකට ලැබෙන අස්වැන්න සාමාන්‍යයෙන් අපි දන්නා විධියට කිලෝ 2,300ක් විතර වෙනවා. හැබැයි කොම්පැනිකාරයන් මහා විශාල මුදල් කන්දරාවක් වියදම් කරලා තේ වවනවා. ඒ ගොල්ලන්ගේ තේ වගාවෙන් හෙක්ටයාරයකට ලැබෙන්නේ කිලෝ 1,300යි, 1,350යි. කොච්චර ලොකු වෙනසක්ද?

ඊයේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා අපේ වැවිලි කර්මාන්ත ඇමතිතුමාගෙන් ප්‍රශ්න කළා. ඒ ප්‍රශ්නයේ ගැබ් වෙලා තිබුණේ නිෂ්පාදන පිරිවැය - cost of production - ඉහළ යාම ගැනයි. එතුමා කියන්න උත්සාහ කළේ නිෂ්පාදන පිරිවැය ඉහළ ගියේ ළඟදි කම්කරුවන්ට පඩි වැඩි වීම නිසාය කියායි. නැහැ, ඒ නිසා පමණක්ම නොවෙයි. එහෙම නම් කොහොමද සියයට 68ක් වන කුඩා තේ වතු හිමියන්ගේ තේ අස්වැන්න හෙක්ටෙයාරයකට තේ දළු කිලෝ 2,300ක් වෙනකොට කොම්පැනිකාරයන්ගේ තේ අස්වැන්න හෙක්ටෙයාරයකට තේ දළු කිලෝ 1,300ක් වන්නේ.

කොහොම වුණත් මෙතැනදි management එකේ ප්‍රශ්නයක් තිබෙන්න එපායැ. ඒ නිසා ඒ තුළ ගැබ් වෙලා තිබෙන්නේ කොම්පැනිකාරයන් ඒ වතු ටික කුණුකොල්ලයට මිලට අරගෙන ඒ වතු නියමාකාරයෙන් පාලනය කරන්නේ නැහැ කියන එකයි. ඒ වතු නියමාකාරයට පාලනය කරන්නේ නැහැ. එහෙම කරන අය ඉන්න පුළුවන්. නමුත් බහුතරයක් ඉන්නේ ඒවා නිසි අන්දමින් පාලනය නොකරන අයයි. ඒ තේ වතුවලට නියමාකාරයෙන් සාත්තු සප්පායම් කරන්නේ නැහැ. නියමාකාරයෙන් ඒ පාළු ඉඩම්වල තේ හිටුවන්නේ නැහැ. ඒ vacancies ටික පුරවන්නේ නැහැ. හිස් ඉඩම් ටික නැවත වගා කරන්නේ නැහැ. වත්තේ තිබෙන තේ ගස් ටිකෙන් දළු ටික ගන්නවා. මොනරාගල, බිබිල පැත්තේ වත්තක් නම් ඒ වත්තේ මැණික් තිබෙනවා නම් මැණික් ටික ගරා ගන්නවා. තේ වවන එක නොවෙයි ඒ කටයුතු තමයි කරන්නේ.

කුඩා තේ වතු හිමියන් මේ කර්මාන්තයට ආදරෙයි. ඒ අය තමන්ගේ තේ පැළය බලා ගන්නේ දරුවෙක් බලා ගන්නවා වාගෙයි. මොකද, තමන් ජීවත් වන්නේ ඒ කර්මාන්තයෙන්ය කියන එක ඒ අය දන්නවා. ඒ නිසා තමයි කුඩා තේ වතු හිමියන් හෙක්ටෙයාරයකින් තේ දළු කිලෝ 2,300ක් ගන්නේ ගරු ඇමතිතුමනි. ඔබතුමා මේ කරපු මහා පුණ්‍ය කර්මය නිසා කුඩා තේ වතු හිමියන්ට තවදුරටත් තමන්ගේ කර්මාන්තය දියුණු කර ගැනීමට හැකියාව ලැබෙනවා. අවශ්‍ය නම් තේ කොම්පැනිකාරයන්ටත් පුළුවන් දැන් මේ දේ මේ විධියටම භාවිතා කරලා ඒ කාරණා කටයුතු කර ගන්න.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් උඩරට, මැදරට ප්‍රදේශවල නැවත වගා සහනාධාරය රුපියල් ලක්ෂ දෙකේ ඉඳලා දෙලක්ෂ පනස් දහස දක්වාත්, පහත රට ප්‍රදේශවල එය රුපියල් දෙලක්ෂ හතළිස්දහස දක්වාත් වැඩි කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, එය ඉතාම හොඳ වැඩක්. මොකද, ඒ හරහා තමයි කුඩා තේ වතු හිමියන් ධෛර්යවත් වන්නේ. සියයට 60ක් පමණ තේ කර්මාන්තයේ නියැළී ඉන්න අය ධෛර්යවත් වන්නේ මේ හරහාමයි. පාළුවට ගිහින් තිබෙන ඉඩම්වල නැවත තේ සිටුවීමේදී පැළයකට දෙන මුදල රුපියල් 10 සිට රුපියල් 25 දක්වා වැඩි කර තිබෙනවා. ඒකත් ඔබතුමා විසින් අනිවාර්යයෙන්ම කළ යුතුවම තිබුණු දෙයක්. ඒ නිසා ඒ සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වන්නේ නැහැ. මේ කරපු මහඟු කාර්යය වෙනුවෙන් ඔබතුමාට මහා පුණ්‍ය සම්භාරයක් ලැබේවා'යි ප්‍රාර්ථනා කරනවා. මොකද, අපි දන්නවා අපේ පළාත්වල කුඩා තේ වතු කර්මාන්තයේ යෙදිලා ඉන්න ජනතාව කොතරම්- [බාධා කිරීමක්] මේ කාර්යයට මැදිහත් වීම සම්බන්ධයෙන්. මොකද අර කිව්වා වාගේ අතිගරු ජනාධිපතිතුමා මේ කාරණයට මැදිහත් වුණා. එදා කුඩා තේ වතු හිමියන් අනාථ වෙන කොට, කුඩා තේ හිමියන් පහළට

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

වැටෙනකොට පහළට වැටිච්ච තේ මිල ඉස්සරහට අරගෙන එදා අතිගරු ජනාධිපතිතුමා මේ කාර්යයට මැදිහත් වුණා.

විමුක්තිකාමීන්ය කියන සමහර උදවිය ඒ ප්‍රශ්නයට මැදිහත් වන්නේ නැතුව එදා ගාල්ල පැත්තේ තේ දළු ගෝනි පාර මැද තියා ගිනි තියා පුච්චනකොට අතිගරු ජනාධිපතිතුමා මැදිහත් වෙලා තේ පොහොර සහනාධාරය දීලා කුඩා තේ වතු හිමියන්ගේ තත්ත්වය ඉහළ නැංවූවා. අද ග්‍රීස් යකා මවන්නේත් කවුද කියා අපි දන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා තමයි අපි මේ වෙලාවේදී අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු ඇමතිතුමාටත් ස්තුතිවන්ත වන්නේ.

ගරු ඇමතිතුමනි, අපි අද මේ කුඩා තේ වතු කර්මාන්තය නංවන්නට අවශ්‍ය කරන යෝජනා ගෙනෙන කොට අපි ලෝකය ගැනත් කල්පනා කරන්න ඕනෑ. ලෝකයේ අපේ තේ වැඩියෙන්ම ආනයනය කරපු රටවල්, අපේ බඩු ආනයනය කරපු රටවල් අද ඒ අයගේ රටවල තිබෙන්නා වූ මූල්‍ය අර්බුදය බේරා ගන්න හදන්නේ වැඩිපුර අපනයනය කිරීමෙනුයි. උදාහරණයක් වශයෙන් අද ඇමෙරිකාව වැඩියෙන්ම උත්සාහ කරන්නේ ආනයනයන් අඩු කරලා වැඩිපුර අපනයනයට යන්නයි. ඇමෙරිකාව වැනි රටවල් කෝපි බොන එක නවත්වා iced-tea කියන වර්ගය හඳුනා ගෙන තිබුණු නිසා තේවලට ඉල්ලුමක් තිබුණා. නමුත් ඇමෙරිකාව වැනි රටවල් අද උත්සාහ කරනවා, ආනයනය කරනවා වෙනුවට ඒ ගොල්ලන්ගේ දේවල් වැඩියෙන් අපනයනය කරන්න. ඒ නිසා වැඩිපුර අපේ තේ වෙළෙඳ පොළ තිබුණු රටවල්, ඒ ගොල්ලන්ගේ රටවලට යම් යම් දේවල් වැඩිපුර ආනයනය කරනවා වෙනුවට - ඒ රටවල තිබෙන්නා වූ මූල්‍ය අර්බුදය නිසා අපේ තේ ආනයනය කරනවා වෙනුවට- ඒ ගොල්ලොත් යම් යම් දේවල් වැඩිපුර අපනයනය කරන්න පෙළඹුණොත් එතකොට අපට විකල්ප වෙළෙඳ පොළ - විකල්ප markets - සොයා යන්න සිදු වෙනවා. විකල්ප වෙළෙඳ පොළවල් සොයා ගන්නවා වාගේම තේවල අගය වැඩි කරනකොට - value add කරන කොට- තව තවත් අලුත් ක්ෂේත්‍රවලටත් value add කරන්න සිද්ධ වෙනවා. තේ ගැන කල්පනා කළොත් අපි තේ පිට රට යවනකොට විශේෂයෙන්ම අගය වැඩි කිරීමේ කටයුත්ත කළ යුතුව තිබෙනවා. එය ඉතා හොඳින් කෙරෙමින් පවතිනවා. ලංකාවේ රාජ්‍ය අංශයට වඩා විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ සමාගම් අද තේවල අගය වැඩි කිරීමේ කටයුත්ත - value added tea පිට රටට යවන කටයුතු- ඉතා හොඳින් කරමින් පවතිනවා.

අපේ රටේ ගුවන් යානා විතරක් නොවෙයි, වෙන රටවල airlinesවලට නැග්ගාම menu cards වල තේ කියන selection එක බැලුවාම බොහෝ තැන්වල -සියයට අනුවක් විතරම- තිබෙන්නේ ශ්‍රී ලාංකික සමාගම්වලින් යවන තේ පිළිබඳවයි කියලා පෙනෙනවා. Ceylon Tea කියන ඒ නාමය ඔස්සේ -ඒ නාමය යටතේ- ලංකාවට විශාල කීර්ති නාමයක් ලැබුණා. ඉස්සර පිට රටවල කට්ටිය අපේ රට දැන ගත්තේ Ceylon Tea කියන නමිනුයි. ඊට පසුව තමයි ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යතුමිය වීම හරහා අපේ රටට කීර්තියක් ලැබුණේ. ඊට පසුව ක්‍රිකට් හරහා අපේ රටට යම්කිසි ආකාරයක කීර්තියක් ලැබුණා. දැන් ලෝකයේ ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම කියන කාරණය මත අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලය තුළ අපේ රටට කීර්ති නාමයක් ලැබී තිබෙනවා. ඒ අතරතුර විපක්ෂය ගත්තාම ඒ පැත්තෙනුත් අපට දැන් කීර්ති නාමයක් ලැබී තිබෙනවා, බේරා ගන්න බැරුව විශාල පඹ ගාලක පැටලී සිටින එකම විපක්ෂය හැටියට.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා අපේ කුඩා තේ වතු හිමියන්ට තේ කර්මාන්තයටත්, රබර් වතු හිමියන්ට රබර් කර්මාන්තයටත් අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන ගමන්, මේ කර්මාන්ත හරහා අපේ අපනයන ආදායම වැඩි කර ගැනීම සඳහා දැනට තිබෙන වෙළෙඳ පොළවලට අමතරව නව වෙළෙඳ පොළවල් කරා යොමු වන්නට උත්සාහ කරන්නේ කෙසේද කියන එක කල්පනා කරන්නට ඕනෑ. ඒ වෙළෙඳ පොළවල තිබෙන ඉල්ලුම අනුව සැපයුම් කළ යුත්තේ කොයි ආකාරයටද කියන එක පිළිබඳව අපි කල්පනා කරන්නට ඕනෑ.

මම පෞද්ගලිකව දරන මතයක් තමයි අපි තේවලට value add කරන කොට, විවිධ flavours add කරන කොට වැල් පෙනෙල වාගේ flavour එකකුත් තේවලට add කළාට වරදක් නැහැයි කියන එක. අපි දන්නවා ලෝකය පුරාම බොහෝ උදවිය ඒ වාගේ ක්ෂේත්‍රවලට සම්බන්ධ ඖෂධ සඳහාත් විශාල මුදලක් වියදම් කරන බව. මම මේ කියන දේ සමහර විට විහිළුවකට ගන්න පුළුවන්. නමුත් අද ලෝකය දිහා බැලුවාම අපට පෙනෙනවා, ඉල්ලුම තිබෙන්නා වූ සමහර ක්ෂේත්‍රවලට අපි ඉල්ලුම අනුව සපයන්නට ඕනෑ බව. ඒ නිසා තේවලට විවිධ flavours add කරනවා වාගේ වැල් පෙනෙල flavoured tea export කරන්න අපට පුළුවන් නම් ඒකට විශාල ඉල්ලුමක් ලැබේවි. ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා ඒකට මාත් එක්ක එකඟ වනවා. ඒ වාගේම ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාත් මේකට එකඟ වනවාමයි කියලා මම දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේ අප සිතන පතන සම්ප්‍රදායික ක්‍රමයෙන් ඔබ්බට ගිහිල්ලා - out of the box - නව වෙළෙඳ පොළවල් සොයා ගන්න කොට, අපනයනය සඳහා වෙළෙඳ පොළවල තිබෙන්නා වූ ඉල්ලුමත් සැලකිල්ලට ගත යුතු වනවා. ඒ සඳහා තමයි අපට අමාත්‍යාංශයේ නිලධාරින් සහ මේ ක්ෂේත්‍රයට සම්බන්ධ උදවියගේ අදහස් හා ඒ අය සමඟ සාකච්ඡා කිරීම අවශ්‍ය වන්නේ. මොකද, අද ලෝකය ගමන් කරන්නේ විවිධ දිශාවලටයි. ඇමෙරිකාව වාගේ ලෝකයේ බොහෝ රටවල අද ඇති වී තිබෙන ආර්ථික අහේනිය නිසා ඒ ආර්ථික අහේනියෙන් ගැළවෙන්න ඒ ගොල්ලන්ගේ රටවල තිබෙන අපනයන වැඩිපුර වෙනත් රටවලට යවන්න උත්සාහ කරන බව අපි අමතක කරන්න හොඳ නැහැ. වැඩිපුර ආනයනය කරපු රටවල් ඒ ආනයන අඩු කරනවා. ඒගොල්ලන් ආනයන අඩු කරන කොට අපේ රටේ තේ වාගේ දේවල්, රබර් වාගේ දේවල් ඒ රටවලට ගැනීමේ අවකාශ අඩු වන්න පුළුවන්. එය සැලකිල්ලට අර ගෙන අපි නව වෙළෙඳ පොළවල් කරා ප්‍රවිෂ්ට වීමේ දී රටවල් හැටියට නව වෙළෙඳ පොළවල් හඳුනා ගන්නා ගමන්, අගය වැඩි කරලා, අගය එකතු කරලා - value add කරලා - යවන අපේ භාණ්ඩ ඒ රටවල තිබෙන ඉල්ලුමට සරිලන විධියට ගොනු කර ගැනීමේ කටයුත්තට අපි යොමු වන්න ඕනෑය කියන කාරණය තමයි මම මේ කියන්න උත්සාහ කරන්නේ.

ගරු ඇමතිතුමනි, බදුල්ල දිස්ත්‍රික්කයේ කුඩා තේ වතුහිමියන් විසින්ම තමන්ගේ තේ දළු නිෂ්පාදනය කරලා සපයන පස්සර පිහිටා තිබෙන කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කර්මාන්තශාලාවට අමතරව තව කර්මාන්තශාලා එකක් හෝ දෙකක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරනවා. දැනට කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නැතිව වසා දමා තිබෙන කර්මාන්තශාලා කිහිපයක් තිබෙනවා. එකක් තිබෙනවා ඇටම්පිටිය, ඇල්ලේවෙල ප්‍රදේශයේ. තව එකක් තිබෙනවා ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ ගම වන කඳනට උඩින් කෝට්ටේගොඩ ප්‍රදේශයේ. ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ මැතිවරණ කොට්ඨාසයේම තව එකක් තිබෙනවා . එම කර්මාන්තශාලා සම්පූර්ණයෙන්ම වසා දමා තිබෙනවා. ඒවා කිසිම ප්‍රයෝජනයකට ගන්නේ නැහැ. පස්සර කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙන් පටන් ගත්තා වාගේ කුඩා තේ වතු හිමියන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම සඳහා සහ ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහාම බදුල්ල දිස්ත්‍රික්කයට තව කර්මාන්තශාලා එකක් හෝ දෙකක් ලබා දෙන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එය ලබා

දෙනවා නම් අපට ඉතාම ප්‍රයෝජනවත් වනවා. ඒ වසා දමා තිබෙන කර්මාන්තශාලාවලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවලදී අපි යෝජනා ඉදිරිපත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ එක්කම අද මේ වැදගත් විවාදය තුළ අපි දැක්ක ප්‍රධාන කාරණයක් තමයි එක්සත් ජාතික පක්ෂයේම ගරු මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන්ගේ පරස්පරය. මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් ගරු යෝගරාජන් මන්ත්‍රීතුමා ආණ්ඩුවේ ඇමතිතුමාට ප්‍රශංසාව පළ කළා. හැබැයි, ගරු අනෝමා ගමගේ මැතිනිය ප්‍රශංසාව නොවෙයි පළ කළේ. "මේක හරි නැහැ, මේක ව්‍යාපාරිකයන්ට ප්‍රශ්නයක්, කම්කරුවන්ට කෙළවෙලා ගියත් කමක් නැහැ, මේක ව්‍යාපාරිකයන්ට ප්‍රශ්නයක්" කියන කෝණයෙන් තමයි එතුමිය මේ දිහා බැලුවේ. ඒ නිසා අපට පෙනෙනවා එක්සත් ජාතික පක්ෂය තුළ නායකත්ව අර්බුදයක් විතරක් නොවෙයි, දේශපාලන දර්ශනය පිළිබඳවත් අර්බුදයක් මතු වෙලා තිබෙනවා කියලා.

අද විවාද කරන මාතෘකාව තිබෙන්නේ තේ සහ රබර් ගැන. සමහර මන්ත්‍රීතුමන්ලා නම් කථා කළේ වෙන දේවල් ගැන. එතුමන්ලා කථා කළේ ග්‍රීස් යකා ගැනයි. එතුමන්ලාගේ මාතෘකාව ග්‍රීස් යකා. එහෙම නැත්නම් මාතෘකාව හම්බන්තොට වරාය. සමහර මන්ත්‍රීතුමන්ලාට මේ දවස්වල හැම එකකම පෙනෙන්නේ ග්‍රීස් යකා වාගේ තමයි. එයට හේතුව මොකක්ද කියා අපි දන්නවා. සාමාන්‍යයෙන් යක්කු එළවන්න අපි කරන්නේ තොවිලයක් නටන එකයි. අපි දැක්කා, එක්සත් ජාතික පක්ෂයේ සමහර මන්ත්‍රීතුමන්ලා විපක්ෂ නායක කාර්යාලය ඉදිරිපිට තොවිල් නටනවා. ඒ තොවිල් නටපු සමහර උදවිය උස්සා ගෙන හිටපු බෝර්ඩ් එකේ තිබුණේත් "ග්‍රීස් යකා පන්නමු" කියලායි. එතකොට තොවිල් නැටුවේ විපක්ෂ නායක කාර්යාලය ඉදිරිපිටයි. බෝර්ඩ් එකේ තිබුණේ, "ග්‍රීස් යකා පන්නමු" කියලායි. ඒ මන්ත්‍රීවරුන්ගේ ඔළුවේ තිබෙන්නේ ග්‍රීස් යකා නිසාත්, එතුමන්ලාට හැම තිස්සේම රනිල් වික්‍රමසිංහ මහත්මයාව පෙනෙන්නේ යකෙක් හැටියට නිසාත්, රනිල් වික්‍රමසිංහ මහත්මයා එළවන්න කටයුතු කරන නිසාත් ඒ මන්ත්‍රීවරු කථා කරන කොටත් කියවෙන්නේ ග්‍රීස් යකා ගැනමයි. මොකද, ඒ මන්ත්‍රීවරුන්ගේ ඔළුවේ තිබෙන්නේ, මේ ග්‍රීස් යකා එළවන්නේ කොහොමද කියලායි. ඒ ගොල්ලන්ට රනිල් වික්‍රමසිංහ මහත්මයා පෙනෙන්නේ, ඇඟේ ග්‍රීස් ගා ගත්ත, හැම දෙයින්ම ලිස්සා යන නායකයකු හැටියටයි. ග්‍රීස් කියන්නේ ලිස්සන දෙයක්. රනිල් වික්‍රමසිංහ මහත්මයාව පෙනෙන්නේ යකා වාගේයි. ඒ ගොල්ලන්ට පෙනෙනවා, රනිල් වික්‍රමසිංහ මහත්මයා හැම දෙයින්ම ලිස්සා යන යකෙක් වාගේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, your time is over.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මා අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

එතුමන්ලා මේ මාතෘකාවෙන් පිට ගිහින්, හැම දෙයටම ග්‍රීස් යකා ගැන කථා කිරීම පිළිබඳව මා කලබලයට පත් වන්නේ නැහැ. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට මේ දවස්වල ග්‍රීස් යකාට අමතරව මතක් වන්නේම හම්බන්තොට වරායේ තිබෙන ගල ගැනයි. හම්බන්තොට වරායේ තිබෙන ගල් පිළිබඳව දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ විරෝධය පිළිබඳව මා කලබලයට පත් වන්නේ නැහැ. මොකද, එය ඒ පක්ෂය ඇතුළේම තිබෙන ප්‍රශ්නයක්. ඒ පක්ෂය ඇතුළේත් ගල් සහ පාෂාණ පිළිබඳව පක්ෂ අය සහ විරුද්ධ අය වශයෙන් දෙ පාර්ශ්වයක් ඉන්නවා. එවැනි තත්ත්වයකුත් තිබෙන නිසා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ගල් පිළිබඳව දක්වන්නා වූ ඒ විරෝධය පිළිබඳවත් මා පුදුමයට පත් වන්නේ නැහැ.

අවසාන වශයෙන්, විශේෂයෙන්ම අපේ රටේ රබර් කර්මාන්තය හා කුඩා තේ වතු හිමියන් ඇතුළු තේ කර්මාන්තය වෙනුවෙන් ගෙන ආ නියෝග සම්බන්ධයෙන් ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමාටත්, අතිගරු ජනාධිපතිතුමාටත් මා නැවත වරක් ස්තුතිවන්ත වනවා.

අවසාන වශයෙන් මා මහින්ද සමරසිංහ ඇමතිතුමාට යෝජනාවක් කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, විශාල කොම්පැනිවලටත් මේ සහනය ලබා දෙන තත්ත්වයන් තුළ ඒ විශාල කොම්පැනි තවදුරටත් තමන්ගේ අස්වැන්න කුඩා තේ වතු හිමියා ගන්න අස්වැන්න ප්‍රමාණයම නැති වුණත්, අඩු තරමේ හෙක්ටයාරයකට 2000 මට්ටමටවත් ගෙන එන්නේ නැත්නම් කුඩා තේ වතු හිමියන් විසින් කර ගෙන යන්නා වූ ව්‍යාපාරයට අනුකූල වන විධියටම ඒ කොම්පැනිකාරයන්ගේ ව්‍යාපාරය කර ගෙන යන්නත් ඉදිරියේදී කටයුතු කරන්නට සිතා බැලිය යුතුයි කියන යෝජනාව මේ සභාව ඉදිරියේ තබන්නට ඕනෑය කියා මා කල්පනා කරනවා. ඒ යෝජනාව මෙම වැදගත් සභාවේ ප්‍රකාශයට පත් කරමින්, මේ වැදගත් අවස්ථාවට සහභාගි වෙලා, වැදගත් අදහස් ප්‍රකාශ කරපු අයටත්, ඒ වාගේම මේ වැදගත් අවස්ථාවේ බහුබූත දොඩවපු අයටත් මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Gayantha Karunatileka. You have got seven minutes.

[අ. භා. 5.53]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂය විසින් නිර්මාණය කරපු, අද තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලයේ සිටින ඉතාම දක්ෂ ඇමතිවරයකු වාගේම අප බොහොම ප්‍රිය කරන ඇමතිවරයකු ඉදිරිපත් කළ නියෝග යටතේ විශේෂයෙන් තේ කර්මාන්තයට සම්බන්ධ කාරණා කිහිපයක් ගැන ඉතාම කෙටියෙන් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නයි මා බලාපොරොත්තු වන්නේ.

ඊට පෙර, අපේ හිතමිත්‍ර ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා කාරණා කිහිපයක් මතු කරපු නිසා එක තත්පරයකින් ඒ සම්බන්ධයෙන් මතක් කිරීමක් කරන්න කැමැතියි. එතුමාගේ කථාවේ කුඩා තේ වතු සංවර්ධන සමිති ගැන ඉතාම ඉහළින් කථා කළා. ඇත්ත වශයෙන්ම මේ තරම් ලක්ෂ සංඛ්‍යාත පිරිසක් අපේ රටේ ආර්ථිකයට දායක වන බවට වග කිව යුත්තන්ගේ ඇස් ඇරිලා පෙනෙන්න පටන් ගත්තේ එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කුඩා තේ වතු සංවර්ධන සමිති ඇති කරලා, කුඩා තේ වතු හිමියන් මේ වාගේ බලවේගයක් හැටියට එකතු කරපු නිසායි කියන එක මා මතක් කරනවා.

අධිවේගී මාර්ගය ආරම්භ කිරීම පිළිබඳව එතුමා මහ ඉහළින් කථා කළා. ඒ ගැන මා සන්තෝෂ වනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තමයි ලංකාවේ පළමුවන අධිවේගී මාර්ගය හැටියට දක්ෂිණ අධිවේගී මාර්ගයට මුල්ගල් තබා, සියලුම ඉඩම් පවරා ගෙන, ඒවාට වන්දි ගෙවා වැඩ කටයුතු ආරම්භ කළේ කියන එකත් මා සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ඒ විතරක් නොවෙයි. එතුමා ග්‍රීස් යකෙක් ගැන කථා කළා. "යුද්ධය ඉවර කරපු අපට ග්‍රීස් යකාත් මහ ප්‍රශ්නයක් නොවෙයි" කියා කිව්වා. නියෝජ්‍ය සෞඛ්‍ය ඇමතිතුමනි, අපි ඩෙංගු මර්දනය ගැන කථා කරන කොට සමහර ඇමතිවරු, "ප්‍රභාකරන් මර්දනය කරපු අපට ඩෙංගු මදුරුවාත් මහ කජ්ජක්ද?" කියලා ඇහුවා මට මතකයි.

ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ අර්බුද ගැන කථා කරමින් කාර්යාලය ඉදිරිපිට කරන වැඩ ගැන එතුමා කිව්වා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ අර්බුදයක් තිබුණු කාලයේ ඩාර්ලි පාරේ පිහිටි පක්ෂ මූලස්ථානයට ඉබි යතුරු දමා, Rosmead Place එකට යතුර අරගෙන ගිය හැටිත්, උසාවි ගිය හැටිත් අපට මේ අවස්ථාවේදී සිහිපත් වනවා.

අපේ ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමා දක්ෂ ඇමතිවරයෙක් හැටියට මේ ගෙනාපු නියෝගය පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. අලුත් වගාවටයි, නැවත වගාවටයි සහනාධාර වැඩි කිරීම ඇත්ත වශයෙන්ම කළ යුතු දෙයක්. ඇමතිතුමා අලුත් වගාවට සහනාධාර වැඩි කරන හැටි ගැන කියන කොට රුපියල් 50,000කින් ඒක වැඩි කරපු හැටි ගැන බොහොම ඉහළින් කථා කළා. ඇත්ත වශයෙන්ම ඇමතිතුමනි ඔබතුමාත් දන්නවා, අලුත් වගාවට යොමු වන කෙනෙකු පස සාරවත් කිරීමේ කටයුත්ත කළොත් විතරයි මේ රුපියල් 50,000 ගෙවන්නේ කියලා. හැබැයි අලුතෙන් තේ වගා කරන කෙනෙක් පස සංරක්ෂණයක් ගැන ඒ තරම් කල්පනා කරනවා අඩුයි. මේ සහනාධාරය දෙන්නෙත් අක්කරයකට අඩු උදවියට විතරයි. එයිනුත් අලුත් වගාව යටතේ සහනාධාර දෙන්නේ අක්කර කාලකට විතරයි. මේ අක්කර කාලටත් බහුතරයක් සහනාධාරය ගන්නේ පස සංරක්ෂණය කරන්නේ නැතුවයි. ඇත්ත වශයෙන්ම ඒ අයට ලැබෙන්නේ රුපියල් 4,100ක් වාගේ සොච්චමක් විතරයි කියන එක මට පැහැදිලිව කියන්න පුළුවන්කම තිබෙනවා.

ගරු ඇමතිතුමනි, අද පැළයක් රුපියල් 20ක්, 25ක් විතර වෙනවා. එතකොට අක්කර කාලකට පැළ ගන්නට විතරක් රුපියල් 25,000ක් විතර යනවා. එහෙම නම් රුපියල් 4,100ක්, රුපියල් 5,000කට අඩු මුදලක් අක්කර කාලකට කිසි සේත්ම ප්‍රමාණවත් වෙන්නේ නැහැ කියන එක මම ඔබතුමාට කියනවා. අනෙක් එක අක්කරයකට අඩු අයට අක්කර කාලකට විතරක් දෙන එකත් සාධාරණ නැහැ. මේ පිරිස මේ රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් සපයන පිරිසක්. ඒ නිසා අඩු තරමින් මේක අක්කරයකටවත් ලබා දීමට ක්‍රියා කරන්න කියලා මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ඩිලාන් පෙරේරා ඇමතිතුමා කිව්වා, අද රටේ තේ නිෂ්පාදනයෙන් සියයට 68කට විතර කුඩා තේ වතු හිමියන් දායක වෙනවා කියලා. මම හිතනවා ඊටත් වැඩියෙන්, සියයට 70ක්, 72ක් අතර ප්‍රමාණයකට කුඩා තේ වතු හිමියෝ තමයි තේ නිෂ්පාදනයේ ගෞරවය දිනා ගෙන තිබෙන්නේ කියලා. එහෙම නම් මේ පිරිස රටට ප්‍රයෝජනවත් පිරිසක්. ඒ නිසා මේ සහනාධාරය දෙන එක කළ යුතුමයි.

ඊ ළඟට ගරු ඇමතිතුමනි, නැවත වගාවට සහනාධාරය වැඩි කිරීම ඉතාම කාලෝචිතයි කියලා අපි කල්පනා කරනවා. නමුත් නැවත වගාවට කුඩා තේ වතු හිමියන්ගේ යොමු වීමේ ප්‍රවණතාව බොහොම අඩු මට්ටමක තමයි තිබෙන්නේ. ඒකට ප්‍රධාන වශයෙන් බලපාන කාරණා කිහිපයක් තිබෙනවා. ඔවුන් නැවත වගාවට යොමු වුණාම වසර තුනක කාලයක්වත් ඔවුන්ට ආදායමක් නැතුව ඉන්න සිද්ධ වෙනවා. අනෙක ජාතික ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන තිබෙනවා සියයට 3ක්වත් නැවත වගාව කළ යුතු බවට. ඒ නිසා නැවත වගාවට යොමු වන කාල සීමාව තුළ ඔවුන්ට අහිමි වන ආදායම ගැන කල්පනා කරලා ඊට සරිලන සහනාධාර ක්‍රමයට අමතරව තවත් ක්‍රමවේදයක් පිළිබඳව කල්පනා කිරීම ඉතාම සුදුසුයි කියලා මම ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේ සහනාධාර හිමි වන පිරිස ගැන කල්පනා කළොත් රටට කිසිම බරක් නැති, ආණ්ඩුවට කිසිම බරක් නැති, රටේ විදේශ විනිමය උපයා දෙන ප්‍රධානම පිරිසක් නිසා මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීම සුදුසුයි කියලා මම කල්පනා කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ. විනාඩියෙන් අවසන් කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා මට තව විනාඩි දෙකක් දෙන්නට කටයුතු කරයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
මම හිතන්නේ නැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒ වාගේම මම ඇමතිතුමාට කියන්න කැමැතියි, කලින් සහනාධාර දෙන කොට කුඩා තේ වතු හිමියන් දිරිමත් කරන්න විශේෂ ආයුධ කට්ටලයක් දුන් බව. ඒකේ අළවංගුවක් තිබුණා; තේ කප්පාදු පිහියක් තිබුණා; උදැල්ලක් තිබුණා. නමුත් අද වන කොට ඒක උදැල්ලකට පමණක් සීමා වෙලා තිබෙනවා. ඒ නිසා මේවා පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම කියනවා. ඊ ළඟට කුඩා තේ වතු හිමියන්ට අද තිබෙන ප්‍රධානම ප්‍රශ්නයක් කියන්න ඕනෑ. මමත්, අජිත් කුමාර මන්ත්‍රීතුමාත් නියෝජනය කරන්නේ එකම දිස්ත්‍රික්කය නිසා මේ ප්‍රශ්නය පැහැදිලි කරන්න එතුමා මට තව විනාඩි දෙක තුනක් ලබා දෙයි කියා මා හිතනවා. මොකද, මේක ඉතාම අවශ්‍ය කාරණයක් නිසා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Is that all right for you, Hon. Member?

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
හොඳයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
විනාඩි තුනක්. හරි, එතුමා දෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
එහෙම නම් ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමාට විනාඩි 12ක් පමණයි තිබෙන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එතුමාට විනාඩි 12ක් තිබෙනවා. මට තව විනාඩි 3ක්, 4ක් දෙන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඔබතුමාට විනාඩි තුනක් ලබා දෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු ඇමතිතුමනි, එතකොට මෙහි තිබෙන ප්‍රධානම ප්‍රශ්නයක් තමයි කුඩා තේ වතු හිමියන්ගේ නිෂ්පාදනයේ විශාල කඩා වැටීමක් තිබීම. අස්වැන්න ශීඝ්‍රයෙන් පහත වැටිලා තිබෙනවා. සාමාන්‍යයෙන් වෙනදා අක්කරයකින් කිලෝග්‍රෑම් 600ක් විතර ගත්ත මිනිස්සු අද වන කොට කිලෝග්‍රෑම් 300කට, 400කට අඩු ගණනක් තමයි අස්වැන්න ලබන්නේ. මේකට බලපාන ප්‍රධානම කාරණය තමයි සහනාධාර ලෙස දෙන චින්තන පොහොර මල්ලේ ගුණාත්මකභාවයේ තිබෙන ගැටලුව. අද රට පුරාම සිටින කුඩා තේ වතු හිමියන් එක්ක ගිහින් කථා කරන කොට ඔවුන්ගේ තිබෙන මතය තමයි, "චින්තන පොහොර මල්ල යෙදුවාට පස්සේ තිබෙන දල්ලත්, එන දල්ලත් නැතුව යනවාය" කියන එක. ඒ නිසා මේ පොහොර සහනාධාර ක්‍රමයට දෙන එක හොඳයි. හැබැයි ගුණාත්මක පොහොර නොදීම අද කුඩා තේ වතු හිමියන්ගේ අස්වැන්න අඩු වීමට ප්‍රධානම කාරණයක් හැටියට අපි වටහා ගෙන තිබෙනවා.

පසු ගිය කාලවල මේ පොහොර දෙන කොට විශාල ප්‍රශ්නයක් හැටියට තිබුණා, පෝලිමේ ඉන්න සිදු වීම. නොයෙක් නොයෙක් පෝරම පුරවන්න සිද්ධ වෙලා තිබුණා. නමුත් ඉතාම දක්ෂ ඇමතිවරයෙක් කියලා මම හැම තිස්සේම පිළිගන්න අපේ මහින්ද සමරසිංහ ඇමතිතුමාව මම අගය කරනවා, එතුමා මේ රුපියල් 1,000 පොරොන්දුව පැත්තකට දාලා තව රුපියල් 300ක් කුඩා තේ වතු හිමියන්ගෙන් වැඩි කරලා සහනාධාරය දෙන ගමන් හෝ රජ්ජියාදුවකින් තොරව ඕනෑම තැනකින් රුපියල් 1,300ට පොහොර මල්ල ගන්න පුළුවන් ක්‍රමයක් හඳුන්වා දීම ගැන. අනෙක තමයි තේ කර්මාන්තයේ අනාගතය ගැන අපට හුඟක් හිතන්න තිබෙනවා. විශේෂයෙන්ම පුහුණු කම්කරුවන් පිළිබඳ ප්‍රශ්නයක් ඉදිරියේදී අපට ඇති වෙනවා. අපට මේ වගාව ඉස්සරහට ගෙනියන්න, මේ කර්මාන්තය ඉස්සරහට ගෙනියන්න ඇති වන බරපතළ ප්‍රශ්නයක් වෙනවා, කම්කරුවන්ගේ ප්‍රශ්නය. හිටපු කම්කරු ඇමතිවරයකු හැටියටත්, වර්තමාන වැවිලි කර්මාන්ත ඇමතිතුමා හැටියටත් ඒ වාගේම බොහොම දක්ෂ ඇමතිවරයකු හැටියටත් මේ ප්‍රශ්නයටත් ඔබතුමාගේ යුගයේදීම යම් විසඳුමක් දෙන්න කල්පනා කරයි කියලා මා විශ්වාස කරනවා.

අවසාන වශයෙන් මා කියන්නේ, තේ කර්මාන්තය පිළිබඳව කථා කරනකොට තේ කර්මාන්තශාලා හිමියන් පිළිබඳවත් අප කථා කළ යුතුව තිබෙන බවයි. ඇතැම් කර්මාන්තශාලා හිමියන් ඉතාම කෙටි කාලීනව විශාල ආදායමක් ලබා ගැනීම සඳහා නොයෙක් නොයෙක් ක්‍රමවේද අද අනුගමනය කරන තත්ත්වයක් දකින්න තිබෙනවා. මේවා පිළිබඳව අපට ප්‍රසිද්ධියේ කථා කරන්න පුළුවන්කමක් නැහැ. ජාත්‍යන්තර වෙළෙඳ පොළට මේවා ආරංචි වුණොත් සමහරවිට අපේ කර්මාන්තයට ඒක බරපතළ තර්ජනයක් වෙයි. නමුත් ඔබතුමාත් දන්නවා, අපිත් දන්නවා විශාල දේවල් සිද්ධ වෙන බව. දැන් සමහරු අහු වෙලා තිබෙනවා. මේ තේ කර්මාන්තයට බලපාන, ශීඝ්‍රයෙන් මුදල් සෙවීම සඳහා යොදා ගන්නා විවිධ ක්‍රම තිබෙනවා. ඉතින් මේවා නැති කිරීමට අවශ්‍යයි. භාරලක්ෂයකට අධික කුඩා තේ වතු හිමියන් වෙනුවෙන්, ඒ වාගේම අපේ රටේ ප්‍රධාන කර්මාන්තයක් වෙච්ච තේ කර්මාන්තයේ අනාගතය වෙනුවෙන්, Ceylon tea කියන කීර්තිනාමය තවදුරටත් රැක ගැනීම වෙනුවෙන් quality තේ දිගටම නිෂ්පාදනය කිරීම අවශ්‍යයි. විශේෂයෙන්ම quality ඇමතිවරයකු හැටියට ජාත්‍යන්තර මට්ටමේ ඇමතිවරයකු හැටියට ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරලා, දැඩි නීතිරීති ගෙනැල්ලා ඒ කටයුතු නතර කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමාටත් මා ස්තුතිවන්ත වෙනවා, කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් කථා කරන්න එතුමාගේ කාලයෙන් මට විනාඩි කිහිපයක් හෝ ලබා දීම ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Ajith Kumara. Before he starts, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුයි."යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 6.03]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ කුඩා තේ වතු පිළිබඳව වචන කිහිපයක් කියන්න මා කල්පනා කරනවා. ඒ සඳහා මට අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ ජාතික නිෂ්පාදනයට වැඩිම ආදායමක් ලබා දෙන වැවිල්ල තමයි තේ. එයට විශාලම දායකත්වය ලබා දෙන්නේ කුඩා තේ වතු හිමියන්. තේ මණ්ඩලය සකස් කරපු වාර්තාවක් තිබෙනවා. ඒ වාර්තාවට අනුව පසු ගිය වර්ෂයේ කිලෝ මිලියන76ක් පමණ වූ තේ නිෂ්පාදනයෙන් මිලියන 45ක් පමණ නිෂ්පාදනය කර තිබෙන්නේ කුඩා තේ වතු ආශ්‍රිතවයි. අපි සන්තෝෂ වෙනවා, විශේෂයෙන් ගාල්ල දිස්ත්‍රික්කය ඒ අතර ඉහළ තැනක සිටීම ගැන. එහිදී පහත රට තේ නිෂ්පාදනය ඉතා වැදගත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කියන්න වෙලාව නැති නිසා මේ සභාවේ කථා වුණු ගොඩක් කරුණු මා අත් හරිනවා. කුඩා තේ වතු කර්මාන්තයේ යෙදෙන අයට, අපේ ජාතික නිෂ්පාදනයට දායක වන අයට තිබෙන සැලකිල්ල පිළිබඳව අපි කල්පනා කරන්න ඕනෑ. මෙය විශේෂයෙන්ම පසු ගිය අය වැයෙන් ඉදිරිපත් කළ යෝජනාවක්; ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් කළ යෝජනාවක්. විශේෂයෙන් මහින්ද චින්තන ඉදිරි දැක්මෙනුත් එතුමා මේ කාරණය ඉදිරිපත් කර තිබෙනවා. කුඩා තේ වතු වැවිලිකරුවන්ට දෙනු ලබන සහනාධාරය හෙක්ටයාරයකට රුපියල් 50,000කින් වැඩි කිරීමට එතුමා පසු ගිය අය වැයෙන් යෝජනා කර තිබෙනවා.

[ගරු අජිත් කුමාර මහතා]

පමා වෙලා හෝ මේ ගැසට් නිවේදනය කරලා ඒ සහනය ලබා දෙන්න තීන්දු කරපු එක ගැන අපි ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව මුලින්ම කළා. මේ අවස්ථාවේ මා මේ කාරණය දැන ගන්න කැමැතියි. අය වැය යෝජනාවක් සම්මත වුණාට පස්සේ ඊ ළඟ අවුරුද්දේ ජනවාරි මාසයේ සිට ඒක ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේ සහනය දැන් දෙන්නේ කොහොමද? එතකොට අදින් පස්සේ නේද මේ සහනය ලැබෙන්නේ? ඒක මම දැන ගන්න කැමැතියි. හරි නම් ඒ අය වැය යෝජනාවෙන් දුන්න සහනය ජනවාරි මාසයේ ඉඳලා ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මම දන්නේ නැහැ, ඒ ක්‍රමවේදය මොකක්ද කියලා. ඒක නිසා මේක ඇත්තටම යෝජනා වෙලා පාර්ලිමේන්තුව සම්මත කරපු දෙයක්. නමුත් ඒ සහනය කුඩා තේ වතු හිමියාට ලැබෙන්නේ සෑහෙන කාලයක් පමා වෙලා. ඒකෙන් අසාධාරණයක් වෙනවා. ඒ නිසායි මම කිව්වේ පමා වෙලා හරි මේක දෙන එක හොඳයි කියලා. මොකද තව ටික දවසකින් ලබන අවුරුද්ද සඳහා අය වැය ඉදිරිපත් වෙනවා. ඒ නිසා අය වැයෙන් සම්මත වුණු මෙවැනි යෝජනා ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කරන්න මැදිහත් වෙනවා නම් හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද චින්තනයේ තිබුණ මේ කාරණය මා මතක් කරන්නට ඕනෑ. මහින්ද චින්තනය ඉදිරිපත් කළේත් ගරු ජනාධිපතිතුමා. දැන් කෙනෙකුට කියන්න පුළුවන්, "ඒක ඉවරයි, දැන් තිබෙන්නේ, ඉදිරි දැක්ම" කියලා. නමුත් මහින්ද චින්තනයේත් කියපු දේවල් ප්‍රමාණයක් තිබෙනවා. "වැවිල්ලට නවෝදයක්" කියලා, පහත රට තේ වගාව වැඩි දියුණු කිරීම සඳහා වැවීමට උනන්දුවක් දක්වන අයට ඉඩම් අක්කරය බැගින් දෙනවා කිව්වා. ඒ වාගේම ගරු ජනාධිපතිතුමා පසු ගිය අය වැයේදී කිව්වා, වැවිලි සමාගම්වලට අයත් වගා නොකළ ඉඩම් මාස හයක් තුළ එළදායී කටයුතුවලට යොදා ගන්නා ලෙස එම සමාගම්වලට දැනුම් දෙනවාය, එහෙම නොකරන වැවිලි සමාගම්වලට අයත් ඉඩම්, ඒ දැනුම් දීමෙන් පසුව නැවත වගා කිරීම සඳහා කුඩා ඉඩම් හිමියන් අතර බෙදා දෙනවාය කියලා. ඒ අනුව මහින්ද චින්තනයේත්, ඉදිරි දැක්මේත්, අය වැය ප්‍රකාශනයේත් තිබෙනවා, කුඩා තේ වතු හිමියාට වැවීම සඳහා ඉඩම් ලබා දෙනවාය කියන යෝජනාව.

අපි පිළිගන්නවා, මේ රටේ කාන්තාවන් ශ්‍රමිකයන් හැටියට පිට රට යවනවා වෙනුවට, එය වෙනත් පැත්තකට යොමු කරලා පුහුණු ශ්‍රමිකයන් පිට රට යවන වැඩ පිළිවෙළක් හදන අතරේ, මේ රටේ නිෂ්පාදන පිට රට යවන්නත් වැඩිම දායකත්වයක් දක්වන්න ඕනෑ බව. ඒ නිසා අපේ ජාතික ආර්ථික ප්‍රතිපත්තියේ මූලික වැදගත්කමක් දෙන්න ඕනෑ, ශ්‍රමිකයන් පිටරට යැවීම වෙනුවට අපේ නිෂ්පාදන පිට රට යැවීමටයි. එහිදී දැනටත් ඉතාම ඉහළ තැනක් ගන්නා දෙයක් තමයි තේ කර්මාන්තය. ඒ නිසා තේ නැවත වගා කරන්න, අලුතින් වගා කරන්න සහන දෙන අතරේම, ඒ සඳහා උනන්දුව තිබෙන අයට ඉඩම් ලබා දීමේ වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක වන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ රටේ දේවල් විකුණන්නේ නැහැ, අපි දේශප්‍රේමී ආණ්ඩුවක්" කියලා මේ රජය පසු ගිය කාලයේ කිව්වාට, ගොවීන්ට ඉඩම් නැති තත්ත්වයක් තුළ වුණත් විශාල කොම්පැනිකාරයන්ට ඉඩම් දෙනවා. එහෙනම් ඇයි මහින්ද චින්තයේ, ඉදිරි දැක්මේ, අය වැයේ කිව්වා වාගේ කුඩා තේ වතු හිමියන්ට වගා කිරීම සඳහා ඉඩම් නොදෙන්නේ? රජයේ කවුරු හරි කෙනෙකුගෙන් අපි දැන ගන්න කැමැතියි, - ගරු ඇමතිතුමා කථා කරලා ඉවර නිසා - මහින්ද චින්තනයේත්, අය වැයේත් කියපු විධියට කුඩා තේ වතු හිමියන්ට එවැනි ඉඩම් ලබා දීමක් සිදු වෙලා තිබෙනවාද කියලා. මා දන්නා විධියට, මා දන්නා තැන වන ගාල්ල දිස්ත්‍රික්කයේ LRC එකේ ඉඩම්වත්, රජයේ ඉඩම්වත්, වෙන ඉඩම්වත් කුඩා තේ වතු හිමියන් සඳහා දීලා නැහැ. එහෙනම් පොරොන්දු වූ පරිදි කුඩා තේ වතු වැවිලිකරුවන්ට දෙනු ලබන සහනාධාරය හෙක්ටයාරයකට රුපියල් 50,000කින් වැඩි කිරීම පමා වුණා වාගේම, ඒ පොරොන්දු වුණු අනෙක් කරුණුවලටත් තවම අත තියලා නැහැ නේද කියන එක අපි අහන්න කැමැතියි. ඒ නිසා කරුණාකරලා ඊළඟ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්නට කලින්වත් ඒ කියපු විධියට අක්කර 10ක් හෝ කුඩා තේ වතු හිමියන්ට ලබා දෙන්න කියලා මා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එහෙම නැත්නම් ලබන අය වැයේදී නැවතත් මේ ගැන කියන්න වෙනවා. එතකොට ඒක විශ්වාස කරන්නේ නැහැ. ඔබතුමන්ලා මේ ඉඩම් පමා වෙලා හරි දෙනවා නම් ඒකත් කරන්න.

ඊළඟට, මේ ගරු සභාවේ දී මා මතු කරන්නට කැමැතියි, වතුකරයේ වැටුප ගැන. තේ කර්මාන්තයට පෝෂණයක් දෙන, ඒ සඳහා විශාලම දායකත්වයක් දෙන වතුකරයේ ජනතාවට ජීවත් වන්න පුළුවන් වැටුපක් නැහැ. ලබා දුන් ඒ වැටුප් වැඩි වීම ඔවුන් ඉල්ලපු එක නොවෙයි. ඒකෙන් ජීවත් වන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වතුකරයේ ඔවුන් විඳින දුක්ඛදායක තත්ත්වයෙන් මුදවා ගත්තේ නැත්නම්, රන් දළු නෙළලා, විශාල ආදායමකට දායකත්වය දක්වන ඔවුන් පැත්තකට දැම්මා වෙනවා. අද රටක් දුවන්නේ මේ ආදායමෙන්. විදේශ විනිමය ලැබෙන්නේ මේ ආදායමෙන්. ඒ නිසා ඔවුන්ට නිසි වැටුපක් නොගෙවීම ඉතාම අසාධාරණ වැඩක්. ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න කියලා ඉල්ලා සිටිනවා. ඉදිරි අය වැයෙන්වත් ඒකට ඒකට විසඳුමක් දෙන්න කියලා අපි මතක් කරනවා.

ඊළඟට, සෙස් බද්ද ගැනත් කියන්න ඕනෑ. මේ සෙස් බදුවලට මොකද වෙන්නේ? ඇමතිතුමනි, ඔබතුමා නිරීක්ෂණය කරන්න. ගාල්ල දිස්ත්‍රික්කයේ නෙළුව, තවලම, ප්‍රදේශවල, මාතර දිස්ත්‍රික්කයේ දෙණියාය වැනි දුෂ්කර ප්‍රදේශවල කුඩා තේ වතු කර්මාන්තයෙන් ඉහළම ආදායමක් රටට දෙන ජනතාවක් ජීවත් වන්නේ. හැබැයි, ඒ ප්‍රදේශවල තිබෙන පහසුකම් බලන්න. හරියට ඉස්කෝලයක් නැහැ. ඉස්කෝලයක් තිබුණත් පහසුකම් නැහැ. සෞඛ්‍ය මධ්‍යස්ථානයක් නැහැ. ඉස්පිරිතාල තිබෙනවා, බෙහෙත් නැහැ. තේ දළු ටික අරගෙන ට්‍රැක්ටරයකට යන්න පාර හරියට හදලා නැහැ. රටට විශාලම ආර්ථික දායකත්වයක් දෙන, ආදායමක් ලබා දෙන්න ජීවිතය කැප කරන ජනතාව සිටින ප්‍රදේශවල තමයි දුෂ්කරතා වැඩි. අධ්‍යාපනය ගත්තත්, සෞඛ්‍ය ගත්තත්, ප්‍රවාහන පද්ධතිය ගත්තත් ඒ මූලික අවශ්‍යතාවන් ඉතාම නරක තත්ත්වයක තිබෙන්නේ. ඒ පහසුකම් හොඳට තිබෙන්නේ නගරයේ. ඉතින් රටට මේ තරම් දායකත්වයක් දක්වන මොවුන් වෙනුවෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මූලික වෙලා මේ සෙස් බද්ද වාගේ ඒවායින් ලැබෙන මුදල් පාවිච්චි කරලා යම් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑය කියලා අපි කල්පනා කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ ගරු සභාවේදී කිව්වා, ගාල්ල දිස්ත්‍රික්කයේ තේ දළු නගරයට ගෙනල්ලා පිච්චුවා කියලා. අපි නම් එහෙම එකක් අහලා නැහැ. හැබැයි මා මතක් කරන්න ඕනෑ, පසු ගිය පාර්ලිමේන්තුවේ හිටපු අමාත්‍යවරයකු වන චන්ද්‍රසේන විජේසිංහ සහෝදරයා දවසේ විවාද දෙකක් මේ ගරු සභාවේදී ලබා ගත්තා. තේ කර්මාන්තය පහළටම වැටිලා, පොහොර සහනාධාරය නැති වුණු වෙලාවේ මුළු රටේම කුඩා තේ වතු ක්ෂේත්‍රයේ ජනතාව ඒකරාශී වෙලා හඬක්, අරගලයක් නඟපු නිසා රජය ඒකට මැදිහත් වෙලා තීන්දුවක් දුන් බව අපි විශ්වාස කරනවා. ඒ තීන්දුව දීම ගැන අපි ස්තුති කරනවා. නමුත් ජනතාව ඒ පිළිබඳව ලොකු මතවාදයක්, කරුණු දැක්වීමක් කළාට පසුව තමයි ඒක ලැබුණේ. ඒකත් මා මතක් කරන්න ඕනෑ. කොහොම වුණත් මේ කර්මාන්තය වෙනුවෙන් ජීවිතය කැප කරන ඒ ජනතාව ජීවත්වන ප්‍රදේශවල මූලික අවශ්‍යතාවන් ඇති කරන්න, පහසුකම් නංවන්න වැඩ පිළිවෙළක් හදන්න. එහෙම නැත්නම් ඒක ඉතාම අසාධාරණයි.

තේ ශක්ති අරමුදල ගැනත් මා මතක් කරන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මේ තේ ශක්ති අරමුදලෙන් සාධාරණ වැඩ

පිළිවෙළක් ක්‍රියාත්මක වනවාද කියන එක පිළිබඳව මේ ගරු සභාවේ කරුණු මතු කරන්නට මට වෙලාව මදි. ඒ ගැන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදී වෙනම සාකච්ඡා කරන්න. ඒ ගැන හොඳ චිත්‍රයක් ජනතාව තුළ නැහැ, ඇමතිතුමනි.

විශේෂයෙන් අගය එකතු කළ නිෂ්පාදන පිළිබඳව කථා කළා, තේ සහ රබර් සම්බන්ධයෙන්. අපේ රටේ ජාතික නිෂ්පාදනය වැඩි කරද්දී අපි රබර් පිළිබඳව මීට වඩා මැදිහත් වීමක් කරන්න ඕනෑ.

අපි රබර් පිට රට යවනවා. නමුත් නිෂ්පාදනයන් පිට රට යවන්න දක්වන දායකත්වය මොකක්ද? මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේත්, මහින්ද චින්තන ඉදිරි දැක්ම වැනි වැඩ පිළිවෙළවල්වල මේක තිබෙනවා. හැබැයි අප දැන ගන්න කැමැතියි රජය රබර් කර්මාන්තය ආශ්‍රිතව නිෂ්පාදනයන් පටන් අරගෙන තිබෙනවාද, කොයි තරම් ප්‍රමාණයක් පටන් අරගෙන තිබෙනවාද, මොකක්ද ඒකට හදපු ජාතික වැඩ පිළිවෙළ කියලා. අපට පෙනෙන විධියට එහෙම එකක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තේ කර්මාන්තයේත්, රබර් කර්මාන්තයේත් යෙදෙන කුඩා වතු හිමියන්ගේ, ඒ කර්මාන්තය ආශ්‍රිතව ඉන්න අයගේ අනාගතය මොකක්ද? ඒ ගොල්ලන්ට තිබෙන රක්ෂණය මොකක්ද? පෞද්ගලික අංශයේ සේවකයෙකුට නම් ETF, EPF තිබෙනවා. රජයේ සේවකයෙකුට විශ්‍රාම වැටුප් තිබෙනවා කියලා අපට කියන්න පුළුවන්. ඒක ප්‍රමාණවත් නැති කථාව වෙනම එකක්. නමුත් මේ නිෂ්පාදනයට දායක වන අයගේ -රබර් වතුවල වැඩ කරන, ඒ වාගේම කුඩා තේ වතුවල වැඩ කරන, මේ කර්මාන්තයත් එක්ක ඉන්න අයට- අනාගතයට මොකක්ද වන්නේ? ඔවුන්ට තිබෙන රක්ෂණ ක්‍රමය මොකක්ද? ගොවීන්ට ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයක් තිබෙනවා. ඒ වැඩේත් දැන් ඇණහිටලා තිබෙන්නේ. නමුත් මේ පිළිබඳව ජාතික වශයෙන් වූ මැදිහත්වීමක් අවශ්‍යයි කියන එක අප මේ ගරු සභාවේදී මතු කරන්න ඕනෑ.

ඒ වාගේම අප දන්නවා, අපේ රටේ විදේශ කොම්පැනිකාරයන්ට -BOI ව්‍යාපෘතිය යටතේ කොම්පැනි-කාරයන්ට- විශාල සහනයන් දෙන බව. නමුත් රටේ ජාතික තේ නිෂ්පාදනය වැඩි කරන්න, ඵලදායී කරන්න මැදිහත් වෙන අපේ රටේ ව්‍යාපාරිකයන්ට දෙන සහන මොනවාද? පසු ගිය කාලයේ අපේ රටේ තේ කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් බිඳ වැටුණා. තේ කර්මාන්තශාලා හිමියන් කරන ඒ කාර්යය අගයමින්, ඔවුන්ගේ නිෂ්පාදනය, ඔවුන්ගේ ඵලදායිත්වය වැඩි කිරීම සඳහා මීට වඩා සාධාරණ මැදිහත්වීමක් කළ යුතුය කියලා අප විශ්වාස කරනවා. මොකද අපේ නිෂ්පාදනය වැඩි කිරීමෙන් අපට විදේශ විනිමය තව ප්‍රමාණයක් වැඩි කර ගන්න පුළුවන් කියලා අප පිළිගන්නවා. ඒ වාගේම මේ කාරණයත් මා මතක් කරන්න ඕනෑ. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත් මේක මතු කළා. ඒක තමයි මේ සහනාධාර ගන්න ගියාට පස්සේ තිබෙන ක්‍රමවේදයන් පිළිබඳව. මෙහි ඉතාම සංකීර්ණ ක්‍රියාවලියක් තිබෙනවා. මේක සඳහා ඉල්ලුම් කරන්න ගන්න තිබෙන පෙළඹීම මේ ක්‍රියාදාමයන් නිසා සමහර විට අඩු වෙනවා. ඒ නිසා මේ ගැන උපදේශක කාරක සභාවේදී සාකච්ඡා කරලා ඔවුන්ට මේ පිළිබඳව සරල ක්‍රමවේදයන් හඳුන්වලා දෙන්න, ඒ වාගේම ඒ පිළිබඳව හොඳ දැනුවත් කිරීම් කරන්න කියන ඉල්ලීමත් මේ ගරු සභාවේදී මම කරනවා.

ගරු ඇමතිතුමනි, නැවත වතාවක් අපට ඔබතුමාගෙන් දැන ගන්න ඕනෑ මහින්ද චින්තනයේ සහ මහින්ද චින්තන ඉදිරි දැක්මේත්, අය වැය ප්‍රකාශයේත් කියපු විධියට කුඩා තේ වතු හිමියන්ට ලබා දෙනවා කියපු ඉඩම් ලබා දීමේ වැඩ පිළිවෙළ පටන් ගත්තාද කියලා. ඒ වාගේම වතු සමාගම් පිළිබඳව ඒ තක්සේරුවට ගියාද? ඒ පිළිබඳවත් අප නැවත වතාවක් විමසමින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

[අ. භා. 6.14 ]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අයත් එම විෂයය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ ඉතා කෙටියෙන් හෝ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. විශේෂයෙන්ම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරමින් අපේ වැවිලි කර්මාන්ත අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමා මේ ක්ෂේත්‍රයේ ඉතාම ආකර්ෂණීය වූත්, ප්‍රායෝගික වූත්, එමෙන්ම ජනතා හිතවාදී වූත් වැඩ පිළිවෙළවල් රාශියක් දියත් කරලා තිබෙනවා.

විශේෂයෙන් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ තිබෙන පුළුල් වූ විදේශ සම්බන්ධතාවන් තුළින් රුසියාව, ඉරානය වැනි නව වෙළෙඳ පොළවල් වඩ වඩාත් ළඟා කර ගනිමින් මැද පෙරදිග වෙළෙඳ පොළ සඳහා තේ යැවීම වඩාත් සාර්ථක ලෙස ඉටු කරමින් තේ සඳහා වඩා හොඳ මිලක් ලබා ගැනීමට කටයුතු කරනවා. ඒ තුළින් තමයි තේ නිෂ්පාදනය කරන සමාගම්වලටත්, ඒ වාගේම කුඩා තේ වතු හිමියන්ටත් අද විශාල සහනයක් ලැබිලා තිබෙන්නේ; හොඳ මිලක් ලැබිලා තිබෙන්නේ. ඒ නිසා රජය ගෙන යනු ලබන එම පුළුල් වූ, එසේම ශ්‍රී ලංකාවට හිතකර වූ ඒ විදේශ ප්‍රතිපත්තිය තුළින් අද අපට නව වෙළෙඳ පොළවල් රාශියක් තේ, රබර් වැනි අපනයන ද්‍රව්‍ය සඳහා ලබා ගැනීමට හැකි වෙලා තිබෙනවා. ඒ නිසා "සහනාධාර, සහනාධාර, සහනාධාර" කිය කියා අර පොඩි ළමයෙකුට කිරි පොවනවා වාගේ අපේ ජනතාව ඒවා ඉල්ලන්නේ නැහැ . අපේ ජනතාවට වී සඳහා හොඳ මිලක් ලබා දීලා තිබෙනවා; කුරුඳු සඳහා හොඳ මිලක් ලබා දීලා තිබෙනවා; ගම්මිරිස් සඳහා හොඳ මිලක් ලබා දීලා තිබෙනවා; තේ සඳහා හොඳ මිලක් ලබා දීලා තිබෙනවා; රබර් සඳහා හොඳ මිලක් ලබා දීලා තිබෙනවා. මේ රටේ ආර්ථිකය හා මේ රටේ ජනතාව සෑම විටම යම් දේකට ගැතිකම් නොකරන, එහෙම නැත්නම් හැම විටම ස්වශක්තියෙන් නැඟී සිටින ප්‍රජාවක් බවට පත් කිරීම තමයි මහින්ද චින්තන වැඩ පිළිවෙළ තුළින් අප බලාපොරොත්තු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවට පුළුවන් නම් සහනාධාර ඉල්ලන්නේ නැතුව, සහනාධාර ලබා ගන්නේ නැතුව තමන්ගේ ස්වශක්තියෙන් තමන්ගේ නිෂ්පාදන කරමින්, ඒ නිෂ්පාදන තුළින් හොඳ ආදායමක් ලබා ගෙන, රටේ ජාතික ආර්ථිකයට දායාද කරන්න, ඒක තමයි සංවර්ධනයේ නිසි මාවත කියන එකයි අපි කල්පනා කරන්නේ. ඒ නිසා අන්න එවැනි වැඩ පිළිවෙළක් සඳහා අපට තේ ගොවියාත්, රබර් ගොවියාත් මේ සියලු දෙනාමත් අනිවාර්යයෙන්ම යොමු කළ යුතුයි. එහෙම නම් අපි හොඳ වෙළෙඳ පොළක් හදලා දීලා තිබෙනවා. වෙළෙඳ පොළ පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. නිෂ්පාදනය කරන තරමට ගොවියාට, නිෂ්පාදකයාට ආදායම් ලබා ගැනීමට පුළුවන්කමක් තිබෙනවා. ඒ වාගේම ඔබතුමා දන්නවා, මේ රටේ රබර් සමාගම් ඉස්සර රබර් ගස් ගලවලා අහක දාලා වෙන වෙන දේවල් වවපු බව. මේ මිල වැඩි වීමත් එක්කම දැන් නැවත රබර් වගාවට යෑමේ ප්‍රවණතාවක් තිබෙනවා. ඒ නිසා අද මොනරාගල වැනි ප්‍රදේශවල විශේෂයෙන්ම අපේ බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල වැනි ප්‍රදේශවල මේ තිබෙන ඉල්ලුම අනුව රබර් වගාව ප්‍රචලිත වෙලා යනවා. ඉල්ලුම සහ සැපයුම මිල ගණන් අතර තිබෙන චක්‍රය තමයි මේ අපනයන

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ද්‍රව්‍යයන් කෙරෙහි බලපාන්නේ. ඉතින් ඒ නිසා අපි සන්තෝෂ වන්නට ඕනෑ, එවැනි ස්ථාවරයක් අපේ ජනතාවට ලබා දීමට අපේ රජයට හැකිවීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි තේ කර්මාන්තය ගැන කල්පනා කිරීමේදී විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේම අපි බහු ජාතික අනෙකුත් සමාගම්වලට වැඩිය කුඩා තේ වතු හිමියා පිළිබඳව කථා කරන්නට ඕනෑ. අද සමාගම්වලට දීලා තිබෙන වතු පිළිබඳව අපේ අනාගත දර්ශනය මොකක්ද, ඉදිරි කාලයේදී මේ වතුවල වැඩ කරන්නට කම්කරු ජනතාව රැඳී ඉඳීවිද කියන ප්‍රශ්න අපට තිබෙනවා. ඒ නිසා මේවා නවීකරණය කිරීමේ වැඩ පිළිවෙළවල් අනිවාර්යයෙන්ම අවශ්‍ය වනවා. අද වතුකරයේ ද්‍රවිඩ තරුණ, තරුණියන් බොහෝ දෙනෙකු විදේශ රැකියාවන් සඳහා එහෙම නැත්නම් වෙනත් ක්ෂේත්‍රවල රැකියාවන් සඳහා යනවා. ඒ නිසා ඉදිරි කාලයේදී මේ ප්‍රශ්නය පිළිබඳව අපි ගැඹුරින් කල්පනා කළ යුතු වනවා. නමුත් අපේ සුළු තේ නිෂ්පාදකයන් දිහා බැලුවොත්, ඔවුන් තමන්ගේ ශ්‍රමය, තමන්ගේ පවුලේ අයගේ ශ්‍රමය, ඒ සියල්ල එකතු කරමින් තමයි මේ ආර්ථිකය සඳහා දායක වන්නේ. එහෙම නම් අද සුළු තේ වතු හිමියා එක්තරා ආකාරයකින් ප්‍රෞඪත්වයක් තිබෙන ව්‍යවසායකයෙක් බවට අපි පත් කරලා තිබෙනවා. සුළු තේ වතු හිමියන්ගේ සංගම් අද ඉතා හොඳින් වැඩ කටයුතු කරනවා.

විශේෂයෙන්ම මට මතකයි, පස්සර ප්‍රදේශයේ තිබෙන තේ ශක්ති අධිකාරියට අයත් අපේ තේ කර්මාන්ත ශාලාව පාඩුවටයි තිබුණේ. දැන් ඉතා විශාල ලාභයක් ලබමින් ඒ කර්මාන්තශාලාව වැඩ කටයුතු කරගෙන යනවා. ඒ නිසා රජය මඟින් හරි, ඒ ජනතාව මඟින් හරි ගෙන ගිය ඒ ව්‍යාපාරවල සාර්ථකභාවය අපි පෙන්නුම් කරලා තිබෙනවා. නමුත් උඩරට ජනතාවට මේ තේ ආර්ථිකය සමඟ ඇති වුණු තවත් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවා ගැනත් අපි විශේෂ අවධානය යොමු කරන්නට ඕනෑ. මුදල් ගැන පමණක් හිතන්නේ නැතුව, ජනතාවට ලැබෙන ප්‍රතිලාභය ගැන පමණක් හිතන්නේ නැතුව අපේ පරිසරයට සිදු වෙලා තිබෙන හානි පිළිබඳවත් අපි කල්පනා කරන්න ඕනෑ. අද අපේ වනාන්තර ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. අපේ ගලා එන ජල ධාරාවන්ගේ ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. එහෙම නම් අද තේ වතුවල විශේෂයෙන්ම අපේ ජල පෝෂිත හා රක්ෂිත ප්‍රදේශ විශාල ප්‍රමාණයක් තර්ජනයට ලක් වෙලා තිබෙනවා.

අපි මේ වතු සමාගම් සඳහා මේ ගිවිසුම් අත්සන් කර දෙන වෙලාවේදී ඒ හදන ලද ගිවිසුම නැවත සමාලෝචනයට භාජනය කළ යුතු කාලය දැන් ඇවිල්ලා තිබෙනවා. මොකද ඒ අවස්ථාවේදී අපි කල්පනා නොකළ ප්‍රශ්න රාශියක් අද ඇති වෙලා තිබෙනවා. Golden share එක පිළිබඳව, එය අපි ක්‍රියාත්මක කිරීමේදී ගත යුතු ක්‍රියා මාර්ගයන් හා කාර්යභාරය පිළිබඳව අපි කල්පනා කළ යුතු වනවා. වතුකරයේ සම්පූර්ණ ආදායම ලබා ගෙන කොතරම් මුදල් ලබා ගත්තත් වතු සමාගම් අද වතුකරයේ යටිතල පහසුකම් දියුණුව සඳහා මුදල් වැය කරන්නේ නැහැ. අද ඒ වතුවල තිබුණු සෞඛ්‍ය ප්‍රශ්න ඔක්කෝම අපේ ආණ්ඩුව භාර ගත්තා. ඒ ඉස්පිරිතාල ඔක්කෝම රජයට පවරා ගත්තා. එයිනුත් වතු සමාගම්වලට විශාල ලාභයක් අත් වුණා. නමුත් ඒ වෙනුවෙන් ඔවුන් වතුකරයේ ජනතාවට යමක් කරන්නේ ඉතාම මඳ වශයෙන්. එහෙම නම්, ඒ වතු සමාගම්වලට ලැබෙන ලාභයෙන් යම් කොටසක් පාරවල් සහ යටිතල පහසුකම් සැදීම සඳහා වෙන් කිරීමට නියෝග කරන යම් ක්‍රමවේදයක් අපේ ගරු ඇමතිතුමා හදන්නට ඕනෑ. එහෙම නැතිව ලාභයක් ලැබුණාම superintendent මහත්වරුන්ට, කළමනාකාර මහත්වරුන්ට පැජරෝ ජීප් අර ගෙන දෙන එක නොවෙයි කළ යුත්තේ. ඒ පිළිබඳව වතුකරයේ ඉන්න management එකත් එක්ක- ඒ සමාගම් සමඟ- සාකච්ඡා කර ඔවුන්ගේ social responsibility එකක් හැටියට - සමාජ වගකීමක් හැටියට- ඒවා කළ යුතුයි. නැත්නම් අප ගිහින් කොන්ක්‍රීට් පාරවල් හදන තුරු, අප ගිහින් පාරවල් කාපට් කරන තුරු වතුකරයේ පාලන අධිකාරීන් බලා ගෙන ඉන්නවා. ඔවුන් ඒ සඳහා යොමු වන්නේ නැහැ. මේ කාරණය ගැන විශේෂයෙන් අවධානය යොමු කළ යුතුයි.

වතුකරයේ තිබෙන ජල පෝෂිත හා ජල රක්ෂිත ප්‍රදේශයන් රැක ගැනීමේ විශේෂ වග කීමක් අප වතු අධිකාරීවරුන්ට පවරන්නට ඕනෑ. ඒ වාගේම වතුකර ප්‍රදේශයේ ඇති වන අනවසර ඉදිකිරීම් නිසා සිද්ධ වන්නේ මොකක්ද? මට මතකයි වරක් ගම්පොල ප්‍රදේශයේ පාවන රෝගය හැදිලා විශාල පිරිසකට විශාල ප්‍රශ්නයක් ඇති වුණා. මොකද, ඒ ඉහළ ප්‍රදේශවල ඒවා පිළිබඳව නිසි පාලනයක් නැතිකමයි.

ඊටත් වඩා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඇති වෙලා තිබෙන සමහර දේවල් දෙස බැලුවාම උඩරට ප්‍රදේශවල වඩාත් වැදගත් වන්නේ වතුකරයේ ජනතාව හා ගමේ ජනතාව අතර තිබෙන සමඟිය රැක ගැනීමයි. එය මේ සියල්ලටම වඩා වැදගත්. මොකද, මේ ග්‍රීස් යක්කු පිළිබඳව කෙරෙන බොරු ප්‍රචාරයන්, රාජ්‍ය විරෝධී ප්‍රචාරයන්, අපේ රජය අපහසුතාවට පත් කරන තත්ත්වයන් තුළ අද ගම සහ වතුකරය අතර යම් ආකාරයකින් එකිනෙකා විරසක කිරීමේ දැවැන්ත යටි ව්‍යාපාරයක් ගෙන ගිහින් තිබෙනවා. එම නිසා අනිවාර්යයෙන්ම අප මේ අපේ ප්‍රදේශවල ගොඩ නංවන ලද ජාතික සමඟිය සිංහල ජනතාව සහ ඒ ද්‍රවිඩ ජනතාව -ගමේ ජනතාව- අතර තිබුණු සමඟිය රැක ගැනීමත් අතිශයින්ම මේ කර්මාන්තය රැක ගැනීම සඳහා අත්‍යවශ්‍යයි. එම නිසා අප සහනාධාර පිළිබඳව පමණක් -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා ] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියා ගෙන ආවේ, අප හුදෙක් ආර්ථික ප්‍රතිලාභ ගැන පමණක් කල්පනා කරන්නේ නැතිව වතුකරයේ ජනතාව සමඟ වැඩ කටයුතු කිරීමේදී අපේ ජාතික සමඟිය රැක ගැනීමේ ඒ වැඩ පිළිවෙළත් මේ වැවිලි කර්මාන්ත දියුණු කිරීමේ වැඩ පිළිවෙළට අප අනිවාර්යයෙන්ම ඇතුළත් කර ගත යුතුයි කියලායි. එහෙම නැත්නම් වන්නේ අප ලබා ගන්නා මේ ආර්ථික ප්‍රතිලාභ සියල්ලම ඉතා ටික කලකදී නැවත විනාශ මුඛයට ගලා යන්නට පුළුවන් වීමයි. එම නිසා මේ කාරණය මතක් කරමින් ඒ පිළිබඳව අපේ ගරු ඇමතිතුමාගේ ද අවධානය යොමු කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කුඩා තේ වතු සංවර්ධන පනත: නියෝග
## தேயிலை சிறு பற்றுநில அபிவிருத்திச் சட்டம்: ஒழுங்குவிதிகள்
## TEA SMALL HOLDINGS DEVELOPMENT LAW: REGULATIONS

**ගරු මහින්ද සමරසිංහ මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Plantation Industries)

I move,

"That the Regulations made by the Minister of Plantation Industries under Section 22, read with Section 15 of the Tea Small Holdings Development Law, No. 35 of 1975, and published in the Gazette Extraordinary No. 1701/1 of April 11th, 2011, which were presented on 13.07.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි කිරීමක් ඉල්ලා සිටියා. ඔබතුමාගෙන් අවසරය ලැබෙනවා නම් එතුමා සූදානම්.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க )
(The Hon. Mahinda Samarasinghe )

I can give him an explanation but it will take a little bit of time.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

We have already finished debating it.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)

Then, I will speak to him outside.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Okay.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

සභාව කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්නේ, ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා.

## කටුනායක නිදහස් වෙළඳ කලාපයේ සේවකයන් මුහුණපාන දුෂ්කරතා
### கட்டுநாயக்க சுதந்திர வர்த்தக வலய ஊழியர்கள் எதிர்நோக்கும் கஷ்டங்கள்
## DIFFICULTIES FACED BY WORKERS OF KATUNAYAKE FREE TRADE ZONE

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් පාලනය කරනු ලබන කටුනායක නිදහස් වෙළඳ කලාපයේ සේවකයන්ගේ වෘත්තීය සමිති අයිතිවාසිකම්වලට දැඩි ලෙස බාධා පමුණුවනු ලැබූ බවත්, උසස්වීම්, වැටුප් වර්ධක සහ වෙනත් ප්‍රතිලාභ ඔවුන් හට අහිමි කරනු ලැබූ බවත්, අතිකාල දීමනා නතර කරනු ලැබූ බවත් පසු ගිය කාලයේදී දක්නට ලැබුණි.

මෑතකදී පවත්වනු ලැබූ සේවක විරෝධතාවලට සහභාගි වී තුවාල ලැබූ කටුනායක නිදහස් වෙළඳ කලාපයේ සේවයේ නියුතු සේවකයන් හට වන්දි ගෙවීමක් ද සිදු වී නො මැත. මෙම හිංසාවන්වලට භාජනය වන්නේ රජයට සම්බන්ධ නැති වෘත්තීය සමිතිවල සාමාජිකයන්ට හා නායකයන්ට පමණක් බව ද පැහැදිලිව දකින්නට තිබේ.

කටුනායක නිදහස් වෙළඳ කලාපයේ සේවකයන් හට මුහුණ දීමට සිදු වී ඇති මෙම බාධාවන් සම්බන්ධයෙන් සත්‍ය තත්ත්වය ගරු අමාත්‍යතුමා විසින් මෙම සභාවට දැනුම් දිය යුතු යැයි මෙම සභාව යෝජනා කර සිටී."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හැමෝම දන්නවා, පසු ගිය කාලයේ කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ ඇති වුණු සිද්ධිය මේ රටේ විවාදයට තුඩු දුන් කාරණයක් බව. ඒ සිද්ධිය වෘත්තිය සමිති ව්‍යාපාරයට විතරක් නොවෙයි, විවිධ ක්ෂේත්‍රවලට -දේශපාලන අංශවලට ඒ වාගේම විවිධ අංශවලට- බලපෑම් කළා. ඒ සිද්ධිය මේ රටේ සේවක පද්ධතියටත්, නිෂ්පාදන ක්‍රියාවලියටත් සෘජු බලපෑමක් කළා. අප හැමෝම දන්නවා, එම සිද්ධිය සිද්ධ වුණ ආකාරය. එතැනදී නව දෙනකුට ආසන්න පිරිසකට වෙඩි වැදුණා; පන්සියයක් හයසියයක් තුවාල ලැබුවා; සමහර අය ඔළු පලා ගත්තා; අත පය කඩා ගත්තා; විවිධ අඩන්තේට්ටම්වලට ලක් වුණා. සේවකයෝ තමන්ගේ කර්මාන්තශාලා තුළට නැත්නම් තමන් සේවය කරමින් හිටපු ස්ථානවලට දුවමින් සිටියදී පවා, කෑම ගනිමින් සිටියදී පවා පොලිස් පහර දීම් සිදු වෙලා අවසානයේ පොලිස්පතිවරයා පවා මේ වැරැද්ද භාර ගනිමින් පොලිස්පති ධුරයෙන් පවා ඉල්ලා අස් වුණා. අවසානයේ එතුමා තානාපතිවරයෙක් වශයෙන් පත්වෙලා ගියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේට පැහැදිලි කරන්න ඕනෑ, මේ සිද්ධියත් එක්ක කරුණු කාරණා ගණනාවක් උද්ගත වුණ බව. මෙවැනි සිද්ධියක් ඇති වුණාම ඒවාට සාධාරණ විසඳුම් දෙන්න රජයට විශේෂ වග කීමක් තිබෙනවා. ඒ වාගේම හිටපු අධිකරණ විනිසුරුවරයෙක් වන මහානාම තිලකරත්න

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපතිවරයා පවා ඒක පුද්ගල කමිටුවක් පත් කරලා -ඒක පුද්ගල කොමිසමක් දමා- මේ සම්බන්ධයෙන් කරුණු හොයා බලන්න කටයුතු කළා. මානව හිමිකම් කොමිෂන් සභාව පවා මේ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන්න තීරණය කළා. නමුත් මම කනගාටුවෙන් කියන්න ඕනෑ මේ කාරණය. මේ වන තෙක් අපට දැන ගන්න ලැබිලා නැහැ, මහානාම තිලකරත්න හිටපු විනිසුරුතුමාගේ ඒක පුද්ගල කොමිසම දීපු වාර්තාව. ජනාධිපතිවරයාටත් දීලා තිබෙනවා කියා අපට දැන ගන්න ලැබිලා තියෙනවා. ඒකට කවුද වැරදිකාරයෝ වෙලා තිබෙන්නේ? කවුද වෙඩි තියන්න අණ දුන්නේ? ඒ වෙනකොට BOI එකේ නිසි බලධාරියා වශයෙන් කටයුතු කළේ කවුද? මෙවැනි සිද්ධි ගණනාවක් මේ වන තෙක් හෙළිදරව් වී නැහැ.

මේ සිද්ධිය නිසා රොෂේන් තරුණයා මරුමුවට පත් වුණා. විශේෂයෙන්ම ඒ පවුලට ආණ්ඩුවෙන් විවිධ දේවල් ලබා දෙනවා කියා, ඒ පවුලේ අනෙකුත් සාමාජිකයන්ට රැකියා ලබා දෙනවා කියා, ජනාධිපතිවරයාගේ පණිවුඩයක් අරගෙන ප්‍රධාන අමාත්‍යවරයා ගිහින් තිබුණා. ඊට අමතරව ගේ හදලා දෙන්න පොරොන්දු වෙලා තිබුණා. මෙවැනි විවිධ දේවල් පොරොන්දු වෙලා තිබුණා. මුදලුත් පොරොන්දු වෙලා කොටසක් දීලා තිබෙනවා. කොටසක් හෝ දීම පිළිබඳව අපි ස්තුතිවන්ත වන්න ඕනෑ. නමුත් තුවාල ලැබූ විශාල ප්‍රමාණයක් තවමත් රෝහල් ගත වෙලා සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහිදී තුවාල ලැබූ අය බොහොම අසරණ තත්ත්වයට පත් වෙලා. අද මේ වියදම් දරා ගන්න බැරිව විශේෂයෙන්ම තුවාල ලැබූ කෙනෙක් රෝහලේ ඉන්නවා. ඔහුට වැසිකිළි යාමට අවශ්‍ය බෑග් එකවත් ඒ ගොල්ලන්ට මිලදී ගන්න පුළුවන්කමක් නැහැ. ඒවා හෝද හෝදා පාවිච්චි කරන බව ඒ ගොල්ලන්ගේ දෙමවුපියන් විසින් අපට දැනුම් දුන්නා.

මෙහිදී රජයට වග කීමක් තිබෙනවා. මේ සිද්ධිය උද්ගත වූ අවස්ථාව දෙස බලන විට, මේ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න මේ රජයට වග කීමක් තිබෙන බව අපට පෙනෙනවා. මෙතැන තමන්ගේ බිරිඳ ගෙන යන්නට ඒ ස්ථානයට පැමිණි සැමියෙක් ඉන්නවා, වෙඩි වැදිලා; තුවාල ලබලා. තුවාල ලැබූ ත්‍රීවීලර් රියදුරෙක් ඉන්නවා. කිසිම හේතුවක් නැතුව මොනවාවත් දන්නේ නැතුව -වෘත්තීය සමිති ව්‍යාපාරය ගැනවත්, වෘත්තීය සමිති අයිතිවාසිකම් ගැනවත් දන්නේ නැතුව- වෙඩි කාපු තුවාල ලැබූ බොහෝ පිරිසක් සිටිනවා. ඒ කිසිම කෙනෙක් සම්බන්ධව ආණ්ඩුවට මේ වන තෙක් ක්‍රියා කරන්න බැරි වෙලා තිබෙනවා.

මේ සිද්ධියෙන් පසු එක අවස්ථාවක බැසිල් රාජපක්ෂ මැතිතුමාත් ගිහින් වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කර තිබුණා. සාකච්ඡා කළාට පසු ඒ කර්මාන්තශාලා හිමියන් පවා ඒ අයට වුණු අලාභ හානි සම්බන්ධයෙන් පවා පැමිණිලි කරන්න භය වෙලා තිබෙනවා. ඒ ගොල්ලන් පැමිණිලි කරලත් නැහැ.

පළි ගැනීමේ ක්‍රියාවලියකුත් මේ අවස්ථාවේ යෙදෙමින් පවතිනවා. සේවකයන්ගේ උසස් වීම් නතර කර තිබෙනවා. මේ සේවකයන් තුවාල ලබා ඉද්දි මේ සිද්ධිවලට භාජනය වෙලා සිටියදී මේ සේවකයන්ට නිවාඩු ලබා දීමත් අවලංගු - cancel - කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ ගොල්ලන්ගේ උසස් වීම් නවත්වලා විතරක් නොවෙයි, මේ ගොල්ලන්ට දෙන්න තිබෙන හැම පහසුකමක්ම නවත්වලා පළි ගැනීමේ ක්‍රියාවලියක යෙදෙන බව අපට දැන ගන්න ලැබිලා තිබෙනවා. අප මේ ආණ්ඩුවට මතක් කරන්න ඕනෑ, මේ දේ කරන්න එපා; මෙවැනි ආකාරයෙන් පළි ගන්න හදන්න එපා කියා.

මේ, අහිංසක මිනිස්සු. මේ, අපේ රටේම මිනිස්සු. මේ, අපේ නිෂ්පාදන ක්‍රියාවලියට විවිධ මට්ටමින් දායක වන මිනිස්සු. මේ ගොල්ලන් හම්බ වුණාමත්, දුරකථන මාර්ගයෙන් කථා කරලාත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන් විධියට අපට පැමිණිලි කරනවා, "අනේ මන්ත්‍රීතුමා, ආණ්ඩු පක්ෂයේ අයට කියලා අපට මොකක් හරි සහනයක් ලබා දෙන්න, අපි හරිම අසරණ තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ" කියලා. අපේ ගාමිණී ලොකුගේ ගරු අමාත්‍යතුමා ගරු සභාවේ ඉන්නවා. මේ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් වහාම ගන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

මේ සිද්ධියේදී පොලීසිය හැසිරුණු ආකාරය, ඒ වාගේම වෙඩි තියන්න පොලීසියට නියෝග දුන්නේ කවුද කියන එක විරුද්ධ පාර්ශ්වය විධියට අපට දැන ගන්න අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ වාගේම මේ සිද්ධියේදී සමහර වෘත්තීය සමිති නායකයන්ගේ නිවෙස්වලට පොලීසිය ගිහිල්ලා තිබෙනවා. එක් කෙනකු පැහැර ගෙන ගිහින්, ලේ එන කල් පහර දීලා, මඟ දමා ගිහින් තිබුණු අවස්ථාවක් පසු ගිය කාලයේ අපට දක්නට ලැබුණා. ඒ නිසා මම ඉතාම වුවමනාවෙන් ඉල්ලා සිටිනවා, ගරු අමාත්‍යතුමා මේ සම්බන්ධයෙන් මේ සභාවේදී කරුණු පැහැදිලි කරන්න කියලා. ඒ වාගේම මෙම ප්‍රශ්නාවලිය මම ගරු ඇමතිතුමාට නැවත වතාවක් ඉදිරිපත් කරනවා. වෙඩි තියන්න අණ දුන් ප්‍රධානියා කවුද, එදා වෙඩි තියන්න තුවක්කු කීයක් භාවිත කර තිබෙනවාද, ඒවා භාවිත කළ නිලධාරින් කවුද, ඔවුන්ව අධිකරණයට ඉදිරිපත් කරනවාද, අවසරයකින් තොරව BOI ප්‍රදේශයට ඇතුළු වීමට පොලීසියට තහනම්ව තිබියදී ඇතුළු වීමට අවසර දුන්නේ කවුද, එදින වගකීම් භාරව සිටි කටුනායක කලාපය භාර BOI නිලධාරියා කවුද, කටුනායක කලාපයට පොලීසිය ඇතුළු වීම සම්බන්ධයෙන් ඔහු වග කිය යුතු නැද්ද යන කරුණු කාරණා ගණනාවක් සම්බන්ධයෙන් උත්තර ලබා දෙන ලෙස අපි ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මේ සම්බන්ධයෙන් එකම ආයතනයක් විතරක්, එනම් නොරාටෙල් කියන ආයතනය විතරක් ධම්මික කියන තුවාලකරුවාට සහයෝගය දීලා තිබෙනවා. මම අහනවා, එහෙම නම් මේ කර්මාන්තශාලා හිමියන් උදවු කරන එකත් නවත්වලා තිබෙන්නේ ඇයි කියලා. කර්මාන්තශාලා හිමියෝ උදව් කරන එක නවත්වලා තිබෙන්නේ කාගේ බලපෑමක් මතද? එක අවස්ථාවකදී මේ කර්මාන්තශාලාවල සේවකයෝ සියලු දෙනාම ඉල්ලීමක් කරලා තිබෙනවා, "අපි සියලු දෙනාගේ දිනක වැටුප් කපා මේ තුවාලකරුවන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්නට අවශ්‍ය මුදල් ප්‍රමාණය ලබා දෙන්න" කියලා. ඒ අවස්ථාව පවා ඒ සේවකයන්ට ලබා දීලා නැහැ. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍යතාවක් තිබියදීත් මෙසේ නොසලකා හැරීමෙන් මෙතැන අදෘශ්‍යමාන හස්තයක් ක්‍රියාත්මක වන බව අපට පෙනෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අපව දැනුවත් කරන ලෙස මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

අකිල විරාජ් තරුණ මන්ත්‍රීවරයා අද මේ ගරු සභාවට ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරන්නයි මම නැඟී සිටියේ. එතුමා මෙම යෝජනාව ගෙනෙන්න හේතුව, එක පැත්තකින් එදා ඒ සිද්ධිය පමණක් නොවෙයි. එතැනදී දුන්නු පොරොන්දු කිසිවක් අද වන කල් රජය ඉෂ්ට කරලා නැහැ. නැත්නම් මේ යට ගිය දේ නැවත වතාවක් මේ ගරු සභාවට ගෙනැල්ලා මේ පිළිබඳව කථා කරන්න අවශ්‍යතාවක් ඇත්තේ නැහැ. එය මුළු රටේම ආන්දෝලනයට ලක් වුණු සිද්ධියක්.

මම දන්නා තරමට අපේ එක්සත් ජාතික පක්ෂ රජය 1978 වැඩ පටන් අරන් 1979 දී වාගේ වෙළෙඳ කලාප ආරම්භ කළා. එදා ඉඳලා මේ සිද්ධිය වන කල් එවැනි දෙයක් මේ පරිමාණයෙන්

කවදාවත් වෙළෙඳ කලාපයක ඇති වුණේ නැහැ. මම එය පෞද්ගලිකව දන්නවා. අප ඒ කාලයේදී කම්කරුවන් සපයා දීම ආදී දේ කරමින් ඒ වෙළෙඳ කලාපත් එක්ක සම්බන්ධ වෙලා කටයුතු කළා. නමුත් මේ විධියේ කම්කරු අයිතිවාසිකම් පාගා දමන, වෙළෙඳ කලාපයේ වැඩ කරන සේවකයන්ට හිරිහැර කරන, ඒ අය කලකිරීමට පත් කරන සිද්ධියක් කවදාවත් ඇති වුණේ නැහැ.

ගරු අකිල විරාජ් මන්ත්‍රීතුමා කථා කළ එදා ඇති වුණු වෙඩි තැබීම සහ කම්කරු මර්දනය මම දන්නා තරමට පළමුවන වතාවට තමයි ලක්ෂ ගණනක් වැඩ කරන මේ වෙළෙඳ කලාපය තුළ ඇති වුණේ. රජයේ වාසනාවට එදා ඒ ප්‍රශ්නය වැඩිය කලබලයක් නැතුව අවසාන වුණා. ඒ ප්‍රශ්නය හරියට රටට ගෙනිච්චා නම් ඔය ආණ්ඩුව වැටෙන්න ඉඩ තිබුණා. මම කියනවා, එදා ඇති වුණේ ඒ තරම් දරුණු තත්ත්වයක්ය කියලා. කම්කරුවන් කනස්සල්ලට පත් වුණා, මේ රටට විදේශ විනිමය උපදවන, රැකියා සපයන මෙවැනි ආයතනවලට, එහෙමත් නැත්නම් ආයතන සංකීර්ණයකට මේ විධියේ ක්‍රියා කලාපයක්, මේ විධියේ තර්ජනයක්, මර්දනයක් රජය ඇති කළේ ඇයි කියලා.

දැන් එතැනදී තිබෙන ප්‍රශ්නය මෙකයි. ඒක වුණා ඉවරයි. අපි ආයෙත් ඒක මතු කරන්න වුවමනාවක් නැහැ කියන තර්කය ඉදිරිපත් වන්න පුළුවන්. කලින් කියපු විධියට ඒ තුවාලකරුවන්ට වන්දි ගෙවීමක් කළා නම්, එහෙම නැත්නම් ඔවුන්ගේ වෛද්‍ය පහසුකම්වලට වන්දියක් ලබා දුන්නා නම්, එහෙම නැත්නම් අවාසනාවන්ත ලෙස මරණයට පත් වුණු ඒ තරුණයාගේ පවුලට එදා පොරොන්දු වුණු දේ ලබා දීමට කටයුතු කළා නම් අද ඒ ප්‍රශ්නය ගැන අපට මෙතැන කථා කරන්න අයිතියකුත් නැහැ, අවශ්‍යතාවකුත් නැහැ. දැන් මෙතැන පළි ගැනීම ඉහළින්ම සිද්ධ වන බව තමයි මෙතුමා ඉදිරිපත් කරපු කරුණු කාරණාවලින් ඔප්පු වුණේ. ඒ කියන්නේ ඒ වෘත්තීය සමිතිවලට හිරිහැර කිරීම, කෙනහිලිකම් කිරීම, ඒ අයගේ අයිතිවාසිකම් පිළිබඳව නොසලකා හැරීම වැනි ප්‍රශ්න ගණනාවක් මෙතැනදී මතු වුණා. මේ එක ප්‍රශ්නයක් තමයි ශ්‍රී ලංකා රජය කම්කරු ජනතාවට සලකන්නේ මෙහෙමද කියන එක. අනික් අතින් මේ රටේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳව මහා විශාල ප්‍රශ්නයක් ඒ වෙලාවේ පැන නැඟිලා තිබුණා. කම්කරුවන්ට පමණක් නොවෙයි, ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට පවා ඇති වන තර්ජන, ගර්ජන දිහා බැලුවාම ඒක පෙනෙනවා.

මෙම යෝජනාවේ ඉල්ලීම් කිහිපයක් තිබෙනවා. එතුමා ඒක බොහොම පැහැදිලිව ඉදිරිපත් කළා. මෙතැන කම්කරු ඇමතිතුමා ඉන්නවා. මේ සිද්ධිය පිළිබඳව සොයා බැලීම එතුමාගේ වගකීම. ඒ සඳහා පත් කළ ඒකපුද්ගල කොමිසමේ වාර්තාව කෝ? ඒ වාර්තාව ඉදිරිපත් කරලා, ඒ වාර්තාව අනුව මේ සඳහා වග කිව යුත්තේ කවුද කියලා සොයා බලා, ඒ අයට විරුද්ධව පියවර නොගන්නේ ඇයි? පොලිස්පතිතුමා තමයි මේ සඳහා අණ දුන්නේ, ඒ නිසා පොලිස්පතිතුමා මේකට වග කියන්න ඕනෑ කියලා එතැනදී කියැවුණා. නමුත් අද එතුමාට ඒ වෙනුවෙන් උසස්වීමක් දීලා - තානාපති ධුරයක් දීලා- එතුමා පිටත් කරලා හැරලා තිබෙනවා. මම දන්නේ නැහැ, එතුමා කොහොම ගියාද කියලා. මොකද එතුමාට විරුද්ධව මානව හිමිකම් නඩුවකුත් තිබෙනවා. මම දන්නේ නැහැ, උසස් නිලතල පිළිබඳ කාරක සභාවේදී කොයි විධියට ඒක අනුමත කරලා හැරියාද කියලා. ඒකත් වැරැදියි. ඒ පොලිස්පතිතුමා සමඟ මගේ කිසිම පෞද්ගලික වෛරයක් නැහැ. නමුත් මේ සිද්ධිය පිළිබඳව ඇයි මේ වාර්තා එළියට දමන්නේ නැත්තේ? මේ වාර්තා එන තුරු අපි බලා ගෙන ඉන්නවා. හිතන්න එපා කම්කරු ජනතාව මේක අමතක කරලා කියලා. ඔවුන් බොහොම වුවමනාවෙන් බලා ගෙන ඉන්නවා, මේ සම්බන්ධයෙන් රජය ගන්නා පියවර කුමක්ද කියා.

ඒ නිසා මමත් මෙතුමාගේ කාලීන යෝජනාව ස්ථිර කරමින් ඉල්ලීමක් කරනවා. විශේෂයෙන් කම්කරුවන් පිළිබඳව හොඳ හැඟීමක් තිබෙන, ඒ වාගේම කම්කරුවන්ගේ අවශ්‍යතාවන් පිළිබඳව දැනීමක් තිබෙන, එක්සත් ජාතික පක්ෂයෙන් හොඳ පන්නරයක් ලබපු කෙනෙක් තමයි කම්කරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා. මේ යෝජනාවෙන් කරන ඉල්ලීම් ඉටු කරන්න, සම්පූර්ණ කරන්න පියවර ගන්නය කියා මා ඉල්ලා සිටිනවා. එතුමා හෙට අනිද්දා ඉඳලාම ඒ සඳහා කටයුතු කරයි කියන බලාපොරොත්තුවෙන් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාවට ස්තුතිවන්ත වෙමින්, ඒ යෝජනාව නැවත ස්ථිර කරමින් ඒ සම්බන්ධයෙන් අදහස් කීපයක් එකතු කරන්න මා කල්පනා කරනවා.

විශේෂයෙන්ම පසු ගිය කාලයේදී කටුනායක පැවතුණු පෞද්ගලික අංශයේ සේවකයන්ට විශ්‍රාම වැටුපක් ලබා දීම සඳහා රජය ඉදිරිපත් කරපු සාධාරණ නොවූ "සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත" පිළිබඳව දැක්වූ විරෝධයේදී මේ රජය ගත් ක්‍රියාමාර්ග පිළිබඳව නැවත වතාවක් අපේ අප්‍රසාදය පළ කරනවා. විශේෂයෙන්ම ඒ ක්‍රියාමාර්ගවලදී පොලීසිය කරපු වෙඩි තැබීමේදී වෙළඳ කලාපයේ සේවය කළ සහෝදරයෙක් මිය ගියා. විශාල ප්‍රමාණයක් තුවාල ලැබුවා. ඒ වාගේම ආයතනවලට විශාල අලාභ හානියක් වුණා. නමුත් ජනාධිපතිතුමාත්, අමාත්‍යතුමාත්, රජයේ පාර්ශ්වයේ අනෙක් මැති ඇමතිවරුනුත් පැහැදිලි කළේ ඒ පිළිබඳව සාධාරණ පරීක්ෂණයක් පවත්වලා ඒ සේවකයන්ටත්, ඒ වාගේම ආයතනවලටත් වන්දි ගෙවීමක් කරනවාය කියලායි. නමුත් අපි දන්නා විධියට ඒ මිය ගිය සහෝදරයාට කිසියම් වන්දි මුදලක් ගෙව්වා හැර අනෙකුත් සේවකයන්ට හෝ ආයතනවලට වන්දියක් ගෙව්වේ නැහැ. ඒ වාගේම ඒ පිළිබඳව ක්‍රියාමාර්ගයක් ගැනීම දිගින් දිගටම කල් යවමින් පවතිනවා. මෙවැනි ආන්දෝලනාත්මක සිද්ධියක් සම්බන්ධයෙන්, විශාල කලබැගෑනියක් වෙච්ච දෙයක් සම්බන්ධයෙන් ටික කලක් ගියාට පස්සේ රජය කරන සාකච්ඡා අඩු වෙලා, වෙනත් ප්‍රශ්න මතු වුණාම ඒක පැත්තකින් තියනවා නම් ඒක මේ රටේ ජනතාවට කරන අගෞරවයක් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම විශේෂයෙන් එය කම්කරුවන්ට; වැඩ කරන ජනතාවට කරන අගෞරවයක්.

අපි දන්නවා අපේ රටේ ජාතික නිෂ්පාදනයේදී, ජාතික ආදායමේදී වැඩිම විදේශ විනිමයක් උපයන ක්ෂේත්‍රය වෙලා තිබෙන්නේ ඇඟලුම් කර්මාන්තය බව. එවැනි පිරිසකට මෙවැනි සැලකිල්ලක් දක්වනවා නම් ඒක කනගාටුදායක කාරණයක්. ඒ නිසා අප අපේ පැත්තෙනුත් නැවතත් රජයට මතක් කරන්න ඕනෑ, මේ සම්බන්ධයෙන් ඔවුන්ට දිය යුතු දීමනා, වන්දි ලබා දීම සහ කළ යුතු පරීක්ෂණය කඩිනම් කරන්න කියා. ඒ වාගේම ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මතු කළ ප්‍රශ්නය සම්බන්ධයෙනුත් අපි දැන ගන්න කැමැතියි. ඒ පිළිබඳව රජය විශාල ආන්දෝලනයක් ගෙන ගියා; විවිධ පාර්ශ්වවලට චෝදනා කළා. හැබැයි, එහි වැරැද්ද රජය පැත්තෙන් නීතිය හා සාමය ආරක්ෂා කිරීමට බැඳී සිටි හිටපු පොලිස්පතිතුමා යම් ප්‍රමාණයකට භාර ගත්තා. අඩු පාඩුවක් වුණා කියන එක එතුමා ප්‍රකාශ කළා. ඒ වාගේම එතැනින් නොනැවතී එතුමා ඉල්ලා අස් වුණා. නමුත් රජය දිගින් දිගටම වෙනත් පාර්ශ්වවලට චෝදනා කළා. මේ ගැන ගොඩාක් කතන්දර කිව්වා. දූරකථන සන්නිවේදන කුලුනු හරහා තොරතුරු සොයා ගත්තා කියලාත් කිව්වා. හැබැයි මේ කිසිවක් තවම එළිදරව් කරලා නැහැ. එහෙම සොයා ගත්තා නම් එළිදරව් කරන්න ඕනෑ. නමුත් රජය කළේ මොකක්ද? වෙනත් පැත්තකට මේ චෝදනාව එල්ල කරලා සාධාරණ මැදිහත් වීමක් නොකළ

[ගරු අජිත් කුමාර මහතා]

එකයි. ඒ වාගේම ඊට අදාළ පරීක්ෂණය ගනිමු. ඒ පිළිබඳව කරපු කථාවල හැටියට අපි හිතුවා සතියක් දෙකක් යන කොට කරුණු එළියට දමාවි කියලා. නමුත් තවම ඒ ගැන කථාවක් නැහැ. පොලිස්පතිතුමාත් ඉල්ලා අස් වුණා. එතුමාට තනතුරකුත් හම්බ වුණා. කලාපයේ සහෝදරයෙක් මිය ගියා. විශාල පිරිසකට අලාභ හානි වුණා; තුවාල වුණා. ඒ වාගේම වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් යම් හඬක් නඟන්න, අරගලයක් කරන්න තිබෙන ඉඩකඩ සීමා කළා. ඒ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයට භය වුණා. ඒ සියල්ලම කරලා ඉවර වෙලා දැන් රජය කිසි සාකච්ඡාවක් නැතිව ඒ කාරණය පැත්තකින් තියලා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව රජයේ පැත්තෙන් පැහැදිලි කර ගැනීමක් කර ගන්න දැන් අපට අවශ්‍යයි. ඒ වාර්තාවට මොකක්ද වුණේ? ඒක ඉදිරිපත් කරනවාද, නැද්ද? ඇත්තටම ඒ කියපු කථා බොරු නේද කියලා දැන් අපට හොඳටම තේරිලා තිබෙනවා. විවිධ පාර්ශ්වවලටයි චෝදනා කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය ආපු වෙලාවේ රජය කිව්ව දේ තමයි අපි මේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත ගෙනෙන්නේ නැහැ, ඉල්ලා අස් කර ගන්නවා කියන එක. ගරු ඇමතිතුමාත් කිව්වා මේ පිළිබඳව සංවාදයක් හදනවා කියලා. ප්‍රධානම ප්‍රශ්නය තමයි මහ ජනතාව එක්ක, විශේෂයෙන්ම මේ ප්‍රශ්නයට අදාළ වන පාර්ශ්වයන් එක්ක සාධාරණ සාකච්ඡාවක් කළේ නැති එක. එහෙම සාකච්ඡාවක් කරලා හොඳ සංවාදයක් රටේ හදලා මෙවැනි එකක් ගෙනාවා නම් ඒක හරි. මෙවැනි ගැටුමක් ඇති වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපිත් පිළිගන්නවා පෞද්ගලික අංශයේ සේවකයන්ට විශ්‍රාම වැටුපක් දෙන්න ඕනෑ කියලා. හැබැයි ඒක සාධාරණ එකක් වෙන්න ඕනෑ. ඔවුන් අමාරුවේ දමන එකක් නොවෙයි. සාධාරණ එකක් වෙන්න ඕනෑ. එයට නිශ්චිත ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත තුළ එහෙම ඒවා තිබුණේ නැති නිසා තමයි ප්‍රශ්නය ආවේ. ඒ වාගේම මේ ප්‍රශ්නය ආපු වෙලාවේ රජය කිව්ව දේ තමයි මේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත අයින් කරනවා කියන එක. එය පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ නැහැ කිව්වා. ඡන්දය විමසන්න, සම්මත කරන්න එය පාර්ලිමේන්තුවට ගෙනාවේ නැහැ. ඒක ඇත්ත. නමුත් ඒ වාගේම කිව්වා මේක න්‍යාය පුස්තකයෙනුත් ඉවත් කරනවා කියලා. හැබැයි පාර්ලිමේන්තුවේ මේ අගෝස්තු මාසයේ 24වැනි දා, එනම් අද න්‍යාය පත්‍රයේත් "සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත - දෙවැනි වර කියවීම" කියලා හයවැනි අංකය යටතේ තවම එය තිබෙනවා. මේක න්‍යාය පුස්තකයෙනුත් අයින් කරනවා කියලායි කිව්වේ. ඒ කම්කරු සහෝදරයන්, ඒ ජනතාව ඉල්ලා සිටියා මේක අයින් කරන්න කියලා. අලුත් එකක් ගෙනෙන්න කියලා. හැබැයි මේක තවම තිබෙනවා. මේ පරීක්ෂණ යට ගහලා, අසාධාරණය වූ අලාභ හානි වූ සේවකයන්ට වන්දි නොගෙවා නැවත හදන්නේ ඒ අයට හිතකර නොවූ -අහිතකර වූ- ඔවුන්ගේ මුදල් මං කොල්ල කන මේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත නැවත ගෙනෙන්නද කියන ප්‍රශ්නයත් අපට තිබෙනවා.

රජය පුන පුනා කිව්වා මේ පනත් කෙටුම්පත අයින් කරනවා; සම්පූර්ණයෙන්ම අයින් කරලා අලුත් එකක් ගෙනෙනවා කියලා. ඒ ගැන ප්‍රවෘත්ති වාර්තා, හඬපට ඕනෑ තරම් ඉදිරිපත් කරන්න අපට පුළුවන්. හැබැයි තවම මේ න්‍යාය පත්‍රයේ තිබෙනවා ආන්දෝලනයට ලක් වූ ජීවිතයක් පවා බිලි ගත්ත ඒ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත. ඒ නිසා අපි දැන ගන්න කැමැතියි, පසු ගිය කාලයේ ජනාධිපතිතුමාගේ ඉඳලා අමාත්‍ය මණ්ඩලයේ අයත්, රජයත් කිව්ව ප්‍රකාශ සාවද්‍යද, ඒවා ඒ වෙලාවේ තිබුණු ප්‍රශ්නය යට ගහන්න කරපු ප්‍රකාශද කියලා. මේ සියලු දේවලින් පෙනෙන්නේ ඒ වෙලාවට ගැලවෙන්න උත්තරයක් දෙනවා ඇරෙන්න, අරගලයක් යටපත් කරන්න මර්දනය කරන්න උත්තරයක් දෙනවා ඇරෙන්න නිශ්චිත පැහැදිලි පිළිතුරක් දෙන්නේ නැතිව අසත්‍ය ප්‍රකාශයන් කරනවා කියන එකද කියන කාරණය අපි දැන ගන්න කැමැතියි. ඒ නිසා නැවත වතාවක් අහන්න කැමැතියි මේ ප්‍රධාන ප්‍රශ්නය මතු වෙන්න හේතු වෙච්ච, පෞද්ගලික අංශයේ සේවකයන්ට බලෙන් පටවන්න හදපු ඔවුන්ගේ අරමුදල් මං කොල්ල කන්න ගෙනාපු ඒ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත සම්පූර්ණයෙන්ම අයින් කර ගෙන සාධාරණ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පතක් ගෙනෙනවාද කියන ප්‍රශ්නය.

අසාධාරණයට පත් වෙච්ච, විරෝධතාවලට සහභාගි වෙලා මිය ගිය සහ තුවාල වෙච්ච, අත පය අහිමි වෙච්ච අයට සහ අසාධාරණයට ලක් වූ ආයතනවලට ඉතා ඉක්මනින් සාධාරණ වන්දියක් ගෙවනවාද කියන කාරණයත් මම අහනවා. ඒ වාගේම අර සිද්ධියට සම්බන්ධ පරීක්ෂණය අවසන් කරන්නේ කවදාද, ඒ වාර්තාව රටට හෙළිදරවු කරන්නේ කවදාද කියලා අපි මේ සභාවෙන්, ගරු ඇමතිතුමාගෙන් සහ රජයෙන් දැන ගන්න කැමැතියි. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් මා එතුමාට කාරණයක් මතක් කරන්න කැමැතියි. එතුමාම දන්නවා, කටුනායක නිදහස් වෙළෙඳ කලාපය මේ රටේ ඇති කරපු පළමුවැනි නිදහස් වෙළෙඳ කලාපය කියලා. ඇයි මේ නිදහස් වෙළෙඳ කලාපයක් ඇති කළේ? ඒකේ තිබෙන නීති රීති ඒ වාගේම නිදහස් වෙළෙඳ කලාපය මේ රටේ ඇති කරපු අනාගත බලාපොරොත්තුව මොකක්ද කියන එක මම හිතන්නේ එතුමා එක්සත් ජාතික පක්ෂයේ නිසා හොඳට දන්නවා කියලායි. මොකද මේ නිදහස් වෙළෙඳ කලාප ක්‍රමය මේ රටේ පළමුවෙන්ම ස්ථාපිත කරන කොට ආයෝජනය කරපු කර්මාන්තශාලා ගෙනාවාට පස්සේ ඒවා ඇතුළේ තිබෙන නීති රීති සහ අයිතිවාසිකම් මා හිතන්නේ අනික් තැන්වලට වඩා වෙනස් කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ පළමුවැනි ප්‍රශ්නය තමයි මේ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ සේවකයන්ගේ වෘත්තීය සමිති අයිතිවාසිකම් තදබල ලෙස උල්ලංඝනය වෙලාය කියන කාරණය. මම ඉතාමත්ම පැහැදිලිව කියනවා, මේ කලාපය තුළ වෘත්තීය සමිතිවල කිසිම අයිතිවාසිකමක් රජය විසින් මර්දනයකට පත් කරලා හෝ වෘත්තීය සමිති අයිතිවාසිකමකට රජය විසින් කිසිම බාධාවක් හෝ හිංසාවක් කරලා නැහැ කියන එක. කලාපය තුළ තිබෙන වෘත්තීය සමිති අයිතිවාසිකම් පිළිබඳව කථා කරන කොට මේ කලාපයේ කර්මාන්තශාලා 84ක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මේ කර්මාන්තශාලා 84 තුළ සේවකයෝ 43,300ක් ඉන්නවා. 2011.06.30වැනි දා වන කොට මේ වෘත්තීය සමිති කියන ඒවාට බැඳිලා තියෙන්නේ සේවකයෝ 1,519යි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කරන්න තවම අවස්ථාවක් දීලා නැහැ. එතකොට වෘත්තීය සමිති අයිතිවාසිකම් උල්ලංඝනය කළේ නැහැ කියන්නේ කොහොමද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමා වෘත්තීය සමිති පිළිබඳව සාකච්ඡා කරන්නේ කම්කරු අමාත්‍යාංශයේදීයි. එතුමා කථා කරන කොට ඒකට උත්තර දෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කලාපය තුළ 43,300ක් ඉන්න සේවකයන්ගෙන් 1,519ක් වෘත්තීය සමිතිවල ඉන්නවා. මේ කලාපය තුළ කර්මාන්තකරුවන්, හිමිකරුවන් සහ කලාපයේ සේවකයන් අතර ගිවිසුමක් තියෙනවා. එතකොට මේකේ බැඳීමක් තිබෙනවා. කම්කරු ඇමතිතුමා ඒක ඉතාමත්ම පැහැදිලිව ඉදිරිපත් කරයි. විශේෂයෙන්ම ආයෝජන මණ්ඩලය අයිතිව තිබෙන ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අපි පැත්තක ඉඳන් උදව්වක් කරන එක තමයි මේකේදී කරන්නේ. මේ ඔක්කොටම පොලීසියට චෝදනා ඉදිරිපත් කරන කොට පොලිස්පතිවරයා ඉල්ලා අස් වුණු එකත් ඇත්ත. ඉන්දියාවේ සමහර රටවල්වල දුම්රියක් පෙරළුණාම ඇමතිවරයා ඉල්ලා අස් වෙනවා. ඒ ඇමතිවරයාගේ තියෙන සදාචාරය උඩ ඒ ඉල්ලා අස් වීම කරනවා. පොලීසිය වැරැද්ද කළාද නැද්ද කියන එක උඩ ඉල්ලා අස් වුණා නොවෙයි. එතුමාට වග කීමක් තිබුණා. ඒ වගකීම කවුරු හරි නිලධාරියෙක් අතින් බැහැර වුණා කියලා ඒක සිද්ධ වුණා.

කටුනායක නිදහස් වෙළෙඳ කලාපය තුළ කිසිම ආයුධයක් නැතිව අඩු ගණනේ පිස්තෝලයක්වත් නැතිව සිටි නියෝජ්‍ය පොලිස්පතිතුමාට බිම දාගෙන පහර දීලා ඉවර වුණාට පස්සේ ඇති වුණු සිද්ධියක් බව අමතක කරන්න එපා. අපි මේක අවංකව පිළිගන්න ඕනෑ. නිදහස් වෙළෙඳ කලාපය තුළ මේ තත්ත්වය ඇති කරන්න හැදුවේ මළ මිනියක් රට පුරා ගෙනි යන්න. ඒක තමයි මේ කරන්න හැදුවේ. මේ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත නිසා අහිංසක සේවකයන් එළියට අරගෙන මේ රටේ නැති ප්‍රශ්නයක් ඇති කරන්න හැදුවා. කම්කරුවන්ට යහපත්ය කියලා කල්පනා කරපු නිසා මේ රජය සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත ගෙනාවා. ඒකට කවුරු හරි අකමැති නම්, කම්කරුවන් පැත්තෙන් ඒකට විරෝධයක් දක්වනවා නම් හොඳ දේ වුණත් ඒක නොගෙනෙන්න මේ ආණ්ඩුව තීන්දු කළා.

ඒකේ ප්‍රශ්නයක් නැහැ. ජනතාවට -කම්කරුවන්ට- ඒක අවබෝධ වෙන්න කලින්, ඒ පිළිබඳව දීර්ඝ සාකච්ඡාවකට සංවාදයකට ගිහිල්ලා එකඟතාවකට එන්න කලින් රජය ඒ පනත් කෙටුම්පත ගෙනෙන්න ක්‍රියා කළා. නමුත් කටුනායක නිදහස් වෙළෙඳ කලාපය තුළ කිසිම සේවක අයිතිවාසිකමක් උල්ලංඝනය කරන්න රජය මැදිහත් වෙලා කටයුතු කරලා නැහැ. කර්මාන්තශාලා හිමියන්ට ප්‍රශ්න කිහිපයක් තිබුණා. ඒ අයට ඒ ප්‍රශ්න ඉදිරිපත් කරන්න අවශ්‍ය නම් කම්කරු ඇමතිතුමා ඉන්නවා. මෙන්න මේ පාර්ශ්වයට, මෙන්න මේ සේවකයන්ට මෙන්න මේ ටික ඉෂ්ට වෙලා නැහැ කියලා ඔබතුමා කියනවා නම්, ඒ පිළිබඳව කොහේටද පැමිණිලි කරලා තිබෙන්නේ? මොකක්ද වුණේ කියලා ආයෝජන මණ්ඩලයට එක සේවකයෙක්වත් පැමිණිල්ලක් එවලා නැහැ. [බාධා කිරීමක්] කම්කරු අමාත්‍යාංශයට යවලා ඇති. [බාධා කිරීමක්] ඔබතුමාට කථා කරන්න කාලය දුන්නා නේ. මගේ කථාව ඉවර වුණාට පස්සේ කම්කරු ඇමතිතුමාත් එක්ක කථා කරන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔබතුමා දැන් කියනවා කිසිම ප්‍රශ්නයක් වෙලා නැහැ කියලා. ගෙවල්වලට පොලීසියෙන් යවලා පහුවෙනිදා,-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔහොම ඉන්න. කම්කරු ඇමතිතුමා ඒකට උත්තර දෙයි. [බාධා කිරීමක්] නැහැ. මම කථා කරනතුරු ඔහොම ඉන්න. කම්කරු ඇමතිතුමා ඒකට උත්තර දෙයි. මේ ප්‍රශ්නය විකුණාගෙන කන්න හදන්න එපා. අපට යම් කිසි පැමිණිල්ලක් ආවාම කරන්නට තිබෙන්නේ ඒක කම්කරු දෙපාර්තමේන්තුවට යවන එකයි. එහෙම පැමිණිල්ලක් ආවොත් අපි ඒක කම්කරු දෙපාර්තමේන්තුවට යවන්නම්. ආයෝජන මණ්ඩලයට මෙවැනි පැමිණිල්ලක් ආවේ නැහැ කියන එකයි මම කියන්නේ. කම්කරු දෙපාර්තමේන්තුවට එම පැමිණිල්ල ඉදිරිපත් කර තිබෙනවා නම්, කම්කරු දෙපාර්තමේන්තුව ගත් තීන්දුව පිළිබඳව අදාළ ඇමතිවරයා පැහැදිලි කිරීමක් කරයි. ඒ පිළිබඳව ගැටලුවක් නැහැ.

දෙවැනි කාරණය තමයි, වෘත්තීය සමිති සාමාජිකයන්ට සේවා උසස්වීම්, වැටුප් වර්ධක වැනි වරප්‍රසාද ලබා නොදීම කියන කාරණය. කවුද ලබා නොදී තිබෙන්නේ? මොකක්ද මේ කරන කථාව? මේ පිළිබඳව දැන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් තිබෙනවා. විශාල වන්දි ප්‍රමාණයක් මෙන්න මේවාට දෙන්න කියලා සේවකයෝ ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා තිබෙනවා. එතැන ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. දැන් සමහර කර්මාන්තශාලා හිමියෝ ඒ සඳහන් වන්දි ගෙවලා තිබෙනවා. තවත් සමහර කර්මාන්තශාලා හිමියෝ එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. එහෙම ඉන්න අතරේ කොටසක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා තිබෙනවා. ඒ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව එන තෙක් සමහර අය බලා ගෙන ඉන්නවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමා, පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. සේවකයෝ ඔක්කෝම එකතු වෙලා තමන්ගේ දිනක වැටුප කපලා ලබා දෙන්න කියලා ඉල්ලීමක් කළා. නමුත් ඒ කර්මාන්තශාලා හිමියෝත් භය කරලා තිබෙනවා. විශේෂයෙන් ප්‍රධාන පෙළේ ඇමතිවරයෙක් ගිහිල්ලා සාකච්ඡාවක් පවත්වලා තිබෙනවා. [බාධා කිරීමක්] ඒ සාකච්ඡාව පැවැත්වූවාට පස්සේ කර්මාන්තශාලා හිමියෝ ඒ එකකටවත් එකඟ වෙලා නැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මට කියන්න, කවුද භය කරලා තිබෙන්නේ කියලා?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
කවුද භය කරන්නේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අපේ කවුද ගිහිල්ලා භය කරලා තිබෙන්නේ? කියන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මොකක්ද කියන්නේ, මට තේරෙන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මම අහන්නේ මේකයි. ඔබතුමා කියනවා නේ භය කරලා තිබෙනවා කියලා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මේ රජය මඟින්, රජයේ ඇමතිවරයකු විසින් කර්මාන්තශාලා හිමියන්ට කරපු තර්ජනය නිසා කර්මාන්තශාලා හිමියෝ කිසි දෙයක් ක්‍රියාත්මක වෙන්න දෙන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. [බාධා කිරීමක්] මට උත්තරයක් දෙන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
පැහැදිලිව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
කවුද හය කරලා තිබෙන්නේ කියලා මට උත්තරයක් දෙන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ආණ්ඩුවෙන් නේ හය කළේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ආණ්ඩුවේ කවුද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඇමතිවරයා ගිහිල්ලා කර්මාන්තශාලා හිමියන්ව හම්බ වෙලා කර්මාන්තශාලා හිමියන්ට තර්ජනය කළාම ඒ ගොල්ලෝ හයයි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මොන ඇමතිවරයාද? එහෙම කිසිම දෙයක් වෙලා නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඊට පස්සේ කර්මාන්තශාලා පවත්වාගෙන යන්න හම්බ වෙන්නේ නැහැ. කම්කරු ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. විවිධාකාරයෙන් බලපෑම් කරන්න ආණ්ඩුවට පුළුවන්.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒවා මම දන්නවා. මේ පාර්ලිමේන්තුවේදී මට පැහැදිලිව කියන්න මොන ඇමතිවරයාද හය කරලා තිබෙන්නේ කියලා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මෙතැනදී නම කියන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඇයි නම කියන්න බැරි?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඇමතිතුමා තමයි හය කරලා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒක සම්පූර්ණයෙන්ම ඉල්ලා අස් කර ගන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
කර්මාන්තශාලා හිමියෝ තමන්ට වුණු අලාභයවත් ඉල්ලන්නේ නැහැ. එච්චරම හයයි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒ කථාව ඉල්ලා අස් කර ගන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි,

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඇමතිතුමා කිසිම සාකච්ඡාවකදී කිසිම දෙයක් කියලා නැහැ.

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඇමතිතුමා කිසිම කෙනෙක් හය කළේ නැහැ. අපි ඒක පැහැදිලිව කියනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, the Hon. Member made an allegation regarding the conduct of an Hon. Minister of this House. That must be expunged.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That portion will be expunged. Whatever is contrary to the Standing Orders will be expunged. ගරු ඇමතිතුමා කථා කරන්න. [බාධා කිරීමක්] Order, please!

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඇමතිතුමා කිසිම රැස්වීමකට ගිහිල්ලා බලපෑමක් හෝ කථාවක් කළේ නැහැ කියන එක මම පැහැදිලිව මේ ගරු සභාවට කියනවා. මම ඒක වග කීමෙන් කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම කර්මාන්තශාලා හිමියන් වන්දි රක්ෂණ ප්‍රතිලාභ සඳහා ගිවිසුම්ගත වෙලා තිබෙනවා. ඒ කම්කරුවන්ට මොකක් හෝ හදිසියක් වුණොත්, කර්මාන්තශාලාවට හදිසියක් වුණොත් ඒවා ප්‍රතිපූරණය කරන්න රක්ෂණ සමාගම් එක්ක ගිවිසුම්ගත වෙලා තිබෙනවා. ඒ අනුව දැනට එම රක්ෂණ සමාගම්වලින් ප්‍රතිලාභ අය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර ගෙන යනවා. කෙනෙක් මැරුණාම ආණ්ඩුවේ කැමැත්ත අනුව කීයක් හරි දෙන එක හරි. නමුත් මේ හැම සේවකයෙක්ම, කර්මාන්තශාලාවක්ම රක්ෂණය කරලා තිබෙනවා. මේවා විදේශීය ආයෝජන. ඒ අය නිකම් මෙහේ කර්මාන්ත කර ගෙන යන්නේ නැහැ. ඒ සිද්ධිය ඇති වූ ඒ වෙලාවේම ජර්මනියට කථා කරලා, ඒ කොම්පැනිවලට කථා කරලා "මෙතැන ආරාවුලක් වෙනවා. අපට මෙහෙම සිද්ධ වෙනවා" කියලා තිබෙනවා. මේවා සංවිධානය වෙලා කළේ. නිකම් නොවෙයි මේවා කළේ. මේ රටේ ආයෝජනවලට බාධා කරන්න, මේ ආයෝජන වළක්වන්න, කම්කරුවන් යොදා ගෙන මේ රජය අපහසුතාවට පත් කරන්නයි ඒවා කළේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මේවා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ පටන් ගත්ත ඒවා. ඒක ඔබතුමාත් දන්නවා. ඒ නිසා අපට ඕනෑකමක් නැහැ ඒවා කඩාකප්පල් කරන්න. නමුත් තමුන්නාන්සේ මේ ප්‍රශ්නය අවබෝධ කර ගන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔබතුමා තොප්පිය දා ගන්න ඕනෑ නැහැ නේ. එක්සත් ජාතික පක්ෂයට තොප්පිය දා ගන්න ඕනෑ නැහැ. තොප්පිය දා ගන්න කෙනෙකුට දා ගන්න අරින්න. ඔබතුමා ඒක එක්සත් ජාතික පක්ෂයට දා ගන්න යන්න එපා. මම කිව්වේ නැහැ නේ එක්සත් ජාතික පක්ෂය කියලා.

සමහර කර්මාන්තශාලා හිමියන් අනතුරුවලට මුහුණ දුන් සේවකයන්ගේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා වැය වන මුදල් වෛද්‍ය ආධාර ක්‍රමවලින් සම්පූර්ණයෙන්ම හර කරලා තිබෙනවා. ඒ වාගේ දේවල් කර ගෙන ගිහින් තිබෙනවා. වෘත්තීය සමිතිවලට සම්බන්ධ සිද්ධීන් පදනම් කර ගෙන සමහර අයගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වෙලා කියලා මම කලින් කිව්වා වාගේ සමහර අය ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් තිබෙනවා. දැන් ඒ ගැන ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් තිබෙනවා. ඔවුන්ට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් තිබෙන නිසා ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව එන තුරු සමහර කර්මාන්තශාලා හිමියන් බලා ගෙන ඉන්නවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඒ කොමිසමේ වාර්තාව ඇයි අපට ඉදිරිපත් කරන්නේ නැත්තේ? ඒ වාගේම මානව හිමිකම් කොමිෂන් සභාවෙන් කළ පරීක්ෂණයේ ප්‍රතිඵලය ඉදිරිපත් කරන්නේ නැත්තේ මොකද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අපි සම්පූර්ණ සිද්ධිය පිළිබඳව මහානාම තිලකරත්න වාර්තාව ඉදිරියේදී ඉදිරිපත් කරනවා. ඒකේ ගැටලුවක් නැහැ. ඒකෙන් ඉදිරිපත් කරන කාරණා පිළිබඳව අපි සලකා බලනවා, මොකක්ද වුණේ කියලා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මිය ගිය රොෂේන්ගේ දෙමවුපියන් ඉල්ලීමක් කරලා තිබෙනවා, අපේ පුතා මරණයට පත් වුණේ කෙසේද, ඒ පිළිබඳව ජනාධිපතිවරයාට ලබා දුන් වාර්තාව අපට ලබා දෙන්න කියලා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒකත් හෙළි කරනවා. භය වෙන්න එපා. මේ ආණ්ඩුව හෙළි නොකරන එකක් නැහැ නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කලබල වෙන්න එපා. ඒවා අවශ්‍ය වෙලාවට හෙළි කරයි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මේ ආණ්ඩුවට හංගන්න දෙයක් නැහැ. මේවා ඔක්කොම සිද්ධ වුණේ එළියේ. තමුන්නාන්සේ දන්නවා නියෝජ්‍ය පොලිස්පතිතුමාට ගැහුවාට පස්සේ -බිම දා ගෙන ගැහුවාට පස්සේ - සමහර සිද්ධීන් සිදු වුණ බව. ඒවා රජයකට, පුද්ගලයන්ට පාලනය කරන්න බැරි සිද්ධීන්. ඒක කරන්න තමයි සමහර අයට වුවමනා වෙලා තිබුණේ. ඒක තමයි මේ රටේ කරන්න වුවමනා වෙලා තිබුණේ. ඒක යුද්ධයෙන් කරන්න බැරි වුණ එක. ආයෝජන බිම දාන්න, ආයෝජන කලාපය සම්පූර්ණයෙන් අස්ථාවර කරන්න තමයි හැදුවේ. ඒක තමයි මූලික පරමාර්ථය. ඒකට ඔබතුමන්ලා හවුල් වෙන්න එපා. සමහර අයගේ මූලික පරමාර්ථය වෙලා තිබුණේ ඒක. මම කලින් කිව්ව විධියට ඒ අය තමයි මේ සිද්ධිය සිදු වන විට විදේශීය රටවලට ඒ වෙලාවේම දුරකථන ඇමතුම් දීලා, මේ කලාපය තුළ කර්මාන්තශාලාවල සේවකයන්ට හිරිහැර කරනවා, තමුන්නාන්සේලාගේ පුද්ගලයන්ට හිරිහැර කරනවා කියලා විනාඩි පහක් ඇතුළත ලංකාවෙන් එපිටට, විදේශීය සමාගම්වලට කථා කළේ. මොකක්ද මේ කරන්න හැදුවේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්තශාලාවකට හෝ වෘත්තීය සමිති සාමාජිකයන්ට කිසිම වෙනස් සැලකීමක් ආණ්ඩුවෙන් කළා කියලා මම පිළිගන්නේ නැහැ. ආණ්ඩුවට යමක් කරන්න පුළුවන් සීමාවක් තිබෙනවා. නිදහස් වෙළෙඳ කලාපය තුළ ප්‍රශ්නයක් ඇති වුණාම ඒ කාරණයට උදවු කරන්න අපට මැදිහත් වෙන්න පුළුවන්. සේවකයන්ට ප්‍රශ්නයක් කියන්න තිබෙන තැන තමයි කම්කරු අමාත්‍යාංශය. එහෙම නැත්නම් කම්කරු දෙපාර්තමේන්තුව. සේවකයන්ගේ ප්‍රශ්න පිළිබඳව ඒ දෙපාර්තමේන්තුවට පැමිණිලි කළාට පස්සේ ඒ අයටත් මැදිහත්

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

වෙන්න පුළුවන් යම් ප්‍රමාණයක් තිබෙනවා. මේ නිදහස් වෙළෙඳ කලාප තුළ තිබෙන තත්ත්වය අනෙක් තැන්වලට වඩා වෙනස්. ඒවායේ ගේට්ටු දෙක වැහුවාම කිසි කෙනෙකුට ඇතුළු වෙන්න බැහැ. හැබැයි, මේ සිද්ධියේදී කර්මාන්ත පුරයට ඇතුළු වෙලා, කර්මාන්ත පුරයේ සිටිය සේවකයන්ටත් ගහන තත්ත්වයක් ඇති වුණා. ඒක තමයි ප්‍රකෝපකාරී තත්ත්වය. ඒ තත්ත්වය උඩ තමයි මේ සිද්ධිය ඇති වුණේ.

රජය කොයි වෙලාවකවත් සේවකයන්ට හානියක් කරලා, සේවකයන්ගේ අයිතිවාසිකම් නොදී, සේවකයන්ට වන්දි නොදී සේවකයන්ට තිබෙන අයිතිවාසිකම් විනාශ කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මම හිතන හැටියට මේ කලාපය තුළ තිබෙන අනෙක් රටවල -බංගලිදේශය වැනි රටවල- කර්මාන්තශාලාවල සේවකයන්ගේ අයිතිවාසිකම්, කම්කරු අයිතිවාසිකම් පිළිබඳව බැලුවාම, කම්කරු අණපනත් ගෙනැල්ලා ඉතාම හොඳ තත්ත්වයෙන් කම්කරු අයිතිවාසිකම් පිළිබඳව සලකන ලංකාව තරම් රටක් නැහැ.

අද අපේ රටේ ආයෝජන ව්‍යාපාරවලට සමහර වෙලාවට ලොකුම ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ අපේ තිබෙන දීමනා ඇතුළු අනෙකුත් සියලුම දේවල් අනෙක් රටවල්වලට වඩා වැඩි වීමයි. අපේ කර්මාන්තශාලා වියට්නාමයට යන්නේ ඒකයි. මේ production cost එක වැඩියි. Cost එක වැඩි වෙන්නේ අයිතිවාසිකම් ඔක්කෝම අපි දෙන නිසායි. හැබැයි රජයක් හැටියට අපි වග කීමෙන් කියනවා, ඒවා දෙන්න ඕනෑය කියලා. මොකද, කම්කරු ශ්‍රමය ඕනෑවට වඩා සූරා ගෙන කන්න අපි ඉඩ දීලා නැහැ. ඒ තත්ත්වය නිසා අපට රටක් හැටියට අලාභත් වෙලා තිබෙනවා, මේ කාලය තුළ. නමුත් අපි කම්කරුවන්ගේ පැත්තේ ඉන්නවා. ඒක නිසා තමයි මේ රටේ එදා වාමාංශික ව්‍යාපාර කරපු දේවල් අද ඉන්න වාමාංශික දේශපාලන පක්ෂවලට සහ අනෙක් අයට කරන්න බැරි වෙලා තිබෙන්නේ. අද ඒවා එළියට ගන්න බැහැ. අද මේ ආණ්ඩුවට විරුද්ධව අරගල කරන්න වෘත්තීය සමිති පාරට ගන්න එහෙම උවමනාවක් නැහැ. අයිතිවාසිකම් පිළිබඳව මේ ඇති වී තිබෙන තත්ත්වය මේ පනත් කෙටුම්පත නිසා ඇති වුණු තත්ත්වයක් විතරයි. එහෙම නැතිව පඩිවල ප්‍රශ්නයක්වත්, වෙනත් දීමනාවල ප්‍රශ්නයක්වත් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිදහස් වෙළෙඳ කලාපය තුළ මෙතුමා මේ කියන එකක්වත් පසු ගිය කාලයේ තිබුණේ නැහැ. ඒ කාලයේ සේවකයින්ට වැටුප් වර්ධක දුන්නේ නැහැ; සේවකයින්ට පඩි දුන්නේ නැහැ. පසු ගිය දිනක මා එක්තරා කොම්පැනියකට ගියා. එහි සේවකයින්ට මාසික පඩිය රුපියල් 32,000ක් ලැබෙනවා. අවුරුද්දේ අන්තිම වෙන කොට රුපියල් 60,000ක බෝනස් එකක් ලැබෙනවා. අද නිදහස් වෙළෙඳ කලාපය තුළ පුරප්පාඩු 7,000කට වැඩිය තිබෙනවා. සමහර අයගේ හැඟීමක් තිබෙනවා, රජයේ රැකියාවක් කරන්න ඕනෑය කියලා. නමුත් සමහර කොම්පැනි තිබෙනවා රජයේ ආයතනවලට වැඩිය හොඳට ගෙවීම් කරන. ඒ වාගේ ආයතන තිබෙනවා. සේවකයින්ට මේක ඇතුළේ ලොකු ප්‍රශ්නයක් තිබුණේ නැහැ. මේ ප්‍රශ්නය ඇද ගත්තා. ඇදගෙන, සේවකයෝ එළියට අරගෙන, සේවකයින්ගේ ප්‍රශ්නය දැන් දේශපාලනඥයෝ අරගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සේවකයින් 43,300න් මේ වෘත්තීය සමිතිවලට ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ එක්දහස් පන්සිය ගණනක්. ඇයි එහෙම වෙලා තිබෙන්නේ? මේ සේවකයින්ගේ අයිතිවාසිකම් දුන්නේ නැත්නම්, ඒවායේ මහා මර්දනයක් තිබෙනවා නම් සේවකයින් හතළිස්තුන්දහසින් අඩු ගණනේ හතළිස්දහසක්වත් වෘත්තීය සමිති සාමාජිකත්වය ගනීවි. එහෙම නම් ඇයි ඒ අයට බැරි වුණේ වෘත්තීය සමිති සාමාජිකත්වය ගන්න? හතළිස්තුන්දහසකින් එක්දහස් පන්සියයක් විතරක් වෘත්තීය සමිතිවලට බැඳෙන්නේ ඇයි? සමහර ටික දෙනෙක් මෙන්න මේ තත්ත්වය අරගෙන විකුණාගෙන කන්න හදනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉතාමත්ම පැහැදිලිව කියනවා, රජයේ මේ සඳහා කිසිම මර්දනයක් නැහැ, මේ අයිතිවාසිකම් නොදෙන්න කිසිම කල්පනාවක් නැහැ කියන එක. ඒ පරීක්ෂණ කරපු වාර්තාවේ යම් යම් කාරණා තිබෙනවා නම්, නීතියේ හැටියට යම් යම් නිලධාරින්ට දඬුවම් දෙන්න තිබෙනවා නම්, රජය කිසි ආකාරයකින් පැකිළෙන්නේ නැහැ, ඒ අයට දඬුවම් දෙන්න. අපි ඒ සඳහා ක්‍රියා කරනවා. ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉන්න දේශපාලන දර්ශනය උඩ මේ රටට ආයෝජනය අවශ්‍යයි. ඔබතුමා ඒක පිළිගන්නවා. ඔබතුමා කඩාකප්පල්කාරී ක්‍රියාවන්ට කැමැති නැහැ. ඒ ආයෝජන ප්‍රතිපත්ති අනුව. මේ ආයෝජනය රටට ගේන්න මේ වෙලාව තමයි ඉතාමත්ම හොඳ වෙලාව. මේ වෙලාවේදී මේ නිදහස් වෙළෙඳ කලාපයේ ඇති වුණු තත්ත්වයන් වාගේ දේවල් ඉදිරියේදී ඇති නොවෙන්න නම් තමුන්නාන්සේලාටත් යම් කිසි කාර්ය භාරයක් තිබෙනවා ඉටු කරන්න. අන්න ඒකට සහයෝගය දෙන්නය කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)

(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා, ඇත්ත තත්ත්වය අවබෝධ කරන්න මේ වාගේ අවස්ථාවක් ලබා දීපු එක ගැන.

කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ ඒ සිද්ධිය ඇති වෙලා මිය ගිය සේවකයින් වෙනුවෙන් අපි ඉතාම කනගාටුවට පත් වනවා. අද වාගේම එදාත් අපි කනගාටුවට පත් වුණා. මේ ප්‍රශ්නය ඇති වුණේ කටුනායක වෙළෙඳ කලාපයේ පඩි වැඩි වීමක් ඉල්ලාවත්, අර්ථසාධක අරමුදල් ඉල්ලාවත්, අතිකාල ඉල්ලාවත් නොවෙයි. මේ විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් පනතේ නැති කාරණා කියලා ඒ සේවක මහත්වරුන්ට වැරදි අවබෝධයක් දීලා ඒ පිළිබඳව උද්ඝෝෂණයක් ඇති කළා. ඒ අයගේ අර්ථ සාධක අරමුදල නැති වෙනවා, පාරිතෝෂිකය නැති වෙනවා කියලා මේ වාගේ විවිධ කරුණු කියලා සේවකයින් අතර වැරදි මතයක් ඇති කරලා සේවක අසහනකාරී තත්ත්වයක් ඇති කළා. ඒ අවස්ථාවේදී අපි කටුනායකට ගිහිල්ලා ඒ සේවක මහත්වරුන් මුණ ගැහිලා සංවාදයක් ඇති කළා.

ඒ සංවාදයේදී සේවක මහත්වරු අපිත් එක්ක තර්ක කළා; විතර්ක කළා. අවසානයේ ඒ අය තීන්දු කළා, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න ඉස්සෙල්ලා සංශෝධනත් එක්ක ඒ අයට ඒ පනත එවන්නය; ඒ අය ඒක කියවලා, ඒ ගැන සාකච්ඡා කරමුය කියා. ඒ විධියේ එකඟතාවක් ඇති වෙලා තිබුණා. නමුත් ඊළඟ සඳුදා සමහර දේශපාලන පක්ෂවල අය ගිහින් ඒ අයගේ අයත්, පිටස්තර අයත් වෙළෙඳ කලාපයට ඇතුල් වෙලා විශාල කලබැගෑනියක් ඇති කළා. පොලීසිය එහි ගියේ ආයුධ නැතිව. අපේ ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා කිව්වා වාගේ, නියෝජ්‍ය පොලිස්පතිතුමාට හිරිහැර කරන්න යනකොට විශාල ප්‍රශ්නයක් ඇති වුණා. ඒ සිද්ධියේදී අහිංසක සේවක මහතෙක් මිය ගියා. එහිදී විශාල කෝලාහලයක් ඇති වුණා.

රජය මැදිහත් වෙලා කල්පනා කළා, පළමුකොටම සේවක සුභදතාවය තිබෙන්න ඕනෑය කියා. මේ විධියේ කලබලයක් ඇති වෙනවා නම් ඒ පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගන්නට ඕනෑය කියා අතිගරු ජනාධිපතිතුමා තීන්දු කළා. අපි ඒක ඉල්ලා අස් කර ගත්තා විතරක් නොවෙයි, ඒ සමාගම් එක්ක, සේවකයන් එක්ක සාකච්ඡා කරලා ඊළඟ සතියේම කලාපයේ කටයුතු

නැවතත් පටන් ගත්තා. ඒ නිසා සාමකාමීව අද එහි කටයුතු කෙරීගෙන යනවා. ඊට අමතරව අපි කම්කරු අමාත්‍යාංශයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් කළා. ඒ පරීක්ෂණයේදී කිසිම අවස්ථාවකදී ඔය තමුන්නාන්සේලා කියන කාරණා එකක්වත් මතු වුණේ නැහැ. තමුන්නාන්සේලාට එවැනි කාරණා තිබෙනවා නම් ඒවා මට දෙන්න. මම අපේ නිලධාරින් යොදවා ඒ ගැන පරීක්ෂා කරලා බලන්නම්.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු ඇමතිතුමනි, පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගන්නවාය කියා කිව්වා. නමුත් තවමත් ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තු න්‍යාය පුස්තකයේ තිබෙනවා. ඒ ගැන පාර්ලිමේන්තුවේදී මතු කළා. නමුත් තවම ඉල්ලා අස්කර ගැනීමක් වෙලා නැහැ.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
හරි. ඒ ගැන පක්ෂ නායක සාකච්ඡාවේදී කටයුතු කරයි. අපි ඒක ක්‍රියාත්මක කරන්නේ නැහැ නේ. අපි මේ පාර්ලිමේන්තුවේදීත් කියා තිබෙනවා, පිටතදීත් කියා තිබෙනවා, ත්‍රෛපාර්ශ්වික සාකච්ඡාවේදීත් කියා තිබෙනවා අපි ඒක ක්‍රියාත්මක කරන්නේ නැහැ කියා. ඒක හරි. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. නිදහස් වෙළෙඳ කලාපයේ කටයුතු කරනකොට ඒවායේ පඩි වැඩි වීම් කරන්නේ, උසස් වීම් දෙන්නේ, බෝනස් දෙන්නේ ඒ අයගේ හාම්පුතුන් හා ශුභ සාධක සංගම් එකට වාඩි වෙලා සාකච්ඡා කිරීමෙන් පසුවයි. ඒ අනුව තමයි ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා මේක ආරම්භ කරපු දවසේ පටන් අද වනතෙක්ම ක්‍රියාත්මක වෙන්නේ. යම්කිසි විධියකින් ඒවායේ ගැටලුවක් ඇති වෙලා, අපට පැමිණිලි කළාම අපේ නිලධාරින් ඒ සාකච්ඡාවට සහභාගි වෙලා ඒ කටයුතු කරනවා. ඒ නිසා තමුන්නාන්සේලා කියන විධියට overtime කැපුවාය කියා හෝ උසස් වීම් දුන්නු කාරණා පිළිබඳව කිසිදු පැමිණිල්ලක් මේ මොහොත වනකොටත් ඉදිරිපත් වෙලා නැහැ. තමුන්නාන්සේලාට එවැනි පැමිණිල්ලක් ඉදිරිපත් වෙලා තිබෙනවා නම් මට ඒවා ඉදිරිපත් කරන්න. මම අපේ කම්කරු නිලධාරින් යොදවා ඒවා පරීක්ෂා කරලා බලන්නම්. ඒ ගැන කිසිම අවුලක් නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමනි, අපි තමුන්නාන්සේට කියා සිටින්නේ යම් යම් හේතු මත පැමිණිලි කරන්න නොහැකි වාතාවරණයක් ඇති වෙලා තිබෙනවාය කියන එකයි.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
නැහැ, නැහැ. කිසිම හේතුවක් නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඒ සේවක සේවිකාවන්ට වැටුප්, නිවාඩු, වන්දි සහ සෞඛ්‍ය පහසුකම් ලබා දෙන්නය කියා අපි ඉල්ලා සිටිනවා. මොකද, රෝහල්ගත වෙලා සිටියත් අඩුම ගණනේ ඒ අයට නිවාඩුවක්වත් දීලා නැහැ.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ පාර්ලිමේන්තුවේ කතා කරනවා වාගේම ඔය වෘත්තීය සමිති නායකයෝත් මාසයකට වරක් ත්‍රෛපාර්ශ්වික සාකච්ඡාවලදී අපේ අමාත්‍යාංශයේ වාඩි වෙනවා. එතැනදි කාගේවත් බලපෑමක් නැහැ. එහිදී අපි මේ රටේ තිබෙන විවිධ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරනවා. විවිධ කාරණා පිළිබඳව සාකච්ඡා කරනවා. වෘත්තීය සමිති 1519ක් තිබෙනවා. ඒ ඔක්කොම වෘත්තීය සමිතිවල නියෝජිතයන් එතැන ඉන්නවා. ඒ ගොල්ල වෙනත් පළාත්වල වෘත්තීය සමිතිවලත් ඉන්නවා. ඒ ත්‍රෛපාර්ශ්වික සාකච්ඡාවේදී කතා කරන්න ඒ නායකයන්ට කිසිම බලපෑමක් ඇති වෙලා නැහැ. පෞද්ගලිකව අපට ඒ අයට කියන්න පුළුවන්, ඒකේ Minutes ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ නිසා කිසිම අවස්ථාවකදී එවැනි ප්‍රශ්නයක් මතු වෙලා නැහැ. තමුන්නාන්සේට කවුරු හරි පැමිණිල්ලක් කර තිබෙනවා නම් මට ඒක ඉදිරිපත් කරන්න. අපේ කම්කරු නිලධාරින් යොදවා මම ඒක පරීක්ෂා කරලා බලන්නම්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
වෘත්තීය සමිති ඒකාබද්ධ පෙරමුණ ඉල්ලා තිබෙනවා, මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් දෙන්නය කියා.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
වෘත්තීය සමිති ඒකාබද්ධ සේවක පෙරමුණේ සමරසිංහ නමැති අය අපේ කමිටුවේ ඉන්නවා. මාසෙකට වතාවක් රැස් වෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඉතින් එතුමා ඉල්ලීමක් කරලා තිබෙනවා. ඒ අය තමයි කියන්නේ. මම දන්නේ නැහැ, එතුමා ඔබතුමා ඉස්සරහ ඒ බව කියන්න බයද කියලා.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
එතුමා කවදාවත් අපෙන් ඉල්ලීමක් කරලා නැහැ. මම දන්නේ නැහැ තමුන්නාන්සේ ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරනවාද කියා. එත්සත් ජාතික පක්ෂයේ වෘත්තීය සමිති නියෝජිතයොත් ඉන්නවා. ඒ ගොල්ලවත් ඉල්ලීමක් කරලා නැහැ.

අපේ ත්‍රෛපාර්ශ්වික සාකච්ඡාවට ජාතික සේවක සංගමයත් ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණ-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
දෙමව්පියන් පවා අපි එක්ක කථා කළා. [බාධා කිරීමක්]

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
මම දන්නේ නැහැ. තමුන්නාන්සේ මේ පාර්ලිමේන්තුවේ කිව්වාට, ඒකේ සභාපති හැටියට කටයුතු කරන්නේ මමයි. තමුන්නාන්සේට ඕනෑ නම් පසු ගිය සභා වාරයේ වාර්තා ටික මම දෙන්නම්. ජාතික සේවක සංගමය නියෝජනය කරනවා. ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් සමරසිංහ මහත්මයා නියෝජනය කරනවා. සීඑම්යූ එක ඉන්නවා. ලංකාවේ තිබෙන ප්‍රධාන දේශපාලන පක්ෂවල නියෝජිතයෝ ඔක්කොම ඉන්නවා.

[ගරු ගාමිණී ලොකුගේ මහතා]

තමුන්නාන්සේ අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන තෙක් තමුන්නාන්සේලාගේ කවුරුවත් අපට කථා කළේ නැහැ. කථා කළා නම් ඒ ගැන පරීක්ෂා කරන්න අපේ අමාත්‍යාංශය බැඳිලා ඉන්නවා. අපිත් කම්කරුවන් වෙනුවෙන් කටයුතු කරන උදවිය. මම අවුරුදු ගණනාවක් වෘත්තීය සමිති කරලා තිබෙනවා. වෘත්තිය සමිතියක සේවක මහත්මයෙක් අපේ අමාත්‍යාංශයට ප්‍රශ්නයක් ඉදිරිපත් කළොත් මම විශේෂයෙන් ඒ ගැන සලකනවා. මොකද, ඒ අය වෙනුවෙන් අපි පෙනී ඉන්න ඕනෑ. ඒ නිසා තමුන්නාන්සේට පෞද්ගලිකව කවුරු හරි ඒක දීලා තිබෙනවා නම් මට දෙන්න. අපේ නිලධාරි මහත්මයෙක් ලවා මම ඒක විභාග කරන්නම්. ඒක අපේ යුතුකමක්. අපි හැමදාම කරන්නේ ඒකයි. Free Trade Zone එකේ කර්මාන්තශාලාවල විවිධ ප්‍රශ්න ඇති වුණාම සමහර වෙලාවට කර්මාන්තශාලා හිමියෝත් අපට පැමිණිලි කරනවා. සේවකයෝත් පැමිණිලි කරනවා. අපි මේ දෙකටම මැදිහත්ව ක්‍රියා කරනවා.

මේ සිද්ධියේදීත් අපි බොහොම ප්‍රවේශමෙන් මැදිහත්ව ක්‍රියා කළා. ඒ නිසා අද කිසි ප්‍රශ්නයක් නැතිව සමගියෙන් ඒ කටයුත්ත කර ගෙන යනවා. මේ සිද්ධිය වෙන කොට හුඟාක් උදවිය බලාපොරොත්තු වුණේ නිෂ්පාදන නැති කරලා මහා විප්ලවයක් ඇති වෙයි කියලායි. නමුත් අතිගරු ජනාධිපතිතුමා බොහොම ගැඹුරින් කල්පනා කරලා මේ ප්‍රශ්නයට මැදිහත් වුණා. ඒ සම්බන්ධයෙන් එතුමාට අපි ස්තුතිවන්ත වන්නට ඕනෑ. ඒ අනුව සතියකින් නිදහස් වෙළෙඳ කලාප සියල්ලම විවෘත කරලා කිසි ප්‍රශ්නයක් නැතිව ඒ නිෂ්පාදන කටයුතු කර ගෙන යන්න අපට පුළුවන් වුණා. ඒ නිසා අද කොහේවත් නිදහස් වෙළෙඳ කලාපයක ප්‍රශ්නයක් නැහැ. ඒවායේ තිබෙන විවිධ ප්‍රශ්න පිළිබඳව -පඩි වැඩිවීම් පිළිබඳව, overtime පිළිබඳව, bonus පිළිබඳව- ඒ ගොල්ලන් වාර්ෂිකව සාකච්ඡා කරනවා. සාකච්ඡා කරලා ගිවිසුම්වලට එනවා. ඒ විධියට තමයි ක්‍රියා කරන්නේ. අදටත් ඒ විධියටයි ක්‍රියා කරන්නේ. ඉතින් ඒක බොහොම හොඳට යනවා.

තමුන්නාන්සේ කොහොම කිව්වත් ඒ සේවකයෝ වෘත්තීය සමිතිවලට බැඳිලා නැහැ. වෘත්තීය සමිති තුනක තමයි සේවකයෝ ඉන්නේ. ඕනෑ නම් මට ඒ ෆැක්ටරියෙන් ෆැක්ටරියට ඉන්න ගණන කියන්න පුළුවන්. එකක ඉන්නේ හය දෙනායි. වැඩියෙන්ම ඉන්නේ 604 දෙනායි. ඒ නොරාටෙල් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගමේ. ඉතින් මෙන්න මේ වාගේ තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒ නිසා අපි බොහොම සතුටු වනවා, තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. විවිධ ප්‍රශ්න පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාම ඒ කාරණා පිළිබඳව තමුන්නාන්සේලාට පැහැදිලි කර දෙන්න අපට පුළුවන් වනවා. මොකද, අපි ඒකෙන් මඟහැරලා යන්නේ නැහැ.

මොකද, නිදහස් වෙළෙඳ කලාපය කියන්නේ-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මම කියන්නේ මේවා ගැන සොයා බලන්න කියලායි.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
මම සොයලා බලලා තිබෙනවා. අපේ කම්කරු නිලධාරි මහත්වරු ගිහිල්ලා ක්ෂේත්‍ර පරීක්ෂණයක් කළා. දිනපතා අපි ඒ පැමිණිලිවලට සම්බන්ධ වුණා. ඒ වාර්තා මගේ ළඟ තිබෙනවා. එහෙම දෙයක් තමුන්නාන්සේලා ළඟ තිබෙනවා නම් අපට ඉදිරිපත් කරන්න. අපි බොහොම මැදිහත්ව, පැහැදිලිව පරීක්ෂා කරලා ක්‍රියා කරන්නම්.

ඒ නිසා මම දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. තමුන්නාන්සේ අහපු ප්‍රශ්නයට මේ කරුණු ටික හොඳටම ඇති කියලා මම හිතනවා. ඒ නිසා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.14ට, 2011 අගෝස්තු 25 වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பாராளுமன்றம் பி. ப. 7.14 க்கு, 2011 ஓகஸ்ட் 25, வியாழக்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 7.14 p.m. until 1.00 p.m. on Thursday, 25th August, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.